# වාර්ෂික වාර්තාව 2012



පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පේරාදෙණිය ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව
# (පාලන හා ගිණුම්)
# 2012

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# පටුන


1 දැක්ම ........................................ 1

2 මෙහෙවර සහ අගයන් ........................................ 1

3 උපකුලපතිතුමන්ගේ සමාලෝචනය ........................................ 2

අ කෙටි හැඳින්වීම........................................ 2

ආ ජයග්‍රහණ........................................ 6

ඇ බාධක හා පිළියම් ........................................ 18

ඈ අනාගත සැලසුම් ........................................ 18

ඉ පාලක සභාව සහ සනාතන සභාව ........................................ 20

4 සම්පත් හා සිසුන්ගේ විස්තර ........................................ 21

5 දේශීය සිසුන් පිළිබඳ විස්තර ........................................ 22

6 විදෙස් සිසුන් පිළිබඳ විස්තර ........................................ 23

7 අ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර ........................................ 23

ආ අධ්‍යයන සහය කාර්ය මණ්ඩලයේ විස්තර ........................................ 25

8 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර ........................................ 26

9 පර්යේෂණ, නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර ........................................ 27

10 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර ........................................ 27

11 ලබාගත් සම්මාන පිළිබඳ විස්තර ........................................ 27

12 ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර ........................................ 28

13 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ........................................ 28

14 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර ........................................ 29

15 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) ........................................ 29

16 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) ........................................ 29

17 මුදල් ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර ........................................ 29

18 මුදල් ප්‍රගතිය (සාමාන්‍ය ආදායම) පිළිබඳ විස්තර ........................................ 29

19 මුදල් කාර්ය සාධන විශ්ලේෂණය 2012 ........................................ 30

20 2012 වසරේ ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර ........ 30

අ . 2012 වසර සඳහා ක්‍රියාත්මක වන සියලුම මුලධන ව්‍යාපෘති ........ 30

ආ 2012 වසර සඳහා ක්‍රියාත්මක වන සියලු පුනුරුත්තාපන ව්‍යාපෘති ........ 31

ඇ 2012 වසරේ අවසන් කල ව්‍යාපෘති ........ 32

**21 උපග්‍රන්ථ**

**උපග්‍රන්ථ A- පීඨ වාර්තා**

A 1 කෘෂිවිද්‍යා පීඨය ........ 33

A 2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය ........ 35

A 3 ශාස්ත්‍ර පීඨය ........ 37

A 4 දන්ත වෛද්‍ය පීඨය ........ 39

A 5 ඉංජිනේරු පීඨය ........ 41

A 6 වෛද්‍ය පීඨය ........ 43

A 7 විද්‍යා පීඨය ........ 45

A 8 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය ........ 47

A 9 පශ්චාත් උපාධි ආයතන

A 9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ........ 49

A 9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ........ 52

**උපග්‍රන්ථ B - විශ්වවිද්‍යාලයීය ප්‍රධාන මධ්‍යස්ථාන**

B 1 කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ........ 54

B 2 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ........ 56

B 3 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය ........ 58

B 4 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය ........ 61

B 5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය ........ 63

**උපග්‍රන්ථ C- ඉගෙනුම් සහයක සේවාවන්**

C 1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය ........ 66

C 2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ........ 68

C 3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ........ 70
C 4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය ........ 72

**උපග්‍රන්ථ D - උපස්ථම්භක සේවාවන්**

D 1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ........ 74
D 2 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන් ........ 76
D 3 ශාරීරික අධ්‍යාපන අංශය ........ 79
D 4 ශිෂ්‍ය සේවා අංශය ........ 81
D 5 ආරක්ෂක සේවාවන් ........ 83
D 6 විනයාරක්ෂක අංශය ........ 84
D 7 උද්‍යාන අංශය ........ 85
D 8 වැඩ දෙපාර්තමේන්තුව ........ 87

**උපග්‍රන්ථ E - මුදල් වාර්තාව**

E 1 මුදල් වාර්තාව - 2012 ........ 89
E 2 විගණන කමිටු වාර්තාව ........ 91

**උපග්‍රන්ථ F- පාලක සභාව හා සනාතන සභාව**

F 1 පාලක සභාව ........ 92
F 2 සනාතන සභාව සහ එහි සාමාජිකත්වය ........ 94

**උපග්‍රන්ථ G - ව්‍යාපෘති විස්තර**

G 1 ව්‍යාපෘති විස්තර (දෙස්/විදෙස්) ආධාර කළ 2012 ........ 99
G 2 ව්‍යාපෘති වියදම් (දෙස්/විදෙස්) ආධාර පිළිබඳ විස්තර 2012 ........ 108

**උපග්‍රන්ථ H - විගණන වාර්තා**

H 1 විගණකාධිපති වාර්තාව - 2012 ........ 118
H 2 2012 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ වාර්තාවෙන් පෙන්වා දෙන කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග ........ 133

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

## 01. දැක්ම

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කළාපයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැක්ම වනු ඇත.

## 02. මෙහෙවර සහ අගයන්



### මෙහෙවර

සමාජීය වශයෙන් සංවේදීවූත්, සදාචාරාත්මක හා සුසංවර බවින් පිරිපුන්වූත්, අධ්‍යාපනය හරහා ආර්ථිකමය වශයෙන් සෞභාග්‍යමත්වූත් සහ පර්යේෂණ, දැනුම ව්‍යාප්ත කිරීම, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය හා කාර්යක්ෂමව සැලසුම් කරනු ලැබූ සංවර්ධනය යන කර්තව්‍යයන් කෙරෙහි ක්‍රියාශීලි ලෙස සහභාගි විය හැකිවූත්, බුද්ධිමය වශයෙන් ප්‍රබෝධමත් හා වාදභේද රහිතවූත්, විශ්වවිද්‍යාල පරිසරයක් තුළින් දැනුම පාදක කරගත් සමාජ වටපිටාවක් ගොඩනැගීම සඳහා උරදීම විශ්වවිද්‍යාලයේ කාර්යභාරය වනු ඇත.

.

### අගයන්

- ඉගැන්වීම්, ඉගෙනුම් හා පර්යේෂණයේ උසස්ම තත්ත්වය
- අධ්‍යයන නිදහස
- සියලු කෘත්‍යයන්වල ඒකීයත්වය සහ විනිවිදභාවය
- සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම

## 03. උපකුලපතිතුමන්ගේ සමාලෝචනය



### (අ) කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ උරුමක්කරු වන 1942 වසරේ ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය ප්‍රමාණය, සිසුන් බඳවා ගැනීම, කාර්ය මණ්ඩල ශක්තිය, පහසුකම් හා සම්පත් යන අංශවලට අනුව ශ්‍රී ලංකාවේ විශාලතම විශ්වවිද්‍යාලයයි. හෙක්ටයාර 770ක් පුරා පැතිර යන භූමි ප්‍රමාණයකින් යුතු අධ්‍යාපන, නේවාසික පහසුකම්, ක්‍රීඩා හෝ සංස්කෘතික යන කුමන කරුණකින් වුවත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර අද්විතීය අත්දැකීමක් දායාද කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි. අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 60%කට නේවාසික පහසුකම් සපයන නේවාසිකාගාර 17ක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, විශ්වවිද්‍යාලයේ විවිධ ජනකොටස්වල අභිරුචීන් පිරිමසාලන සිද්ධස්ථාන, සංගම් රාශියකින් ඉටු කෙරෙන ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම්වලින් යුතු සිසුන් මෙන්ම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඇතුළත්වීමට අපේක්ෂා කරන්නන් අතරෙහිද මෙරට වඩාත් දැකුම්කළු විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. විශ්වවිද්‍යාල ප්‍රජාව සුබසාධන සංස්කෘතික හා ආගමික යන අංශයන්හි පුළුල් පරාසයක ක්‍රියාකාරකම්වලට සහභාගී වෙයි. මෙම ක්‍රියාකාරකම්වලට විශ්වවිද්‍යාල දිවියේ වැදගත් අංශයන් අඩංගු වේ. මෙම ක්‍රියාකාරකම්වල වැඩි ප්‍රමාණයක් ශිෂ්‍ය සංගම් මඟින් සංවිධානය කරනු ලබන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය හා විශ්වවිද්‍යාල ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන් විසින්ද සංවිධානය කොට පුළුල් සහභාගිත්වයක් ලබාදෙනු ලබයි.

පර්යේෂණ කටයුතුවල නියැලීමට සිසුන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සාමකාමී භෞතික පරිසරයක් විශ්වවිද්‍යාලය මඟින් සලසා දෙනු ලබයි.

පුහුණු අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පිරිනමනු ලබන පාඨමාලාවල විවිධත්වය, විද්‍යාගාර පර්යේෂණ ඇතුළත් යටිතල පහසුකම් හා සංවර්ධනය හා ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි සිසුන් බිහිකිරීම යන අංශවලට අනුව ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතිය තුළ වඩාත් විස්තීර්ණ ප්‍රථම හා පශ්චාත් උපාධි පිරිනමන විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව පීඨ 08ක් ඇත.

1. කෘෂිවිද්‍යා පීඨය
2. සම සෞඛ්‍ය විද්‍යා පීඨය
3. ශාස්ත්‍ර පීඨය
4. දන්ත වෛද්‍ය පීඨය
5. ඉංජිනේරු පීඨය
6. වෛද්‍ය පීඨය
7. විද්‍යා පීඨය
8. පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

පශ්චාත් උපාධි ආයතන දෙකක් ද මෙම විශ්වවිද්‍යාලය සතුව ඇත.

1. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

3a1 වගුවේ දැක්වෙන පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර උපාධි අපේක්ෂක පාඨමාලා හදාරන උපාධි අපේක්ෂකයන් 10,000කට අධ්‍යයන දෙපාර්තමේන්තු 74ක් හරහා අධ්‍යාපනය ලබා දෙන අධ්‍යයන කාර්ය මණ්ඩල සවිශක්තිය ආසන්න වශයෙන් (තාවකාලික සේවක 61ද ඇතුළුව) 725කි. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි සිසුන්ද ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 4194කි. (විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් 2012 වසරේ ප්‍රථම උපාධි සිසුන් බඳවා නොගත් බව සළකන්න)

3a1 වගුව : 2012 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ, දෙපාර්තමේන්තු, අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන්

| පීඨය | දෙපාර්තමේන්තු සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | ප්‍රථම උපාධි සිසුන් | පශ්චාත් උපාධි සිසුන් |
|---|---|---|---|---|
| කෘෂිකර්ම පීඨය/ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 08 | 108 | 712 | 2184 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 05 | 18 | 670 | - |
| ශාස්ත්‍ර පීඨය | 17 | 179 | 3714 | 2430 |
| දන්ත වෛද්‍ය පීඨය | 07 | 51 | 378 | - |
| ඉංජිනේරු පීඨය | 08 | 99 | 1241 | 136 |
| වෛද්‍ය පීඨය | 16 | 98 | 1222 | 37 |
| විද්‍යා පීඨය | 08 | 94 | 1707 | 1438 |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය | 05 | 37 | 338 | 47 |
| **එකතුව** | **74** | **684** | **9982** | **6272** |

අධ්‍යයන පරිපාලන හා සේවා අංශයන්හි සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව ආසන්න වශයෙන් 2500කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කලා, නීතිය හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සිට භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ඉංජිනේරු හා පරිගණක විද්‍යාව, කෘෂිවිද්‍යාව, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය විද්‍යාව, පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩසටහන් 47ක් ප්‍රදානය කරනු ලබයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙරට සම සෞඛ්‍ය විද්‍යා පීඨයක්, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයක් හා භූ ගර්භ විද්‍යා අධ්‍යයන අංශයක් පවතින එකම විශ්වවිද්‍යාලය වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සැලසුම් කරන ලද්දේ අභ්‍යන්තර සිසුන් බහුතරයකට මෙන්ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට නේවාසික පහසුකම් සැපයීම සඳහායි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය අභ්‍යන්තර සිසුන්ට අමතරව දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හරහා ද උපාධි පාඨමාලා පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ප්‍රථම උපාධි සඳහා අපේක්ෂකයන් 25000ක් පමණ ලියාපදිංචි කොට ඇති අතර අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා සඳහා 500ක් පමණ ලියාපදිංචි කොට ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්වලට වැදගත් ඉගෙනුම් සහයක සේවාවන් හතරක් මඟින් සහයවනු ලබයි. ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ලෙස හැඳින්වේ. සුවිශේෂී පුහුණු හා සේවා කෘත්‍යයන් ඉටු කිරීම සඳහා පහත දැක්වෙන මධ්‍යස්ථාන හා ඒකක කීපයක්ද ස්ථාපිත කොට ඇත. ඒවා පහත පරිදි වේ.

1. කෘෂි ව්‍යාපාරික මධ්‍යස්ථානය
2. කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය
3. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය
4. මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය
5. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය
6. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
7. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
8. වෛද්‍ය අධ්‍යාපන ඒකකය
9. විද්‍යා අධ්‍යාපන ඒකකය
10. පශු වෛද්‍ය අධ්‍යාපන ඒකකය

11. සෞඛ්‍ය ආපදා කළමනාකරණ හා පුහුණු මධ්‍යස්ථානය
12. කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය
13. ඉංජිනේරු අධ්‍යාපන ඒකකය

මෙම විශ්වවිද්‍යාල මධ්‍යස්ථාන හා ඒකක විශේෂ පුහුණු හා සේවා කෘත්‍යයන් සිදුකරන අතර ඩිප්ලෝමා හා සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හා විවිධ කාර්මික හා වෘත්තීය සේවා සැලසුම් කොට මූලිකවම මුදල් අයකිරීමේ පදනම මත ප්‍රදානය කරනු ලබයි.


පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මධ්‍යම පරිපාලනය, පරිපාලන අංශ 08කින් යුක්ත වේ. එම අංශ පහත නම් වලින් හැඳින්වේ.

1. අධ්‍යයන හා පාලක සභා අංශය
2. අධ්‍යයන ආයතන අංශය
3. අනධ්‍යයන ආයතන අංශය
4. සාමාන්‍ය සේවා අංශය
5. මූලධන හා පුනරුත්ථාපන ව්‍යාපෘති අංශය
6. ශිෂ්‍ය සේවා හා ලියාපදිංචි කිරීමේ අංශය
7. නීති හා ප්‍රලේඛන අංශය
8. සංයුක්ත කළමනාකරණ අංශය

පහත සඳහන් විශ්වවිද්‍යාල සහයක සේවාවන් විශ්වවිද්‍යාල පරිපාලනයට සවියක් වේ.

1. සෞඛ්‍ය සේවා අංශය
2. ආරක්ෂක අංශය
3. විනයාරක්ෂක අංශය
4. උද්‍යාන අංශය
5. වැඩ දෙපාර්තමේන්තුව
6. ශාරීරික අධ්‍යාපන අංශය
7. සංඛ්‍යාලේඛන හා තොරතුරු අංශය
8. මහජන සම්බන්ධතා හා විශේෂ ව්‍යාපෘති අංශය
9. සුබ සාධන අංශය
10. විසි එක්වන ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC)

විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය සහ මධ්‍යම පරිපාලනය ඊළඟ පිටුවේ දැක්වේ.




DR - Deputy Registrar
DB - Deputy Bursar
DIA - Deputy Internal Audit
SAR - Senior Assistant Registrar
AR - Assistant Registrar
SAB - Senior Assistant Bursar
AB - Assistant Bursar
PGIA - Postgraduate Institute of Agriculture

PRO - Public Relations Officer
PM - Project Manager
SO - Statistical Officer
CMO - Chief Medical Officer
CSO - Chief Security Officer
SSA - Senior System Analyst
PGIS - Postgraduate Institute of Science

## (ආ) ජයග්‍රහණ

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ පශ්චාත් උපාධි ආයතන, මධ්‍යස්ථාන හා ඒකකවල සාමාන්‍ය විස්තර හා අත්කරගත් ජයග්‍රහණ උපග්‍රන්ථ "A" හි දැක්වේ.

## I සාමාන්‍ය

- **ඉහළ හන්තාන පුහුණු හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය**



හන්තාන කඳු පන්තියේ මහනුවර සානුවට ඉහළින් දෘෂ්‍යමානවන ඉහළ බෑවුමේ පිහිටා ඇති ගොඩනැගිලි සංකීර්ණය මුලින් ඉදිකරන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සෙංකඩගල ගුවන් විදුලි සේවය ස්ථාපිත කිරීම සඳහාය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය එම ස්ථානයෙන් ඉවත් කළ පසු එම ගොඩනැගිලි සංකීර්ණය ජරාජීර්ණ වී පාවිච්චියට ගත නොහැකි තත්ත්වයට පත්විය. කෙසේවෙතත් විශ්වවිද්‍යාලය මෙම ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කොට සියදෙනෙකුට (100) අසුන්ගත හැකි පරිදි කලා පුහුණු හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කළේය.

උපකුලපතිතුමන් විසින් මෙම මධ්‍යස්ථානය 2012 සැප්තැම්බර් 04 වැනි දින විවෘත කරන ලද අතර එහි පළමු පුහුණු වැඩසටහන විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා පැවැත්වූ අතර එම වැඩසටහනේ තේමාව වූයේ "S5" ය. මෙම පහසුකම බාහිර පාර්ශවයන්ට ද ලබාගත හැකිය.

- **ඩිජිටල් පුස්තකාලය**

2011 වසරේ සකස් කරන ලද සැලසුම් මත ක්‍රියාකරමින් 2011 දෙසැම්බර් මස ආරම්භ කරන ලද ඩිජිටල් පුස්තකාලයට සැලකියයුතු ප්‍රමාණයේ ලේඛන සංඛ්‍යාවක් එකතු කරන ලදි. විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසියේ කටයුතු විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත්කරන ලද වාරසඟරාවල ලිපි (නූතන ශ්‍රී ලංකාවේ අධ්‍යයන, ඓතිහාසික හා සමාජ අධ්‍යයනයන්වල ශ්‍රී ලංකා වාරසඟරාව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් පිළිබඳ ශ්‍රී ලංකා වාරසඟරාව, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සමාලෝචනය) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වෙනත් පර්යේෂණ ප්‍රකාශන, සහ විශ්වවිද්‍යාලයට බාරදෙන ලද උපාධි නිබන්ධන, උපුටන යන ලේඛන මෙම පුස්තකාලයෙහි මේවන විට තබා ඇත. මෙම ලේඛන http://www.dlib.pdn.ac.lk:8080/ispuil වෙත පිවිසීමෙන් දැකගත හැකිය.

- **නව පශු වෛද්‍ය ශික්ෂණ රෝහල**

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ පශු සායනික විද්‍යා අධ්‍යයන අංශයේ නව පශු ශික්ෂණ රෝහල අලුත් ස්ථානයක (පීඨ, ක්‍රීඩා හා විනෝද සමාජ ශාලාවට විරුද්ධ පසින්) ස්ථාපිත කොට එහි කටයුතු 2012 මැයි මස 21 වැනි දින ආරම්භ කරන ලදි. මෙම නව පශු ශික්ෂණ රෝහලට ශ්‍රී ලංකා රජයේ මිලියන 84ක මුදල් යොදා ඉදිකරන ලදි. පැවති පරණ රෝහලට වඩා පස්ගුණයකින් විශාල වන මෙය බාහිර රෝගී අංශයක්, අඛණ්ඩ නිරීක්ෂණ ඒකකයක්, දැඩිසත්කාර ඒකකයක්, ශල්‍යාගාර දෙකක්, ශල්‍යකර්මවලින් පසු රෝග සුවවීමේ ඒකකයක්, විවිධ පහසුකම් සහිත අල්ට්‍රා සවුන්ඩ් ස්කෑනිං ඒකකයක්, ෆයිබ-ඔප්ටික් එමෙන්ම ස්කොපි ඒකකයක්, ඔසුහලක් හා දියුණු පහසුකම් සහිත රෝග හඳුනාගැනීමේ විද්‍යාගාරයක් යන අංශවලින් යුක්ත වේ. එමෙන්ම රෝගී සතුන් සඳහා නේවාසික පහසුකම්, හුදකලා ඒකකයක් හා භාරකරුවන් නැවතී සිටින නිවාසද මෙම පරිශ්‍රය තුළ පිහිටා ඇත.

මෙම නව රෝහල ඉදිවීමත් සමගම පීඨයේ උපාධි අපේක්ෂකයන් දිරිගැන්වී ඇති අතර කෙටි කාලයක් තුළ සුරතල් සතුන්ගේ අයිතිකරුවන් ආකර්ශණය කරගැනීමට ද සමත් වී ඇත. රෝහල් කාර්ය මණ්ඩලය ඔවුනගේ සේවාදායකයන්ට හැකි උපරිම සේවයක් සලසා දීමට වෙර දරන අතරම පශු වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ට දැනුම, සායනික සහ වෘත්තීය කුසලතාවන් හා නිවැරදි ආකල්ප වර්ධනය කිරීමට ද වෙහෙසී කටයුතු කරයි.



- හිටපු උපකුලපති එස්.බී.එස්. අබයකෝන් මහතා විසින් 2012 ජුලි 28 වැනි දින නව භූ ගර්භ විද්‍යා ගොඩනැගිල්ල විවෘත කරන ලදි.



- පරිගණක ඉංජිනේරු අංශයට ඇමෙරිකාවේ NVIDIA සමාගමෙන් GPGP4 යෙදුම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සඳහා Tesla c2075 ග්‍රැෆික්ප්‍රොසෙසිං යුනිට් උපකරණයක් ලැබිණ. මෙම උපකරණය රුපියල් 300,000ක් වටින අතර CUDA cores 448ක් අඩංගු වේ.

## II අධ්‍යයන කටයුතු

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

- **වඩාත් කැපීපෙනෙන ජ්‍යෝෂ්ඨ පර්යේෂක - 2012**



විද්‍යා පීඨයේ උද්භිත විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම් " කෘෂිකර්ම හා සම සෞඛ්‍ය විද්‍යාවන්ද ඇතුළුව ජීවවිද්‍යා ක්ෂේත්‍රයේ 2012 වසරේ වඩාත් කැපීපෙනෙන ජ්‍යෝෂ්ඨ පර්යේෂක" සඳහා වන CVCD සම්මානය දිනාගෙන ඇත. මෙම සම්මානය 2012 නොවැම්බර් 30 වැනි දින රත්මලාන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පැවැත්වූ උත්සවයකදී ප්‍රදානය කරන ලදි.



- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.ඩී. තටිල් මහතාට ශ්‍රී ලංකා ව්‍යවහාර සංඛ්‍යාන ආයතනයෙන් ප්‍රථම සහෘදත්ව සම්මානය (fellowship) පිරිනමා ඇත. මෙම සම්මානය ප්‍රදානය කිරීමේ උත්සවය කොළඹ OPA ශ්‍රවණාගාරයේදී 2012 නොවැම්බර් 24 වැනි දින පැවැත්වූ ව්‍යාපාර සංඛ්‍යාන ආයතනයේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීමේදී පවත්වන ලදි. ව්‍යාපාර සංඛ්‍යාන ආයතනයේ විධායක කමිටුව මහාචාර්ය තටිල් විසින් ශ්‍රී ලංකා සංඛ්‍යාන ක්ෂේත්‍රයට සිදුකර ඇති සේවාව වෙනුවෙන් මෙම සම්මානය නිතරගයෙන් පිරිනමා ඇත.



- දන්ත වෛද්‍ය පීඨයේ මුඛ ව්‍යාධිවේද අධ්‍යයන අංශයේ මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න මහනුවර වෛද්‍ය සෞඛ්‍ය විද්‍යා සංගමයේ 2012 වසර සඳහා වන ත්‍යාගය පිරිනැමීම සඳහා තෝරා ගෙන ඇත. 2012 සැප්තැම්බර් මාසයේදී මෙම සමාගමේ මූලික සැසියේදී ඔහුගේ පර්යේෂණ පිළිබඳ දේශනයක් පැවැත්වීම සඳහා මහාචාර්ය ඩබ්.ඒ.ඒ. දිසානායකට ආරාධනා ලැබුණි. මුඛ පිළිකා සහ පූර්ව පිළිකා පිළිබඳ අවුරුදු 20ක පමණ කාලයක් ඔහු පර්යේෂණ පවත්වා ඇති අතර එම තේමාව යටතේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් දේශන පවත්වා ඇත.

- ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ මහාචාර්ය කැමරන් වික්‍රමගේ ඇගේ පරිවර්තන කටයුතු වෙනුවෙන් 2012 වසරේ රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ දී හොඳම ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්නාට හිමි සම්මානය දිනාගත්තාය. මෙම සම්මානය සඳහා බඳුන් වූයේ සුනේත්‍රා රාජකරුණානායකගේ "පොදු පුරුෂයා" නවකථාව "මෙත්තා ආදරය පිළිබඳ කථාවක්" ලෙස ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙනි. මහාචාර්ය වික්‍රමගේ සාහිත්‍ය කෘතීන් රාශියක් සිංහලෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට ඇති අතර සිංහල සාහිත්‍ය පිළිබඳ පුළුල් ලෙස ලේඛන කටයුතු සිදුකොට ඇත.

- **Chevalier dans L'ordre des palms අධ්‍යයන සම්මානය**

Chevalier dans L'ordre des palms අධ්‍යයන සම්මානය ප්‍රංශ රජය විසින් විද්‍යා පීඨයේ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය වෙරන්ජන් කරුණාරත්නට පිරිනමා ඇත. මෙම සම්මානය ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා පත්කොට ඇති ප්‍රංශ තානාපති ක්‍රිස්ටිනා රොබිකන් විසින් 2012 මැයි 11 වැනි දින මහනුවර ස්විස් හෝටලයේ පැවැත්වූ උත්සවයකදී පිරිනමන ලදී. ප්‍රංශ රජය විසින් පිරිනමන පැරණිම සම්මානය මෙයයි. උගත් ප්‍රජාවේ වටිනා ගෞරවණීය සමාජිකයන් වෙත පිරිනැමීම සඳහා මෙම සම්මානය 1808 වසරේ නැපෝලියන් විසින් පිහිටුවන ලද්දකි.

- **පේරාදෙණිය ස්නැප්ස් වූ ඊ-ස්වාභිමානි සම්මානය-2012**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉන්ජිනේරු පීඨයේ කණ්ඩායම් දෙකක් පහත සඳහන් කාණ්ඩ යටතේ හොඳම e-content ජාතික සම්මානය දිනාගත්තේය.

ඊ-විද්‍යා හා තාක්ෂණය -"An open-source framework for lead Identification in Dray designing" යන තේමාව යටතේ වූ ව්‍යාපෘතිය සඳහා උපුල් සේනානායක මහතා, රහල් ප්‍රබුද්ධ මයා හා ආචාර්ය රොෂාන් රගෙල් සහභාගි වූහ.

ඊ-පරිසර හා තරඟ -"eatlem All" තරඟය සඳහා අජිත් සමරසිංහ මයා, සමිත මාරසිංහ මයා හා ලක්ෂාන් ප්‍රියදර්ශන මයා ඉදිරිපත් වූහ.



- වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යයන අංශයේ මහාචාර්ය ඉන්දික ගවරම්මාන්න හොංකොං හදිසි ප්‍රතිකාර වෛද්‍ය විද්‍යා පීඨය විසින් සත්කාරත්වය දැරූ ආසියා පැසිෆික් වෛද්‍ය ටොක්සිකොලොජි සංගමයේ II වැනි විද්‍යා සමුළුවේ දේශකයා විය.

- වෛද්‍ය පීඨයේ ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ආර්. සිවකනේෂන් මහාචාර්යවරයාට ඉන්දියාවේ පැවැත්වූ "Diabetes Mellitus and Cancer" පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී ඔහු පැවැත්වූ දේශනය සඳහා හොඳම සමස්ත දේශකයා සඳහා වන ත්‍යාගය පිරිනමා ඇත. මෙම පර්යේෂණ පත්‍රයේ සම කතෘවරුන් වනුයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශයේ වෛද්‍ය ජේ.පී. සුරවීර හා වෛද්‍ය අධ්‍යයන අංශයේ මහාචාර්ය වී.එල්.යු. ඉලංගසේකරය.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨයේ මුඛ ව්‍යාධිවේදය පිළිබඳ මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්නයන්ට නවසීලන්තයේ ඔටාග විශ්වවිද්‍යාලයෙන් "Sri Thomas K.Sidey visiting professorship" ප්‍රදානය කොට ඇත.

- ඖෂධවේද අධ්‍යයන අංශයේ එම්.එච්.එෆ්. සකීනා මහත්මියට "Trams dermal product regulatory requirement in Asian scenario" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවක් පැවැත්වීම සඳහා ඉන්දු-ශ්‍රී ලංකා සම්මානයක් පිරිනමා ඇත. ඇය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය IIශ්‍රේණියට උසස් කොට ඇති අතර ඖෂධවේදී අධ්‍යයන අංශයේ අංශ ප්‍රදාන ලෙස ද පත්කොට ඇත.

- මැලේසියා විශ්වවිද්‍යාලයේදී 2012-12-10 වැනි දින පවත්වන ලද උත්සවයකදී මැලේසියා විශ්වවිද්‍යාලයීය විශිෂ්ටතා සම්මානය -2012 වෛද්‍ය එම්.ඉසඩ්.එම්. සලීම් හට ප්‍රදානය කොට ඇත.

- දන්ත වෛද්‍ය පීඨයේ මුඛ ව්‍යාධිවේද අංශයේ මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග ලෝක දන්ත වෛද්‍ය සංගමයේ විද්‍යා කමිටුවේ විධායක සාමාජිකයෙකු ලෙස තෝරාගෙන ඇත.

- දර්ශන ජයසිංහ මහතා චීනයේ බීජිං නුවර පැවැත්වූ චිරස්ථායිතාවය සඳහා තොරතුරු හා ස්වයංක්‍රීයත්වය පිළිබඳ 6 වැනි ජාත්‍යන්තර සමුළුවේදී ඔහු විසින් "Contestant time Encryption as a Timing Attack"යන තේමාව යටතේ ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රයට හිමි ත්‍යාගය දිනාගත්තේය. මෙම පත්‍රයේ සම කතෘත්වය රොෂාන් රගෙල් සහ ධම්මික ඇල්කඩුව යන ආචාර්යවරුන් විසින් දරනු ලබයි. ජයසිංහ මහතා මෙම පර්යේෂණය පවත්වන විට පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශයේ තාවකාලික සහය කථිකාචාර්ය වරයෙකු ලෙස අනුයුක්ත කොට සිටියේය. ඔහු මේ වනවිට ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයේ ඔහුගේ දර්ශනශූරී උපාධිය සඳහා අධ්‍යයන කටයුතු කරමින් සිටී.

- සී.කේ. පතිරණ මිය ආචාර්ය ඒ.පී.එන්. සොමරත්න හා එච්. අබේරුවන් යන අයගේ සම කතෘත්වයෙන් රචිත "Numerical simulation of Alkali Aggregate Reaction in concrete using general purpose finite element program" යන තේමාවෙන් යුතු පර්යේෂණ පත්‍රයට 106 වැනි IESL වාර්ෂික සැසියේදී 2012 වසර සඳහා ඉහත ත්‍යාගය පිරිනමා ඇත.

- පශු වෛද්‍ය පීඨයේ මූලික පශු වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ කාර්මික නිලධාරී හේමන්ත උපුල් දිසානායක මහතාට තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යංශය විසින් සංවිධානය කළ ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයේ "සහසක් නිමැවුම් 2012" තරඟයෙන් ඔහුගේ නව නිපයුමක් සඳහා ප්‍රථම ස්ථානය හිමිවිය.

- ශ්‍රී ලංකා ව්‍යවහාර සංඛ්‍යාන ආයතනය විසින් මහාචාර්ය පී. විජේකෝන් මහත්මිය ශ්‍රී ලංකා ව්‍යවහාර සංඛ්‍යාන වාර සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලෙස පත්කොට ඇත.

- වෛද්‍ය පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ වෛද්‍ය සුධීර කළුපහන එක්සත් රාජධානියේ වෛද්‍ය පර්යේෂණ සභාව (MRC) විසින් සමාලෝචක ලෙස පත්කොට ඇත.

## III සිසුන්

- ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ අංශය විසින් සංවිධානය කළ වාර්ෂික අන්තර් වෛද්‍ය පීඨ ළමා රෝග ප්‍රශ්න විචාරාත්මක තරඟය පිළිවෙළින් 6වැනි වරටත් කොළඹ, නිදහස් චතුරශ්‍රයේ ශ්‍රී ලංකා පදනම් ආයතනයයේදී 2012-09-30 වැනි දින පවත්වන ලදි.

  පේරාදෙණිය වෛද්‍ය පීඨ සාමාජිකයෝ පස්වන වරටත් අනෙකුත් වෛද්‍ය පීඨ හයක් පරදවා එම ගෞරවණීය ත්‍යාගය දිනාගත්හ. වෛද්‍ය එම්.එම්.ටී.බී. හේරත්, වෛද්‍ය ඩී.එම්. ලියනගේ, වෛද්‍ය එච්.ඩබ්.එන්.එන්. ගුණරත්න, වෛද්‍ය ආර්.එම්.යු.සී. රත්නායක හා වෛද්‍ය පී.ජී.ඩබ්.එස්. සමරනායක එම කණ්ඩායමේ සාමාජිකයෝ වූහ.

- කෘෂිවිද්‍යා පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ ව්‍යාපාර කළමනාකරණ උපාධි වැඩසටහනේ විද්‍යාවේදී සිසුවෙකුට ඔහුගේ ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා (ආසියා පැසිෆික් කළාපයේ) ඕල්ටෙක් යං සයන්ටිස්ට් ත්‍යාගය පිරිනමන ලදි.

- කෘෂිවිද්‍යා පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ උපාධි වැඩසටහනේ විද්‍යාවේදි සිසුවෙකු ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය විසින් සංවිධානය කළ "නැගීඑන තරුණ නායකත්ව ත්‍යාගය "Eyla 2011" තරඟයෙන්" ශ්‍රී ලංකාවේ නැගීඑන පළමු තරුණ නායකයන් දසදෙනාගෙන් එක් අයෙකු ලෙස තෝරා ගන්නා ලදි.

- දන්ත වෛද්‍ය පීඨයේ ප්‍රථම උපාධි සිසුන් දෙදෙනෙකු ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ නිගාටා විශ්වවිද්‍යාලය නැරඹීමට ගියහ.

- දන්ත වෛද්‍ය පීඨයේ ප්‍රථම උපාධි සිසුන් දෙදෙනෙකු මැලේසියාවේ සයින්ස් විශ්වවිද්‍යාලයේදී 2012 ඔක්තෝබර් 13-14 යන දිනවල පැවැත්වූ 22 වැනි "PESTA BOLAUSM" ජත්‍යයන්තර (දැල් පන්දු) තරඟාවලියට සහභාගි වූහ.

- කලා පීඨයේ සිසුන් දෙදෙනෙකු ජපානයේ Fukuoka විශ්වවිද්‍යාලයේ එක් අධ්‍යයන වර්ෂයක් ගත කිරීම සඳහා තෝරාගනු ලැබිණි.

- කෘෂිවිද්‍යා පීඨයේ කාර්මික නිලධාරීන් තිදෙනෙකු ජත්‍යන්තර විද්‍යා වාරසඟරාවල පළකළ පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ලබාගත්හ.

## IV මධ්‍යස්ථාන හා ඒකක

ප්‍රධාන මධ්‍යස්ථාන සහ ඒකකවල සමාන්‍ය විස්තර හා ජයග්‍රහණ උපග්‍රන්ථ "B" හි විස්තරාත්මකව දැක්වේ.

## V තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂා නිපුණතා, පුස්තකාල සේවා, වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් පිරිනමනු ලබන පාඨමාලාවන් තුළින් ඉංග්‍රීසි භාෂා නිපුණතා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවන්ට අදාළ පුළුල් පාඨමාලාවන් සමුදායක් ප්‍රදානය කරයි. සියලුම පීඨවල ප්‍රථම වසර සිසුන් සඳහා දිසානුයෝජන වැඩසටහනක් හා ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණ පාඨමාලා මොඩියුල පවත්වනු ලබයි. සියලුම ප්‍රථම උපාධි සිසුන් ඔවුන්ට අදාළ උපාධිය ලබාගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා නිපුණතා පරීක්ෂණයෙන් "A" සමාර්ථයක් ලබාගත යුතු වේ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ සහ තොරතුරු තාක්ෂණ මධස්ථානයේ, පුස්තකාල සේවය, වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන සේවාවන් ඇතුළත් වෙනත් ඉගෙනුම් සහයක සේවාවන්ට අදාළ සමහර තොරතුරු උපග්‍රන්ථ "C" යටතේ දැක්වේ.

## VI මධ්‍යම පරිපාලනය

සාමාන්‍ය පරිපාලනයේ සංවිධාන ව්‍යුහය ක්‍රියාකාරිත්වය හා රාජකාරී කටයුතු පුළුල්ව සමාලෝචනය කොට සංශෝධනය කිරීම ආරම්භ කොට ඇත. නව අංශ හා ඒකක ස්ථාපිත කොට ඇති අතර පුළුල් වූ නව පද්ධතියක් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදී.

විවිධ පරිපාලනමය තනතුරු හා බැඳී පවතින වගකීම් පිළිබඳව නිසි අවධානය යොමු කොට සුමට ආකාරයෙන් රාජකාරී බෙදීයාම සඳහා ඉහළ නිලධාරී තන්ත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස පරිපාලනය විසින් කටයුතු සුදානම් කර ඇත. අධ්‍යයන, පරිපාලන හා සාමාන්‍ය කළමනාකරණය හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රයෝජනවත් වැඩමුළු රාශියක් පවත්වන ලදි. රාජකාරී කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයෙන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන නිපුණතා හා දැනුම සම්බන්ධ දියුණු කළයුතු අංශයන් හඳුනා ගැනීමට හැකි විය.

පහතින් දැක්වෙනුයේ 2012 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල ලැයිස්තුවකි.

වගුව 3(b) ii සංයුක්ත කළමනාකරණ අංශය හා අනධ්‍යයන ආයතන අංශය විසින් 2012 වසරේදී පවත්වන ලද පුහුණු වැඩසටහන්


| දිනය | කාර්යය/තේමාව | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| 2012 අප්‍රේල් | රියදුරන් තුළ ආරක්ෂිතව රිය පැදවීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් බව දියුණු කිරීම | 45 |
| 2012 මැයි | | 44 |
| 2012 සැප්තැම්බර් | "S5" පිළිබඳ වැඩමුළුව | 70 |
| 2012 පෙබරවාරි | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පස්වන ප්‍රේරණ වැඩසටහන-2012 | 24 |
| 2012 මාර්තු | | |
| 2012 අප්‍රේල් | | |
| 2012 ඔක්තෝබර් | ක්‍රියාපද්ධති කළමනාකරණ වැඩමුළුව | 75 |
| 2012 නොවැම්බර් | සේවා ස්ථානයේ සාර්ථකත්වයේ රහස් පිළිබඳ වැඩමුළුව | 130 |


## VII උපස්ථම්භක සේවාවන්

උපස්ථම්භක සේවාවන්ගේ විස්තර හා ජයග්‍රහණ උපග්‍රන්ථ "D" හි ඇතුළත් කොට ඇත.

## VIII මුදල් සහ ගිණුම්

2012 වසරේ මුළු ආදායම රුපියල් මිලියන 2,687ක් වූ අතර ඉන් 86% ක් රජයේ අරමුදල් ලෙස ලැබුන අතර ඉතිරිය අභ්‍යන්තරව උපයාගත් ආදායමයි. 2012 වසරේ මුළු වියදම මූල්‍යමය නොවන වියදම් ද ඇතුළුව රුපියල් මිලියන 3,082කි. මූලධන වියදම් සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 301ක් වූ අතර එය විශ්වවිද්‍යාල සඳහා වෙන් කෙරෙන මුළු මූලධන වෙන් කිරීමෙන් 78%කි.




රූප සටහන 3b1 - ආදායම -2012

මුල්‍ය කළමනාකරණය පිළිබඳ මුල්‍යාධිකාරී වාර්තාව උපග්‍රන්ථ E1හි දැක්වේ.


මහා භාණ්ඩාගාරය විසින් විගණන කමිටුව ස්ථාපිත කරන ලද්දේ මුදල් කළමනාකරණයේ හා පාලනයේ කර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහායි. විගණන කමිටුව විසින් අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා යෝග්‍ය නිවැරදි පිළියම් නිර්දේශ කිරීම පිණිස සමාලෝචනය කරන ලදි. 2012 වසර සඳහා වන විගණන කමිටු වාර්තාව උපග්‍රන්ථ E2 හි ඉදිරිපත් කොට ඇත.

## IX සමස්ත කාර්ය සාධනය

විශ්වවිද්‍යාලය 2012 වසරේදී එහි පීඨ අට, පශ්චාත් උපාධි ආයතන, මධ්‍යස්ථාන හා ඒකක හරහා පර්යේෂණ ඇතුළු අධ්‍යයන ක්‍රියාකාරකම් පැවැත්වීම අඛණ්ඩව සිදුකරන ලදි.


පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2012 වසරේදී එහි ඉලක්කයන් කරා ලඟාවීම පිණිස අධ්‍යයන 27%, අධ්‍යයන සහය 2%, පරිපාලන 2%ක් හා අනධ්‍යයන 69%කින් යුතු 2566ක් වු ස්ථිර කාර්ය මණ්ඩලයේ සහයෝගය සහිතව කටයුතු කරන ලදි.

(කෙසේ වෙතත්, ආචාර්යවරුන්ගේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ගය හා අනධ්‍යන සේවකයන්ගේ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ගය හේතුවෙන් මාස හතරක් පමණ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට බාධා සිදුවිය)




3b2 රූප සටහන කාර්ය මණ්ඩල ශක්තිය 2012

ජ්‍යෙ. මහාචාර්ය, මහාචාර්ය, සහය මහාචාර්ය, ජ්‍යෙ. කථිකාචාර්ය හා කථිකාචාර්ය, පිළිවෙලින් 6%, 13%, 25% හා 53% වේ.





රූපසටහන 3b3 – අනධ්‍යනය කාර්ය මණ්ඩල ශක්තිය – 2012

## X ශිෂ්‍ය ලියාපදිංචිය, බඳවා ගැනීම හා උපාධිධාරී පිටවීම ප්‍රථම උපාධි ලියාපදිංචිය - 2012

- **ප්‍රථම උපාධි ලියාපදිංචිය-2012**

2012 වසරේ මුළු ප්‍රථම උපාධි ලියාපදිංචිය 9985කි. "3b4" රූපසටහනේ දැක්වෙන පරිදි ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහනේ කාන්තා නියෝජනය 58%ක් විය. පීඨ අතර බෙදීයාම 3b4 රූප සටහනින් දැක්වේ.

**ප්‍රථම උපාධි ලියාපදිංචිය- 2012**




3b4 රූප සටහන- ප්‍රථම උපාධි ලියාපදිංචිය-2012

- **ප්‍රථම උපාධි බඳවා ගැනීම හා උපාධිධාරි පිටවීම-2012**

**ප්‍රථම උපාධි බඳවා ගැනීම**

ආචාර්ය වරුන්ගේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග නිසා 2012 වසරේදී ප්‍රථම උපාධි බඳවා ගැනීමක් සිදුනොවීය.

**ප්‍රථම උපාධිධාරීන් පිටවීම-2012**

ආචාර්ය වරුන්ගේ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ගය නිසා 2012 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය 2012 මැයි 30 වැනි දිනට කල්දමන ලදි. විශ්වවිද්‍යාලය 2012 වසරේ උපාධි ප්‍රදානෝත්සවයේදී පීඨවලින් සහ පශ්චාත් උපාධි ආයතන දෙකෙන් උපාධිලාභීන් සඳහා උපාධි 2454ක් ප්‍රදානය කරනු ලැබීය. " 3b1" වගුවෙන් දැක්වෙනුයේ විවිධ උපාධි යටතේ වර්ගීකරණය කළ ප්‍රථම උපාධිධාරීන් පිටවීමයි.

**"3b1" වගුව ප්‍රථම උපාධිධාරීන් පිටවීම-2012**

| උපාධිය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| කෘෂි විද්‍යාවේදී උපාධිය | 222 |
| ඖෂධ විද්‍යාවේදී උපාධිය | 25 |
| වෛද්‍ය රසායන විද්‍යාවේදී උපාධිය | 22 |
| හෙද විද්‍යාවේදී උපාධිය | 43 |
| භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධිය | 30 |
| විකිරණවේද/විකිරණ චිකිත්සක විද්‍යාවේදී උපාධිය | 27 |
| ශාස්ත්‍රවේදී උපාධිය | 851 |

| | |
|---|---|
| වාණිජවේදී උපාධිය | 20 |
| දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධිය | 84 |
| ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | 413 |
| ශල්‍ය වෛද්‍යවේදී උපාධිය | 192 |
| විද්‍යාවේදී උපාධිය | 469 |
| පශු වෛද්‍යවේදී උපාධිය | 56 |
| **එකතුව** | **2454** |

- **පශ්චාත් උපාධි පිටවීම-2012**

"3b2" වගුවෙන් දැක්වෙනුයේ උපාධි වැඩසටහන්වලට අනුව වර්ගීකරණය කරන ලද 2012 වසරේ පශ්චාත් උපාධිධාරීන් පිටවීමයි.

**"3b2" වගුව පශ්චාත් උපාධිධාරීන් පිටවීම-2012**

| උපාධිය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ගෞරව උපාධිය | 02 |
| ශාස්ත්‍රපති උපාධිය | 223 |
| විද්‍යාපති උපාධිය | 395 |
| දර්ශනපති උපාධිය | 72 |
| ව්‍යාපාර පරිපාලනපති උපාධිය | 41 |
| අධ්‍යාපනපති | 08 |
| පශු වෛද්‍ය විද්‍යාපති | 04 |
| දර්ශනශූරී | 23 |
| **එකතුව** | **768** |

## XI පර්යේෂණ හා ජාත්‍යන්තර කටයුතු

- **පර්යේෂණ**

පෙර සඳහන් කළ පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පවතින වඩාත් පුළුල් විශ්වවිද්‍යාලයයි. එය ආරම්භ වී පළමු අවුරුදු 60 තුළ පර්යේෂණ කාර්යයන් පවත්වන ලද්දේ පීඨ හා අධ්‍යයන දෙපාර්තමේන්තු සීමාවන් තුළය. අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පවතින අතිවිශාල වූ සම්පත් ප්‍රයෝජනයට ගැනීම වර්තමාන පරිපාලනයේ පරමාර්ථයයි. මෙම අරමුණ සහිතව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වැනි මූලික පියවර කීපයක් දියත් කර ඇත. ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන පරමාර්ථයන් වේ. Scanning Electrom Microscope හා Gamma කැමරා වැනි උසස් උපකරණ මිලදී ගෙන ඒවා විශ්වවිද්‍යාලය තුළ සහ ඊට පරිබාහිර පර්යේෂකයන්ට ලබාගත හැකි පරිදි සැලැස්වීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරමින් සිටී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය (PURSE) මීට පෙර සිදුකළ පරිදි පීඨ යටතේ නොව එක් එක් තේමාවන් යටතේ සංවිධානය කරන ලදි. මෙම පර්යේෂණ සැසිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අංශයක් වන අතර එය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වාර සටහනේ වැදගත් සිදුවීමක් ද වේ. මෙය

පීඨ අටෙහි පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් එකම වේදිකාවකදී ඉදිරිපත් කිරීමට හා ඔවුනොවුන්ගේ අදහස් හුවමාරු කරගැනීමට ලැබෙන අවස්ථාවක් ලෙසද මෙය හැඳින්විය හැකිය. එසේම මෙම අවස්ථාව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මෙන්ම වෙනත් ආයතනවල පර්යේෂකයන්ට එකිනෙකා අතර සඵලදායි ආකාරයෙන් අන්තර්ක්‍රියා කිරීමටද ලැබෙන මහඟු අවස්ථාවකි.

2012 වසරේ ආචාර්යවරුන්ගේ සංගමය විසින් දියත් කළ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ගය හේතුවෙන් 2012 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය 2013 ජුලි 04 වැනි දින දක්වා කල්දැමීමට සිදුවිය. 2011 වසරේ පර්යේෂණ සැසියේදී නූතන වටිනාකමකින් යුතු තේමාවන් නවයක් මත පදනම්ව පර්යේෂණ පත්‍ර 268ක් හා පෝස්ටර ඉදිරිපත් කිරීම් 32ක් ඉදිරිපත් කරන ලදි. 2012 පර්යේෂණ සැසියේ පර්යේෂණ පත්‍ර හා ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව සැලකියයුතු මට්ටමින් වැඩිවිය. සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව, ආහාර හා පෝෂණය, පශු සම්පත්, ශාඛ විද්‍යාවන් හා වනජීව, ස්වභාවික විද්‍යාවන් තොරතුරු තාක්‍ෂණය, ගණිතය සහ සංඛ්‍යානය, ඉංජිනේරු විද්‍යාව, අධ්‍යාපනය සහ සමාජ විද්‍යාවන් හා මානව ශාස්ත්‍ර 2011 පර්යේෂණ සැසියේ ප්‍රධාන තේමාවන් විය. විද්‍යා පීඨයේ උද්භිත විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය මාධව මීගහකුඹුර විසින් ශ්‍රී ලංකාවට ආවේනික වූ "TARUGA" වෘක්ෂය සොයා ගන්නා ලදි.

පසුගිය අවුරුදු කීහිපය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ පර්යේෂණ පත්‍ර "Science" හා " Nature" වැනි ලෝක ප්‍රසිද්ධ වාරසඟරාවල පළකර තිබීම වැදගත්වේ.

- **ජාත්‍යන්තරකරණය**

**ජාත්‍යන්තර සමුළු සහ ජාත්‍යන්තර සහයෝගිතා ගිවිසුම්**

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ අරමුණින් යුතුව ක්‍රියා කරන පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2012 වසරේදී ජාත්‍යන්තර සමුළු කීපයක් පැවැත්වූ අතර ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් කීපයක් ද අත්සන් කරන ලදි.

2012 වසරේ පැවැත්වූ සමුළු හා අත්සන් කළ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් පිළිවෙලින් "3b3" හා"3b4" වගුවල දැක්වේ.


**"3b3" වගුව 2012 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු**

| අංකය | කාර්යය | පීඨ /ප.උ.ආයතන | පැවැත්වූ දින |
|---|---|---|---|
| 01 | චිරස්ථායි සංවර්ධනය සඳහා කෘෂි ජෛව තාක්‍ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ඉන්දියා සමුළුව | කෘෂි විද්‍යා පීඨය | 2012 මාර්තු |
| 02 | එම | එම | 2012 මාර්තු |
| 03 | LASSNET සමුළුව | කලා | 2012 දෙසැම්බර් |
| 04 | Tsurumi විශ්වවිද්‍යාලයේ OMF ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය සමඟ එක්ව පැවැත්වූ, මුඛ පිළිකා පිළිබඳ සම්මන්ත්‍රණය | දන්ත | 2012 නොවැම්බර් |
| 05 | ICSBE 1 පූර්ව සමුළුව | ඉංජිනේරු | 2012 ජනවාරි |
| 06 | ICSBE 2 පූර්ව සමුළුව | ඉංජිනේරු | 2012 මාර්තු |
| 07 | ICSBE3 පූර්ව සමුළුව | ඉංජිනේරු | 2012 අගෝස්තු |
| 08 | ICSBE4 පූර්ව සමුළුව | ඉංජිනේරු | 2012 සැප්තැම්බර් |
| 09 | චිරස්ථායි ලෙස ගොඩනැඟු පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | ඉංජිනේරු | 2012 දෙසැම්බර් |
| 10 | නාගරික වැව් නිරීක්‍ෂණය හා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | කෘ.වි.ප.උ.ආයතනය | 2012 මැයි |
| 11 | නේපාල රජයේ විධායක නිලධාරීන් සඳහා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | කෘ.වි.ප.උ.ආයතනය | 2012 මැයි |
| 12 | ශ්‍රී ලංකාවේ පාංශු පෝෂක කළමනාකරණයේ නූතන ප්‍රවණතා පිළිබඳ වැඩමුළුව | කෘ.වි.ප.උ.ආයතනය | 2012 දෙසැම්බර් |
| 13 | වාර්ෂික සමුළුව | කෘ.වි.ප.උ.ආයතනය | 2012 දෙසැම්බර් |
| 14 | ආපදා කළමනාකරණ වැඩසටහනේ (විද්‍යාපති) ආචාර්ය මණ්ඩලය සඳහා පීඨ සංවර්ධන වැඩමුළුව | කෘ.වි.ප.උ.ආයතනය | 2012 දෙසැම්බර් |

| | | | |
|---|---|---|---|
| 15 | ජලයේ ගුණාත්මක භාවය සහ මානව සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | කෘ.වි.ප.උ.ආයතනය | 2012 මාර්තු |
| 16 | දකුණු ආසියාවේ ආහාර ආරක්ෂණය හා චිරස්ථායි ජල සම්පත් පරිහරණය ප්‍රවර්ධනය කිරීමේ සාර්ක් ඕස්ට්‍රේලියා ව්‍යාපෘතිය | කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය | 2012 මාර්තු |
| 17 | චිරස්ථායි සංවර්ධනය සඳහා කෘෂි ජෛව තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ඉන්දියා සමුළුව | කෘෂි විද්‍යා පීඨය | 2012 මාර්තු |

**"3b4"** වගුව 2012 වසරේ අත්සන් කළ ජාත්‍යන්තර ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්

| අංකය | ආයතනය | පීඨය/පේරා.වි.වි | අත්සන් කළ දිනය |
|---|---|---|---|
| 01 | VLIR-ous විශ්වවිද්‍යාල සංවර්ධන සමාගම බෙල්ජියම | කෘෂි විද්‍යා පීඨය | 2012 මාර්තු |
| 02 | නිගාටා විශ්වවිද්‍යාලය, ජපානය | සම සෞඛ්‍ය | 2012 සැප්තැම්බර් |
| 03 | කළමනාකරණ හා විද්‍යා විශ්වවිද්‍යාලය සහ අලාම්, මැලේසියාව | සම සෞඛ්‍ය | 2012 ඔක්තොබර් |
| 04 | ගුන්මා විශ්වවිද්‍යාලය, ජපානය | සම සෞඛ්‍ය | 2012 අගෝස්තු |
| 05 | නන්යැං තක්ෂණ විශ්වවිද්‍යාලය | ඉංජිනේරු | 2012 මැයි |
| 06 | කැළණි කේබල්ස් ලිමිටඩ් | ඉංජිනේරු | 2012 අප්‍රේල් |
| 07 | TOSLANA පුද්ගලික සමාගම | ඉංජිනේරු | 2012 ජුනි |
| 08 | ගහනා විශ්වවිද්‍යාලය | කෘ.වි.ප.උ. ආයතනය | 2012 නොවැම්බර් |
| 09 | CSIRO ඕස්ට්‍රේලියාව | කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය | 2012 ජනවාරි |




3b5 රූප සටහන ජාත්‍යන්තර සහයෝගිතා 2008-2012

## XII සනාතන සභා නිර්දේශයන්

සමාලෝචිත වර්ෂයේදී සනාතන සභාව විසින් කරන ලද වැදගත් නිර්දේශ කීපයක් පහතින් දැක්වේ.

අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පර්යේෂණ සහෘදත්ව සම්මානවලට අදාළ අතුරු ව්‍යවස්ථා (2012-03-21 දින පැවැත්වූ 369 වැනි රැස්වීමේදී පිළිගෙන 2012-06-09 දින පැවැත්වූ 409 වැනි රැස්වීමේදී අනුමත කරන ලදි).

**ආ) යාවජීව මහාචාර්ය පදවි ප්‍රදානය**

**කෘෂිවිද්‍යා පීඨය**
මහාචාර්ය යූ. සමරජීව

**ඉංජිනේරු පීඨය**
මහාචාර්ය ඊ.එම්.එන්. ඒකනායක

**විද්‍යා පීඨය**
මහාචාර්ය එම්.ඒ. කරීම්

**ඇ) සාහිත්‍යශූරී උපාධි ලාභීන් (ගෞරව උපාධි)**

(2012 උපාධි ප්‍රදාන උත්සවයේදී ගෞරව උපාධි පිරිනැමීමට නියමිතය)
කේ.එම්. ජයලත් මනෝරත්න මහතා
එච්.ඒ.පී. අබේවර්ධන මහතා

**ඈ) ගරු ආගන්තුක පත්වීම**

| නම | අධ්‍යයන අංශය | පීඨය | පත්කළ දිනය | පත්වීමේ කාලය |
|---|---|---|---|---|
| වෛද්‍ය එල්. කරල්ලියද්ද | ඖෂධවේද අංශය | වෛද්‍ය | 2012-01-01 | අවුරුදු 02 |

## XIII සිසුන්, කාර්ය මණ්ඩල සුබ සාධනය සහ සේවාවන්

ප්‍රධාන වශයෙන්ම අලුතින් ස්ථාපිත කළ සුබසාධන අංශ හා වෙනත් විවිධ අංශ හා ඒකක මඟින් සිදුකෙරෙන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කෙරෙන ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධන පද්ධතිය පිළිබඳ සොයා බැලීම පිණිස මනා ලෙස පැහැදිලි කළ හා නිරූපණය කළ යාන්ත්‍රණයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව පවතී. ඊට අමතරව උපකුලපතිතුමා සභාපතිත්වය දරන මාසික රැස්වීම්වලදී ද සිසුන් විසින් මතුකරනු ලබන ගැටළු පිළිබඳ සොයා බලනු ලබයි.

මෙම ශිෂ්‍ය සුබසාධන පද්ධතිය ශිෂ්‍ය නේවාසිකාගාර, ආපනශාලා පද්ධතිය, ශිෂ්‍ය සේවා, ලියාපදිංචිය, වෘත්තීය ශිෂ්‍ය උපදේශනය හා සෞඛ්‍ය යන කටයුතුවලින් යුක්ත වේ. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් ශිෂ්‍ය සේවා අංශය, ශාලාධිපතීන්, උප ශාලාධිපතීන්, මහජන සම්බන්ධතා නිලධාරි, ආරක්ෂක අංශය, විනයාරක්ෂක අංශය, විනය පාලක, සුබසාධන සංවිධාන, ශිෂ්‍ය සංගම් මෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන අංශය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හා වැඩ දෙපාර්තමේන්තුව වැනි සේවා ඒකකයන්ද මෙම සුබසාධන පද්ධතිය මඟින් පරිහරණය කරනු ලබයි.

**කාර්ය මණ්ඩල සුබසාධනය**

- සුබ සාධන අංශයක් ස්ථාපිත කරන ලදි.
- සිසුන්ට හා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා කෙටි ගමන් බස්රථ සේවාවක් සපයන ලදි.
- සුබසාධනය මුල්කරගත් සාප්පු සංකීර්ණයක් ආරම්භ කරන ලදි.
- මූල්‍ය ආධාරක සේවාවක් ස්ථාපිත කිරීම අවමඟුල්, විවාහ හා ළදරු උපත් සඳහා

## XIV අධ්‍යයන සංවර්ධන සැලසුම් හා තත්ත්ව සහතිකය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය නිරන්තරයෙන්ම ජාතික හා ගෝලීය සන්දර්භය තුළ උසස් අධ්‍යාපනයේ වෙනස්වන ප්‍රවණතාවන් සමඟ ගමන්කර ඇත. මතුවී එන ප්‍රවණතා සහ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් අධ්‍යයන පුහුණු වැඩසටහන්වල හා ක්‍රියාමාර්ගවල සහ අධ්‍යයන සැලසුම් හා සංවර්ධනයේ වෙනත් සංශෝධන පිළිබඳ නව පියවර ගෙන කටයුතු කොට ඇත.

## XV සංයුක්ත සැලසුමක්/උපක්‍රමික සැලසුමක් සකස් කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙනුවෙන් යටිතල පහසුකම් සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට බාරදෙන ලදි. මෙම සැලසුමට විශ්වවිද්‍යාලයට අයත් අක්කර 1900ක භූමිභාගය තුළ සිදුවන සියලුම වර්තමාන හා යෝජිත සංවර්ධනයන් ඇතුළත් විය.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන නව ක්‍රියාමාර්ග සන්දර්භය තුළ විශ්වවිද්‍යාල පද්ධතියේ සංයුක්ත සැලසුම් හා උපක්‍රමික සැලසුම් සකස් කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීම අවශ්‍ය විය.

මේ සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ ආදියට පේරාදෙණිය විශ්වවිද්‍යාලය ක්‍රියාශීලීව සහභාගි වෙයි. සැලසුම් අවසන් කිරීම සඳහා අභ්‍යන්තරිකව විවිධ මට්ටමේ කමිටු කීපයක් ස්ථාපිත කරන ලදී. විශ්වවිද්‍යාල ව්‍යුහය තුළ පමණක් නොව පුද්ගලයන්ගේ සාමාන්‍ය ආකල්ප සහ බාහිර ස්වරූපය තුළ පවා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව වෙහෙස වී කටයුතු කළේය. 2012 වසර සඳහා සංයුක්ත සහ උපක්‍රමික සැලසුම් 2012 වසරේදී අවසන් කරන ලදි.

### (ඈ) බාධක සහ පිළියම්

වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් 2012 වසර සඳහා සැලසුම් කළ අධ්‍යයන වැඩසටහන් අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකිවිය. ප්‍රථමයෙන් මාසයක කාලයක් සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද දෙවනුව මාස තුනක (3) කාලයක් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයද එම ක්‍රියාමාර්ගවල නිරත වූහ. ව්‍යවස්ථාදායක කමිටු සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගි නොවීම තුළින්ද සමස්තයක් ලෙස විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරිත්වය අඩපණ කළේය. මෙම සියලු ක්‍රියාමාර්ගයන්ගේ බලපෑම විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රකාශණවල පහළ වැටීමට හා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල පහත වැටීමට ද හේතුවිය. වෙන්කරන ලද මුදල් නිසි කලට නොලැබීම නිසා මූලධන ව්‍යාපෘතිවලින් 2012 වසර සඳහා විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීමට නොහැකිවිය.

වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග අවසන්වී විශ්වවිද්‍යාලය සාමාන්‍ය පරිදි ක්‍රියාකිරීමට පටන් ගැනීමෙන් අනතුරුව පුහුණු වැඩසටහන්, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් හා ආකල්ප වෙනස් කිරීමේ වැඩමුළු මාලාවක් හඳුන්වාදීමට විශ්වවිද්‍යාල පරිපාලනයට හැකිවිය. මෙම වැඩසටහන්වල සඵලදායිතාවය ඒවාට සහභාගි වූවන්ගේ ඇගයීමට ලක්වූවද ඒවායේ ප්‍රබල බලපෑම විශ්වවිද්‍යාලය තුළට ඉදිරියේදී දැනෙනු ඇත. මීට අමතරව මූල්‍ය අනුමැතිය හා මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට හා ගුණාත්මකභාවයෙන් යුතු මිළදී ගැනීම් සහතික කිරීම සඳහාත් නව ක්‍රියාමාර්ග මාලාවක් ද විශ්වවිද්‍යාලය හඳුන්වා දෙයි. මෙම වෙනස්කම්වල සුභවාදී බලපෑම් 2012 වසර අවසානයේ දී හඳුනාගන්නා ලදි.

### (ඇ) අනාගත සැලසුම්

මහාචාර්ය අතුල සේනාරත්න නව උපකුලපති ලෙස 2012 අගෝස්තු මස රාජකාරී බාරගන්නා ලදි. මහාචාර්ය ශාන්ත හේන්නායක නව නියෝජ්‍ය උපකුලපති ලෙස 2012 සැප්තැම්බර් මස රාජකාරී බාරගන්නා ලදී. නව උපකුලපතිතුමා පහත සඳහන් පරිදි විශ්වවිද්‍යාලයේ අනාගත සැලසුම් ගෙනහැර දක්වන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය දකුණු ආසියාවේ අනෙකුත් විශ්වවිද්‍යාල අතර බබලන හා ගෝලීය වශයෙන් බලපෑමක් සහිත විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීමට වෙරදැරීම මාගේ දැක්මයි.

මාගේ එළඹුම ශිෂ්‍ය කේන්ද්‍රීය වන අතර එතුළින් මා අදහස් කරනුයේ මාගේ සියලු උත්සහයන්වල අවසන් ප්‍රතිඵල සිසුන්ට අත්වියයුතු බවයි. එමෙන්ම ඔහු මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භකයා වූ ශ්‍රීමත් අයිවෝ ජෙනිංස්ගේ අදහස් සමඟ සම්පූර්ණයෙන් එකඟවන බවද පැවසීය. එසේම අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන ලෙසට සිසුන්, ඔවුන්ගේ දෙමාපියන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, සහය කාර්ය මණ්ඩලය හා විද්‍යාර්ථීන් ඇතුළු සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවටම ආරාධනා කර සිටියේය.

පහත සඳහන් සුවිශේෂි ප්‍රදේශයන් පහ යටතේ අනාගත සැලසුම් ගෙනහැර දැක්වීය.

1. ශිෂ්‍ය සුබසාධනය
2. අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක බව දියුණු කිරීම
3. පීඨ/කාර්ය මණ්ඩලයේ සුබසාධනය
4. හරිත වර්ණ විශ්වවිද්‍යාලයක් බිහි කිරීම
5. ගෝලීය ශ්‍රේණිගතකරණය

**පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කොට ශිෂ්‍ය සුබසාධනය ඉහළ නැංවීම.**

1. සිසුන්ගේ දැවෙන ගැටළු සොයා බැලීම
2. නවකවදය හා සම්බන්ධ රෙගුලාසි දැඩිව ක්‍රියාත්මක කිරීම
3. පීඨ, සිසු කණ්ඩායම් ආදිය අතර සමාජ සහජීවනය ශක්තිමත් කිරීම
4. ප්‍රජාතාන්ත්‍රික ආයතන ක්‍රියාකාරී කිරීම/සිසු නායකයන් තේරීම
5. තාවකාලික ක්‍රියාමාර්ග තුළින් සුදුසුකම් ලැබූ සිසුන්ට 100%කින් නේවාසික පහසුකම් ලබාදීම හා ස්ථිර විසඳුම් ලඟාකර ගැනීම සඳහා කටයුතු කිරීම
6. නිරීක්ෂණ වැඩසටහන් හරහා උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය හා ඔවුන්ගේ රැකියා අවස්ථා දියුණු කිරීම
7. සිසුන්ගේ යහපත සඳහා අර්ධ කාලීන රැකියා කාර්යාංශයක් විවෘත කිරීම
8. විශ්වවිද්‍යාලය-කර්මාන්ත ක්ෂේත්‍රය අතර අන්තර්ක්‍රියා වැඩිකිරීම, පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා මුදල් ලබාගැනීම
9. ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම. මලල ක්‍රීඩා පිටියට අලුතින් ධාවන පථයක් හා ප්‍රේක්ෂකාගාරයක් එකතු කිරීම
10. විදුලි බලය අපතේ යෑම වැලැක්වීම පිණිස සෑම නේවාසිකාගාරයක් සඳහාම gas-fired kitchens පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකිරීම
11. භූමියේ නීතිය ශක්තිමත් කිරීම

**පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කොට අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක භාවය දියුණු කිරීම.**

1. සියලුම පීඨවලට අවශ්‍ය කරන සේවක තනතුරු තක්සේරුව
2. විද්‍යාගාර සහ වෙනත් පහසුකම් ඉහළනැංවීම
3. අධ්‍යයන අංශවලට හා ශිෂ්‍ය පොදු කාමරවලට wi-fi කළාප බිහි කරීම
4. මහනුවර ක්‍රියාත්මක VIR, DA, IFS, ශික්ෂණ රෝහල්, රජයේ පර්යේෂණ ආයතන සමඟ සමීප සහයෝගිතාවන් පැවැත්වීම
5. විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන වැඩිකිරීම
6. තෝරාගත් පාඨමාලාවන් අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත්කිරීම
7. පේරාදෙණිය ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන්ගේ යහපත සඳහා පේරාදෙණිය අධ්‍යයන අංශ සමඟ විදෙස් ආයතන (අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඔවුන්ගේ පශ්චාත් උපාධි හදාරන) සමඟ සම්බන්ධතා ගොඩනැගීම
8. වාර්ෂිකව ප්‍රදානය කෙරෙන ආචාර්ය උපාධි සංඛ්‍යාව අවම වශයෙන් සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් 01% දක්වා ගෙන ඒම සඳහා සිවිල් සේවකයන්, සුදුසුකම්ලත් රජයේ නිලධාරීන් අතර ආචාර්ය උපාධි ප්‍රවර්ධනය කරීම සඳහා නව පශ්චාත් උපාධි වැඩසටහන් සකස් කිරීම
9. හුවමාරු වැඩසටහන් යටතේ විදෙස් පීඨ සාමාජිකයන් හුවමාරු කිරීම

**පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කොට විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සුබසාධනය ඉහළනැංවීම.**

1. කාර්ය මණ්ඩලය සඳහා BOO or BOT වර්ගයේ condominiums පිළිබඳ පුළුල් අධ්‍යයනයන් සිදුකිරීම
2. ජරාජීර්ණව ඇති කාර්ය මණ්ඩල නිවාස (වසර 50කට වැඩි) ප්‍රතිසංස්කරණය කිරීම
3. කාර්ය මණ්ඩලය, දෙස් විදෙස් පුද්ගලයන් සඳහා නවීන රෙස්ටුරන්ට් එකක් පිහිටුවීම ඇතුළුව ආපනශාලා දියුණු කිරීම
4. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මහජන ආරක්‍ෂාව සැලසීම
5. විශ්වවිද්‍යාල දේපල ආරක්‍ෂා කිරීම සඳහා ගිණි නිවන උපකරණවලින් සමන්විත විශ්වවිද්‍යාල යටම අයත් ගිණි නිවීමේ ඒකකයක් පිහිටුවීම
6. විශ්වවිද්‍යාල පරිසරය තුළ ආහාර ගබඩා පිහිටුවීම
7. විශ්වවිද්‍යාල උපදේශන/විශේෂඥ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම
8. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම
9. ඇවිදීමේ/සෙමින් දිවීමේ ධාවන පථ සකස් කිරීම
10. කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ඔවුන්ගේ නිවාසවලට ආසන්නයේ අමතර ක්‍රීඩා පහසුකම්, ගල් බංගලාව සමීපයේ ක්‍රීඩා ස්ථානයක් ස්ථාපිත කිරීම

**පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළින් හරිත වර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීම**

1. පොලිතින්වලින් තොර පරිසරයක්
2. සම්පත් සංරක්‍ෂණය/ වියදම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම/නේවාසිකාගාරවල විදුලි හා ජල විගණනය
3. ඵලදායි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීම
4. විදුලිය ලබා ගැනීමේ විකල්ප මූලාශ්‍රයන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් කිරීම
5. විකල්ප ජල මූලාශ්‍ර/භූගත ජලය පිළබඳ ශක්‍යතා අධ්‍යයනයක් කිරීම
6. හන්තාන පාකන්දේ රුක් රෝපණය කිරීම සඳහා සැලසුම් ඇඳීම (උද්‍යාන අංශය)
7. ISO 14000 ප්‍රමිතිය විශ්වවිද්‍යාලයට ලබාගැනීම

පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළින් ලෝක විශ්වවිද්‍යාල අතර ශ්‍රේණිගත කිරීමේ ස්ථානය දියුණු කිරීම.

1. ලෝක විශ්වවිද්‍යාල අතර ශ්‍රේණිගත කිරීම පිළිබඳ යෝජනා සකස් කිරීම සඳහා කමිටුවක් ස්ථාපිත කිරීම
2. විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වැඩිදියුණු කොට පුළුල් කිරීම
3. වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම
4. සියලුම කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට pdn.email ලිපිනයක් ලබාදීම
5. ජාත්‍යන්තර සිසුන් බඳවා ගැනීම පුළුල් කිරීම
6. විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම
7. ජාත්‍යන්තර උගතුන් සමඟ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ස්ථාපිත කිරීම ඉහළනැංවීම
8. ජාත්‍යන්තර අධ්‍යයන මධස්ථාන ස්ථාපිත කිරීම

**(ඉ) පාලක සභාව සහ සනාතන සභාව**

පාලක සභාවේ සහ සනාතන සභාවේ විස්තර උපග්‍රන්ථ “F” හි දැක්වේ.



## 04. සම්පත් සහ සිසුන්ගේ විස්තර (2012-දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | මුළු අධ්‍යයන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | 519 | 108 | **107** |
| | ආහාර විද්‍යාව හා තාක්ෂණය | 58 | | |
| | සත්ව විද්‍යාව සහ මත්ස්‍ය විද්‍යාව | 135 | | |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | ඖෂධවේදය | 81 | 18 | **40** |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 108 | | |
| | හෙදවේදය | 221 | | |
| | භෞතවේදය | 148 | | |
| | විකිරණවේදය හා විකිරණ චිකිත්සාව | 112 | | |
| **ශාස්ත්‍ර පීඨය** | කලා | 2954 | 179 | **70** |
| | ව්‍යාපාර පරිපාලනය | 613 | | |
| | නීතිය | 150 | | |
| **දන්ත වෛද්‍ය පීඨය** | දන්ත වෛද්‍ය විද්‍යාව | 378 | 51 | **133** |
| **ඉංජිනේරු පීඨය** | ඉංජිනේරු විද්‍යාව | 1241 | 99 | **161** |
| **වෛද්‍ය පීඨය** | වෛද්‍ය විද්‍යාව | 1222 | 98 | **178** |
| **විද්‍යා පීඨය** | ජීව විද්‍යාව | 535 | 94 | **110** |
| | භෞතික විද්‍යාව | 811 | | |
| | ගණනය සහ කළමනාකරණය | 204 | | |
| | සංඛ්‍යානය සහ මෙහෙයුම් පර්යේෂණ | 157 | | |
| **පශු වෛද්‍ය පීඨය** | පශු වෛද්‍ය | 338 | 37 | **52** |
| | **එකතුව** | **9985** | **684** | **851** |

## 05. දේශීය සිසුන් පිළිබඳ විස්තර (2012 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර | උපාධි ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | ඉංග්‍රීසි | 174 | 178 | 167 | - | - | 203 |
| | ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 22 | 18 | 18 | - | - | 20 |
| | සත්ව විද්‍යාව හා මත්ස්‍ය විද්‍යාව | | 43 | 50 | 42 | - | - | - |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | ඖෂධවේදය | | 23 | 20 | 17 | 21 | - | 33 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | | 27 | 25 | 13 | 23 | 20 | 43 |
| | හෙදවේදය | | 48 | 49 | 39 | 42 | 43 | 36 |
| | භෞත චිකිත්සාව | | 31 | 25 | 31 | 31 | 30 | 32 |
| | විකිරණ හා විකිරණ චිකිත්සාව | | 22 | 21 | 18 | 23 | 28 | 32 |
| ශාස්ත්‍ර පීඨය | කලා | ඉං/සි/දෙ | 693 | 716 | 707 | 838 | - | - |
| | ව්‍යාපාර පරිපාලනය | ඉංග්‍රීසි | 138 | 156 | 171 | 148 | - | - |
| | නීතිය | ඉංග්‍රීසි | 50 | 51 | 49 | - | - | - |
| දන්ත වෛද්‍ය පීඨය | දන්ත වෛද්‍ය විද්‍යාව | ඉංග්‍රීසි | 79 | 81 | 80 | 69 | 69 | - |
| ඉංජිනේරු පීඨය | ඉංජිනේරු විද්‍යාව | | - | 415 | 415 | 411 | - | - |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය විද්‍යාව | | - | 411 | 207 | 205 | 399 | 192 |
| විද්‍යා පීඨය | ජීව විද්‍යාව | | 149 | 135 | 170 | 81 | - | - |
| | භෞතික විද්‍යාව | | 240 | 221 | 243 | 107 | - | - |
| | ගණනය සහ කළමනාකරණය | | 50 | 47 | 59 | 48 | - | - |
| | සංඛ්‍යානය සහ මෙහෙයුම් පර්යේෂණ | | 46 | 30 | 32 | 49 | - | - |
| පශු වෛද්‍ය පීඨය | පශු වෛද්‍ය විද්‍යාපති | | 84 | 72 | 63 | 63 | - | - |
| **එකතුව** | | | **1919** | **2721** | **2541** | **2215** | **589** | **591** |

ඉං - ඉංග්‍රීසි  සිං - සිංහල  දෙ - දෙමළ

## 06. විදෙස් සිසුන් පිළිබඳ විස්තර (2012 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 2011 බඳවා ගැනීම | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර උපාධි ලැබූ සංඛ්‍යාව | පීඨය |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | ඉංග්‍රීසි | - | - | - | - | - | - | - |
| | ආහාර විද්‍යාව හා තාක්ෂණය | | - | - | - | - | - | - | - |
| | සත්ව විද්‍යාව | | - | - | - | - | - | - | - |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | | - | - | - | - | - | - | - |
| ශාස්ත්‍ර පීඨය | - | | - | - | - | - | - | - | - |
| දන්ත වෛද්‍ය පීඨය | - | | 01 | 02 | 05 | - | - | - | - |
| ඉංජිනේරු පීඨය | - | | - | - | - | - | - | - | - |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය විද්‍යාව | | 09 | 10 | 07 | 09 | 04 | 03 | - |
| විද්‍යා පීඨය | - | | - | - | - | - | - | - | - |
| පශු වෛද්‍ය පීඨය | - | | - | - | - | - | - | - | - |
| **එකතුව** | | | **10** | **12** | **12** | **09** | **04** | **03** | - |

## 07 (අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර (2012 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | අධ්‍යයන අංශය | මාධ්‍ය | සහය මහාචාර්ය | ජ්‍යෙ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙ කථිකාචාර්ය | කථිකාචාර්ය |
|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | සත්ව විද්‍යාව | ඉංග්‍රීසි | 01 | 03 | 05 | 06 | **02** |
| | කෘෂි විද්‍යාව | | 01 | 02 | 03 | 04 | **03** |
| | බෝග විද්‍යාව | | 02 | 04 | 04 | 09 | **02** |
| | කෘෂි ආර්ථික විද්‍යාව | | 01 | - | 03 | 01 | **04** |
| | කෘෂි ඉංජිනේරු විද්‍යාව | | 01 | 02 | 03 | 08 | - |
| | කෘෂි ව්‍යාප්ති | | - | 01 | 01 | 04 | **02** |
| | ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 02 | - | 01 | 05 | - |
| | පාංශු විද්‍යාව | | - | 02 | 03 | 02 | **02** |
| | මහඉලුප්පල්ලම | | - | - | - | 05 | **04** |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය රසායන විද්‍යාව | ඉංග්‍රීසි | - | - | - | 03 | **01** |
| | හෙදවේදය | | - | - | - | - | **04** |
| | ඖෂධ වේදය | | - | - | - | 01 | **04** |
| | භෞත චිකිත්සාව | | - | - | - | - | **04** |
| | විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සාව | | - | - | - | - | **01** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍ර පීඨය | අරාබි භාෂාව හා ඉස්ලාම් ශිෂ්ටාචාරය | ඉං/දෙ | - | - | - | 05 | **01** |
| | පුරා විද්‍යාව | ඉං/සි | - | - | 01 | 06 | **-** |
| | සම්භාව්‍ය භාෂා | ඉං/සි | - | - | - | 03 | **02** |
| | ආර්ථික විද්‍යාව | ඉං/සි/දෙ | 01 | - | 01 | 18 | **03** |
| | අධ්‍යාපන | ඉං/සි/දෙ | 01 | - | - | 03 | **04** |
| | ඉංග්‍රීසි භාෂා | ඉංග්‍රීසි | - | 01 | 01 | 04 | **01** |
| | ලලිත කලා | ඉං/සි | - | - | - | 04 | **01** |
| | භූගෝල විද්‍යාව | ඉං/සි/දෙ | 02 | - | 03 | 09 | **04** |
| | ඉතිහාසය | ඉං/සි/දෙ | - | 01 | 02 | 07 | **04** |
| | නීති | ඉංග්‍රීසි | - | - | - | 01 | **-** |
| | කළමනාකරණ අධ්‍යයනය | ඉං/සි/දෙ | - | - | 01 | 10 | **08** |
| | පාලි හා බෞද්ධ අධ්‍යයන | ඉං/සි | 01 | - | 01 | 03 | **-** |
| | දර්ශනය හා මනෝවිද්‍යාව | ඉං/සි | - | - | - | 11 | **05** |
| | දේශපාලන විද්‍යාව | ඉං/සි | - | 02 | 01 | 06 | **02** |
| | සිංහල භාෂා | සිංහල | - | - | - | 07 | **06** |
| | සමාජ විද්‍යා | ඉං/සි | - | 01 | 05 | 09 | **03** |
| | දෙමළ භාෂා | දෙමළ | - | - | 01 | 02 | **-** |
| දන්ත වෛද්‍ය පීඨය | මූලික විද්‍යා අංශය | ඉංග්‍රීසි | - | 01 | - | 10 | **-** |
| | ප්‍රජා දන්ත වෛද්‍ය අංශය | | - | 02 | 01 | 05 | **02** |
| | මුඛ සෞඛ්‍ය හා පරිදන්ත අංශය | | - | - | 03 | 07 | **01** |
| | මුඛ ව්‍යාධිවේද අංශය | | - | - | 03 | 03 | **-** |
| | මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය | | - | - | 01 | 05 | **-** |
| | පරිදන්ත අංශය | | - | - | - | 03 | **-** |
| | සංරක්ෂණ දන්ත වෛද්‍ය අංශය | | - | - | 02 | 02 | **-** |
| ඉංජිනේරු පීඨය | රසායන හා සැකසුම් ඉංජිනේරු අංශය | ඉංග්‍රීසි | - | - | 01 | 03 | **01** |
| | සිවිල් ඉංජිනේරු අංශය | | - | 02 | 04 | 17 | **08** |
| | පරිගණක ඉංජිනේරු අංශය | | - | - | - | 07 | **01** |
| | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය | | 01 | - | 01 | 11 | **06** |
| | ඉංජිනේරු ගණිත විද්‍යා අංශය | | - | 01 | - | 06 | **06** |
| | කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශණ අංශය | | - | - | - | 02 | **02** |
| | තොරතුරු තාක්ෂණ අංශය | | - | - | - | - | **01** |
| | යාන්ත්‍රික ඉංජිනේරු අංශය | | - | - | 01 | 06 | **03** |
| | නිෂ්පාදන ඉංජිනේරු අංශය | | - | - | 01 | 03 | **04** |
| වෛද්‍ය පීඨය | කාය ව්‍යවච්ඡේද අංශය | ඉංග්‍රීසි | - | 01 | - | 05 | **03** |
| | නිර්වින්දන අංශය | | - | - | 01 | 01 | **-** |
| | ජීව රසායන විද්‍යා අංශය | | 01 | - | 01 | 04 | **01** |
| | ප්‍රජා වෛද්‍ය අංශය | | 03 | - | - | 04 | **-** |
| | අධිකරණ වෛද්‍ය අංශය | | - | - | - | 03 | **02** |
| | වෛද්‍ය අංශය | ඉංග්‍රීසි | 01 | - | 04 | 03 | **-** |
| | ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය | | - | 01 | - | 01 | **03** |
| | වෛද්‍ය අධ්‍යාපන ඒකකය | | - | - | - | 03 | **-** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය | | - | - | - | 03 | **-** |
| | ප්‍රසව හා නාරිවේද අංශය | | - | - | - | 04 | **01** |
| | ළමා රෝග අංශය | | - | - | 03 | 02 | **03** |
| | පරපෝෂ විද්‍යා අංශය | | - | - | - | 02 | **01** |
| | ව්‍යාධිවේද අංශය | | - | 01 | 01 | 03 | **02** |
| | භිෂග්වේද අංශය | | - | - | - | 01 | **03** |
| | භෞතවේද අංශය | | - | - | 01 | 05 | **03** |
| | මනෝ වෛද්‍ය අංශය | | - | - | - | 02 | **02** |
| | ශල්‍ය වෛද්‍ය අංශය | | - | - | 01 | 05 | **03** |
| විද්‍යා පීඨය | උද්භිත විද්‍යා අංශය | ඉංග්‍රීසි | - | 02 | 01 | 08 | **02** |
| | රසායන විද්‍යා අංශය | | 01 | 06 | 03 | 04 | **01** |
| | විද්‍යා අධ්‍යාපන ඒකකය | | - | - | 01 | 01 | **-** |
| | භූ විද්‍යා අංශය | | - | - | 03 | 08 | **-** |
| | ගණිත විද්‍යා අංශය | | 01 | - | 02 | 01 | **07** |
| | අණුක ජීව විද්‍යාව හා ජෛව රසායන විද්‍යාව | | - | - | - | 03 | **01** |
| | භෞතික විද්‍යා අංශය | | - | 01 | 01 | 12 | **01** |
| | සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අංශය | | 01 | - | 01 | 02 | **07** |
| | සත්ව විද්‍යා අංශය | | - | 01 | 02 | 07 | **02** |
| පශු වෛද්‍ය පීඨය | මූලික පශු වෛද්‍ය විද්‍යා අංශය | ඉංග්‍රීසි | - | - | 01 | 07 | **03** |
| | පශු ව්‍යාධ ජීව විද්‍යාව | | - | 01 | 01 | 04 | **04** |
| | ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශය | | - | 01 | 01 | 06 | **02** |
| | පශු සායනික අංශය | | - | 01 | - | 03 | **02** |
| | පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අංශය | | - | - | - | - | **-** |
| **එකතුව** | | | **22** | **41** | **87** | **363** | **171** |

ඉං – ඉංග්‍රීසි සිං – සිංහල දෙ – දෙමළ

## 07 (ආ) අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලයේ විස්තර: (2012 දෙසැම්බර් 31 දිනට)

| ශාඛාව | කාර්ය මණ්ඩල තත්ත්වය | | එකතුව |
|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | |
| ඉං.භා. ඉ.ඒකකය | 10 | 33 | **43** |
| පුස්තකාලය | 03 | - | **03** |
| ශාරීරික අධ්‍යාපනය | 06 | - | **06** |
| වෘත්තීය මාර්ගෝපදේශන | 02 | 01 | **03** |
| කෘෂි විද්‍යා | - | - | **-** |
| දන්ත වෛද්‍ය | 01 | - | **01** |
| ඉංජිනේරු | 11 | - | **11** |
| වෛද්‍ය | 01 | - | **01** |
| විද්‍යා | 03 | - | **03** |
| සාමාන්‍ය පරිපාලන | - | 06 | **06** |
| මුදල් පරිපාලන | 01 | - | **01** |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 08 | - | **08** |
| **එකතුව** | **46** | **40** | **86** |

## 08. අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර: (2012 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | වඩාත් ජ්‍යෙ | ජ්‍යෙ කා.ම | ආධුනික කා.ම | සුළු සේවක |
|---|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | 22 | 29 | 51 | 36 |
| මුදල් පරිපාලන | 10 | 13 | 38 | 08 |
| ගබඩා හා සැපයුම් සේවා | 02 | 02 | 03 | 14 |
| ආරක්ෂක සේවා | - | 08 | 57 | 01 |
| ප්‍රවාහන සේවා | - | 01 | 01 | 55 |
| කෘෂි විද්‍යා පීඨය | 02 | 26 | 36 | 43 |
| ස.සෞ.වි. පීඨය | 03 | 01 | 22 | 14 |
| කලා පීඨය | 02 | 11 | 28 | 28 |
| දන්ත වෛද්‍ය පීඨය | 01 | 23 | 66 | 43 |
| ඉංජිනේරු පීඨය | 03 | 31 | 39 | 88 |
| වෛද්‍ය පීඨය | 02 | 43 | 66 | 67 |
| විද්‍යා පීඨය | 01 | 22 | 34 | 53 |
| පශු වෛද්‍ය පීඨය | 01 | 04 | 20 | 27 |
| පුස්තකාල සේවා | 02 | 18 | 36 | 51 |
| සෞඛ්‍ය සේවා | - | 07 | 14 | 49 |
| ශාරීරික අධ්‍යාපන | - | 03 | - | 14 |
| ශිෂ්‍ය සේවා | 01 | 04 | 07 | 03 |
| ඉඩම් හා ගොඩනැගිලි | 04 | 11 | 05 | 109 |
| විදුලි සැපයුම් | - | - | - | 32 |
| ජල සැපයුම් | - | - | - | 07 |
| දු.හා.අ.අධ්‍යාපන මධ්‍යස්ථානය | 03 | 04 | 12 | 03 |
| නේවාසිකාගාර | - | 15 | 15 | 104 |
| දංගොල්ල පර්යේෂණ ආයතනය | 01 | 02 | 05 | 40 |
| උඩපේරාදෙණිය පශු සම්පත් ආයතනය | 02 | 01 | - | 18 |
| මහඉලුප්පල්ලම | - | - | 10 | 05 |
| දත්ත සැකසුම් ඒකකය/තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 01 | - | 01 | - |
| **එකතුව** | **63** | **279** | **566** | **912** |

1 - පරිපාලන හා විධායක මට්ටම්
2 - ජ්‍යෙ.කා.මණ්ඩල ශ්‍රේණි
3 - ලිපිකාර හා සම ශ්‍රේණි
4 - ඉහත ශ්‍රේණිවලට පහළ ශ්‍රේණි

## 09. පර්යේෂණ, නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර

| | විෂය | ප්‍රකාශයට පත් කළ | වාණිජ | ඉදිරිපත් කළ |
|---|---|---|---|---|
| අ | පර්යේෂණ සංඛ්‍යාව | 280 | 04 | 324 |
| ආ | නිපැයුම් සංඛ්‍යාව | 04 | 03 | 06 |
| ඇ | වාර සඟරා සංඛ්‍යාව | 149 | 04 | 77 |
| ඈ | පොත් සංඛ්‍යාව | 48 | 01 | 02 |
| ඉ | ලිපි සංඛ්‍යාව | 241 | - | 26 |
| ඊ | වෙනත් (කරගෙන යන උපුටා ගැනීම්) | 94 | 05 | 12 |
| | **එකතුව** | **816** | **17** | **447** |

## 10. වැඩසටහන්. සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| | විෂය | සහභාගිවූ | අවසන් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|---|
| අ | පශ්චාත් උපාධි වැඩසටහන් | 81 | 54 | 51 |
| ආ | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | 69 | 35 | 04 |
| ඇ | උපාධි වැඩසටහන් | 10 | 01 | 05 |
| ඈ | ඩිප්ලෝමා වැඩසටහන් | - | - | 02 |
| ඉ | සහතික පත්‍ර වැඩසටහන් | 37 | 31 | 27 |
| ඊ | වෙනත් (පුහුණු පාඨමාලා, පුහුණු වැඩසටහන්, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ, කෙටි පාඨමාලා, පර්යේෂණ සම්මන්ත්‍රණ, සමුළු) | 529 | 249 | 344 |
| | **එකතුව** | **726** | **370** | **433** |

## 11. ලබාගත් සම්මාන පිළිබඳ විස්තර

| | විෂය | සම්මාන සංඛ්‍යාව | ආචාර්යවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අ | දේශීය සම්මාන | 10 | 02 | 06 |
| ආ | ජාතික සම්මාන | 34 | 11 | 26 |
| ඇ | ජාත්‍යන්තර සම්මාන | 11 | 11 | 02 |
| ඈ | වෙනත් | 06 | 06 | - |
| | **එකතුව** | **61** | **30** | **34** |

## 12. ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | - | | - | - | - | - | - | - | - |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | - | | - | - | - | - | - | - | - |
| **කලා පීඨය** | පාසැල් ගුරුවරුන් සඳහා භූගෝල විද්‍යාව | | - | √ | - | - | - | - | - |
| **දන්ත වෛද්‍ය පීඨය** | - | | - | - | - | - | - | - | - |
| **ඉංජිනේරු පීඨය** | සිවිල් ඉංජිනේරු විද්‍යාව | ඉං/දෙ/සි | - | - | - | - | √ | - | - |
| **වෛද්‍ය පීඨය** | - | | - | - | - | - | - | - | - |
| **විද්‍යා පීඨය** | භූ ගර්භ විද්‍යාව | | - | - | - | - | - | 6 | 3 |
| **පශු වෛද්‍ය පීඨය** | - | | - | - | - | - | - | - | - |

ප්‍රදාන කටයුතු

1. උපාධි අපේක්ෂක වැඩසටහන්
2. සහතික පත්‍ර
3. ඩිප්ලෝමා
4. පශ්චාත් උපාධි ඩිප්ලෝමා
5. පශ්චාත් උපාධි
6. දර්ශනපති
7. දර්ශනශූරී

ඉං - ඉංග්‍රීසි  සිං - සිංහල  දෙ - දෙමළ

## 13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

| විෂය | 2011 | 2012 |
|---|---|---|
| **අ පුද්ගල වේතන** | 1,751,881,110 | 1,927,230,174 |
| **ආ ප්‍රවාහන** | 5,925,330 | 6,020,405 |
| **ඇ සැපයුම්** | 122,307,138 | 121,949,389 |
| **ඈ නඩත්තු** | 19,958,735 | 15,141,007 |
| **ඉ කොන්ත්‍රාත් සේවා** | 223,378,618 | 272,175,536 |
| **ඊ වෙනත්** | 798,724,301 | 576,754,856 |
| **එකතුව** | **2,922,175,232** | **2,919,271,367** |

## 14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:

| විෂය | 2011 | 2012 |
|---|---|---|
| අ ලී බඩු සහ කාර්යාල උපකරණ ලබා ගැනීම | 36,909,588 | 74,440,187 |
| ආ යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | 10,356,897 | 9,999,848 |
| ඇ ගොඩනැගිලි හා ව්‍යුහයන් ලබා ගැනීම | 25,137,661 | 55,467,358 |
| ඈ වෙනත් | 52,015,295 | 98,352,662 |
| එකතුව | **124,419,441** | **238,260,055** |

## 15 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ)

ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) උපග්‍රන්ථ "G" හි දැක්වේ.

## 16 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදස් ආධාර කළ)

ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) උපග්‍රන්ථ "H" හි දැක්වේ.

## 17 මුදල් ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර :

| විෂය | 2011 වසරේ සැපයුම රු. | 2012 වසරේ වියදම රු. | ඉතිරිය/ අතිරික්තය රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,267,100,000 | 2,919,271,367 | (652,171,367) |
| ප්‍රාග්ධන | 301,000,000 | 238,290,055 | 62,709,945 |
| ව්‍යාපෘති - දේශීය ආධාර කළ | - | - | - |
| ව්‍යාපෘති - විදේශීය ආධාර කළ | - | - | - |

## 18 මුදල් ප්‍රගතිය (සාමාන්‍ය ආදායම) පිළිබඳ විස්තර :

| ආදායම් මූලාශ්‍ර | 2012 සැපයුම රු. | 2012 එකතු කිරීම රු. | හිඟය/ අතිරික්තය |
|---|---|---|---|
| ප්‍රථම උපාධි අධ්‍යයන | 38,670,000 | 63,683,214 | (25,013,214) |
| පශ්චාත් උපාධි අධ්‍යයන | 2,480,000 | - | 2,480,000 |
| විශේෂඥ උපදේශන | - | - | - |
| වෙනත් | 81,078,000 | 89,437,137 | (8,359,137) |

19 මුදල් කාර්ය සාධන විශ්ලේෂණය 2012:

| විෂය | ෆෝමියුලා | එක් සිසුවෙකු සඳහා වියදම රු. (පීඨ මට්ටමින්) රු. 000 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෘෂි | සම සෞඛ්‍යය | කලා | දන්ත | ඉංජී | වෛද්‍ය | විද්‍යා | පශු |
| (අ) සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම | පු.වි./ශිෂ්‍ය සංඛ්‍යාව | 335 | 76 | 85 | 420 | 195 | 189 | 127 | 262 |
| (ආ) සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම | පු.වි./ශිෂ්‍ය සංඛ්‍යාව | 41 | 13 | 08 | 21 | 15 | 18 | 04 | 22 |
| එකතුව | | **376** | **89** | **93** | **441** | **210** | **207** | **131** | **284** |

20 **2012 වසරේ ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර:**

20. අ) **2012 වසරේ ක්‍රියාත්මක වන සියලුම මූලධන ව්‍යාපෘති :**

| | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්තුවේ නම | VAT සහිත ටෙන්ඩර මුදල (රු) | 2013-01-01 දිනට අතුරු ගෙවීම් (රු) | ගෙවීමට ඇති ශේෂය(රු) |
|---|---|---|---|---|---|
| 1 | වෛද්‍ය පීඨයේ පාරා සායනික ගොඩනැගිල්ල CW/CON/2005/662 | SEC<br>ප්‍රදානය කළ මුදල | 280,000,000.00<br>205,400,052.23 | 211,220,888.91 | 68,779,111.09 |
| 2 | නව භූගර්භ විද්‍යා ගොඩනැගිල්ල ඉදිකිරීම CW/CON/2006/718 | CECB | 94,539,442.60 | 66,574,773.90 | 27,964,668.70 |
| 3 | සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ඉදිවන ගොඩනැගිල්ල CW/CON/2001/743 | වෝටර්මැන් ඉංජිනියරිං | 43,214,599.16 | 11,851,868.03 | 31,362,731.13 |
| 4 | කාලාගාරය සහ කෞතුකාගාර ව්‍යාපෘතිය ඉදිකිරීම CW/CON/2011/867 | ෆර්නිඩයිනමික් ඉංජිනියරිං | 7,832,683.04 | 1,178,963.40 | 6,653,719.64 |
| 5 | සත්ව විද්‍යා අංශයේ සත්ව නිවහනේ යෝජිත දිගුව ඉදිකිරීම CW/CON/2011/876 | ලුමිනෙක්ස් (පුද්) සමාගම | 11,111,111.03 | 6,475,870.18 | 4,635,240.85 |
| 6 | කලා පීඨයේ කළමනා කරණ අධ්‍යයන අංශය සඳහා ඉදිවන ගොඩනැගිල්ලේ අදියර I,II කොටස CW/CON/2011/889 | ගාමිණී ඉංජිනියරිං වර්ක්ස් | 9,647,558.23 | 7,400,424.49 | 2,247,133.74 |
| 7 | එම ගොඩනැගිල්ලේ අදියර I,II කොටස CW/CON/2021/941 | සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් | 19,927,276.99 | 3,558,442.32 | 16,368,834.67 |
| 8 | මාකස් ප්‍රනාන්දු ශාලාවේ ජල සැපයුම් පද්ධතිය CW/CON/2011 | NW&SDB | 7,000,000.00 | 3,733,968.00 | 3,266,032.00 |

**20 ආ) 2012 වසර සඳහා ක්‍රියාත්මකවන සියලු පුනරුත්තාපන ව්‍යාපෘති :**

| | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | VAT සහිත ටෙන්ඩර මුදල (රු.) | 2013-01-01 දිනට අතුරු ගෙවීම් | ගෙවීමට ඇති ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 1 | විශ්වවිද්‍යාල ක්‍රීඩාගාරයේ ආලෝක පද්ධතිය CW/CON/2012 | ලුම්නෙක්ස් (පුද්) සමාගම | 7,842,776.20 | 700,248.00 | 7,142,528.20 |
| 2 | නව නඩත්තු දෙපාර්තමේන්තුවට අලුතින් පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම CW/CON/2012 | ඩයිනමික් කන්ස්ට්‍රක්ෂන් | 2,800,000.00 | 1,765,867.25 | 1,034,132.75 |
| 3 | මාර්ස් ශාලාවේ පිරිමි වැසිකිලි පද්දතියේ අලුත් වැඩියා කටයුතු | ITCS | 1,109,556.00 | 330,305.48 | 779,250.52 |
| 4 | පීඨ, ක්‍රීඩා හා විනෝද කටයුතු මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු CW/CON/2012 | ITCS | 938,025.76 | 750,420.56 | 187,605.20 |
| 5 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ අළුත්වැඩියා කටයුතු | ගනේගෙදර බිල්ඩර්ස් | 1,346,800.00 | 168,084.00 | 1,178,716.00 |
| 6 | විශ්වවිද්‍යාල ක්‍රිකට් පිටියේ වැඩිදියුණුව සඳහා කම්කරුවන් සැපයීම CW/CON/2012 | යසිත එන්ටප්‍රයිසස් | 819,000.00 | | 819,000.00 |
| 7 | AQ 70 අළුත්වැඩියා කටයුතු විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ අදියර III, බිම පිඟන් ගඩොල් ඇල්ලීම CW/CON/2012 | ITCS | 1,867,152.00 | 1,379,249.08 | 487,902.92 |
| 8 | සිවිල් ඉංජිනේරු වැඩපොළේ ගොඩනැගිල්ලට යෝජිත දිගුව CW/CON/2012 | ලුම්නෙක්ස් (පුද්) සමාගම | 11,330,007.36 | 5,088,313.76 | 6,241,693.60 |
| 9 | Drawing කාර්යාලයේ නවීකරණ කටයුතු CW/CON/2012 | SD & CC | 11,817,519.42 | 2,659,127.00 | 9,158,392.42 |
| 10 | ආහාර විද්‍යා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් හා ඉතිරි කටයුතු CW/CON/2012 | SEC | 34,178,475.41 | 6,000,000.00 | 28,178,475.41 |
| 11 | පිහිනුම් තටාකයේ පැති බැම්මේ අළුත්වැඩියා කටයුතු CW/CON/2012 | ලුම්නෙක්ස් (පුද්) සමාගම | 3,281,236.00 | 531,935.08 | 2,749,300.92 |
| 12 | සිතියම් විද්‍යාගාරය GIS විද්‍යාගාරයක් බවට හැරවීම CW/CON/2012 | යසිත එන්ටප්‍රයිසස් | 1,800,500.80 | 1,262,031.00 | 538,469.80 |
| 13 | අක්බාර් නෙල් ශාලාවේ පිටුපස වැට ඉදිකිරීම CW/CON/2012/945 | ITCS | 2,196,488.00 | | 2,196,488.00 |

## 20. ඇ) 2012 වසරේ අවසන් කළ ව්‍යාපෘති

| | ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කළ මුදල VATසහිතව | කොන්ත්‍රාත්කරුගේ නම |
|---|---|---|---|
| 1 | පශු ශික්ෂණ රෝහල-අදියර I SAR/CW/CON/650 | 44,000,000.00 | CECB |
| 2 | ආහාර විද්‍යා හා විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම CW/CON/2005/658 | 86,605,177.10 | SEC |
| 3 | කළමනාකරණ අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර I, කොටස CW/CON/2007/660 | 26,352,397.46 | ලුම්නෙක්ස් (පුද්) සමාගම |
| 4 | පශු ශික්ෂණ රෝහල-අදියර II CW/CON/2007/745 | 35,347,819.06 | CECB |
| 5 | රසායන ඉංජිනේරු ගොඩනැගිල්ල ඉදිකිරීම CW/CON/2007/748 | 27,935,739.52 | SEC |
| 6 | නව කලා ගොඩනැගිලි දිගුව අදියර V CW/CON/2009/848 | 18,549,449.24 | ලුම්නෙක්ස් (පුද්) සමාගම |
| 7 | නව කලා ගොඩනැගිලි දිගුව අදියර VI CW/CON/2009/849 | 11,303,090.05 | විජය බිල්ඩස් |
| 8 | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පශ්චාත් උපාධි ආයතනය මේ සඳහා යෝජිත ගොඩනැගිල්ල CW/CON/2010/861 | 15,619,026.36 | වෝටර්මන් ඉංජිනියරිං |
| 9 | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පශ්චාත් උපාධි ආයතනය සඳහා යෝජිත ගොඩනැගිල්ලේ බිම් මහලේ අවසන් කටයුතු CW/CON/2010/863 | 11,093,230.18 | ලුම්නෙක්ස් (පුද්) සමාගම |
| 10 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරක්‍ෂක මුරකුටි 06ක් ඉදිකිරීම CW/CON/200/815 | 1,314,572.11 | කරුණාරත්න ඉදිකිරීම් |
| 11 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ආරක්‍ෂක මුරකුටි CW/CON/2010/859 | 681,788.80 | මතුරට ඉංජිනියරිං |
| 12 | මාවලවත්ත ගොවිපලේ කුකුළු සත්ව ඒකකයට යෝජිත පිවිසුම් මාර්ගය CW/CON/2010/860 | 843,220.00 | ඒ කේ. කන්ස්ට්‍රක්ෂන් |
| 13 | සම සෞඛ්‍ය විද්‍යා පීඨයට fly mesh සපයා සවිකිරීමCW/CON/2010/872 | 588,000.00 | ගනේගෙදර බිල්ඩර්ස් |
| 14 | විදුලි හා විද්‍යුත් අධ්‍යයන අංශයේ නව ගොඩනැගිල්ලේ ජනේල ආවරණය කිරීම CW/CON/2011/895 | 178,080.00 | ගයාන් කන්ස්ට්‍රක්ෂන් |
| 15 | වෛද්‍ය පීඨයේ භෞතවේද දේශන ශාලාවේ අළුත් වැඩියා කටයුතු CW/CON/2011/887 | 1,722,560.00 | ITCS |
| 16 | දුම්රිය පාලමේ සිට සිරි අමරවංශ මාවත දක්වා කම්බිවැටක් ඉදිකිරීම් CW/CON/2011/894 | 1,226,400.00 | ගයාන් කන්ස්ට්‍රක්ෂන් |
| 17 | මා ඔය ඉවුරු ඛාදනය වැළැක්වීම CW/CON/2011/912 | 1,108,800.00 | කෝසල සිවිල් කන්ස්ට්‍රක්ෂන් |
| 18 | භෞතික විද්‍යා ගොඩනැගිල්ල පිටුපස වැටක් සහිත පැති බැම්ම ඉදිකිරීම CW/CON/2011/913 | 1,306,032.00 | ITCS |
| 19 | උපකුලපති නිල නිවස අසළ යකඩ ගේට්ටුවක් සපයා සවි කිරීම CW/CON/2011/918 | 87,920.00 | ITCS |
| 20 | විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක් බවට AQ 70 අළුත්වැඩියා කිරීම CW/CON/2011/928 | 594,412.00 | ගයාන් කන්ස්ට්‍රක්ෂන් |

මහාචාර්ය අතුල සේනාරත්න
උපකුලපති
2013 මාර්තු

## උපග්‍රන්ථ A - පීඨ වාර්තා

### A1 කෘෂිවිද්‍යා පීඨය
(පීඨාධිපති, මහාචාර්ය කේ. සමරසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උසස් අධ්‍යාපනය 1948 වසරේදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් යුතුව කෘෂිකර්ම පීඨයේදී සහ පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා පීඨයේදී ආරම්භ විය. තුන් අවුරුදු කෘෂිවිද්‍යා උපාධි වැඩසටහන 1968 වසරේදී එක් අවුරුදු ගොවිපළ පුහුණු පාඨමාලාවක් ඇතුළත් කිරීම තුළින් සිව් අවුරුදු උපාධි වැඩසටහනක් බවට පත් විය. මෙම පාඨමාලාව 1968 වසරේ ස්ථාපිත කළ මහඉලුප්පල්ලම උප-මණ්ඩපයේදී පවත්වන ලදි. පීඨය මඟින් පිරිනමනු ලබන කෘෂිවිද්‍යා උපාධි වැඩසටහන ශක්තිමත් කිරීම පිණිස පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අරමුණින් යුතුව එම වසරේදීම අක්කර 76.06ක ඉඩමක් කුණ්ඩසාලේ දොඩංගොල්ල ප්‍රදේශයෙන් විශ්වවිද්‍යාලය විසින් ලබාගන්නා ලදි. අධ්‍යයන දෙපාර්තමේන්තු හයකින් (06) සමන්විත වෙනමම වූ අංග සම්පූර්ණ කෘෂිවිද්‍යා පීඨයක් 1972 වසරේදී ස්ථාපිත කරන ලදි. වර්තමානය වනවිට පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු අටකින් (08), වියළි කළාපයේ (මහඉලුප්පල්ලම) පිහිටි උප-මණ්ඩපයකින් විවිධ කෘෂිකර්ම-පාරිසරික කළාපයන්හි පිහිටි ශික්ෂණ ගොවිපළවල් හතරක් හා සමාජ මධ්‍යස්ථාන/ඒකක කීපයකින් මෙන්ම පූර්ණ සුදුසුකම්වලින් යුතු ශක්තිමත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලින් සමන්විත වේ.

වර්තමානයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින පැරණිම, විශාලතම හා වඩාත් පිළිගත් කෘෂිකර්ම පීඨය වේ. පීඨය එහි ප්‍රධාන උපාධි වැඩසටහන්වලට (කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය) අමතරව ආහාර විද්‍යා හා තාක්ෂණය සහ සත්ව විද්‍යාව හා මත්ස්‍ය යන නම්වලින් හැඳින්වෙන විද්‍යාවේදී උපාධි දෙකද පිරිනමන අතර වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන සිසුන් සංඛ්‍යාව 275කි.

**ජයග්‍රහණ**

2012 වසර තුළදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සහ පරිවාස කථිකාචාර්යවරුන් තිදෙනෙකු බඳවා ගැනීමට පීඨයට හැකිවිය. විදෙස් අධ්‍යයන නිවාඩු ලබා සිටි එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ඔහුගේ ආචාර්ය උපාධිය සාර්ථකව අවසන් කොට ආපසු පැමිණි අතර තවත් සාමාජිකයෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. පීඨයේ එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් විද්‍යාශූරී ගෞරව උපාධිය පිරිනමන ලදි. පීඨ සාමාජිකයන්ට 2012 වසරේදී රුපියල් මිලියන 35.5ක මුළු මුදලක් පර්යේෂණ ප්‍රදාන ලෙස ලැබුණි.

කෘෂිකර්ම පීඨය එහි කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය හරහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ව්‍යාපෘති දෙකකටද (යළි පුබුදමු ව්‍යාපෘතිය සහ දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන තත්ත්ව දියුණු කිරීමේ ව්‍යාපෘතිය) තාක්ෂණික සහය ලබාදීමේ වගකීම බාරගන්නට විය. මෙම කාර්ය පහසුකරවීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති හා ව්‍යාපෘති අධ්‍යක්ෂ අතර අවබෝධතා ගිවිසුම් දෙකක් 2012 වසරේ ජනවාරි මාසයේදී අත්සන් කරනන්ට විය. දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන තත්ත්ව දියුණු කිරීමේ ව්‍යාපෘතියේ තරුණ තරුණියන් 400කට සාමාන්‍ය කෘෂිකර්මය පිළිබඳ දින 45ක නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වීමට කැපවී සිටි. සිසුන් 40 දෙනෙකු ඇතුළත් එහි පළමු කණ්ඩායම සඳහා පුහුණුව 2012 ජනවාරි මස ආරම්භ කරන ලදි.

පීඨය SLCARP Crop Life - Sri Lanka සමඟ එක්ව "කෘමිනාශක වර්ගීකරණය" (Pesticide Classification) පිළිබඳ ජාතික වැඩමුළුවක් සංවිධානය කළේය. කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය 2012 මාර්තු මස කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ චිරස්ථායි සංවර්ධනය සඳහා කෘෂි ජෛව තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා - ඉන්දියා සමුළුව සම්බන්ධීකරණය කළේය. තවද, කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය හරහා 2012 මැයි/ජූනි මාසවල මහනුවරදී පැවැත්වූ දකුණු ආසියා ආහාර ආරක්ෂණය සහ චිරස්ථායි ජල සම්පත් පරිහරණය ප්‍රවර්ධනය කිරීම සඳහා Cropping Systems modelingහි ධාරිතාවය සංවර්ධන කිරීම පිළිබඳ SAARC - ඕස්ට්‍රේලියා ව්‍යාපෘතියේ වැඩමුළුවක් හා මධ්‍ය වාර සමාලෝචනයක් සංවිධානය කරන ලදි.

ඉතාලියේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා CARIPLO හා VISMARA පදනම මඟින් මුදල් ලබාදෙන "කිරි ගොවීන්ගේ ජාලයක් හා කිරි සැකසුම් ඒකකයක් ස්ථාපිත කිරීමේ" ව්‍යාපෘතිය යටතේ මාවෙල පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමේ සැකසුම් මධ්‍යස්ථානය 2012 වසරේ අවසාන භාගය තුළ ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය සත්ව විද්‍යා අධ්‍යයන අංශය විසින් ගන්නා ලද උත්සාහයක ප්‍රතිඵලයක් වන අතර මෙහි වරකට කිරි ලීටර් 500ක් සැකසුම් කිරීමේ හැකියාව පවතී. එමෙන්ම මෙහි උසස් තත්ත්වයේ යෝගට්, චීස් ආදිය නිෂ්පාදනය කිරීමේ නූතන යන්ත්‍රෝපකරණ ද පවතී. ආහාර විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාවේ තත්ත්වය හා අදාළත්වය දියුණු කිරීම සඳහා HETC ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 25ක ප්‍රදානයක් ලබාගැනීම ට සමත් විය.

ඇඳමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ සිසුන්ට "Sustainable Tropical Agriculture Systems" පිළිබඳ සති 04ක අධ්‍යයන විදෙස් පුහුණු වැඩසටහනක් පිරිනමන්නට ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් සහිත මෙම පීඨයට හැකිවිය. 2012 වසරේ මෙහි දෙවන අධ්‍යයන විදෙස් පුහුණු වැඩසටහන ජපානයේ සගා විශ්වවිද්‍යාලයේ සිසුන්ට පිරිනැමීය.

පීඨය එහි ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරගනිමින් පොදු රාජ්‍ය මණ්ඩලීය විද්‍යාත්මක හා කර්මාන්ත පර්යේෂණ සංවිධානය සමඟ ගිවිසුමක් අත්සන් කළේය. "ශ්‍රී ලංකාවේ සෘතුමය කාලගුණික පුරෝකථනය හා ආහාර ආරක්ෂණය පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යාපනික ව්‍යාපෘතිය කරගෙන යෑම AUSAID වෙතින් ලබාගත් අරමුදල් මඟින් සිදුකෙරේ. කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව හා ප්‍රැක්ටිකල් ඇක්ෂන් (රා.නො.සං) සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර මෙම ව්‍යාපෘතිය වර්ෂ දෙක හමාරක කාලයක් සඳහා වන අතර මුළු වටිනාකම රුපියල් මිලියන 18.05කි.

අදවන විට පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් බොහෝ දෙනෙක් ජාතික හා ජාත්‍යන්තර කටයුතුවල අන්තර් ක්‍රියා කරමින් නියැලෙන අතර සුවිශේෂි ජයග්‍රහණයන් ද අත්කර ගනී. කෘෂි තාක්ෂණ හා කළමනාකරණ උපාධි පාඨමාලාවේ එක් කෘෂිවිද්‍යා සිසුවෙකු ඔහුගේ ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා Alltech තරුණ විද්‍යාඥ ත්‍යාගය (ආසියා පැසිපික් කළාපය) හිමිකර ගත්තේය. ඔහු එම සංවිධායකයන්ගේ සහෘදයන්ගෙන් අනුග්‍රහයක් ලබා ඇමරිකාවේ කෙන්ටකි, ලෙක්ෂිංටන්හි පැවැත්වූ එම ත්‍යාගය පිරිනැමීමේ උලෙළට සහභාගි විය. ආහාර විද්‍යාව හා තාක්ෂණ කෘෂිවිද්‍යා උපාධි වැඩසටහනේ තවත් සිසුවෙකු ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය ශ්‍රී ලංකා තරුණ කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කළ EYLA (නැගී එන තරුණ නායකත්ව සම්මාන) තරගයේ "ශ්‍රී ලංකාවේ නැගී එන තරුණ නායකයන් දසදෙනාගෙන් අයෙකු ලෙස තෝරාගනු ලැබීය. කෘෂි තාක්ෂණ හා කළමනාකරණ වැඩසටහනේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් දෙදෙනෙකු ඔවුන්ගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිවලින් සහ ජර්මනියේ පැවැත්වූ in-plant පුහුණුව සාර්ථකව අවසන් කළහ.

**බාධක සහ පිළියම්**

එක් පරිවාස කථිකාචාර්යවරයෙකු විශ්වවිද්‍යාල සේවාවෙන් ඉල්ලා අස් වී 2012 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා රේගුවට සම්බන්ධ වූවේය. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග නිසා අධ්‍යයන වැඩසටහන මාස හතරකින් පමණ ප්‍රමාද විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 සැප්තැම්බර් අවසන් කිරීමට නියමිතව තිබූ අධ්‍යයන වැඩසටහන ඊළඟ වර්ෂය දක්වා දීර්ඝ කිරීමට සිදුවිය. යටිතල පහසුකම්වල ගැටළු හේතුවෙන් සත්ව විද්‍යා හා මත්ස්‍ය කෘෂිවිද්‍යාවේදී උපාධි වැඩසටහනේ සිව්වන සිසු කණ්ඩායම ඇතුළත් කර ගැනීම ප්‍රමාද කරන්නට කෘෂිවිද්‍යා පීඨ මණ්ඩලයට සිදුවිය.

**අනාගත සැලසුම්**

අධ්‍යයන වැඩසටහන්වලට පහසුකම් සැපයීම පිණිස යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පීඨයේ ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් පීඨය පසු වේ. පීඨයේ ප්‍රධාන සැලසුම 2011 වසරේදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන තෙක් බලා සිටී. පීඨයේ අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළහොත් සත්ව විද්‍යා හා මත්ස්‍ය කෘෂිවිද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම නැවත ආරම්භ කළ හැකිවනු අතර පීඨය මඟින් පිරිනමනු ලබන වෙනත් උපාධි වැඩසටහන් සඳහා විදෙස් සිසුන් ඇතුළත්ව අමතර සිසුන් කීපදෙනෙකු ද ඇතුළත් කරගැනීමට පීඨයට හැකිවනු ඇත.

## A2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය
(පීඨාධිපති, වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

2007 වසරේ ස්ථාපිත කරන ලද සම සෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුඩාම හා අට වැනි පීඨයයි. නූතනයේදී සම සෞඛ්‍ය විද්‍යා පීඨය හෙදවේද විද්‍යාවේදී උපාධිය, භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධිය, වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී උපාධිය, ඖෂධ විද්‍යාවේදී උපාධිය, සහ විකිරණවේද හා විකිරණ චිකිත්සක විද්‍යාවේදී උපාධි සඳහා සුදුසුකම් ලැබීම පිණිස හෙදවේද සහ සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු (4) හා තුන් අවුරුදු (3) එක් අවුරුදු විශේෂ ප්‍රථම උපාධි වැඩසටහන් හයක් (6) පිරිනමනු ලබයි. මෙම පීඨය සතුව ඉහත සඳහන් එක් එක් අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යයන අංශයේ සාමාජිකයන් 36 දෙනෙකු සිටී. පීඨය විවිධ විෂය ධාරාවන්ගෙන් සැදුම්ලත් දැනුම දායාද කරන අතරම මනා ලෙස ව්‍යුහගත කළ රෝහල් පදනම් කරගත් පුහුණුව, ප්‍රායෝගික පුහුණුව, විද්‍යාගාර, පරිගණක හා පුස්තකාල පහසුකම්වලින් යුතු විශිෂ්ට ගණයේ අධ්‍යයන පරිසරයක් සිසුන්ට ලබාදෙයි. මෙම පීඨයට ඇතුළත් කළ දෙවන සිසු කණ්ඩායම (සිසුන් 150) ඔවුන්ගේ පාඨමාලාවන් අවසන් කොට ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉතිහාසයේ ප්‍රථම වතාවට 2012 වසරේ පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේදී නව විද්‍යාවේදී උපාධි පහක් හා ඖෂධවේදී උපාධිය පිරිනමන ලදී. වර්තමානයේදී ඉහත සඳහන් කළ විෂයධාරාවන්ගෙන් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව 670කි. පීඨය සිසුන්ට රෝහල් පදනම් කරගත් පුහුණුව ලබාදීම සඳහා ජාතික සහ පුද්ගලික අංශයේ රෝහල්වල බලධාරීන් සමඟ සහයෝගිතාවක් ගොඩනගාගෙන ඇත. මෙම පීඨයේ උපාධිධාරීන් මෙරට පුද්ගලික රෝහල්වල සහ විද්‍යාගාරවල රැකියාවන්හි නියුතුව සිටිති. කෙසේ වෙතත් සම සෞඛ්‍ය විද්‍යා පීඨය තවමත් රැඳී පවතිනුයේ වෙනත් පීඨ පීඨාධිපතීන්ගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල හොඳ හිත හා සහයෝගය මතයි. දැනට ක්‍රියාත්මක ඉගැන්වීමේ වැඩසටහනට දේශිය හා විදේශීය ආගන්තුක කථිකාචාර්යවරුන්ගෙන් ඉටුවනුයේ අතිවිශාල සේවාවකි.

**ජයග්‍රහණ**

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පළමු සිසු කණ්ඩායම (2005/2006) ඔවුන්ගේ නිර්දේශිත පාඨමාලා වැඩ අවසන් කොට උපාධිලාභීන් වීම සඳහා සුදුසුකම් ලබාගන්නා ලදි. 2012 වසරේ පවත්වන ලද වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී මුළු සිසුන් 159 දෙනෙකු ඔවුන්ට අදාළ උපාධි ලබාගත්හ. එම උපාධි ප්‍රදානෝත්සවයේදීම ඖෂධවේදී සිසු කණ්ඩායම් දෙකක් (2005/06 හා 2006/07) උපාධි ලබාගත්හ. පීඨයේ සිසු කණ්ඩායමේ " සමුගැනීමේ සාදය" 2012 පෙබරවාරි මස 19 වැනි දින WUS පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදි.

පීඨය වෙනුවෙන් ඉදිවෙන නව ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තැබීමේ උත්සවය (පහත මහළ, බිම් මහළ හා පළමු මහළ) 2012 පෙබරවාරි 24 වැනි දින පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදි. මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස උපකුලපතිතුමා සහභාගි වූ අතර කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙන්ම සිසුහු ද මේ සඳහා සහභාගි වූහ. භෞත චිකිත්සක අධ්‍යයන අංශයේ සිසුහු 2012 ජනවාරි මස 23 වැනි දින කොළඹ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්වූ " Back Care හා Sports Nutrition" පිළිබඳ ශ්‍රී ලංකා ක්‍රීඩා වෛද්‍ය ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශන කුටි දෙකක් සංවිධානය කොට පැවැත්වීමට ක්‍රියාශීලිව සහභාගි වූහ. මෙම අධ්‍යයන අංශය 2012 මාර්තු මස සිට මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් ආරම්භ කළේය. භෞත චිකිත්සක සිසුන් ක්ෂේත්‍ර චාරිකාවල නියැලි ප්‍රජා කටයුතුවල යෙදෙනු ඇත. වෛද්‍ය එච්.ජේ. සුරවීර භෞත චිකිත්සක උපකරණ කීපයක් සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ භෞත චිකිත්සක අධ්‍යයන අංශය වෙත 2012-10-09 වැනි දින පරිත්‍යාග කළේය.

ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සඳහා ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ නිගාටා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන් තිදෙනෙකු හා සිසුන් 10 දෙනෙකු (හෙදවේද සහ වෛද්‍ය රසායනාගාර) ඇතුළත් නියෝජිත මණ්ඩලයක් පීඨයට පැමිණ 2012 සැප්තැම්බර් 2-12 දින දක්වා රැඳී සිටි අතර පේරාදෙණිය සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද, වෛද්‍ය රසායනාගාර සහ විකිරණවේද අධ්‍යයන අංශවල සිසුන් නව දෙනෙකු 2012-08-13 සිට 2012-11-03 දින දක්වා මාස තුනක කාලයක් පර්යේෂණ අධ්‍යයනයක් හදාරන ලදි. නිගාටා විශ්වවිද්‍යාලය සම සෞඛ්‍ය විද්‍යා පීඨය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ඇතිකරගත් Sister Link වැඩසටහන යටතේ නිගාටා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු 06 දෙනෙකු ඇතුළත් නියෝජිත මණ්ඩලයක් 2012 නොවැම්බර් 26-30 දක්වා පීඨයට පැමිණ සිටි අතර මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි (වැ.බ.අංශ ප්‍රධාන/හෙද අංශය) හා වෛද්‍ය එම්.පී.එස්. මුදලිගේ (වෛද්‍ය රසායනාගාර අංශ ප්‍රධාන) නිගාටා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහනකට 2012 දෙසැම්බර් 08-15 දින දක්වා සහභාගි වූහ.

මැලේසියාවේ කළමනාකරණ හා විද්‍යා විශ්වවිද්‍යාලයේ සිසුන් 16 දෙනෙකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් අන්තර් විශ්වවිද්‍යාල සබඳතා දියුණු කරගැනීමට හා සම්ප්‍රදායික හා සංස්කෘතික වටිනාකම් හුවමාරු කරගැනීමටත් ජාත්‍යන්තර අත්දැකීම් ලබාගැනීම සඳහාත් 2012 ඔක්තෝම්බර් 30 වැනි දින පේරාදෙණිය සම සෞඛ්‍ය විද්‍යා පීඨයට පැමිණියේය. හෙදවේද අධ්‍යයන අංශය ජපානයේ ගුන්මා විශ්වවිද්‍යාලය සමඟ "Skype හරහා හෙද නිපුණතාවන් හුවමාරු කරගැනීමේ හැකියාව ඇගයීම " පිළිබඳ පර්යේෂණ සහයෝගිතාවක නියැලී සිටි. විශ්වවිද්‍යාල දෙක අතර අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තබන ලදි.

දැයට සෙවන ජාතික පැළ සිටුවීමේ ව්‍යාපාරය 2012-11-15 දින සම සෞඛ්‍ය විද්‍යා පීඨයේදී පැවැත්වූ අතර එදිනම ("Herbal Garden") "ඖෂධ වත්තක්" ද ආරම්භ කරන ලදි. ඖෂධ පැළෑටි කීපයක් සම සෞඛ්‍ය විද්‍යා පීඨාධිපති වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න විසින් සිටුවන ලදි. අංශ ප්‍රධානීන්, කාර්ය මණ්ඩලය සහ සිසුන් ද මේ සඳහා සහභාගි වූහ.

ඖෂධවේද වැඩසටහන් 3+1 විෂය නිර්දේශය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරන ලද අතර අනෙකුත් අධ්‍යයන අංශවල 3+1 විෂය නිර්දේශයන් විශ්වවිද්‍යාලයේ (ADPC) අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුව විසින් අනුමත කරන ලදි. පීඨයේ හෙදවේද අංශය සහ වෛද්‍ය රසායනාගාර අංශ විසින් HETC තරගකාරී ප්‍රදාන ලබා ගැනීම සඳහා යෝජනා දෙකක් වෙන වෙනම බාරදෙන ලදී. ඖෂධවේද අංශයේ එම්.එච්.එෆ්. සකීනා මහත්මියට ජාත්‍යන්තර වැඩමුළුවක් සඳහා ඉන්දු-ලංකා ප්‍රදානයක් ලැබිණි. ඇය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කරන ලද අතර 2012-11-07 දින ඖෂධවේද අංශ ප්‍රධානී ලෙසද පත්කරන ලදි.

**බාධක සහ පිළියම්**

ශ්‍රී ලංකා හෙදවේද සහ සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ පුවත් ගොනුවේ සිව්වන කළාපය නුදුරේදීම ප්‍රකාශයට පත්කරනු ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග නිසා මෙය ප්‍රමාද විය. මීළඟ කළාපය සඳහා අදාළ ලිපි සකස් කොට අවසන් කර ඇත.

CT-SCAN යන්ත්‍රය පීඨයේ සවි කිරීමේ ක්‍රියාවලිය ඒ සඳහා අවශ්‍ය සමහර කොටස් ලබාගත නොහැකි වීම නිසා අවසන් කිරීමට නොහැකි විය.

කම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවුණ හෙයින් පරණ ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු නිම කිරීමට නොහැකි විය. කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදය හේතුවෙන් පීඨයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කිරීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

- පීඨයේ ඔසුහලක් ස්ථාපිත කිරීම හා සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ "M.Pharm" වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය විසින් සම සෞඛ්‍ය විද්‍යාව ගෘහ මට්ටමින් වැඩිහිටියන් වෙනුවෙන් සෞඛ්‍ය සත්කාරය සපයන්නන් සඳහා පුහුණුව ලබාදීම පිණිස "ප්‍රජා සෞඛ්‍ය අධ්‍යයන මධ්‍යස්ථානයක් " ස්ථාපිත කිරීමේ අරමුණින් පසුවේ.
- Diagnostic රසායනාගාරයක්, සියලු උපකරණවලින් සමන්විත ශුද්‍රජීව විද්‍යා රසායනාගාරයක් හා ශිෂ්‍ය පර්යේෂණ විද්‍යාගාරයක් පීඨයේ ස්ථාපිත කිරීම.
- රසායන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.

## A3 ශාස්ත්‍ර පීඨය
(පීඨාධිපති, මහාචාර්ය ඒ.එච්. නවරත්න බණ්ඩාර විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

ශාස්ත්‍ර පීඨය ප්‍රථම උපාධි සිසුන් 3717 කුගෙන් හා පශ්චාත් උපාධි සිසුන් 1000 කින් සමන්විත ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ විශාලතම පීඨයයි. මෙම පීඨයේ අධ්‍යයන අංශ 17ක් ඇත. අරාබි සහ ඉස්ලාම් ශිෂ්ටාචාරය, පුරාවිද්‍යාව, සම්භාව්‍ය භාෂා, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන, ඉංග්‍රීසි භාෂා, ලලිත කලා, භූගෝල විද්‍යාව, ඉතිහාසය, නීතිය, කළමනාකරණ අධ්‍යයනය, පාලි හා බෞද්ධ අධ්‍යයන, දර්ශනය හා මනෝවිද්‍යාව, දේශපාලන විද්‍යාව, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, හා දෙමළ භාෂාව යන විෂයන් මෙම අධ්‍යයන අංශ හරහා ඉගැන්වේ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයක් හා මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයක්ද පීඨය සතුව ඇත. ප්‍රධාන වශයෙන් විෂය ක්ෂේත්‍රයන් 17ක් ඔස්සේ පීඨය ප්‍රථම උපාධි වැඩසටහන් 04ක් පිරිනමනු ලබයි. ඒවා ශාස්ත්‍රවේදී (විශේෂ හා සාමාන්‍ය උපාධි, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය, නීතිවේදී උපාධිය වේ.) 2007/2008 අධ්‍යයන වර්ෂයේ ප්‍රථම සිසු කණ්ඩායමට ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය 2011/2012 අධ්‍යයන වර්ෂය අවසානයේදී පිරිනැමෙනු ඇත. අලුතින් පත්කළ පීඨාධිපති මාහාචාර්ය ඒ.එච්. නවරත්න බණ්ඩාර 2012 නොවැම්බර් 16 වැනි දින වැඩ බාර ගන්නා ලදි.

### ජයග්‍රහණ

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාවට 2012 ඔක්තෝබර් මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබිණි. එය වැදගත් ජයග්‍රහණයකි.

ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි හදාරන සිසුන් දෙදෙනෙකු ජපානයේ Fukuoka විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වර්ෂයක කාලයක් ගත කිරීම සඳහා 2012 වසරේදී තෝරා ගන්නා ලදි.

මලය විශ්වවිද්‍යාලයේ විශිෂ්ටතා සම්මාන 2012 දෙසැම්බර් 10 වැනි දින මලය විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද උත්සවයකදී ආචාර්ය එම්.ඉෂඩ්.එම්. සලීම්ට ප්‍රදානය කරන ලදි. පීඨයේ නීති දේපාර්තමේන්තුව "ජාත්‍යන්තර LASS - NET සමුළුව - 2012" සංවිධානය කොට දෙසැම්බර් මස 14-16 යන දිනවලදී ශාස්ත්‍ර පීඨයේදී පවත්වන ලදි. සිංහල අධ්‍යයන අංශයේ කථිකාචාර්ය නිමල් විජේසිරි මහතා විසින් අධ්‍යක්ෂණය කළ "පෙම්බර භූතය" වේදිකා නාට්‍යය 2012-12-05 දින එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨයේදී රඟ දැක්විණි.

දර්ශන අධ්‍යයන අංශය UNESCO සමඟ එක්ව සංවිධානය කොට ජාත්‍යන්තර දර්ශන දිනය පීඨයේදී පවත්වන ලදි.

**අනාගත සැලසුම්**

- පරිවාස ආචාර්යවරුන් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන සැලසුම්.
- පීඨ කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.
- පීඨයේ සියලු අධ්‍යයන හා සංවර්ධන ව්‍යාපෘතිවල සමස්ත කළමනාකරණය සඳහා පීඨ සංවර්ධන කමිටුවක් සකස් කිරීම.
- පර්යේෂණ හා ප්‍රකාශන වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි කුසලතාවන් ඉහළනැංවීම.
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විධිමත් ලෙස ස්ථාපිත කිරීමට අදාළ පනත බාර දී ඇත.
- ප්‍රථම උපාධි අපේක්ෂකයන් අතර බුද්ධිමය/වාර්ගික සහජීවන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- පීඨයේ විශේෂ හැකියාවන් සහිත සිසුන්ගේ අවශ්‍යතා සඳහා විශේෂ අවශ්‍යතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- පීඨ පරිපාලනය සඳහා නව පරිපාලන ඒකකයක් ගොඩනැගීම.

## A4 දන්ත වෛද්‍ය පීඨය
(පීඨාධිපති, මහාචාර්ය යූ.බී. දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

ඉගැන්වීම, පර්යේෂණ හා රෝගී සත්කාර කටයුතුවලට සහයවන දන්ත වෛද්‍ය පීඨය සහ පේරාදෙණිය දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සංසන්දනය කළහැකි නවීන උපකරණ හා පහසුකම්වලින් යුත් ගොඩනැගිලි සමුදායකින් යුක්ත වේ. රටට අවශ්‍ය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කරන එකම ආයතනය දන්ත වෛද්‍ය විද්‍යා පීඨය වන අතර පහත සඳහන් අධ්‍යයන අංශයන් ඊට අයත් වේ. මූලික විද්‍යා අංශය, ප්‍රජා දන්ත වෛද්‍ය අංශය, මුඛ සෞඛ්‍ය හා පරිදන්ත අංශය, මුඛ හා විකලාංග ශල්‍ය වෛද්‍ය අංශය, මුඛ ව්‍යාධිවේදී අංශය හා දන්ත සංරක්ෂණ අංශයයි.

ප්‍රථම උපාධි අපේක්ෂකයන් පුහුණු කිරීමට අමතරව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව දන්ත වෛද්‍ය විශේෂඥයන් පුහුණු කිරීම හා වෙනත් දන්ත වෛද්‍ය සහයක වෘත්තිකයන් පුහුණු කිරීම පීඨයේ කෘත්‍යයන් වේ. තවද, දන්ත වෛද්‍ය පීඨය/දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල රෝගී සත්කාරය සඳහා තෘතීය විමර්ශන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාකරන අතර එහි පහසුකම් වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා සිසුන් විසින් ද ඔවුන්ගේ පුහුණුව සඳහා පරිහරණය කරනු ලබයි.

දන්ත වෛද්‍ය පීඨය/රෝහල මුඛ පිළිකා ශල්‍ය කර්ම, මුඛ-හනු ප්‍රතිසංස්කරණ ශල්‍ය කර්ම, පැළුණු තොල් හා හනු සහිතව උපත ලද ළමුන්ගේ පූර්ණ සත්කාරය, මාර්ග අනතුරුවලින් සිදුවන හානි යන සුවිශේෂී වූ සේවාවන් සපයා දෙනු ලබයි. මෙය ශ්‍රී ලංකාවේ සියලුම රෝහල්වලට පිළිකා රෝග ලක්ෂණ හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයක් ද වෙයි.

**ජයග්‍රහණ**

සිසුන්ට ඔවුන්ගේ ප්‍රථම සහ දෙවන වසර සඳහා ක්‍රියාත්මක ඉංග්‍රීසි වැඩසටහන හඳුන්වා දෙන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන අවබෝධතා ගිවිසුම යටතේ පශ්චාත් උපාධි ඉගැන්වීම් කටයුතු සඳහා අත්‍යාවශ්‍ය රුපියල් මිලියන 1.5ක් වටිනා Cryostat උපකරණයක් ලබාගන්නා ලදි. එතුළින් ශල්‍යාගාර සඳහා Frozen biopsy සේවාවන් ස්ථාපිත කිරීමට අපට හැකි වී ඇත. දන්ත වෛද්‍ය ප්‍රථම උපාධි අපේක්ෂකයන් දෙදෙනෙකු විශ්වවිද්‍යාල දෙක අතර සිදුවන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයට සංචාරය කළහ.

මෙම පීඨය තරඟකාරී පදනම් මත ප්‍රදානය කරනු ලබන HETC තත්ත්ව හා නව නිපැයුම් ප්‍රදාන යටතේ රුපියල් මිලියන 25ක් වටිනා ප්‍රදානයක් දිනා ගන්නා ලදි. දන්ත වෛද්‍ය පීඨයේ මුඛ ව්‍යාධිවේදය පිළිබඳ මාහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග FDI ලෝක දන්ත වෛද්‍ය සංගමයේ විද්‍යා කමිටුවේ විධායක සාමාජිකයෙකු ලෙස තෝරා ගන්නා ලදි.

දන්ත වෛද්‍ය පීඨයේ මුඛ ව්‍යාධිවේදය පිළිබඳ මාහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න සෞඛ්‍ය පර්යේෂණ ත්‍යාගය 2012 සඳහා තෝරා ගන්නා ලදි.

මුඛ සෞඛ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය ආර්.ඩී. ජයසිංහ ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ (SLDA) 2012 රැස්වීමේදී "මුඛ හා හනු විකිරණවේදය එදා, අද සහ හෙට සඳහා දන්ත වෛද්‍ය

විකිරණවේදය" යන තේමාව යටතේ දේශනයක් පැවැත්වීය. 2012 වසරේදී පහත සඳහන් පොත් ප්‍රකාශයට පත් කරන ලදි.
වෛද්‍ය ඒ.කේ.එස්. අරඹවත්ත හා වෛද්‍ය එච්.ආර්.ඩී. පීරිස් මුඛ සෞඛ්‍ය හා සබැඳි මිත්‍යා විශ්වාස.

වෛද්‍ය ආර්.ඩී. ජයසිංහ දන්ත වෛද්‍ය සිසුන් සඳහා මුඛ විකිරණ චිකිත්සාව සහ විකිරණවේදය වෛද්‍ය ආර්.ඩබ්. පල්ලේගම වේදනා කළමනාකරණය නූතන සංකල්ප I හා II කොටස්.

දන්ත වෛද්‍ය සිසුන් දෙදෙනෙකු මැලේසියාවේ Sains විශ්වවිද්‍යාලයේදී 2012 ඔක්තෝබර් 13-14 දිනවලදී පැවැත්වූ "22 වැනි ජාත්‍යන්තර PESTA BOLA USM" සඳහා සහභාගි වූහ.

මැලේසියාව විසින් ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පිළිගෙන ඇති මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය මැලේසියානු රජය විසින් නම් කරන ලද මුඛ හනුක ශල්‍ය වෛද්‍යවරයෙකු සඳහා ඇමරිකානු ඩොලර් 15.000.00 ක නාමික ගාස්තුවකට යටත්ව "ප්‍රතිසංස්කරණ ක්‍රම සහිත මුඛ පිළිකා ශල්‍ය කර්ම කළමනාකරණ ක්‍රම සහිත මුඛ පිළිකා වැඩසටහන් පැවැත්වීය. දන්ත වෛද්‍ය රෝහල දැඩිසත්කාර ඒකකය සහ ශල්‍යාගාරය සම්පූර්ණයෙන් උපකරණවලින් ප්‍රතිස්ථාපනය කරන ලදි.

**අනාගත සැලසුම්**

- වෛද්‍ය පීඨයේ ශල්‍ය කර්ම අධ්‍යයන අංශයේ සහයෝගය ඇතිව දන්ත වෛද්‍ය පීඨයේ සාමාන්‍ය ශල්‍ය කර්ම ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා දන්ත වෛද්‍ය වාට්ටුවට ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම. දන්ත වෛද්‍ය සිසුන් සඳහා සාමාන්‍ය ශල්‍ය ශික්ෂණ වැඩසටහනක් පැවැත්වීම මෙම කටයුත්තේ අරමුණයි.
- අමතර සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය යටතේ ප්‍රධාන සැලසුමෙන් යෝජිත පරිදි පවතින ආපනශාලාවට දිගුවක් ඉදිකිරීම.
- යෝජිත පස් අවුරුදු විෂය නිර්දේශය අවසන් කිරීම.
- ගෙවීමේ පදනම මත විදෙස් සිසුන් 15 දෙනෙකු ඇතුළත් කරගැනීමේ ඉලක්කය ඇතිව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමැතිය හා අරමුදල් ලබාගැනීම .
- HETC - QIC ප්‍රදාන යටතේ සිසුන් සඳහා නිපුණතා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම. පීඨය මේ වන විටත් QIG ප්‍රදාන (window 1 & 2) දිනාගෙන ඇති අතර නිපුණතා විද්‍යාගාරය ස්ථාපිත කිරීම සඳහා කටයුතු සූදානම් කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ. මෙය පීඨයට දීර්ඝ කාලයක සිට දැනුණ අවශ්‍යතාවයකි.

**බාධක සහ පිළියම්**

සිසුන්ට නව අන්වීක්ෂ මිළදී ගැනීම සඳහා සම්පත් හිඟකම. දැනට සිසුන් විසින් පරිහරණය කරනු ලබන අන්වීක්ෂ අවුරුදු 10ක් පමණ අඛණ්ඩව පරිහරණය කිරීම නිසා ඒවා හොඳින් ක්‍රියාත්මක වන තත්ත්වයේ නොමැත. නව අන්වීක්ෂ මිළදී ගැනීම සඳහා මේ වසරේදී ද සම්පත් ලබා දී නොමැත.

## A5 ඉංජිනේරු පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

ඉංජිනේරු පීඨය 2012 වසරේදි අධ්‍යයන වැඩසටහන් පවත්වා ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරීන් 400කට වැඩිපිරිසක් දයාද කරන ලදි. එම උපාධිධාරීන් අතර සිවිල් ඉංජිනේරුවන් 150ක් හා විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන් 100ක්, පරිගණක ඉංජිනේරුවන් 60ක් හා නිෂ්පාදන ඉංජිනේරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන් සහ සැකසුම් ඉංජිනේරුවන් ඉතිරි පිරිසට අයත් වූහ. පීඨය ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වු ඉහළ "Z" ළකුණු අගයක් ලබාගත් සිසුන් ඇතුළත් නවක සිසුන් 440 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් සකස් කරමින් සිටියේය. එමෙන්ම පීඨයේ පශ්චාත් උපාධි වැඩසටහන්වලින් 2012 වසරේදී ඉංජිනේරු විද්‍යාපතීන් 8 දෙනෙකු හා දර්ශනශූරීන් දෙදෙනෙකු බිහිකරන ලදි. පීඨයේ අධ්‍යයන වැඩසටහනට විවිධාකාරයේ බාධක පැමිණියත් පීඨ සිසුන්ට ජාතික තාක්‍ෂණික තරඟ සැලකියයුතු ප්‍රමාණයකින් මෙන්ම ජාත්‍යන්තර තරඟ කිපයකින් ජය ගැනීමට ලැබීම ප්‍රසංශනීය ජයග්‍රහණයකි. මෙරට වෙනත් ඉංජිනේරු පීඨවල සිසුන් ද ඇතුළුව විශ්වවිද්‍යාල රාශියක සිසුන් සහභාගි වූ විවෘත තරඟ විය. ජාතික තරඟ ජය ගැනීමෙන් පසු සමහර ක්‍රියාකාරකම්වලදී අපගේ සිසුන් විදෙස් රටවල පැවැත්වු ජාත්‍යන්තර තරඟ සඳහා ද ශ්‍රී ලංකාව නියෝජනය කළහ. මහත්සේ කැපවී කටයුතු කරන අපගේ කාර්ය මණ්ඩලයේ මාර්ගෝපදේශකත්වය හා අධීක්‍ෂණය මෙම ජයග්‍රහණය සඳහා ඉවහල් විය.

පීඨයේ පවත්වන ලද පරේයේෂණවලින් සැලකිය යුතු මට්ටමේ ප්‍රකාශන සංඛ්‍යාවක් බිහිවිය. ඒ අතරින් පර්යේෂණ පත්‍රිකා 10කට වැඩි ප්‍රමාණයක් පිළිගත් වාර සඟරාවල පළවු අතර අංග සම්පූර්ණ පොත් 5 ක් හා පොත් පරිච්ඡේද සංඛ්‍යාවක් ද ඒ අතරට ඇතුළත් වේ. පීඨය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සමඟ සහයෝගයෙන් පවත්වනු ලබන CPD වැඩසටහන් සම්මන්ත්‍රණ හා ක්‍ෂෙත්‍රයට සපයනු ලබන සේවාවන් හරහා පීඨ-කර්මාන්ත ක්‍ෂේත්‍ර සබඳතා පවත්වා ගන්නා ලදි. ජපානයේ විද්‍යා හා තාක්‍ෂණ ආයතනය (JST) හා JICA ආයතනයේ චිරස්ථායි සංවර්ධනය සඳහා වන විද්‍යා හා තාක්‍ෂණ පර්යේෂණ සම්බන්ධතාවයේ (SA TREP) අරමුදල යටතේ සයිතමා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක ප්‍රයෝජනයට ගත නොහැකි ඉඩම් ගොඩ කිරීම පිළිබඳ පස් අවුරුදු ව්‍යාපෘතිය 2012 වසරේදී මනා ලෙස ක්‍රියාත්මක විය.

තාක්‍ෂණයේ මෑත කාලින නව ප්‍රවණතාවයන් පිළිබඳ නව පාඨමාලා හඳුන්වාදීම අඛණ්ඩව සිදුවිය. අධ්‍යයන අංශ විසින් ප්‍රථම උපාධි වැඩසටහනට නව තාක්‍ෂණික පාඨමාලා කිහිපයක් හඳුන්වා දෙන ලදි. විශාල විෂය නිර්දේශ සංශෝධනයක් පීඨය තුළ සිදුවු අතර එක් එක් අධ්‍යයන අංශ ජාත්‍යන්තර මාර්ගෝපදේශන පැවරුම් අවශ්‍යතාවන් අනුගමනය කොට නව ව්‍යුහයන් යොජනා කරමින් ප්‍රථම වසර අධ්‍යයන වැඩසටහනේ ප්‍රබල සංශෝධනයක් සඳහා කටයුතු කරමින් සිටියේය. පීඨයේ සියලූම අධ්‍යයන වැඩසටහන් එක් එක් අධ්‍යයන අංශ හා IESL පැවරුම් අංශය විසින් පෙර බාරදෙන ලද වාර්තා මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ තත්ත්ව සහතික සභාව විසින් සිදුකරනු ලබන ඇගයීම් ක්‍රියාවලිය අවසන් කරන ලදි. සමහර අධ්‍යයන අංශ වෙනත් ඉංජිනේරු පීඨයන්හි අධ්‍යයන අංශවලට නිසි උපදෙස් සකස් කර දෙන දෙවන IESL ක්‍රියාකාරකම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් සිටි.

ඒ ඒ ආයතන අංශ හා පීඨයේ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයද විසින් පවත්වනු ලබන CPD වැඩසටහන් හරහා දේශිය වෘත්තිකයන්ට දැනුම ව්‍යාප්ත කරලීම අඛණ්ඩව සිදුකරන ලදි. විවිධ අවස්ථාවන්වලදි අදාළ විදෙස් අයතනවලින් පැමිණි සම්පත්දායක පුද්ගලයන් සමඟ කෙටි පාඨමාලා 20කට වැඩි සංඛ්‍යාවක් දින

(1-3 දක්වා) පවත්වන ලදි. පීඨය RED සංවර්ධනය කිරීමට හා කර්මාන්ත ක්ෂේත්‍ර සම්බන්ධතාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා විදෙස් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් රාශියකට එළඹෙන ලදි. ගෙවීගිය වසරේදී පීඨය ජාතික හා ජත්‍යන්තර සමුළු කිහිපයක් සංවිධානය කරන ලද්දේ පර්යේෂණ සහයෝගිතාවන් ප්‍රවර්ධනය කිරීමේ සහ පර්යේෂණ විශේෂඥයන් හුවමාරු කර ගැනිමේ අරමුණිනි. චිරස්ථායිව ගෙඩනැගූ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව එයින් එක් වැදගත් සිද්ධියක් වු අතර ඒ තුළින් පීඨයට අනුබද්ධ පශ්චාත් උපාධි සිසුන් බෝහෝ දෙනෙකුට ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් සඳහා සංසදයක් ලබාදෙන ලදි.

සමහර අධ්‍යයන අංශවල ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැඩි හිඟය 2012 වසරේදී ද පැවතිණ. එම අධ්‍යයන අංශවලට සුදුසුකම් සහිත යෝග්‍යය අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම ඉතා සාර්ථක නොවීය. කෙසේ වෙතත් වර්ෂාවසානයේදි ප්‍රමාද වී ලැබුණු අයදුම්පත්‍ර සැකසුම් කොට බඳවා ගැනීම් කීපයක් සිදුකරන ලදි. විශේෂිත අංශවලට අවශ්‍ය කරන සුදුසුකම් සහිත ඉංජිනේරුවන් බිහිකිරීම සඳහා සුදුසුකම්වලින් යුතු තරුණ කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන පුහුණු කොට පීඨයේ පවත්වා ගෙන යාම සඳහා වැදගත් වේ. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ඉංජිනේරුවන්ට හා ඉංජිනේරු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පවතින ඉහළ ඉල්ලුම හා ඉහළ පාරිතෝෂික දීමනා ලබාදීම මෙසේ අධ්‍යයන කාර්ය මණ්ඩල ශක්තියට අසුබවාදි බලාපොරොත්තුවක් ඇතිවීමට හේතුවක් වී ඇත. උපාධි වැඩසටහන්වල උසස් තත්ත්වයන් සහ ජාත්‍යන්තර තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා උසස් සුදුසුකම්වලින් යුතු කාර්ය මණ්ඩලයක් රඳවා ගැනීම පිණිස විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු ආකර්ශණීය කිරීමේ උපක්‍රම කිහිපයක් (උදා. ලෙස ඉංජිනේරු දීමනා ගෙවීම සඳහා මුදල් ලබා දීම, දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමට සහය දැක්වීම ආදිය) අනුගමනය කිරීම අවශ්‍ය වේ. සම්පත් හිඟය, අධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය හා වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් බාධක පැවතියත් දැනට සිටින කාර්ය මණ්ඩලය වෙහෙස මහන්සි වී කටයුතු කිරීම නිසාවෙන් වර්ෂය තුළදී සතුටුදායක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවිය.

## A6 වෛද්‍ය පීඨය
(පීඨාධිපති, මහාචාර්ය එම්. ඩී. ළමාවංශ විසින් වාර්තා කරන ලද පරිදි)




### හැඳින්වීම

ක්‍රියාකාරකම් රාශියක් සිදුකළ වසරක් ලෙස 2012 හැඳින්විය හැකිය. වෘත්තීය සංගම් ක්‍රියාමාර්ගවල බලපෑම පීඨයේ අධ්‍යයන කාර්යන්වලට හා යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රබල බාධකයක් විය. පීඨාධිපති ලෙස වර්ෂ තුනක් සේවය කල ඒ.ජී. බුත්පිටිය සැප්තැම්බර් මාසයේ දී අළුතින් පත්වූ පීඨාධිපති වෙත රාජකාරී බාර කළේය.

### ජයග්‍රහණ

### සංවත්සර සැමරුම

පීඨය ආරම්භ කොට එහි 50 වැනි සැමරුම 2012 ජනවාරි මාසයට යෙදී තිබූ අතර ප්‍රථම සිසු කණ්ඩායමට අයත් විද්‍යාර්ථීන්ගේ සහභාගිත්වයෙන්ද යුතුව තෙදින (03) වැඩසටහනක් සංවිධානය කරන ලදි. විද්‍යාර්ථීන්ගේ මුල් කාර්යයන් ඉදිරිපත් කළ අධ්‍යයන සැසි වෙබ් අඩවිය හරහා විකාශනය කරන ලදි. විද්‍යාර්ථීන්ගේ හා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පොත් ප්‍රදර්ශනයක් හා කලා ප්‍රදර්ශනයක් සහ විනෝදාත්මක වැඩසටහනක් ඉදිරිපත් කළ අතර එම වැඩසටහන්වලට සහභාගිවූ 239ක් දෙනා විසින් මනාසේ අත්විඳින්නට වූහ.

### ප්‍රථම උපාධි අධ්‍යාපනය

උසස් පෙළ විභාගයේ “Z” අගයන් සකස් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් 2012 වසරේදී නවක සිසුන් බඳවා ගැනීමක් සිදුනොවීය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙන් 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා අමතර සිසුන් 35 දෙනෙකු ඇතුළත් කර ගැනීමට පීඨය මූලිකවම එකඟ වී ඇත. 2012 වසරේදි වෛද්‍ය සිසුන් 173 දෙනෙකු වෛද්‍යවරුන් ලෙස උපාධි ලබාගත්හ. එක් සිසුවෙකු පොදු කුසලතා ලැයිස්තුවේ දිවයිනෙන් ප්‍රථමයා බවට පත් වූයේ පීඨයේ සම්ප්‍රදාය රැකගනිමින් පීඨයෙන් පිළිවෙළින් බිහිවූ තෙවැන්නා ලෙසය.

විෂය නිර්දේශය සහ ඇගයීම් වෙනස් කිරීම් කිහිපයකට භාජනය වු අතර 2012/13 සිසු කණ්ඩායමේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත සංශෝධනයක් ආරම්භ කරන ලදි. 2009/10 සිසු කණ්ඩායමේ සිට මනෝචිකිස්තාව අවසන් වසරේ විෂයක් ලෙස හඳුන්වා දුන් අතර එය 2015 වසරේදී ඇගයීමට ලක්වනු ඇත. විෂය නිර්දේශයේ සායනික අංග සංශෝධනය කිරීම සඳහා විස්තෘත කාර්ය මණ්ඩලය සමඟ රැස්වීම් කීපයක් පවත්වා ඇත. එහිදී ගත් තීරණ 2013 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක කරනු ඇත.

### පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ

කාර්ය මණ්ඩලයට සහ පීඨයට අනුබද්ධ සාමාජිකයන්ට පශ්චාත් උපාධි පුහුණුව ලබාදීම සහ පර්යේෂණයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කරගෙන ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ කීපදෙනෙක් ජාතික හා ජාත්‍යන්තර සහයෝගිතාවන් සමඟ එක්ව පර්යේෂණ ව්‍යාපෘති පවත්වන ලදි. ප්‍රදානයන් කීපයක්ද ලබාගෙන ඇත. උපුටන, පෝස්ටර් හෝ වාචික ඉදිරිපත් කිරීම් 107ක් සහිත මෙම කටයුතුවලින් සමහරක් ජාතික හා ජාත්‍යන්තර වාර සඟරා 84ක පළකර ඇත. මෙතුළින් ප්‍රතිබිම්භනය වනුයේ මෙම වසර තුළ

අත්කරගත් අතිශයින් ප්‍රයෝජනවත් පර්යේෂණයන්හි ප්‍රතිඵලයන්ය. මීට අමතරව, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ජනාධිපති සම්මාන තුනක්, ජාත්‍යන්තර සම්මාන දෙකක් හා දේශිය ආයතනික සම්මාන දිනාගෙන ඇත. මෙම වර්ෂය තුළදී පීඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් පොත් පරිච්ඡේද 33ක් රචනා කොට ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කීපදෙනෙකුටම දේශීය සහ ජාත්‍යන්තර සමුළුවල දේශන පැවැත්වීම සඳහා අරාධනා ලැබිණ.

M.D පුහුණුවන්නන් 30කට වැඩි පිරිසක් ලියාපදිංචි කොට අධීක්ෂණය කරන ලදි. 2012 වසරේදී දර්ශනපති සිසුන් 12 ක් හා දර්ශනශූරී සිසුන් පස් දෙනෙකු ලියාපදිංචි කරන්නට විය. "ක්‍රීඩා විද්‍යාව" පිළිබඳ නව විද්‍යාපති උපාධි වැඩසටහනක් අරම්භ කරන ලදි. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාඛාවක් මෙම පීඨයේ ස්ථාපිත කිරීම සඳහා කළ යෝජනාවට බෝහෝ දෙනෙකු විසින් මතුකරන ලද කරුණු නිසා ඉතා මන්දගාමී ප්‍රගතියක් ලබා ඇත.

**යටිතල සංවර්ධනය**

සංවත්සර සැමරුමට සමගාමීව යටිතල සංවර්ධනයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවිය. දේශන ශාලා වැසි වතුර ජල කානු පද්ධතිය, මාර්ග පද්ධතිය, අපද්‍රව්‍ය බැහැර කිරීම හා ලී බඩු අලුත්වැඩියා කිරීම හා ප්‍රතිසංස්කරණය ආදිය මීට ඇතුළත් විය. සමහර ප්‍රතිසංස්කරණ කටයුතු 2012 වසරේ අඛණ්ඩව සිදුවුවත් දේශන ශාලා ප්‍රතිසංස්කරණයේ නිශ්චිත ප්‍රගතියක් දක්නට නොලැබිණ. පාරා සායනික ගොඩනැගිල්ලේ බිම් මහළ සහ පළමු මහළේ වැඩ නිමාව ආසන්නයටම පත්ව ඇති අතර ඉතිරි මහළ් තුනේ කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන සකස් කොට ඇත. වැඩ අවසන් කළ කොටස් 2013 වසරේදී පරිහරණයට ගනු ඇත. සායනික පර්යේෂණ ගොඩනැගිල්ල සඳහා සැලසුම් සකස් කොට ටෙන්ඩර කැඳවා ඇත.

**සමාජ වැඩසටහන්**

පීඨය පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය සේවාවේ 80%ක පමණ දායකත්වයක් දරයි. අතීතයේදී මෙන්ම වර්තමානයේදී ද රෝගීන් සඳහා සායනික හා පාරා සායනික ක්ෂේත්‍රයන්ට විශේෂඥ වෛද්‍ය සේවාව ලබාදෙන ලදි. ඊට අමතරව කාය ව්‍යවච්ඡේද අංශය අ.පො.ස (උ/පෙළ) සිසුන් හා ගුරුවරුන් සඳහා මානව ජීව විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව පවත්වන ලදි .

**නව අධ්‍යයන අංශ/ඒකක හා කාර්ය මණ්ඩලය**

එක් අධ්‍යයන අංශ සාමාජිකයෙකු මහාචාර්ය තනතුරට උසස් කරන ලද අතර අළුතෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අට දෙනෙකු බඳවා ගන්නා ලදි. මෙරට විශ්වවිද්‍යාල පද්දතියේ එකම විකිරණ විද්‍යා ආයතන අංශය ලෙස විකිරණ විද්‍යාව සඳහා නව අධ්‍යයන අංශයක් ස්ථාපිත කරන ලදි.

**වෙනත් ක්‍රියාකාරකම්**

සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාවන් දියුණු කිරීම සඳහා වැඩසටහනක් දියත් කරන ලද අතරම වර්ෂ අවසාන භාගයේදී අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි පාඨමාලාවක්ද ආරම්භ කරණ ලදි.

**බාධක**

2012 නොවැම්බර් මාසයේදී පීඨ පරිශ්‍රයේදී පැවැත්වීමට පීඨය විසින් සංවිධානය කිරීමට සැලසුම් කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය 2012 වසරේදී පැවැත්වීමට නොහැකි විය. පීඨයට අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මෙන්ම වාහන ලබාගැනීම ද දුර්වල විය. සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලට අමතර ඉඩකඩක් ලබාගැනීම මෙතෙක් සිදුවී නොමැත.

**අනාගත සැලසුම්**

විෂය මාලාව සංශෝධනය කිරීම, සායනික පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දැඩි අවශ්‍යතාවක්ව පවතින විභාග ශාලාව ඉදිකිරීම, පාරා සායනික ගොඩනැගිල්ලේ දෙවන අදියර ආරම්භ කිරීම, සායනික පර්යේෂණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ඇරඹීම, පොදු සායනික/සේවා වැඩසටහන් හා පර්යේෂණ ස්ථාපිත කිරීම, සහ පශ්චාත් උපාධි සිසුන් වැඩි පිරිසක් ලියාපදිංචි කිරීම හා පර්යේෂණ සහ පශ්චාත් උපාධි සම්බන්ධීකරණය කිරීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පීඨය ස්ථාපිත කිරීම යන කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අප සැලසුම් කොට ඇත.

## A7 විද්‍යා පීඨය
(පීඨාධිපති, මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

ප්‍රථම උපාධි සිසුන් 1707ක්, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 97ක්, අධ්‍යයන සහය කාර්ය මණ්ඩල සාමාජිකයන් 04ක් හා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 108කුගෙන් සමන්විත විද්‍යා  පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දෙවන විශාලතම පීඨයයි. එය සතුව (උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව භූගර්භ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්‍ෂණවේදීය, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යා හා සත්ව විද්‍යාව) යන අධ්‍යයන අංශ අටක් හා ඒකක තුනක් (විද්‍යා අධ්‍යාපන ඒකකය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා පරිගණක ඒකකය) සහ විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා සංසදයක් ද ඇත. මෙම පීඨයේ අධ්‍යයන කාර්යයෙහි යෙදෙන සිසුන්හට මනා උපකරණවලින් සමන්විත විද්‍යාගාර, තොරතුරු තාක්‍ෂණය හා පුස්තකාල  පහසුකම් ද ප්‍රධාන විෂය ධාරාවන් 10කින් බෙදී එන (ජීව විද්‍යාව, උද්භිත විද්‍යාව, භූගර්භ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යාව, ජෛව තාක්‍ෂණය, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව හා සත්ව විද්‍යාව) විවිධ විෂයන්ගෙන් යුතු පාඨමාලාද (ගගණ විද්‍යාව, මූලික ගණනය, ආර්ථික විද්‍යාව, විද්‍යුත් විද්‍යාව, පාරිසරික විද්‍යාව, ආහාර විද්‍යාව, මැණික් විද්‍යාව හා භූ තොරතුරු පද්දති කළමනාකරණ අධ්‍යයනය, ද්‍රව්‍ය විද්‍යාව, හා විද්‍යා අධ්‍යාපනය) යන පරිපූරක විෂය ධාරාවන් 11ක් ද පිරිනමන විශිෂ්ට අධ්‍යයන පරිසරයක් පීඨය විසින් ලබා දෙනු ලබයි.

**ජයග්‍රහණ**

නව භූ ගර්භ විද්‍යා ගොඩනැගිල්ල හිටපු උපකුලපති මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන් විසින් 2012 ජූලි 28 දින විවෘත කරන ලදි.

උද්භිත විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම් විසින් කෘෂිකර්ම විද්‍යාව හා සම සෞඛ්‍ය විද්‍යාවන් ද ඇතුළුව උද්භිත විද්‍යා ක්‍ෂෙත්‍රයේ "වඩාත් කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂක - 2012" සඳහා වන CVCD සම්මානය 2012 නොවැම්බර් 30 වැනි දින රත්මලාන කොතලාවල ආරක්‍ෂක විද්‍යා පීඨයේදී පවත්වන ලද උත්සවයකදී ලබාගන්නා ලදි.

මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න මහනුවර හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස 2012 අප්‍රේල් මස සිට පත්කරන ලදි . ආචාර්ය ආර්.එල්. විජයවර්ධන විදුලි හා බලශක්ති අධිකාරියේ සභාපති ලෙස අඛණ්ඩව සේවය කළේය. මහාචාර්ය  එන්.එල්.වී.වී. කරුණාරත්න (SLINTEC) ශ්‍රී ලංකා නැනෝ තාක්‍ෂණ ආයතනයේ විද්‍යා කණ්ඩායමේ නායකයා ලෙස දිගටම සේවය කළේය. මහාචාර්ය ඒ. වික්‍රමසිංහ විශ්වවිද්‍යාල පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙකු ලෙස තෝරාපත් කර ගන්නා ලදි. මහාචාර්ය නාමල් ප්‍රියන්ත විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්‍ෂ ලෙස අඛණ්ඩව සේවය කළේය. ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා සහ මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් පිළිවෙළින් ශ්‍රී ලංකා විද්‍යා වාර සඟරාවේ (ජීව විද්‍යා) හා ශ්‍රී ලංකා විද්‍යා වාර සඟරාවේ (භෞතික විද්‍යා) ප්‍රධාන සංස්කාරකවරුන් ලෙස 2012 මැයි මස සිට පත්කරන ලදි.

පීඨය (විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව) පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා  රුපියල් 30,000,000 .00ක HETC-OIG Window 3 ප්‍රදානයන් දිනා ගන්නා ලදි. ආචාර්ය ජේ.ඩබ්. දමුණුපොලට ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදානයෙන් රුපියල් 1,651,720.00ක මුදලක් ලැබිණ. මහාචාර්ය බී.එම්.ආර්. බණ්ඩාර

(ප්‍රදාන විමර්ශක) ජාතික පර්යේෂණ සභාවෙන් රුපියල් 4,885,000.00ක පර්යේෂණ ප්‍රදානයක් ලබාගන්නා ලදි. ආචාර්ය එස්. මල්ලවආරච්චි (ප්‍රදාන විමර්ශක) තාක්‍ෂණ හා පර්යේෂණ සභාවෙන් මිලියන 3.6ක ප්‍රදානයක් ලබා ගන්නා ලදි.

මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න "ජීව විද්‍යාඥයන්ගේ ගෝලිය හමුව" නම් වූ ජාත්‍යන්තර සමුළුවේදී ආරාධිත දේශනය පැවැත්වූ අතර "දෛශික පාලනය හා කළමනාකරණයේ වර්තමාන තත්ත්වය හා ඉදිරි උපක්‍රම" පිළිබඳ ඉන්දියාවේ හයිද්‍රාබාද් නුවර ඔස්මානියා විශ්වවිද්‍යාලයේදී 2012 දෙසැම්බර් මස පැවැත්වූ චන්ද්‍රිකා සමුලුවේ ප්‍රධාන අමුත්තා ද විය. මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන්හි පැවැත්වූ ජාත්‍යන්තර භූගර්භ විද්‍යා සමුළුවට හා ජර්මනියේ හැනෝවා විශ්වවිද්‍යාලයේ පැවැත්වූ Geo-Hannover 2012 සමුලුවට ද සහභාගි විය. ආචාර්ය ජගත් ගුණතිලක තායිලන්තයේ බැංකොක් නුවරදී ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගි විය. ආචාර්ය එම්.එස්.පී.කේ. මලවිආරච්චි චීනයේ පැවැත්වූ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කුඩා විදුලි තාක්‍ෂණය පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගි වූවාය. ආචාර්ය ඒ. පීඨවල ජෝර්දානයේ අම්මාන්හි පැවති පුහුණු වැඩසටහනට සහභාගි විය. එස්.ජේ. වීරසේකර ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සමුළුවකට සහභාගි වූ අතර ආචාර්ය එස්.ඩී.එස්.එස්. සූරියපතිරණ ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ පුහුණු වැඩසටහනකට සහභාගි වුයේය. ආචාර්ය ජේ.ඒ. වැලිවිට සෝලා පද්දති පර්යේෂණ සඳහා වන මැක්ස් ප්ලෑන්ක් ආයතනයේ පුහුණු වැඩසටහනකට සහභාගි විය. මහාචාර්ය කේ. ප්‍රේමරතන ජපානයේ shizuoka විශ්වවිද්‍යාලයේ විද්‍යුත් පර්යේෂණ ආයතනයේ ආගන්තුක මහාචාර්ය ලෙස 2012 ජූලි සිට සැප්තැම්බර් මාසය දක්වා සේවය කළ අතර ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයනය පිළිබඳ වැඩමුලුවකට ද සහභාගි විය. ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර විශ්වවිද්‍යාලයේ අයනික් මධ්‍යස්ථානයේ විද්‍යාගාරය නැරඹීමට ගියේය.

විද්‍යා අධ්‍යාපන ඒකකය ඌව පළාතේ අ.පො.ස (උ/පෙළ) ගුරුවරුන් සඳහා 2012-04-26 දින සිට 2012-04-28 දින දක්වා තෙදින පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදි. එමෙන්ම විද්‍යා අධ්‍යාපන ඒකකය ආචාර්ය එම්. සන්දිරගම විසින් රචිත "බුද්ධිමය දේපල" නම් කෘතිය ද, මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු විසින් රචිත" පරිගණක හැඳින්වීම" කෘතිය ද මහාචාර්ය එස්.එම්.පී.පී. කරුණාරත්න හා ආචාර්ය එස්.ඩී.එස්.එස්. සූරියපතිරණ විසින් රචිත "DNA තාක්ෂණය අවබෝධකර ගැනීම" යන කෘති තුන 2012 වසරේදී පළකරන ලදි.

**බාධක සහ පිළියම්**

පීඨයේ අධ්‍යයන වැඩසටහනට අනධ්‍යන කාර්ය මණ්ඩල වෘත්තිය සංගම් ක්‍රියාමාර්යෙන් (2012 ජූනි) හා අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තිය සංගම් ක්‍රියාමාර්ගයන් (2012 ජූලි- ඔක්තොබර්) නිසා බාධා එල්ල විය. 2012 වසරේදී සිසුන් බඳවා ගැනීම සිදුනොවීය.

**අනාගත සැලසුම්**

- විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය ආරම්භ කිරීම සහ එය පාසල් ළමුන්ට හා ජනතාවට විවෘත කිරීම. විද්‍යා අධ්‍යාපන ඒකකය වැඩියෙන් පාසල් පොත් /මොනොග්‍රාෆ් පළකිරීමට අපේක්‍ෂා කරයි. එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පාසල් සිසුන් අතර විද්‍යා විෂය ජනප්‍රිය කරවීම සඳහා විද්‍යා කඳවුරු හා ගුරු පුහුණු වැඩසටහන් වැඩියෙන් පැවැත්වීමට ද අපේක්‍ෂා කරයි.
- කෘමි සත්ව කුටි, මීන්මැදුරු, කුඩා ක්‍ෂීරපායි සත්ව ඒකකයක් හා නවීන පහසුකම්වලින් යුතු පර්යේෂණ ඒකකයක් සඳහා උපයෝගි කොට ගත හැකි සත්වහලක් අරම්භ කිරීම.
- නව භූගර්භ විද්‍යා ගොඩනැගිල්ල (දෙවන අදියර) ඉදිකිරීම හා සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම, සිව් අවුරුදු තොරතුරු තාක්‍ෂණ උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය කරන ගොඩනැගිල්ල, පරිගණක හා සේවක තනතුරු ලද විට අමතර සිසුන් 50ක් ඇතුළත් කරගැනීමටත් ක්‍ෂුද්‍රජීව විද්‍යා විශේෂ උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට ද අපගේ අපේක්‍ෂාවයි.
- කර්මාන්ත හා පරිසර විද්‍යා නව අධ්‍යයන අංශයක් ආරම්භ කිරීම අවශ්‍ය සම්පත් ලදහොත් පරිසර විද්‍යාවන් පිළිබඳ විශේෂ උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමට ද අප අපේක්‍ෂා කරන්නෙමු.
- වර්තමානයේ පවතින පරිපාලන ගොඩනැගිල්ලට දිගුවක් ලෙස නව ගොඩනැගිල්ලක් ඉදිකොට පරිපාලන ගොඩනැගිලි පද්ධතිය දීර්ඝ කිරීම.

## A8 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය
( පීඨාධිපති, මහාචාර්ය එස්.එච්.බී.එස්. ආරියරත්න විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්දතියේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධි පිරිනැමීම සඳහා බලයලත් එකම ආයතනයයි. සිව් අවුරුදු අධ්‍යයන වැඩසටහන සඳහා වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව අසන්න වශයෙන් (100) සියයකි. අධ්‍යයන අංශ පහක් හරහා බෙදා හැරෙන විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂඥතාවයකින් හෙබි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 43 දෙනෙකුගෙන් පීඨය සමන්විතවේ. ගුණාත්මක අධ්‍යයන හා පරිපාලන ව්‍යුහයක් ඇතිකරලීම සඳහා පීඨාධිපතිට පවරා ඇති බලතලවලට අනුව පීඨ මණ්ඩලය විසින් පත්කරන ලද අනු කමිටු 15ක් හරහා වගකීම් බෙදාහැර ඇත. පශු ශික්‍ෂණ රෝහල, ජංගම සායනය, පශු ශික්‍ෂණ ගොවිපල, පුස්තකාලය, පරිගණක ඒකකය, ජලජ සත්ව රෝග හඳුනා ගැනීම හා පර්යේෂණ මධ්‍යස්ථානය හා ආදර්ශ කිරිහලකින් සහ ජලභීතිකාව හඳුනාගැනීම් ඒකකය ඇතුළත් සේවා ඒකක රාශියක් මඟින් පීඨයේ අධ්‍යයන පරිසරය සුපෝෂණය කොට ඇත. සමාසික අටේ (8) අධ්‍යයන වැඩසටහන පර්යේෂණ ව්‍යාපෘතියක් සහිත තනි සාමාසිකයකින් හෝ සමාසික දෙකකින් යුතු මුළු විෂයන් 23කින් සම්ප්‍රයුක්ත වේ. ඒ අනුව පීඨයේ පාඨමාලා තක්සේරුව, සමාසික අවසාන හා වර්ෂ අවසාන පරීක්ෂණ වශයෙන් විවිධ ඇගයීම් ක්‍රම පවත්වනු ලබයි.

### ජයග්‍රහණ

ගොඩනැගිලි ඉදිකිරීම අවසන්වීමත් සමගම පශු සායනික විද්‍යා අධ්‍යයන අංශය නව ගොඩනැගිලි පරිශ්‍රයට ගෙන ගිය අතර වනජීව හා හීලෑ සතුන්ගේ සෞඛ්‍ය සත්කාරය සඳහා නවීන පහසුකම්වලින් යුතු පශු ශික්ෂණ රෝහල ස්ථාපිත කරන ලදි. ආසන්නතම රෝග හඳුනාගැනීම, විමර්ශනය කිරීම, කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් රෝගීන් නිරීක්ෂණය කිරීම සිදුකිරීමත් පාරිභෝගිකයන්ගේ රෝහල උපකරණවලින් සමන්විත වේ.

පහතින් දැක්වෙනුයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සුවිශේෂී වූ ජයග්‍රහණයන්ය.

- පශු මහජන සෞඛ්‍ය හා ඖෂධවේද අධ්‍යයන අංශය කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) විසින් අනුග්‍රහය දක්වන ලද "හැකියාවන් ගොඩනැගීම" පිළිබඳ ටිසඩේල් කොට් පශු මහජන සෞඛ්‍ය ව්‍යාපෘතියේ සත්කාරත්වය දරන ලදි. කැනඩාවේ DRC ව්‍යාපෘතිවලින් සාර්ථකවම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය කැනඩාවේ ඔට්ටාවා නගරයේදී නිවේදනය කරන ලදි.
- වෛද්‍ය අනෝජා වනිගසේකර ෆුල්බ්‍රයිට් උසස් පර්යේෂණ ජාතික සම්මානයෙන් හා 2012 දේශක සම්මානයෙන් පිදුම් ලැබීය.
- වෛද්‍ය පී.ජී.ඒ. පුෂ්පකුමාර පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන සම්මානය 2012 වසරේදී දිනා ගත්තේය.
- මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ 2012 වසරේදී ඔහුගෙන් පර්යේෂණ කාර්යයට ලද අනුග්‍රහය සඳහා ජනාධිපති පර්යේෂණ සම්මානය හිමිකර ගත්තේය.
- වෛද්‍ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය 2012 වසරේදී සැප්තැම්බර් 30-ඔක්තෝබර් 02 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ "සහසක් නිමැවුම්" ජාතික

නව නිපැයුම් ප්‍රදර්ශනයේදී කාණ්ඩ දෙකක විවෘත අංශවලින් දෙවන සහ තෙවන ස්ථාන හිමි කර ගත්තේය.

- අයි.පී.ජී.එච්.යු. දිසානායක මහතාද එම ප්‍රදර්ශනයේදී කාණ්ඩ දෙකක විවෘත අංශවලින් ප්‍රථම සහ තෙවන ස්ථානය හිමිකර ගත්තේය.

**බාධක සහ පිළියම්**

පශු ශික්ෂණ රෝහල මඟින් සපයාදෙනු ලබන සේවාවන්ගේ කොටසක් ලෙස රෝගී වනසතුන් ස්ථානගත කිරීම සඳහා බිම්කඩක් පීඨය විසින් හඳුනාගෙන ඇත. මෙම කාරණය සඳහා එකී භූමි භාගයට පිවිසෙන මාර්ගයේ කටයුතු විශ්වවිද්‍යාල පරිපාලනය විසින් අවසන් කළයුතුව ඇත.

**අනාගත සැලසුම්**

යටිතල පහසුකම් සංවර්ධනය

- පීඨයේ අනාගත පරිපාලන ගොඩනැගිල්ල ලෙස පරණ සායනික ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පවරා ඇති පරිදි එක් සිසු කණ්ඩායමක සිසුන් 100කට සරිලන පරිදි දේශන ශාලා සහ විද්‍යාගාර දීර්ඝ කිරීම.

අධ්‍යයන වැඩසටහන

- පීඨයේ විෂය නිර්දේශයන් විස්තරාත්මකව අඩංගුවන පොතක් සංග්‍රහ කිරීම.
- අවශ්‍ය මානව සම්පත් හා මුදල් නිසිකලට ලැබුණහොත් (MVSc) පශු වෛද්‍ය විද්‍යාපති තුන්වන සිසු කණ්ඩායමේ සිසුන් ලියාපදිංචි කිරීම.

## A9 පශ්චාත් උපාධි ආයතන

### A9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(අධ්‍යක්ෂ, මහාචාර්ය බී.සී.එන්. පීරිස් විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

මෙරට ප්‍රථම කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ලෙස 1979 අංක 09 දරන ආඥා පනතේ වගන්තිවලට අනුව කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1975 වසරේ ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදි. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කළමනාකරණ මණ්ඩලයේ මගපෙන්වීම යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම ආයතනය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වුයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා දේශීය වශයෙන් ඉඩ ප්‍රස්ථාවන් සංවර්ධනය කිරීමට සහ මෙරට සීඝ්‍රයෙන් පුළුල් වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් පිරිසක් බිහිකිරීමය. ශතවර්ෂ කාලක පමණ කාලයක් පුරා මෙම ආයතනය මෙම ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් සේවය සලසා ඇති අතර එය වර්තමානය වන විට මෙරට මෙන්ම කළාපයේද කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස පිහිටා ඇත.

පසුගිය වසර 37ක කාලය තුළ මෙම ආයතනය ශිෂ්‍ය බඳවා ගැනීමේදී සැලකියයුතු ප්‍රගතියක් ලබා ඇත. 2011/12 අධ්‍යයන වර්ෂය තුළ විවිධ අධ්‍යයන වැඩසටහන් සඳහා බඳවාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 411කි. 2012 වර්ෂයේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් ප්‍රමාදවූ ශිෂ්‍ය ප්‍රවේශයන් ආයතනය විසින් අවසන් නොකළ නිසා ශිෂ්‍ය සංඛ්‍යාව පහත වැටිණ. දර්ශනපති සහ දර්ශනශූරී උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරන ලද්දේ සිසුන් 26 දෙනෙකු පමණි.

2012 වසරේදී සිසුන් 315 දෙනෙකු ඔවුන්ගේ උපාධි සහ ඩිප්ලෝමා අවසන් කළහ. ඔවුන් අතුරින් 216 දෙනෙකු විද්‍යාපති උපාධිය ද, ව්‍යාපාර පරිපාලනපති උපාධිය 04 දෙනෙකු ද 22දෙනෙකු දර්ශනපති උපාධිය ද, දසදෙනෙකු දර්ශනපති උපාධිය ද, දසදෙනෙකු දර්ශනශූරී උපාධිය සහ 27 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමා ද ලබාගත්හ.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාවට පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ, ශාස්ත්‍ර පීඨයේ, විද්‍යා පීඨයේ, වෛද්‍ය ආදි විවිධ පීඨවල උපාධිධාරීන් මෙන්ම විදෙස් සිසුන් ද ඇතුළත් වෙති. බංගලාදේශය, ඉන්දියාව, චීනය, නේපාලය, මියන්මාරය හා ඕමාන්, ගහනාව යන රටවල සිසුන් මේවන විටත් ඔවුන්ගේ පශ්චාත් උපාධි කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් අවසන් කොට ඇත

**ජයග්‍රහණ**

**ප්‍රදාන**

- කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය "climate resilience of upland cropping systems through adaptive crop and soil management and appropriate integrated pest management" යන තේමාවෙන් යුතු පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා දර්ශනපති සිසුන් සිව් දෙනෙකු(4)සහ දර්ශනශූරී සිසුන් සිව්දෙනෙකු පුහුණු කිරීම සඳහා HETC ව්‍යාපෘතියේ ප්‍රදානයක් ලබාගන්නා ලදි.

- CIC ආයතනයට අදාළ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීම වෙනුවෙන් ආයතනයේ පර්යේෂණ සිසුවෙකුට එම ආයතනය (CIC) සම්පූර්ණ මුදල් ලබාදීමට එකඟ විය.
- දර්ශනපති පර්යේෂණ උපාධි සඳහා මූල්‍යමය සහයෝගය ලබාගැනීම සඳහා IDRC සමඟ සාකච්ඡා පවත්වන ලදි.
- කෘෂිකර්ම අමාත්‍යංශය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වී බෝකිරීම, දෙමුහුන් නිෂ්පාදන හා කාලගුණය යන ක්ෂේත්‍රවලට අදාළ මෙම ආයතනයේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමට එකඟ විය.

**අවබෝධතා ගිවිසුම්**

මෙල්බර්න් පර්යේෂණ උපාධි විද්‍යා පීඨය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඒකාබද්ධව දර්ශනශූරී උපාධියක් පිරිනැමීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදි. මෙම උපාධිය පිරිනමනු ලබන්නේ පේරාදෙණිය විශ්විද්‍යාලය විසිනි.

**පහසුකම්**

පර්යේෂණ සිසුන්ගේ ක්ෂේත්‍ර චාරිකා සඳහා යොදා ගැනීම පිණිස කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි අයතනය අලුතෙන් වහනයක් මිලදී ගන්නා ලදි. සිසුන් ඇතුළත් කර ගැනීම, ශිෂ්‍ය තොරතුරු හා පරිපාලනය යන කාර්යයන් ඇතුළත්ව කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සියලුම කටයුතු ස්වංක්‍රීය කිරීම සඳහා පියවර ගෙන ඇත. 2012 වර්ෂය අවසාන වන විට මෙම කාර්යයේ 85%ක පමණ වැඩ කොටසක් අවසන් කොට ඇත. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගගත (online) ක්‍රියාකාරකම් පිළිබඳ සිසුන්ගෙන් ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා පද්ධතියක් හඳුන්වාදී ඇත. පහසු ප්‍රවේශය සඳහා සියලුම සිසුන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විද්‍යුත් තැපැල් (e mail) ලිපිනයන් සංගෘහිත කිරීම අවසන් කරන ලදි. ආයතනයේ පංති කාමරවල පහසුකම් පුළුල් කිරීම සඳහා සියලුම පංති කාමරවල මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර සවිකරන ලදි.

ආයතනයේ සියලුම පාඨමාලා සඳහා වන ගාස්තු ව්‍යුහයන් වෙනස් කොට ඇත. සිසුන්ට ඔවුන්ගේ පාඨමාලා සඳහා එකවර සම්පූර්ණ මුදල ගෙවනවා වෙනුවට වාරික ක්‍රමයට මුදල් ගෙවීම් කිරීමේ පහසුකම පුළුල් කරන ලදි.

**සම්මන්ත්‍රණ/වැඩමුළු**

පහත සඳහන් වැඩමුළු හා සම්මන්ත්‍රණ සාර්ථකව ආයතනයේදී පවත්වන ලදි.

- ජපානයේ සයිතමා විශ්වවිද්‍යාලයේ හා සිංගප්පූරුවේ ජාතික තාක්‍ෂණික විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව capnet ව්‍යාපෘතිය විසින් සංවිධානය කරනු ලබන නාගරික වැව් පරීක්‍ෂණය හා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය.
- නේපාල රජයේ ඉල්ලීම පරිදි එම රජයේ විධායක නිලධාරීන් හත්දෙනෙකු (07) සඳහා ජාත්‍යන්තර පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.
- ජාත්‍යන්තර සැලසුම් පෝෂක ආයතනය (IPNI) සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ පාංශු පෝෂක කළමනාකරණයේ නූතන ප්‍රවණතා පිළිබඳ වැඩමුලුවක් දෙසැම්බර් මාසයේදී පවත්වන ලදි.

**වාර්ෂික සමුළුව 2012**

24 වැනි වාර්ෂික සමුළුව නොවැම්බර් මස 15-16 යන දෙදින තුළ පවත්වන ලදි. තාක්ෂණික සැසි 03කින් යුක්ත වූ මෙම දෙදින සමුළුවට දෙස් විදෙස් පුද්ගලයන් 550ක් පමණ සහභාගි වූහ. ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේ (IWMI) අධ්‍යක්‍ෂ ජෙනරාල් ජෙරමි බර්ඩ් මහතා එහි ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. ලැබුණ පර්යේෂණ පත්‍ර 58කින් 30ක් ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් අතර වෙනත් පත්‍ර 15ක් පෝස්ටර ලෙස ඉදිරිපත් කිරීම සඳහා තෝරාගන්නා ලදි.

**සේවක තනතුරු**

හිටපු සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී මාරුවීම්/උසස්වීම් ලබා පුරප්පාඩු වූ තනතුරු දෙක පිරවීම සඳහා අලුතින් ජ්‍යෙ.ස. මූල්‍යාධිකාරීවරයෙකු සහ සහකාර ලේඛකාධිකාරීවරයෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනයට පත්කර එවන ලදි. ආයතනයේ නිර්දේශ මත කොන්ත්‍රාත් පූර්ණ කාලීන පදනම මත වර්ෂයක කාලයක් සඳහා සම්බන්ධිකාරකවරයෙකු විශ්වවිද්‍යාලය විසින් පත්කොට

ඇත. ඊට අමතරව සේවය දීර්ඝ කළ හැකිවන පරිදි මාස හයක කාලයක් සඳහා රියදුරෙකු අනුයුක්ත කොට ඇත.

**මූලධන කටයුතු**

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශ්‍රාම ශාලාව දීර්ඝ කිරීම මෙම ආයතනයේ පැරණි ගොඩනැගිල්ලේ නවීකරණයත්, පංතිකාමරවල ලී බඩු සවිකිරීම් 2012 වසරේ වැඩ ආරම්භ කළ ගොඩනැගිලි සංකීර්ණයේ වර්ණ ගැල්වීම ඇතුළු කාර්යයන් සඳහා රුපියල් 500,000/ කට වැඩි මූලධන වියදම් වෙනුවෙන් භා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබිණ. ඒ අනුව අවශ්‍ය වෙනත් තාක්ෂණික ලේඛන සකස් කිරීම පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තු සේවාවන් ලබාගන්නා ලදි.

**බාධක සහ පිළියම්**

අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සංගම් ක්‍රියාමාර්ගය නිසා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කටයුතුවලට වර්ෂයේ මුල් භාගය තුළදී ප්‍රබල ලෙස බලපෑම් ඇති කළේය. කෘෂිවිද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ගය දින 100ක් පුරා පවත්වාගෙන යන ලද අතර මෙම කාලය තුළ කාෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය නව පාඨමාලාවන් සඳහා දැන්වීම් පළකර තිබිණ. අයදුම් පත්‍ර (900ක්) නව සියයක් පමණ ලැබී තිබුණ අතර අධ්‍යයන මණ්ඩල ක්‍රියාකාරී නොවී පැවතුණු හෙයින් එම අයදුම්පත්‍ර සැලසුම් කිරීම ප්‍රමාද විය. සාමාන්‍ය වශයෙන් මෙම ආයතනය එහි පළමු සමාසිකය සැත්තැම්බර් මාසයේදී ආරම්භ කළ ද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංගම් ක්‍රියා මාර්ගය නිසා සිසුන් ඇතුළත් කරගැනීම ප්‍රමාද විය. මෙලෙස 2012 වසරේ කාෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නව ඇතුළත් කරගැනීම සිසුන් 26 දෙනෙකුට සීමා විය. පෙර වසර හා සසඳන විට උපාධි ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ මට්ටමක පැවති නමුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග නිසා පැවැත්වීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ පහසු කරවීමේ අරමුදල යටතේ මෙම ආයතනය දර්ශනශූරී සිසුන් තිස්දෙනෙකු සහ දර්ශනපති සිසුන් දෙදෙනෙකුගේ පර්යේෂණ පහසුකරවීම සඳහාත් ගහනාවේ යෙෂූආ තාක්ෂණික ආයතනය සමඟ split උපාධි පාඨමාලාවක් පැවැත්වීම සඳහාත් කෘෂිවිද්‍යාව ජත්‍යන්තරව ප්‍රචලිත කරවීම සඳහාත් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී සාකච්ඡා පවත්වන ලදි. මේ පිළිබඳව අවබෝධතා ගිවිසුම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති හා ගහනා විශ්වවිද්‍යාලයේ සභාපති විසින් අත්සන් තබනු ඇත. ආයතනය විසින් පර්යේෂණ සිසුන්ට අනුග්‍රහය දක්වන ලෙස සංවිධාන, ආයතන හා අමාත්‍යංශ කීපයකින් ඉල්ලීම් කර ඇති අතර මේ පිළිබඳ අමාත්‍යංශ/දෙපාර්තමේන්තු කීපයක් සාකච්ඡා පවත්වා ඒවායින් සුබවාදී ප්‍රතිචාර ලැබී ඇත.

## A 9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(අධ්‍යක්ෂ, මහාචාර්ය බී.එස්.බී. කරුණාරත්න විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ජාතික ආයතනයකි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පණතකින් 1996 වසරේදී විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනය පර්යේෂණ හා සංවර්ධනය ඉහළ නැංවීම සඳහායි. මෙම ආයතනය ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වූයේ උපාධිධාරී අධ්‍යයන අත්දැකීම් ඉහළනංවමින් විවිධ විද්‍යාත්මක අංශයන්ට අදාළ පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව හා පර්යේෂණ ලබාදී ඉහළ නැංවීමය.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විද්‍යාපති, දර්ශනපති, දර්ශනශූරී උපාධි වැඩසටහන් මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලොමා හා සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබන අතරම නේවාසික පුහුණු වැඩසටහන් කෙටි පාඨමාලා හා වැඩමුළු ද පවත්වනු ලබයි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම වැඩසටහන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ අටෙන් මෙන්ම වෙනත් විශ්වවිද්‍යාලවලින් හා ආයතනවලින් සැදුම්ලත්ය. මෙම ආයතනය ප්‍රාදේශීය කර්මාන්තවලට හා රාජ්‍ය/පුද්ගලික අංශයේ ආයතන සඳහා ද උපදේශන සේවාවක් ද පරිනමනු ලබයි. ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ප්‍රංශය, දකුණු කොරියාව හා වෙනත් රටවල ජාත්‍යන්තර ආයතන සමඟ එක්ව විවිධ හා සහයෝගිතා පර්යේෂණ වැඩසටහන් ද දියත්කර ඇත.

**ජයග්‍රහණ**

සිසුන් 94 දෙනෙකුගෙන් සමන්විත විද්‍යාපති වැඩසටහන් හතරක් හා සිසුන් 22දෙදෙනෙකුගෙන් සමන්විත පශ්චාත් උපාධි ඩිප්ලෝම වැඩසටහනක් 2012 වසරේදි අරම්භ කරන ලදි. ඊට අමතරව නව දර්ශනශූරී සිසුන් 33 දෙනෙකු එම වසරේදී ලියාපදිංචි වූහ. එමෙන්ම 2012 වසරේ දර්ශනශූරී සිසුන් දෙදෙනෙකු දර්ශනපති සිසුන් 13 දෙනෙකු, විද්‍යාපති සිසුන් 79 දෙනෙකු, උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සිසුන් 56 දෙනෙකු ඩිප්ලෝමා ද ලබාගත්හ.

2012 වසරේදී විදෙස් විද්‍යාඥයන් පිරිසක් විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පැමිණ සමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන්, වැඩමුළු හා කෙටි පාඨමාලාවල දේශන පැවැත්වූ අතර සම්පත්දායක පුද්ගලයන් ලෙස ද සේවය කළහ. ඔවුන් අතර ඊශ්‍රයාලයේ කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ ආචාර්ය ස්ටැන්ලි ෆිමන්, එම ආයතනයේම මහාචාර්ය ෂිව්මෙන්ඩෙල්, ඕස්ට්‍රේලියාවේ ක්වින්ලැන්ඩ් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පද්දති පීඨයේ මහාචාර්ය කුන්ලි ඔලෝ වෙනී, ඇමෙරිකාවේ ඔස්ටන්හි ටෙක්සස් විශ්වවිද්‍යාලයේ ඖෂධවේද පීඨයේ ආචාර්ය නිහාල් බංඩාර, (ජපානයේ ඔයාමා ප්‍රිපෙක්චරල් විශ්වවිද්‍යාලයේ පරිසර ඉංජිනේරු අධ්‍යයන අංශයේ සභාපති) මහාචාර්ය ටොමොනෝරි කවකාමි, ඇමරිකාවේ ප්ලොරිඩා විශ්වවිද්‍යාලයේ වනජීවී පරිසර හා සංරක්ෂණ අංශයේ මහාචාර්ය කන්රින්සිවිං හා ඇන්ග්යුමාන්හුවා, විධායක අධ්‍යක්ෂ, එන්.එම්.එස්.අයි. අරඹේ පොල මහතා, තායිලන්තයේ ආසියානු ආපදා සැලසුම් මධ්‍යස්ථානයේ සිසිර කුමාර මහතා, ආචාර්ය බුද්ධි වීරසිංහ හා ආචාර්ය මුතාරිකා ප්රුක්සපොං, තායිලන්ත චියං මායි විශ්වවිද්‍යාලයේ ආචාර්ය ලිවා පාඩිනායිසොං-චයිපැනිඩ් ද වූහ.

ජාතික වැදගත්කමකින් යුතු මුළු ක්‍රියාකාරකම් 19ක් (වැඩමුළු, කෙටි පාඨමාලා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ආදිය) 2012 වසරේදි සාර්ථකව පවත්වන ලදි. මෙම ක්‍රියාකාරකම්වලට විවිධ ක්ෂේත්‍රයන්වලින් සහභගි වූ 578 දෙනෙකු ප්‍රතිලාභ ලැබූහ. කෙටි පාඨමාලා 12ක්, වැඩමුලු 4ක්, පුහුණු වැඩසටහනක්,

ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක්, සමුළුවක් හා පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාවක් මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් වූහ. ADPC සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබූ අතර ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව සිසුන්ට සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්ගේ ක්ෂේත්‍ර චාරිකා සහ අධ්‍යයන චාරිකා ශක්තිමත් කිරීම පිණිස ආසන 30ක බස් රථයක් මිළදී ගන්නා ලදි. විද්‍යා පීඨය සමග ඒකාබද්ධව 21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන (HETC) ප්‍රදාන (පශ්චාත් උපාධි පර්යේෂණ) බාරදූන් යෝජනාව සාර්ථක විය. මෙම ප්‍රදානය යටතේ මිලියන 30ක් ප්‍රදානය කෙරෙන අතර දර්ශනශූරී සිසුන් නව දෙනෙක් පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලී සිටිති.

1. සූර්ය බලශක්ති සංරක්ෂණය සඳහා desensitized solar cells සංවර්ධනය.
2. Assessing geo-thermal energy development potential in thermal spring areas of Sri Lanka
3. Development of nanoclay-polymer materials as low-cost oxygen reduction electrodes for fuel cell applications
4. Development of modified photo chromic compounds with improved properties for use in molecular electronics.
5. Assessment of antimicrobial agents in plant-mineral formulations
6. Improving the bioavailability of natural bioactive components for drug and cosmetic based applications
7. Assessment of environmental impacts of the Mahaweli DiveÍion Scheme in selected downstream locations
8. Role of small mammals as reservoir hosts of rickettsioses and leptospirosis in Sri Lanka

වත්කම් නැවත තක්සේරුව සහ නිසි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම දීර්ඝ කාලයක සිට විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට දැණුනු අවශ්‍යතාවයකි. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව හරහා වත්කම් නැවත තක්සේරු කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලද අතර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම සඳහා පරිගණක පැකේජයක් මිළදී ගන්නා ලදි. භාණ්ඩ ලේඛන පරීක්ෂාව, භාණ්ඩ ස්ථානගත කිරීම, භාණ්ඩවල ක්ෂය වූ අගය ආදිය ව්‍යවස්ථාදායකමය ක්‍රියාමාර්ග සඳහා වන ඉල්ලීම්වලට ක්ෂනිකව ප්‍රතිචාර දැක්වීම සහ ස්වංක්‍රීයකරණය තහවුරු කරණු වස් මෙය ඉවහල් වනු ඇත.

**බාධක සහ පිළියම්**

දුර්වල සිසුන්, අදාළ සේවා ස්ථානවලින් නිවාඩු ලබාගැනීම යන හේතු නිසා උපාධිලාභීන්ගේ සංඛ්‍යාව පහත වැටීමට හේතු වන අතර පර්යේෂණ ව්‍යාපෘති/උපාධි නිබන්ධන සම්පූර්ණ කිරීම ප්‍රමාදවීමට පරිපාලන ක්‍රියාමාර්ගවල පවතින දීර්ඝ කාලීන ප්‍රමාදයන් හේතු වේ. ව්‍යාපෘති වාර්තා/උපාධි නිබන්ධනවල ගුණාත්මකභාවය දියුණු කිරීමට හා ඒවා නිසි වේලාවට අවසන් කිරීම සඳහා විසඳුම් වශයෙන් පියවර කිහිපයක් ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2006 සිසු කණ්ඩායම දක්වා පැවති ගැටළු නිරාකරණය කර ගැනීමට අපට හැකි විය. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තරුණ පර්යේෂණ සංසදය හරහා දර්ශනපති හා දර්ශනශූරී සිසුන් දැනුවත් කිරීම ඒ හා සමාන උත්සහයන් ගෙන ඇත. එම උත්සහයන්ගේ ප්‍රතිඵල ලෙස පසුගිය උපාධි ප්‍රදානෝත්සවයේදී දර්ශනශූරී සිසුන් දෙදෙනෙකු, දර්ශනපති සිසුන් 13කු හා විද්‍යාපති සිසුන් 79 දෙනෙකු උපාධි ලබාගත්හ. ප්‍රදාන පර්යේෂණ අපකරණ සඳහා මුදල් ලබාගත නොහැකිවීම හා පර්යේෂණ ප්‍රදාන නොලැබීම පශ්චාත් උපාධි පර්යේෂණ ශක්තිමත් කිරීමට බලපා ඇති ප්‍රධාන බාධකයන්ය. මාර්ගගත විද්‍යා වාරසඟරාවන්ට ප්‍රවේශවීමට නොහැකිවීම තුළින් ද මෙම ගැටළු තවදුරටත් උග්‍රවේ.

**අනාගත සැලසුම්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැක්ම සහ මෙහෙවරට අනුකූලවන පරිදි ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කෙරේ.

## උපග්‍රන්ථ B - විශ්වවිද්‍යාලයීය ප්‍රධාන මධ්‍යස්ථාන

### B1 කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය පර්යේෂණ හා සමාජ කටයුතු සඳහා විශිෂ්ට ගණයේ මධ්‍යස්ථානයක් බවට පත්වීමේ ඉලක්කයෙන් යුතුව 2003 වසරේදී ස්ථාපිත කරන ලදි. මෙරට රාජ්‍ය හා පුද්ගලික යන දෙපාර්ශවයේම සංවිධානවලට සේවා මධ්‍යස්ථානයක් ලෙස සේවය කිරීම සඳහා ජාතික ප්‍රමුඛතාවය, ඉගැන්වීම හා පුහුණුව මත පදනම් වූ ජෛව තාක්ෂණය හා සම්බන්ධ වූ කෘෂිකාර්මික පර්යේෂණ ක්‍රියාත්මක කරන මධ්‍යස්ථානයක් ලෙස කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය හඳුනා ගෙන ඇත.

මෙම මධ්‍යස්ථානයේ පවතින සම්පත් ඖෂධ, රසකැවිලි, බීම වර්ග වැනි ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය වටිනා තාක්ෂණයන් දියුණු කිරීමට සීමාවනවාට වඩා පාරිසරික, වෛද්‍ය, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය, දේශිය වෛද්‍ය හා ඉංජිනේරු විද්‍යාව වැනි ජෛව තාක්ෂණයේ විවිධ අංශ ආවරණය වන පරිදි උපයෝගි කර ගත හැකිය. මෙම මධ්‍යස්ථානය පවත්වා ගෙන යනු ලබන්නේ විශ්වවිද්‍යාලයෙන් සපයන මුදල් හා උපයා ගන්නා ලද අදායම්වලිනි. මධ්‍යස්ථානය සඳහා මුදල් උපයා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් වෙනුවෙන් ප්‍රායෝගික පාඨමාලා, පර්යේෂකයන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමෙන් සහ වෙළඳ ගිවිසුම් තුළිනි.

**ජයග්‍රහණ**

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය 2012 වසරේදි පේරාදෙණිය, රජරට, ඌව වෙල්ලස්ස, හා වයඹ යන විශ්වවිද්‍යාලවල ප්‍රථම හා පශ්චාත් උපාධි සිසුන් සඳහා විද්‍යාගාර ඉදිරිපත් කිරීම්/ප්‍රායෝගික පන්ති හතක් පවත්වා ඇත. මෙම මධ්‍යස්ථානය විසින් පාඨමාලා කීපයක් සඳහා නාමික ගාස්තුවක් අයකරණු ලබයි විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා ද මෙම මධ්‍යස්ථානයේ පවතින සම්පත් පරිහරණය කරනු ලබයි.

**බාධක සහ පිළියම්**

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ටිෂු කල්ච පැලැටි දියුණු කොට ඉල්ලීම්වලට අනුව කර්මාන්තවලට ඒවා අලෙවි කරනු ලබයි. කෙසේ වෙතත් විද්‍යාගාරය පරිහරණය කළ නොහැකි තත්ත්වයේ පැවතීම හා නිසි පහසුකම් සහිත තාක්ෂණික සහනයක් නොමැතිවීම නිසා මෙම කාර්යය වර්ෂය අවසානය තෙක්ම කරගෙන යාමට නොහැකි විය. 2011 වසරේ සැප්තැම්බර් මස විද්‍යාගාර සායනයක් ලියාපදිංචි කිරීමෙන් පසු ටිෂු කල්ච විද්‍යාගාරයේ ක්‍රියාකාරිත්වය නිසි ආකාරයෙන් සිදුනොවිණ. වර්තමානය වනවිට ටිෂුකල්ච විද්‍යාගාරයට වගකිවහැකි කිසිදු පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු අප සතුව නැත.

2012 වසරේ ඔක්තෝබර් මස අවසානය වනතෙක්ම අළුත් ස්වේච්ඡා පුහුණුවන ශිෂ්‍යාවක් ටිෂු කල්ච විද්‍යාගාරයේ කටයුතු ඇය ඉල්ලා අස්වන තුරු කරගෙන යාමට සමත්වුවාය. පුහුණු කාර්මික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ස්වේච්ඡා සිසුවෙකුගේ සහයෙන් විද්‍යාගාරයේ කටයුතු ආරම්භ කිරීමට යෝජනා කෙරේ.

**අනාගත සැලසුම්**

ICEI/ විදෙස් (ඉතාලිය) විසින් ලබාදෙන මුදල්වලින් වාණිජ කාර්යයන් සඳහා ජීව පොහොර නිපදවීම අරමුණු කොටගෙන නව විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදි. මෙතුළින් ගොවීන් අතර බෙදා හැරීම සඳහා වාණිජ මට්ටමින් එන්නත් සංවර්ධනය කිරීමට ඉලක්ක කෙරේ. මීට අමතරව, පාංශු, ජලය හා පැලෑටිවල ක්ෂේත්‍ර විශ්ලේෂණය සඳහා නව විද්‍යාගාරයක් සංවර්ධනය කිරීමට හා ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ හරිතාගාර ඉහළ නැංවීම යන කරුණු කෘෂිවිද්‍යා පීඨය විසින් බාරදෙන ලද QIG යෝජනාවට ඇතුළත් කොට ඇත. ඉල්ලුම මත මෙන්ම විවෘත දැන්වීම් හරහා ද පුළුල් පරාශයක සිටින සේව්‍යයන්ට හා ඒ සඳහා අභිරුචියක් දක්වන වෙනත් පුද්ගලයන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් කිහිපයක් සැලසුම් කොට ඇත.

## B2 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය ඒ.ජී.එච්.ජේ. එදිරිසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය 1979 වසරේ ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශයට හා සමාන්තර වේ. සංවර්ධන අවධීන් කිහිපයක් හා විවිධ නම්වලින් හැඳින්වීමෙන් පසුව "දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය" යන නව නාමයෙන් යුතුව වර්තමාන පරිපාලන ව්‍යුහය 2007 වසරේ අප්‍රේල් මාසයේදී ක්‍රියාකාරිත්වයට පැමිණියේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලසුමේ සඳහන් "විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම" යන අරමුණ සපුරා ගැනීම  මෙය ස්ථාපිත කිරීමේ ඉලක්කය වේ.

තවදුරටත් වෘත්තීය ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට සමාන අවස්ථාවන් ලබාදීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ දැක්ම වේ. "අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නන්ට බාධාවකින් තොරව අධ්‍යාපන අවස්ථා සපයා දෙමින් සියලුම දෙනාට අධ්‍යාපනය ලබාදීම" එහි මෙහෙවර ලෙස මෙම මධ්‍යස්ථානය හඳුනා ගෙන ඇත.

උපකුලපති විසින් සභාපතිත්වය දරන දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ පාලනය යටතේ මෙම මධ්‍යස්ථානය පවතින අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු විසින් මෙහි අර්ධ කාලීන අධ්‍යක්‍ෂවරයෙකු ලෙස ප්‍රධානත්වය දරනු ලබයි. තවද, ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් තිදෙනෙකු නියෝජ්‍ය අධක්‍ෂවරුන් ලෙස අධ්‍යක්‍ෂවරයාට සහය වෙති. එහි පරිපාලන ක්‍රියාකාරිත්වය ලේඛකාධිකාරීවරයාගේ පාලනය යටතට වැටෙන අතර මූලිකව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙකු හා සහකාර මුල්‍යාධිකාරීවරයෙකු විසින් එය කලමනාකරණය කරනු ලබයි. ලිපිකාර හා සම ශ්‍රේණිවල අධ්‍යයන කාර්ය මණ්ඩලය 17දෙනෙකුගෙන් සමන්විත වන අතර කාර්මික ශ්‍රේණියේ දෙදෙනෙකු හා අර්ධ පුහුණු සිව් දෙනෙකු සිටිති.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යයන පරිපාලනය විශ්වවිද්‍යාල පනතේ මධ්‍යස්ථාන හා පීඨවලට අදාළ නීතිවලට අනුව සිදුවේ. 1979 වසරේ සිට පවත්වනු ලබන ශාස්ත්‍රවේදී උපාධිය හා 2008 වසරේ ආරම්භ කළ ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) යන උපාධි වැඩසටහන පමණක් වර්තමානයේදී ක්‍රියාත්මක වේ. මෙම උපාධි දෙක අධ්‍යයන මණ්ඩල දෙකක් යටතේ පවත්වනු ලබන අතර ඒවා අනුමත කරන ලද්දේ ශාස්ත්‍ර පීඨය, අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුව හා පේරාදෙණිය විශ්වවිද්‍යාලෙයේ සනාතන සභාව විසිනි.

**2012 වසරේ ජයග්‍රහණ**

බාහිර උපාධි වැඩසටහන් සඳහා විසිවන ශත වර්ෂයේ උසස් අධ්‍යාපනය (HETS) සඳහා සකස් කළ යෝජනාව මූලිකවම පිළිගත් අතර බාහිර උපාධි වැඩසටහන් හා ඒවා සම්බන්ධ කටයුතු සංවර්ධනය කිරීමේ කාර්යයන් ආරම්භ කරන ලදි.

2012 වසරේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ලැයිස්තුව

- ශාස්ත්‍රවේදී උපාධිය සඳහා නවක සිසු කණ්ඩායම 2012 ජනවාරි මාසයේදී ලියාපදිංචි කරන ලදි.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි සඳහා නවක සිසුන් ලියාපදිංචි කරන්නට විය.
- විෂය නිර්දේශ සංශෝධනය පිළිබඳ වැඩමුළු දෙකක් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රියදුරන් වෙනුවෙන් ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදි.
- ශාස්ත්‍රවේදී උපාධියට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සහ ශාස්ත්‍රවේදී උපාධිය ඉලක්ක කොට ගෙන බාහිර උපාධි අපේක්ෂකයන් සඳහා සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදි.

**අනාගත සැලසුම්**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පහසුකම් දියුණු කිරීම සඳහා මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය (BOM) හරහා ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව (LBMC) වෙත යෝජනාවක් බාරදෙන ලදි. මෙතුළින් කාර්ය මණ්ඩලයට දියුණු වූ වැඩ කිරීමේ පරිසරයක් ද ආගන්තුකයන්ට හා වෙනත් පුද්ගලයන් සඳහා ප්‍රසන්න පරිසරයක් ද සැපයෙනු ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නඩත්තු ඉංජිනේරු අංශය මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සමග එක්ව සැලසුම් සකස් කරමින් සිටි.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය බාහිර උපාධි වැඩසටහන්වල විෂයමාලාවන් සංශෝධනය කිරීම සඳහා සැලසුම් කරමින් සිටි. මෙම මධ්‍යස්ථානය උපකාරක පංති පවත්වන ආයතන සමග සබඳතා ස්ථාපිත කොට ගෙන ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට ද සැලසුම් සකස් කරමින් සිටි. බාහිර උපාධි වැඩසටහන්වලදී උපකාරක පංති පවත්වන මධ්‍යස්ථානවල කාර්යභාරය පිළිගැනීම පිණිස තෝරාගත් උපකාරක පන්ති පවත්වන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් තබනු ඇත.

ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) උපාධිය සඳහා පිරිනැමෙන වත්මන් පාඨමාලා ව්‍යුහය සංශෝධනය කිරීම සඳහා සැලසුමක් පවතින අතර සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයක් සඳහා මෙම මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු සංවිධිත කිරීමට අප අපේක්ෂා කරමු.

**මුහුණ දුන් දුෂ්කරතා**

පරිපාලන කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් වෙනස්වීම නිසාවෙන් මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට බාධා සිදුවිය.

## B3 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය එස්.බී. විජේකෝන් මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

1993 වසරේ ආසියානු සංවර්ධන බැංකුවේ විද්‍යා හා තාක්‍ෂණ ව්‍යාපෘතියක් ලෙස ස්ථාපිත කරන ලද ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය මේවනවිට ස්වාධීන ඒකකයකි. එය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හස්තයක් වන අතර ඉංජිනේරු පීඨයේ කොටසකි.

විශ්වවිද්‍යාලයේ නීති සහ රෙගුලාසි යටතේ පාලනය වන මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති තීරණ ගනු ලබන්නේ විධායක කමිටුවක් විසිනි. පීඨ මණ්ඩලයේ සාමාජිකයන් පස්දෙනෙකුගෙන් හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සාමාජිකයෙකුගෙන් මෙම කමිටුව සමන්විත වේ.

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 2012 වසරේදී රුපියල් මිලියන 19ක ඇස්තමේන්තුගත මුදලකින් ව්‍යාපෘති සිදුකල අතර නූතන තේමාවන් යටතේ වැඩමුළු 14ක් පවත්වන ලදි. 2012 වසරේදි විශ්වවිද්‍යාලය තුළ පැවති තත්ත්වයන් හේතුවෙන් මෙම වසරේදී පෙර වසර හා තුලනාත්මකව සලකන විට පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව පහත වැටිණ.

මුදල් කමිටුවට යෝජනාවක් බාරදීමෙන් පසු උපදේශකවරුන්ට සහ සේවා සපයන්නන්ට ගෙවීම් කිරීමට මේ වසරේදී මධ්‍යස්ථානයට හැකිවිය. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්වල ගෙවීම් නිසි වේලාවට ගෙවීමට හැකිවන පරිදි පීඨය හරහා විමධ්‍යගත කරන ලදි. උසස් හැකියාවන්ගෙන් යුතු සම්පත්දායක පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් කළමනාකරණය කිරීම සඳහා මෙය සුවිශේෂී පිටුවහලක් හා දායකත්වයක් විය.

2012 වසරේදී ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විවිධ ඉංජිනේරු ක්ෂේත්‍රයන්ට අදාළ විවිධාකාරයේ බලශක්ති විගණන බාරගන්නා ලදි. බොයිලේරු අළුත්වැඩියා කිරීම හා වඩාත් දියුණුකළ කාර්යක්‍ෂම බලශක්ති පද්දතින් තහවුරු කරනු ලබන අතිරේඛ උපාංග මෙම බලශක්ති විගණනයන්ට ඇතුළත් විය.

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය ගෙන බලන විට පදනම් සැලසුම් සමාලෝචනය කිරීම පිණිස අධ්‍යයනයන් සිදුකළ අතර විවිධ ව්‍යුහ තක්සේරු කිරීම ද සිදුකරණ ලදි. පාලම් සැලසුම්කරණය පිළිබඳ වැදගත් නිර්දේශයන් හා ප්‍රමුඛ පෙළේ කොන්ත්‍රාත්කරුවන් සඳහා ජලවිදුලි අධ්‍යයනයන් ද සිදුකරන ලදි.

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ වෙරළබඩ ආපදා සිදුවන ස්ථාන දැක්වෙන සිතියම්වල කටයුතු අවසන් කිරීම සඳහා ඊට අදාළ අංශ දැනුවත් කිරීමේ වැඩසටහනක් UNDP විසින් දියත් කොට ඇත.

දීර්ඝ කාලීන ව්‍යාපෘති සිදුකරනවාට වඩා වැඩමුළු පැවැත්වීම තුළින් ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ මූල්‍යමය තත්ත්වය ඉහළ නංවා ගත හැකි වේ. එමනිසා අපි කර්මාන්ත ක්ෂේත්‍රයේ අභියෝගයන්ට අනුකූලව වැඩමුළුවල තේමාවන් කලින් කලට වෙනස් කරනු ලැබේ. නිදසුන් ලෙස 2005 වසරේදී ඉන්දියාවේ පූනේ "Forbes MaÍhall" සමාගමේ සහයෝගය ඇතිව වාෂ්ප ඉංජිනේරු පාඨමාලා පවත්වනු ලැබිණ. මෙම සැසිවලට සහභාගිවූවන් මහත් ඉහළින් ඒවා පැසසුමට ලක්කළහ. ඒ අනුව ඉංජිනේරු සැලසුම් මධස්ථානයේ නියෝජිතයන් 2011 වසරේදී Forbes MaÍhall සමාගමට ගොස් මෝඩියුල පිළිබඳ බොහෝසේ කටයුතු කොට ඒවායේ අවශ්‍යතාවයන්ට අනුව 2011 වසරේදී ඒවා වෙනස් කරන ලදි. අප මේ වසරේදී වඩාත් ඉහළ නැංවූ පාඨමාලා දියත් කොට ඇති අතර එම පාඨමාලා සහභාගිවූවන්ගේ ඇගයීමට ලක්ව ඇත. තවද අප ප්‍රසිද්ධ ආයතන සඳහා ඔවුන්ගේ සංවිධානාත්මක හැකියාවන් ඉහළ නැංවීම පිණිස "tailor-made" පාඨමාලා රාශියක් පවත්වා ඇත.

කෙසේ වෙතත් ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ අවසන් පරමාර්ථය වනුයේ කාර්ය බහුල පරිසරයක ස්වයං පැවැත්මක් සහිත ස්වාධීන සංවිධානයක් බවට පත්වීම සහ එහි හරවත් සක්‍යතාවයන් විසුරුවාලමින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතාවයන් ලබාදෙන තරඟකාරීත්වයක් අත්කර ගැනීමයි.

2012 වසරේදී මෙහෙය වූ ප්‍රධාන ව්‍යාපෘති

| අංකය | විස්තර |
| --- | --- |
| 1 | මධ්‍යම පළාත් මහ ඇමති කාර්යාලය සඳහා මෘදුකාංග පද්ධතියක් සැලසුම් කිරීම පිණිස උපදේශන සේවා සැපයීම. |
| 2 | ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙරළ සංරක්‍ෂණ අංශය සමග සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ආපදා සිදුවන ස්ථාන ඇතුළත් සිතියම් සකස් කිරීම- අනුග්‍රාහක ආයතන - UNDP |
| 3 | උඩරට සංවර්ධන අධිකාරියේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති පහක් වෙනුවෙන් අතුරු ගෙවීම් සහතික කිරීම. |
| 4 | මිනිපේ ජල අමුණ සහ මිනිපේ ඇළේ අවසාදනය සහ ජලයේ ගුණාත්මකභාවය පරීක්‍ෂා කිරීම සහ මහවැලි “D” කළාපයට ප්‍රවාහනය කිරීම. |
| 5 | මාතලේ අලුවිහාරේ උසස් තාක්‍ෂණික පුහුණු ආයතනයේ හත්වන සහ අටවන සිසු කණ්ඩායම නිරීක්‍ෂණය හා ඇගයීමේ උපදේශන සේවාව. |
| 6 | නායිසෙයි සංස්ථාව සඳහා කැළණි ගඟේ ජල අධ්‍යයනය. |
| 7 | කැලණි ගඟේ තාවකාලික coffer වේලි සහිත පාලම් තුනක් සඳහා ජල අධ්‍යයනය (අමතර කටයුතු). |
| 8 | තක්සේරු දෙපාර්තමේන්තුව සඳහා විදුලිය සවිකිරීමේ සහතිකය. |
| 9 | පැරණි ලක්‍ෂපාන පවතින කොන්ක්‍රීට් ව්‍යුහයේ ශක්තිය පරීක්‍ෂා කිරීම. |
| 10 | මැදිරිගිරිය කවුඩුළු ඔය හරහා පයිප්ප පාලම සැලසුම් කිරීම පිළිබඳ උපදේශන සේවය. |
| 11 | Ceytea හි බලශක්ති විගණනය සහ සැකසුම් අධ්‍යයනය |
| 12 | Scouring Analysis and Protection of Kalani Bridge pieÍ For Thaisie Corporation |
| 13 | තෙල්දෙණිය මූලික රෝහල සඳහා ස්ථාන පරීක්‍ෂණ වාර්තාව. |
| 14 | දික්ඔය දිස්ත්‍රික් රෝහලේ- විදුලි සවිකිරීම් පද්දතියේ සැලසුම් සමාලෝචනය. |
| 15 | දඹුල්ල රෝහලේ නව ශල්‍යාගාර ගොඩනැගිල්ලේ පිපිරීම්. |
| 16 | B-10 මාර්ග ව්‍යාපෘතියේ අසාර්ථක මාර්ග අංශ පිළිබඳ ස්ථාන පරීක්‍ෂණ වාර්තාව |

2012 වසරේදී ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද වැඩමුළු සහ පාඨමාලා

| අංකය | විස්තර | 2012 වසරේ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 2012-12-31 දිනට පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අපවිත්‍ර ජල කානු පද්ධතිය පිළිබඳ සිව්දින කෙටි පාඨමාලාව | 1 | 1 |
| 2 | පරිගණක ආධාරක ව්‍යුහ විශ්ලේෂණය පිළිබඳ සිව්දින කෙටි පාඨමාලාව | 1 | 1 |
| 3 | කොන්ත්‍රාත් පරිපාලනය | 1 | 1 |
| 4 | ජල සම්පත් කළමනාකරණය පිළිබඳ එක් දින කෙටි පාඨමාලාව | 1 | 1 |
| 5 | ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ එක් දින කෙටි පාඨමාලාව | 1 | 1 |
| 6 | අපවිත්‍ර ජල පිරිපහදුව සඳහා ඉදිකරන ලද තෙත්බිම් පිළිබඳ එක් දින වැඩමුළුව | 1 | 1 |
| 7 | Auto CAD පිළිබඳ පස් දින කෙටි පාඨමාලාව | 1 | 5 |
| 8 | වාෂ්ප ඉංජිනේරු සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් | 2 | 20 |
| 9 | කාර්මාන්ත විදුලි සැපයුම සහ ආරක්ෂණය පිළිබඳ දෙදින කෙටි පාඨමාලාව | 1 | 12 |
| 10 | අපවිත්‍ර ජල පිරිපහදුව සඳහා ඉදිකරණ ලද තෙත්බිම් පිළිබඳ එක් දින වැඩමුළුව | 1 | 1 |
| 11 | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ Aribitration පිළිබඳ එක් දින සම්මන්ත්‍රණය | 1 | 2 |
| 12 | කැළණි සවිය වැඩසටහන සඳහා පාඨමාලා මොඩියුල තුනක් පැවැත්වීම | 2 | 3 |

## B4 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය ඒ.එම්.එන්. බණ්ඩාර විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය පාලක සභාවේ සහ සනාතන සභාවේ අනුමැතිය සහිතව විදෙස් අරමුදල් ලබන ව්‍යාපෘතියක් ලෙස 2002 වසරේදී ස්ථාපිත කරණ ලද විදෙස් අරමුදල් ලබන ව්‍යාපෘතියකි. 2008 වසර අවසන් වනවිට ව්‍යාපෘති කාලසීමාව තුළදී බාරගත් මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව, මානව හිමිකම් පිළිබද සහතික පත්‍ර පාඨමාලව, ආධුනිකත්ව වැඩසටහන යන නම්වලින් හැඳින්වෙන කාර්යයන් තුන ඉගැන්වීමේ පාඨමාලාවන් සඳහා පවතින ඉල්ලුම හේතුවෙන් අඛණ්ඩව සිදුකරණ ලදි. මානව හිමිකම් සහ මූලික නිදහස යන කරුණු පිළිබඳ නිරවුල් විචාරශීලි සහ ක්‍රියාශීලි සමාජයක් නිර්මාණය කිරීම මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වන අතර විශ්වවිද්‍යාල ප්‍රජාව සහ මහජනතාවට අදාළ මානව හිමිකම් පිළිබඳ දැනුම, බහු ක්ෂෙත්‍ර, අධ්‍යාපනික සහ පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධනය කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ඉලක්කය වේ.

මධ්‍යස්ථානයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

I. පාලක මණ්ඩලය
II. අධ්‍යක්ෂ
III. අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු.
IV. පරිපාලන නිලධාරි.
V. පාලක මණ්ඩලය විසින් කලින් කලට පවතින අවශ්‍යතාවය අනුව තීරණය කරන තනතුරු.

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයට ප්‍රතිපත්ති**,** අයවැය හා මානව සම්පත් කළමනාකරණය යන කාරණා සම්බන්ධයෙන් බලය පැවරී ඇත. ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති (නිල ලත් සභාපති), දේශපාලන විද්‍යා අංශයේ අංශ ප්‍රධානි (නිල ලත්), මානව හිමිකම් සම්බන්ද පාඨමාලා පවත්වනු ලබන මානව හිමිකම් අධ්‍යයන අංශය නියෝජනය කරන ශාස්ත්‍ර පීඨ මණ්ඩලය විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකු හා පීඨ හත නියෝජනය කරමින් සනාතන සභාව විසින් නම්කරණු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. මෙහි අධ්‍යක්ෂවරයා පාලක මණ්ඩලයේ ලේකම් ලෙස ක්‍රියාකරයි. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු මෙහෙයවනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් අතුරින් පුවත් පත් දැන්වීම් හරහා පාලක මණ්ඩලය විසින් තෝරාගනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසිනි. අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු සහ පරිපාලන නිලධාරියෙකු අධ්‍යක්ෂවරයාට සහය වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය ශාස්ත්‍ර පීඨයේ කන්නන්ගර ගොඩනැගිල්ලේ කාමර අංක 04 හි පිහිටා ඇත. ස්ථිර කාර්ය මණ්ඩලයක් මෙම මධ්‍යස්ථානය සතුව නොමැති අතර සියලුම සම්පත්දායක පුද්ගලයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලබාගනු ලබයි. ඔවුහු ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස සේවය කරති.

**ජයග්‍රහණ**

2004 සිට 2011 වසර දක්වා වූ කාලය තුළ මෙම මධ්‍යස්ථානය ඉගැනවීම් වැඩසටහන් දෙකකින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 19ක් උපයා ඇති අතර ඉන් ආසන්න වශයෙන් රුපියල් මිලියන (06ක්) හයක් ඉතිරි කොට ඇත. මේ වනවිට එම ඉගැනවීම වැඩසටහන් දෙක සඳහා විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන්ගෙන්, පොලිසියෙන්, යුධ හමුදාවෙන්, බන්ධනාගාර නිලධාරීන්ගේ හා පාසල් ගුරුවරුන්ගෙන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලින් ද ඉල්ලුම ඇත. 2004 වසරේ සිට 2011 දක්වා වන කාලය තුළ මානව හිමකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහතික පත්‍ර සහ ඩිප්ලෝමාධාරීන් පිළිවෙළින් 2718ක් හා 849 දෙනෙකු බිහිකර ඇත.

2012 වසරේදී ද මෙම මධ්‍යස්ථානය සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා පවත්වන ලදි. ඒ සඳහා සහභාගි වන ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

1) මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර 2012-225 සිංහල හා දෙමල මාධ්‍ය
2) මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමා 2011/2012- 114 දෙනෙකු සිංහල සහ දෙමල මාධ්‍ය දෙකෙන්ම විභාගය සඳහා පෙනී සිටිහ (ප්‍රතිඵල මෙතෙක් නිකුත් කර නැත)

**බාධක සහ පිළියම්**

නොවැලැක්විය හැකි හේතූන් නිසා 2012 වසරේදී සහතික පත්‍ර පාඨමාලා හතරක් පැවැත්වීමට නොහැකි විය. එනමුත් 2011/2012 සහතික පත්‍ර පාඨමාලාව පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කරන ලදි.

**අනාගත සැලසුම්**

- මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
- මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා විදෙස් ප්‍රදාන ලබාගැනීම .
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් මානව හිමිකම් පාඨමාලාවන් හඳුන්වාදීම.

## B5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය නාමල් ප්‍රියන්ත විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

1992 වසරේ ස්ථාපිත කරන ලද පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයට සනාතන සභාවේ, පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ අනුමැතිය ලැබිණ. පසුගිය අවුරුදු විස්සක කාලය තුළ මෙම මධ්‍යස්ථානය පරිසර අධ්‍යාපනය සහ පුහුණුව යන ක්ෂේත්‍රයන් තුළින් විශ්වවිද්‍යාලයට මෙන්ම රටට ද වැදගත් සේවාවක් සිදු කොට ඇත. කෙසේ වෙතත් පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ කළමනාකරණය හා විශ්වවිද්‍යාලයීය මධ්‍යම පරිපාලන පද්ධතිය අතර සම්බන්ධීකරණයේ සංවිධිත භාවය මදවීම නිසා විවිධ බාධක හටගන්නා ලදි. 2007-01-01 දින පවත්වන ලද පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම මධ්‍යස්ථානයේ පරිපාලනමය සහ මුදල් ක්‍රියාපටිපාටි සඳහා සනාතන සභාවෙන් නව වරමක් ලබාගැනීමට තීරණය විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් 2008 වසරේදී අනුමත කරන ලද එම නව වරමට අනුව පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වනුයේ පාරිසරික වශයෙන් දැනුවත්, වගකීම් සහිත සමාජයක් සහතික කිරීමයි. උසස් පාරිසරික දැනුමක් ව්‍යාප්ත කිරීම, කාර්යක්ෂම පරිසර කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම හා විශ්වවිද්‍යාල සිසුන්, වෘත්තිකයන්, සාමාන්‍ය මහජනයා අතර චිරාත්කාලින පාරිසරික ආකල්ප දියුණු කිරීම පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ මෙහෙවර වේ.

**2012 වසරේ ජයග්‍රහණ**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය (පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය වෙනුවෙන්) හා මධ්‍යම පරිසර අධිකාරිය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව ඇමුණුම් අංක 01හි දැක්වෙන පරිදි ක්‍රියාකාරකම් රාශියක් අරම්භ කරණ ලදි. ඇමුණුම් අංක 02හි දැක්වෙන පරිදි කෙටි පාඨමාලා සහ උපදේශන ව්‍යාපෘති 2012 වසරේ දී අවසන් කරන්නට විය. ඊට අමතරව පහත සඳහන් කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා උත්සහ දරණ ලදි.

1. පරිසර කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතුවල නියැලි සිටින පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීමට පියවර ගැනීම.
2. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය වෙනුවෙන් වෙබ් අඩවියක් දියත් කිරීමට පියවර ගැනීම.
3. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පුවත් පත්‍රිකාවක් ආරම්භ කිරීමට පියවර ගැනීම.
4. පරිසරය අධ්‍යයන මධ්‍යස්ථානයට පීඨ නියෝජිතයන් පත්කිරීම.

**බාධක සහ පිළියම්**

1. කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් සංඛ්‍යාවක් සහභාගි නොවීම නිසා කර්මාන්ත දූෂණය පාලනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන ප්‍රදානය නොකරන ලදි.
2. මුදල් සහ පරිපාලනමය ගැටළු හේතුවෙන් වාර සඟරාව එළිදැක්වීම කල්දමන ලදි.
3. කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශයන් මත මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව පිරිනමන ලදි.

**අනාගත සැලසුම්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම මත පදනම් වූ යෝජිත ක්‍රියාකාරකම් ලැයිස්තුව ඇමුණුම් අංක 01හි දැක්වේ. පරිසර ගැටළු හා සම්බන්ධ පර්යේෂණ කටයුතුවලට සහයෝගය දැක්වීම පිණිස වෙනත් ව්‍යාපෘති රාශියක් සිදුකිරීමට ද පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය සැලසුම් කරමින් සිටි. මෙම කටයුතු හා වෙනත් යෝජිත ක්‍රියාකාරකම් ඇමුණුම් අංක iii හි දැක්වේ.

**ඇමුණුම් අංක i**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම මත පදනම්ව 2012 වසරේදී පවත්වන ලද /ආරම්භ කළ ක්‍රියාකාරකම් ලැයිස්තුව.

1. හන්තාන කඳුවැටියේ පාරසරික වශයෙන් අරක්‍ෂා කළ ප්‍රදේශය සිතියම් ගතකරණය අවසන් කිරීම.
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
3. විද්‍යාවේ දියුණුව සඳහා වන ශ්‍රී ලංකා සංගමයේ E2 අංශය සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ වී වගාවේදී සිදුවන කෘමිනාශක දූෂණය පාලනය කිරීම හා කළමනාකරණය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අවසන් කිරීම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම මත පදනම්ව යෝජිත ක්‍රියාකාරකම් ලැයිස්තුව

1. කර්මාන්තකරුවන් සඳහා කර්මාන්ත දූෂණය පාලනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අඛණ්ඩව ඉටුකිරීම.
3. පරිසර කටයුතු සම්බන්ධ පර්යේෂණ උපදේශන කාර්යයන්හි නියැලී සිටින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
4. හන්තාන පාරිසරික වශයෙන් ආරක්ෂිත ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලසුමක් සැකසීම ආරම්භ කිරීම.
5. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා එක්ව පාසල් ළමුන් සඳහා පරිසර දූෂණය පාලනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

**ඇමුණුම අංක ii**

1 වගුව පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පිරිනමන ලද කෙටි පාඨමාලාවක් වෙනුවෙන් තත්ත්ව සහ පරිසර කළමනාකරණ පද්ධතියේ ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන සහතිකය.

| පාඨමාලාව | කාල පරිච්ඡේදය | පවත්වන ලද දිනයන් | සහභාගිවූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | පේ.වි.වි සිසුන් | වෙනත් |
| ජා.ප්‍ර.සං. සහතිකය | දින 02 | 2012 මැයි මස 12-13 | 76 | 01 |

**2012 වසරේදී අවසන් කළ උපදේශන ව්‍යාපෘති**

1. වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා EIA වැඩමුළුව.
2. “ sustainability through knuckles tomato” උපදේශන ව්‍යාපෘතිය නිම කරන ලදි.

3. **යෝජිත උලපනේ IEE කර්මාන්ත වත්තේ උපදේශන ව්‍යාපෘතිය.**

   මෙම ව්‍යාපෘතියේ අවසන් වාර්තාව (සිංහල, දෙමල, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම) 2012 ජුලි 03 දින කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශයට (අරමුදල් සපයන ආයතනය) බාරදෙන ලදි. අවසන් ගෙවීම් පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයට යවා ඇත.

4. **හන්තාන පරිසර ආරක්‍ෂක ප්‍රදේශයේ සිතියම යාවත්කාලින කිරීම.**

   මෙම ව්‍යාපෘතියේ අවසන් කොටස එහි අවසන් වර්තාවට අදහස් ඇතුළත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරියට බාරදී ඇති අතර අවසන් වාරිකය ලැබී ඇත.

**5. කොළඹ-මහනුවර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (RAP) ii**

ඉල්ලුම් කළ පරිදි අවසන් වාර්තාවේ සිංහල, දෙමල පරිවර්තන අවසන් කොට මහාමාර්ග සංවර්ධන අධිකාරියට බාරදී ඇති අතර මහාමාර්ග සංවර්ධන අධිකාරියෙන් එහි අවසන් වාරිකය ලැබෙන තෙක් බලා සිටී.

**ඇමුණුම අංක iii**

**පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පැවැත්වීමට යෝජිත වෙනත් ක්‍රියාකාරකම් ලැයිස්තුව**

**අ) පර්යේෂණ කටයුතු.**

1. පශ්චාත් උපාධි සිසුන් හා පර්යේෂකයන් සඳහා පාරිසරික පර්යේෂණ උපදේශණ උදෙසා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව.
2. බාහිර ආයතනවලට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයට පර්යේෂණ යෝජනා බාරදීම.
3. ගෝලීය සෞඛ්‍ය සහ පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව.
4. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය පාරසරික තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට ගත් උත්සහයේදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද පාරිසරික පර්යේෂණ පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් සංවර්ධනය කිරීම.

**ආ) වෙනත් ක්‍රියාකාරකම්**

1. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා වෙබ් අඩවියක් එළිදැක්වීම.
2. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ පුවත් පත්‍රිකාව එළිදැක්වීම.
3. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය හා වෙනත් විශ්වවිද්‍යාල අතර සහයෝගිතා වැඩසටහන් ආරම්භ කිරීම.
4. පාරිසරික දැනුවත්වීම් පිළිබඳ පුහුණු වැඩසටහන.
5. පහත සඳහන් කරුණු පිළිබඳ කෙටි පාඨමාලා.

   අ. පාරිසරික බලපෑම් තක්සේරුව.
   ආ. සමාජ බලපෑම් තක්සේරුව.
   ඇ. මානව සම්පත් කළමනාකරණය.
   ඈ. පරිසර නිරීක්ෂණය.
   ඉ. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ සහතිකය.

## උපග්‍රන්ථ C - ඉගෙනුම් සහයක සේවාවන්

### C1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය
(පුස්තකාලයාධිපතිණි, ආචාර්ය පී. විජේතුංග (මිය) විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යායතන පුස්තකාලය ලෙස 1921 වසරේ ආරම්භ විය. 1952 වසරේදී පේරාදෙණියට ගෙන එන ලද පුස්තකාලය 1960 වසරේදී එය වර්තමානයේ පිහිටා ඇති පරිශ්‍රයට ගෙන එන ලදි. මෙම පුස්තකාලය පේරාදෙණියට ගෙන ඒමෙන් පසු එය පුස්තකාල ජාලයක් බවට පත්වුයේ ප්‍රධාන පුස්තකාලය සහ එහි ශාඛා පුස්තකාල කෘෂි, විද්‍යා, වෛද්‍ය, ඉංජිනේරු, පශු වෛද්‍ය, සම සෞඛ්‍යය හා දන්ත වෛද්‍ය යන පීඨ පුස්තකාල ලෙස හැඳින්වේ. එහි නවවෙනි පුස්තකාලය කෘෂිවිද්‍යා පීඨයේ මහඉලුප්පල්ලම උප මණ්ඩපයට අනුබද්ධ කොට ඇත. ශාඛා පුස්තකාල අදාළ පීඨවල පිහිටා ඇත. නව ගලහා පාර දිගේ පැමිණ කලාගාරය ප්‍රවේශය පසුකොට දකුණට හැරී සනාතන මන්දිර ගොඩනැගිල්ලට පැමිණෙන මාර්ගයෙන් පැමිණ ප්‍රධාන පුස්තකාලයට ප්‍රවේශ වියහැක. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය ශ්‍රී ලංකාවේ පැරණිතම සහ විශාලතම පුස්තකාලයයි. මෙම පුස්තකාලයේ දැක්ම, මෙහෙවර හා ඉලක්කයන් කියවීම සඳහා කරුණාකර http://www.lib.rdn.ac.lk වෙත පිවිසෙන්න.

**ජයග්‍රහණ**

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් කීපදෙනෙකු පේරාදෙණිය පුස්තකාලයාධිපති සංගමයට 2012 වසර සඳහා තෝරා පත් කරගන්නා ලදි. ආචාර්ය පී. විජේතුංග මිය සභාපති ලෙසත්, ආර්. මහේස්වරන් මහලේකම් ලෙස හා සී. ගුණසේකර මිය භාණ්ඩාගාරික ලෙස ද පත්වුහ.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති සංගමයේ 6 වැනි වාර්ෂික පර්යේෂණ සහ ජයග්‍රහණයන්ගේ සම්මන්ත්‍රණ 2012 පේරාදෙණිය විශ්වවිද්‍යාල ශාස්ත්‍ර පීඨ පශ්චාත් උපාධි ගොඩනැගිලි සංකීර්ණයේදී 2012 මාර්තු 23 වැනි දින පවත්වන ලදි. මේ සඳහා විශ්වවිද්‍යාල එකොළහකින් 50කට වැඩි පුස්තකාලයාධිපතිවරු සහභාගි වු අතර ඉදිරිපත් කිරීම් නවයක් පවත්වන්නට විය. එහිදී ගත් වැදගත් ඡායාරූප කිහිපයක් නැරඹීම සඳහා අපගේ ඩිජිටල් පුස්තකාලය athttp://www.dlib.pdn.ac.lk:8080/lspuil handle/123456789/855 වෙත පිවිසෙන්න.

විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිණි එස්. ඉලංගපෙරුම මහත්මියට ඉන්දියාවේ නවදිල්ලි නුවර විද්‍යා හා පරිසර මධ්‍යස්ථානයේදී 2012 මාර්තු 20 සිට 23 දින දක්වා පැවැත්වු “Managing information in the digital age” පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගිවීම සඳහා (“Full fellowship”) පූර්ණ සභෘදත්ව ශිෂ්‍යත්වය ලැබිණ. සේජ් ප්‍රකාශකයන් විසින් ප්‍රකාශයට පත්කරන “ Information development” නම් වාර සඟරාවේ කතෘ මණ්ඩල උපදේශක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස ද 2012 මාර්තු මස සිට ඇය පත්කරන ලදි.

අජන්ත ධර්මරත්න මහතා සහ මේනකා හිඳගොල්ල මිය 2011 ජුනි මස සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ii ශ්‍රේණියට උසස් කරන ලදි. කේ.පී. ලිනගේ මහතා සහ ඒ.එම්.ඒ.සී. සේනාරත්න මිය 2012 ජුලි මස සිට ලේඛකාධිකාරී/පුස්තකාල සේවා තනතුරට පත්කරන ලදි.

පුස්තකාල ජාලයේ කෘති එකතු දියුණු කිරීම සඳහා HETC (ලෝක බැංකු) ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන නවයක් ලැබුණි. පුස්තකාල හා තොරතුරු විද්‍යා ජාතික ආයතනය එහි වාර්ෂික සම්මන්ත්‍රණය 2012 නොවැම්බර් මස 22-23 යන දිනවලදි කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන්නට විය. එහිදි ආචාර්ය පී. විජේතුංග (මිය) (පුස්තකාලයාධිපතිණි) Mobile Web based Library services පිළිබඳ විශේෂ පර්යේෂණ පත්‍රයක් ඉදිරිපත් කළ අතර කේ.පී.කේ. දඹවින්න මිය (ජ්‍යෙ.ස.පු/ස.සෞ.පි) චම්පා එන්.කේ. අලහකොන්

මිය, (ජ්‍යෙ.ස.පු/ඉංජිනේරු) හා අජන්ත ධර්මරත්න (ජ්‍යෙ.ස.පු/පංශු වෛද්‍ය) යන මහත්ම මහත්මීන් ද පර්යේෂණ පත්‍ර ඉදිරිපත් කළහ.

2011 වසරේ සකස් කළ සැලසුම් සාක්ෂාත් කරගැනීමේදී 2011 වසරේ ආරම්භ කළ ඩිජිටල් පුස්තකාලයට සැලකියයුතු මට්ටමේ වාර්තා ප්‍රමාණයක් එකතු කරන ලදි. මෙම ඩිජිටල් පුස්තකාලය මගින් මේවනවිට පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත්කළ වාරසඟරා කිහිපයක ලිපි (නූතන ශ්‍රී ලංකාවේ අධ්‍යයන, ඓතිහාසික හා සමාජ අධ්‍යයන, ශ්‍රී ලංකා වාර සඟරාව, මානව ශාස්ත්‍ර හා අධ්‍යයන ශ්‍රී ලංකා වාරසඟරාව, මානව ශාස්ත්‍ර හා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සම්මේලනය) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් සිදුකල වෙනත් පර්යේෂණ ප්‍රකාශණ හා විශ්වවිද්‍යාලයට බාරදුන් උපාධි නිබන්දන උපුටනවල කටයුතු සිදුකරමින් පවති. මේවා http:/www.dilb.pdu.ac.lk:8080/15pui/. යන වෙබ් අඩවියේ දැක්වේ.

**බාධක සහ පිළියම්**

මාස හතර හමාරක පමණ කාලයක පැවති කාර්ය මණ්ඩලවල වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග පුස්තකාලයේ සැලසුම් කළ ක්‍රියාකාරකම් සිදුකිරීමට බාධකයක් විය. විශ්වවිද්‍යාලයේදී පැවැත්වීමට සැලසුම්කර තිබූ පුස්තකාල සහයකයන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ (ICT) හා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති සංගමයේ 8 වැනි ජාත්‍යන්තර සමුළුව යන සිදුවීම් කිහිපයක් නොපැවැත්වීමට සිදුවිය. මෙය ප්‍රධාන පුස්තකාලයේ කෘති එකතු ස්වයංක්‍රීය සංසරණය සඳහා සකස් කිරීමේ කටයුතු ද අඩපණ කළේය. විදුලි සෝපානය අක්‍රීයවීම සහ එය අළුත්වැඩියා කිරීමට දිගු කාලයක් ගතවීම නිසා පුස්තකාලයේ ඉහළ මාලයේ පොත් සැකසුම් කිරීමේ කාර්යය තවදුරටත් ප්‍රමාද කළේය. කම්කරුවන් සංඛ්‍යාව කිසිසේත්ම ප්‍රමාණවත් නොවීමද බාධකයක් වූ අතර විශේෂයෙන්ම ප්‍රධාන පුස්තකාලයේ පවිත්‍රතාවය පවත්වා ගැනීමට එය ප්‍රබල බාධකයකි.

**අනාගත සැලසුම්**

ප්‍රධාන පුස්තකාලයේ කෘති එකතු තීරු සංකේත ගත කිරීම අවසන් කිරීම සහ ඩිජිටල් පුස්තකාලය සංවර්ධනය කිරීමට ද අප ඉලක්කකර ඇත්තෙමු. එමෙන්ම දැනට පවතින සේවක පුරප්පාඩු පිරවීමට ද සැලසුම් කර ඇත්තෙමු.

## C2 තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්‍ෂ, මහාචාර්ය කේ.එම්. ලියනගේ විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කුසලතා සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස 2004 වසරේදී ස්ථාපිත කරන ලදි. උපාධි අපේක්‍ෂක සිසුන්ගේ සහ විශ්වවිද්‍යාල ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කුසලතා දියුණු කර ගැනීමට අවස්ථාවක් ලබාදීම මෙම මධ්‍යස්ථානයේ එක් ප්‍රධාන අරමුණකි. මධස්ථානය විසින් සැලසුම් කොට පැවැත්වීමට නියමිත අර්ධ කාලීන සහ නිත්‍ය පුහුණු වැඩසටහන් රාශියක් තුළින් මෙම කාර්යය සාක්ෂාත් කරගැනීමට අපේක්‍ෂා කෙරේ.

පරිගණක භාවිතා කිරීමේ ස්ථාන 320කට පමණ ඉඩසැලසිය හැකිවනසේ මධ්‍යස්ථානය සැලසුම් කර ඇත. Mbps 100ක් අතර එම පරිගණක සියල්ලම VLAN කිහිපයකට සම්බන්ධ කර ඇත. එක් පරිගණකයට දත්ත සැපයීමේ වේගය Mbps 100කි. වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානය සතුව ෆයිල් සර්වරයක්, වෙබ් සර්වරයක්, මේල් සර්වරයක්, ප්‍රොක්සි සර්වරයක්, දත්ත ගබඩා සර්වරයක්, කන්ටෙන්ට් මැනේජ්මන්ට් සර්වරයක් හා පරිගණක භාවිතා කරන ස්ථාන 300කට වඩා වැඩි ප්‍රමාණයක් ද ඇත. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය හරහා ලැබුණු Mbps 1ක ධාරිතාවයකින් යුතු අන්තර්ජාල සබඳතාවය Mbps 2 කි. එම සබඳතාවය සඳහා ADSL මාර්ග තුනක් ඇත.

### ජයග්‍රහණ

- උපාධි අපේක්‍ෂකයන්ට තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ වැඩසටහන් සහ රාජ්‍ය අංශයට හා ජනතාව සඳහා පුහුණු වැඩසටහන්/කෙටි පාඨමාලා පැවැත්වීම දිගටම සිදුකිරීම.
- මධ්‍යම පළාතෙන් තෝරාගත් රැකියා විරහිත තරුණ කණ්ඩායමකට ඔවුන්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීම පිණිස තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. (මෙම තෝරා ගැනීම සිදුකරන ලද්දේ මධ්‍යම පළාත් කර්මාන්ත, තරුණ කටයුතු සහ අධ්‍යාපන, ක්‍රීඩා යන අමාත්‍යාංශ විසිනි.)
- මෙම මධ්‍යස්ථානය සඳහා පාඨමාලා කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම.
- මධ්‍යස්ථානයේ වැඩ ස්ථාන සියල්ලම ඉහළ නැංවීමට කටයුතු ආරම්භ කොට ඇත.

### බාධක සහ පිළියම්

අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැඩවර්ජනය හේතුවෙන් වර්ෂයන් සැහෙන කාල පරිච්ඡේදයක් තුළ ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය නොමැති වු නිසා සැලසුම් කළ කෙටි පාඨමාලා හා පුහුණු වැඩසටහන් කරගෙන යාමට නොහැකි විය. ක්‍රියාත්මක තත්ත්වයේ පැවති පරිගණක බොහොමයක් යාන්ත්‍රික දෝෂ හේතුවෙන් අක්‍රීයවී ඇත. සමහර අක්‍රීය පරිගණක වසර හයකට වැඩි කාලයක් භාවිතා කල ඒවාය. එම පරිගණක නැවත යථාතත්ත්වයට පත්කර ගැනීම සඳහා මධ්‍යස්ථානය මේවනවිට පියවර ගෙන ඇත.

**අනාගත සැලසුම්**

- මධ්‍යස්ථානය මේවන විට උපාධි අපේක්ෂාක සිසුන් හා බාහිර සිසුන් සඳහා එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කරන අතර එම එක් අවුරුදු පාඨමාලාව දෑ අවුරුදු පාඨමාලාව දක්වා දික්වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ විවිධ විෂයන් පිළිබඳ නව කෙටි පාඨමාලා රාශියක් පැවැත්වීමට ද කටයුතු සුදානම් වෙමින් පවති.

- මෙම මධ්‍යස්ථානය CISCO systems සමාගම සමඟ එක්ව එම සමාගමේ දේශීය ආයතනය ලෙස ද කටයුතු කරන අතර CISCO සහතික කළ ජාලකරණ ඇසෝසියට් විභාගය සඳහා සහභාගිවන්නන් ඊට වඩා උසස් CISCO සහතික කළ නෙට්වර්කිං ප්‍රොෆෙෂනල් වැනි උසස් විභාග සඳහා සුදානම් කිරීමට ද පියවර ගනිමින් සිටි. මෙම වැඩසටහන් සඳහා මුදල් විශ්වවිද්‍යාලයෙන් සහ ආයතනය විසින් උපයන ආදායමෙන් යොදා ගැනීමට අපේක්ෂා කොරේ.

**2012 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| අංකය | කාර්යය/තේමාව | පීඨය/අංශය/මධ්‍යස්ථානය/ඒකකය/ පේරාදෙණිය විශ්වවිද්‍යාලය | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 | පරිගණක සහ කාර්යාල හැඳින්වීම. | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 2011-10-09 |
| 2 | ජාවා | | 2011-10-02 |
| 3 | CCNA | | 2011-09-18 |
| 4 | මූලික පරිගණක කුසලතා පිළිබඳ පුහුණු වැඩසටහන | | 2012-12-14 |
| 5 | වෙබ් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | | 2012-12-29 |

## C3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය

(අංශ ප්‍රධානි, ඒ.එන්.එම්. සල්ගාදු මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන සහයක ඒකකයක් වන අතර එහි මූලික අරමුණ වනුයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට අධ්‍යයන, වෘත්තීය හා සාමාන්‍ය කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමයි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය පීඨ අටටම විවිධ මට්ටමේ පාඨමාලා පවත්වන අතර වර්තමානය වනවිට එහි විවිධ මට්ටමේ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 4500කි. අදාළ පීඨවල අවශ්‍යතාවයන්ට අනුව ප්‍රථම, දෙවන සහ තෙවන වසරවලදී ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි (ESL) විශේෂ අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි (ESP) හා අධ්‍යයන කටයුතු සඳහා ඉංග්‍රීසි (EAP) ලෙස ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි.

ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට ඉංග්‍රීසි දැනුම ලබාදෙමින් ඔවුන් බලගන්වන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වේ. සිසුන් අදාළ ක්ෂේත්‍රයන්හි හා අනාගත වෘත්තීන්හි ඵලදායි ආකාරයෙන් නියැලීම සඳහා සිසුන්ගේ ඉංග්‍රීසි කුසලතා දියුණු කිරීම අපගේ අභිලාෂයයි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය උප ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය ලෙස සළකනු ලැබූ අතර මුල්කාලීනව එය ප්‍රධාන ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ කොටසක් ලෙස ක්‍රියාත්මක විය. මෙම අංශය ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලද්දේ 1987 වසරේදීය.

පාසල් මට්ටමේදී තම මව් භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ නවක සිසුන් තෘතීය මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යාපනයට යොමු කරවීම පිණිස ඉංග්‍රීසි භාෂා පංති පැවැත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ ප්‍රධාන වගකීම වේ. මෙම ඒකකය මඟින් දෙවිදිහක පාඨමාලාවන් පවත්වනු ලැබේ. සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයන් නිසිලෙස හැදෑරීම පිණිස මූලික ඉංග්‍රීසි භාෂා කුසලතාවයන් ලබාදෙන කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව හදාරනු ලබයි. එම පාඨමාලාව අවසන් වූ පසු දෙවනුව මෙම මධ්‍යස්ථානය මාර්ගගත ඉංග්‍රීසි පාඨමාලාව පවත්වයි. මේ වනවිට සමාසික ක්‍රමය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමත් සමඟම " කඩිනම්" යන වචනය භාවිත නොකෙරේ. එසේ වුවත් සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළුවූ දින සිට ඉංග්‍රීසි පාඨමාලාවන් ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. ඉංග්‍රීසි වැඩසටහනේ මුල් කොටස ආසන්න වශයෙන් සති 10ක් වුවත් අදාළ පීඨවල අවශ්‍යතා සහ විශේෂතාවලට අනුව එය වෙනස් විය හැකිය. මාර්ගගත පාඨමාලාවල කාල සීමාව වර්ෂ 1-3 දක්වා විවිධ වේ.

ඉංග්‍රීසි පංතිවලට සහභාගීවීම අනිවාර්ය වන අතර මුල් සමාසික (2) දෙක තුළ පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට ශිෂ්‍යයෙකුගේ 80%ක පැමිණීම අවශ්‍ය වේ. ඉංග්‍රීසි පංතිවලට නිතර සහභාගි වීම තුළින් මනා දැනුමක් ලබාගත හැකිවන හෙයින් සිසුන්ට තමන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා දියුණු කර ගැනීම සඳහා පංතිවලට සහභාගිවන ලෙසට දිරිමත් කිරීම් ද කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලට සහභාගි වීම සඳහා සෑම සිසුවෙකුම ඉංග්‍රීසි භාෂාවට "A" සාමාර්ථයක් ලබාගැනීම අනිවාර්ය වේ. වර්තමානයේදී ලෝක බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන HETC ප්‍රදාන කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා ඉංග්‍රීසි වැඩමුළු සංවිධානය කිරීමට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා උපයෝගි කරගනු ලැබේ.

**ජයග්‍රහණ**

HETC වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**බාධක සහ පිළියම්**

ආචාර්යවරුන්/උපදේශකයන් සමූහ වශයෙන් වෙනත් විශ්වවිද්‍යාලවලින් පරිවාස කථිකාචාර්ය තනතුර ලබාදෙන බැවින් නික්ම යෑම අප මුහුණපා ඇති ගැටළුවකි.

**අනාගත සැලසුම්**

HETC වැඩසටහන සියලුම පීඨවල පූර්ණ වශයෙන් දියත් කිරීම.

## C4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
(අධ්‍යක්‍ෂ, ආචාර්ය බී.එම්.කේ. පෙරේරා මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




### හැඳින්වීම

2005 වසරේ ස්ථාපිත වෘත්තිය මාර්ගගෝපදේශන හා උපදේශන ඒකකය විශ්වවිද්‍යාලයට, ශිෂ්‍ය ප්‍රජාවට මෙන්ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විවිධ සේවාවන් සැපයීම අඛණ්ඩව සිදුකොට ඇත. සමාලෝචිත වර්ෂයේදී මෙම ඒකකයේ සේවාවන් ලබාගැනීම සඳහා ඉහළ ඉල්ලුමක් පැවති අතර සිසුන්, කාර්ය මණ්ඩල හා වෙනත් කණ්ඩායම් සහ සංවිධාන සඳහා වෘත්තිය මාර්ගෝපදේශන වැඩමුළු, සම්මන්ත්‍රණ හා දේශන පවත්වන ලදි. මනෝවිද්‍යා උපදේශනය අවශ්‍ය වූ සිසුන්ට උපකාර කිරීමෙන් හා ආවේගාත්මක කම්පන තුළින් හටගන්නා අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය පහසු කරවීම ඉතා සාර්ථකව මෙම ඒකකය විසින් සිදුකරන ලදි. පවත්වන ලද බෝහොමයක් වෘත්තිය වැඩසටහන් සාමාන්‍ය වශයෙන් කෙරෙන ඉල්ලීම්වලට සහ විශ්වවිද්‍යාලයේ උපක්‍රමක සැලසුමෙන් අපේක්ෂිත හා විශේෂ වශයෙන් මෙම ඒකකයේ උපක්‍රමික සැලසුමට අනුව සිදුකරන ලදි. තෙවන හා සිව්වන වසරවල සිසුන්ට ඔවුන්ගේ රැකියා තෝරා ගැනීමට සහ ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රවල අනාගත සංවර්ධනයට ඉතා වැදගත් වන ජීව දත්ත සටහන් ලිවීම, ඵලදායි ලෙස රැකියා සෙවීමේ උපක්‍රම හා සම්මුඛ සාකච්ඡාවලට මුහුණදීම සඳහා අවශ්‍ය කුසලතාවන් පිළිබඳ පුහුණුව ලබාදෙන ලදි.

### ජයග්‍රහණ

"වෘත්තීමය දියුණුව සඳහා තොරතුරු තාක්‍ෂණ කුසලතා" වැඩසටහනට විශාල ඉල්ලුමක් පැවති හෙයින් විශ්වවිද්‍යාලය තුළ නිත්‍ය දේශන නොපැවැත්වෙන කාලය තුළ ද ඇතුළත්ව පැවැත්වූ මුළු වැඩමුළු ගණන හයකි. සමාලෝචිත වර්ෂය තුළදී මෙම ඒකකය කර්මාන්ත ක්ෂේත්‍රයේ කොටස් කරුවන් සමග පවත්වන සහයෝගය සහ සම්බන්ධතාවය තවදුරටත් ඉහළනංවා ගන්නා ලදි.

ජොන් කීල්ස් පදනම සමඟ සහයෝගයෙන් විශේෂ තෙදින වෘත්තීය වැඩමුළුවක් පවත්වන ලදි. කර්මාන්ත ක්ෂේත්‍රය සමග පවත්වනු ලබන සබඳතා, එම ක්ෂෙත්‍රය සිසුන්ගෙන් අපේක්ෂිත ආකල්ප, කුසලතා, අමතර සුදුසුකම් ආදිය පිළිබඳ සිසුන් තුළ විශාල දැනුවත් භාවයෙක් ඇති කිරීමට මංමාවත් විවර කළේය. කළමනාකරණ පුහුණුවන්නන් ලෙස රැකියාවන් විවෘත කරගැනීම පිණිස හදාල යුතු බාහිර පාඨමාලාවන් පිළිබඳව සිසුන් බොහොමයකට උපදෙස් ලබාදෙන ලදි. තමන් තුළ කලක සිට පවතින සිහින සැබැකර ගැනීම සඳහා ගමන් කළයුතු මංමාවත් පිළිබඳ සාකච්ඡා කිරීමට අවශ්‍ය වූ බොහෝ දෙනකුට වෘත්තීය උපදේශනය ලබාදෙන ලදි. කර්මාන්ත ක්ෂේත්‍රය විසින් අගය කොට සලකන ගුණාංග හා ආකල්ප පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීම පිණිස වැඩමුළු රාශියක් පවත්වන ලදි. වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම්වල විස්තර පහතින් දැක්වේ.

| ක්‍රියාකාරකම | දිනය | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| **තරුණ ආචාර්යවරුන් සඳහා දේශන** | | |
| චිත්තවේගී බුද්ධිය | 2012-04-23 | 27 |
| යහපත් අන්තර් පුද්ගල සබඳතා සංවර්ධනය කිරීම. | 2012-03-23 | 27 |
| ඉගැන්වීම් කාර්යයේදී Role Play වල වටිනාකම | 2012-03-29 | 27 |
| **වැඩමුළු/දේශන** | | |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ට වෛද්‍ය සේවයේදී අවශ්‍යවන සන්නිවේදන කුසලතා | 2012-01-19, 2012-02-09 හා 2012-05-17 | 40 |
| විශ්වවිද්‍යාලයේ එක්ස්ප්ලෝරස් ක්ලබ් සිසුන් සඳහා අධ්‍යයන කටයුතුවලදී සහ වැඩවලදී ප්‍රේරණය කළ | 2012-02-12 | 70 |

| | | |
|---|---|---|
| චර්යාව. | | |
| ජෝන්කීල්ස් පදනම සමඟ තෙදින මෘදු කුසලතා සංවර්ධන වැඩමුළුව. | 2012-11-23-25 | 500 |
| විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩ සහ පුද්ගලික ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ප්‍රේණය කළ සහ අර්ථවත් වැඩ හා ආකල්ප පිළිබඳ වැඩමුළුව (වැඩමුළු 06 ක්) | 2012 නොවැම්බර් හා දෙසැම්බර් | 300 |
| වෘත්තීය දියුණුව සඳහා තොරතුරු තාක්‍ෂණ කුසලතා සිව්දින වැඩසටහන (ශාස්ත්‍ර පීඨ සිසුන්) | 2012-02-22-27 | 54 |
| | 2012-03-19-21 | 50 |
| සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයන් සඳහා දෙදින පුහුණු වැඩමුළුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව සහ EDEX ශ්‍රී ලංකා සමඟ එක්ව ජානකී හෝටලයේදී | 2012-12-4-5 | 60 |

**වෙනත් සංවිධානවලට සපයන ලද සේවාන්**

| ක්‍රියාකාරකම | දිනය | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| මහාමායා විද්‍යාලයේ ශිෂ්‍ය නායිකාවන් සඳහා නායකත්ව පුහුණුව | 2012-02-13 | 45 |
| මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ ඉල්ලීම පරිදි එම පළාතේ රජයේ කාර්යාලවලට අලුතෙන් බඳවාගත් පුද්ගලයන් සඳහා ප්‍රේරණ වැඩසටහන | 2012-02-25 | 75 |
| නාවුක හමුදා නිලධාරීන් සඳහා-තළාතුඔය පුහුණු මධ්‍යස්ථානය | 2012-02-28 | 200 |
| ගන්නෝරුව රණබිම රාජකීය විද්‍යාලයේ සිසුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන | 2012-04-30 | 400 |
| SLIATE අධ්‍යක්‍ෂවරුන් හා ඉගැන්වීමේ කාර්ය මණ්ඩල සඳහා තෙදින වැඩමුළුව HETC වැඩසටහන- හිල්ටොප් හෝටලය-මහනුවර | 2012-05-2-4 | 38 |
| මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලය සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන | 2012-05-15 | 200 |
| යෞවන කටයුතු අමාත්‍යංශය විසින් සංවිධානය කළ යෞවනයන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන | 2012-05-29 | 75 |
| යාපනය සහ මහනුවර ATI ගුරුවරුන් හා සිසුන් සඳහා වෘත්තිය සංවර්ධන වැඩසටහන් දෙකක් | 2012-08-6-7 | 250 |
| | 2012-08-4 | 45 |



ආචාර්යවරුන් සඳහා පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුවේ සමාරම්භය-ජානකි හෝටලය



"වෘත්තිය දියුණුව සඳහා තොරතුරු තාක්‍ෂණ කුසලතා වැඩමුළුව"

## උපග්‍රන්ථ D - උපස්ථම්භක සේවාවන්

### D 1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය පී. බෙනරගම විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලද්දේ 1999 වසරේදීය. ඒ ඒ පීඨවල විවිධ ඒකකවලට ඒකච්ත්‍ර සංවිධානයක් වන මෙම මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධනය ඉහල නැංවීමේ කටයුතු බාරගෙන ක්‍රියා කරයි. වර්තමානය වනවිට මෙරට වෙනත් ආයතනයන්හි කාර්ය මණ්ඩල සංවර්ධනය කිරීම සඳහා ද සේවාවන් ලබාදීමේ හැකියාව මෙම මධ්‍යස්ථානය සතුව ඇත.

**ජයග්‍රහණ**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2012 වසරේදී පහත සඳහන් වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

**2012 වසරේ පවත්වන ලද වැඩමුළුව**

**1. "දෙපාර්තමේන්තු භාණ්ඩ ලේඛන කළමනාකරණය පිළිබඳ වැඩමුළුව"**

"දෙපාර්තමේන්තු භාණ්ඩලේඛන කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව 2012 ජනවාරි 9-10 යන දෙදින තුළ සනාතන කාමරයේදී පවත්වනට විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨාධිපතිවරුන්, අංශ ප්‍රධානීන්, සහකාර ලේඛකාධිකාරීන් සහ දේපාර්තමේන්තු භාණ්ඩ ලේඛන පවත්වාගෙන යන පුද්ගලයන් මෙම වැඩමුළුවේ ඉලක්ක කණ්ඩායම විය. මෙම වැඩමුළුවට 192 දෙදෙනෙක් සහභාගි වූහ. එස්.සී. මයාදුන්නෙ (හිටපු විගණකාධිපති) හා එන්.ජී.කේ.කේ. සෙනවිරත්න (විශ්‍රාමලත් ප්‍රධාන ගණකාධිකාරී 1ශ්‍රේණිය) යන මහත්වරුන් සම්පත්දායක පුද්ගලයන් ලෙස සේවය සැලසූ අතර ආචාර්ය චාලින්ද බෙනරගම (අධ්‍යක්ෂ/ ක.ම.ස.ම) මෙම කටයුත්ත සම්බන්ධීකරණය කළේය.

**2. "විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හැකියාව සංවර්ධනය කිරීම" පිළිබඳ වැඩමුළුව**

මෙම වැඩමුළුව 2012 පෙබරවාරි 02 වැනි දින සනාතන කාමරයේදී පවත්වන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියලුම තරුණ ආචාර්යවරුන් මෙහි ඉලක්ක කණ්ඩායම විය. මෙම වැඩමුළුව සඳහා 130 දෙනෙකු සහභාගි වූහ. මහාචාර්ය ඩේවිඩ් ගැලෝවේ මෙහි (යාවජීව මහාචාර්ය, ඩර්හැම් විශ්ව විද්‍යාලය, එ.රාජධානිය) සම්පත්දායක පුද්ගලයා ලෙස කටයුතු කළ අතර ආචාර්ය චාලින්ද බෙනරගම (අධ්‍යක්ෂ/ක.ම.ස.ම) මෙම වැඩමුළුව සම්බන්ධීකරණය කළේය.

**3. අභිවෘද්ධිය සඳහා වන කණ්ඩායමක සාමාජිකයෙකු වීම පිළිබඳ වැඩමුළුව**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උද්‍යාන, වැඩ දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය යන අංශවලට අයත් කම්කරුවන් 200 දෙනෙකු සහභාගි වූ මෙම වැඩමුළුව 2012-11-22 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 6.00 දක්වා විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදි. ආචාර්ය චාලින්ද බෙනරගම මෙහි සම්පත්දායක පුද්ගලයා විය.

**4. "සේවා ස්ථානවල සාර්ථකත්වයේ රහස්" පිළිබඳ වැඩමුළුව**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කම්කරු ශ්‍රේණියේ සියලුම දෙනාට ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප දියුණු කිරීම සඳහා මෙම එක් දින වැඩමුළුව පවත්වන ලදි. මෙම කණ්ඩායමට අයත් කම්කරුවන් 500ක් පමණ වන බැවින් එක් කණ්ඩායමකට 50 දෙනෙකු ඇතුළත් වන ලෙස කණ්ඩායම්වලට බෙදා පහත සඳහන්

දිනවල එනම් 2012 වසරේ නොවැම්බර් 29,30, දෙසැ. 6,18, හා 20, ජනවාරි 03, 04, 08, 10, 01, 2013 ඉහල හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා පැවැත්වීමට තීරණය කරන ලදි. ආචාර්ය චාලින්ද බෙනරගම හා ආචාර්ය බී.එම්.කේ. පෙරේරා (අධ්‍යක්‍ෂ/මා.උ. ඒකකය) සම්පත්දායකයෝ ලෙස සේවය කළහ.

**2012 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්**

**1. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පස්වැනි ප්‍රේරණ වැඩසටහන - 2012**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2012 වසරේදී පරිවාස අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැය 150ක ප්‍රේරණ වැඩසටහනක් පවත්වන ලදි."පේරාදෙණිය, රජරට, මොරටුව හා බුද්ධශ්‍රාවක භික්‍ෂු විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවලින් කාර්ය මණ්ඩල සාමාජිකයෝ විසිහතර දෙනෙකු සහභාගි වුහ.

මෙම වැඩසටහන 2012 පෙබරවාරි 14 වැනි දින ආරම්භ කළ අතර කාණ්ඩ තුනක් යටතේ පහත සඳහන් දිනයන්වලදී එය අවසන් කළේය.

- පළමු කණ්ඩායම - පෙබරවාරි 02-14-17-හා 21-24
- දෙවන කණ්ඩායම මාර්තු 19-23- හා 26-30
- තුන්වන කණ්ඩායම අප්‍රේල් 17-20 හා 23-24

**බාධක සහ පිළියම්**

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛ අංක 937ට අනුව කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යෝජනාවක් බාරදී තිබුණි. එම යෝජනාවට අනුව ඉහත වැඩසටහන පිරිනැමීමට හැකිවුවද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් පහත සඳහන් කටයුතු කල් දැමීමට සිදුවිය.

1. විශ්වවිද්‍යාල ඉහළ කළමනාකරණයේ වැඩ කාර්යක්‍ෂමතාවය දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන.
2. සේවා ස්ථානයේ අන්තර් පුද්ගල සබඳතා දියුණු කිරීම පිළිබඳ විශ්වවිද්‍යාලයේ සියලුම පරිපාලන නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම
3. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සේවාවන් ඉහළ නැංවීම.

**ආනාගත සැලසුම්**

විශ්වවිද්‍යාල පද්දතියේ පරිවාස අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 6 වැනි ප්‍රේරණ වැඩසටහන 2013 පෙබරවාරි 11 වැනි දින ආරම්භ විය. මෙම වැඩසටහන 2013 පෙබරවාරි සහ අප්‍රේල් මාසවලදී පහත සඳහන් දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා පවත්වන ලදි.

පළමු කොටස - පෙබරවාරි 11-15 හා 18-22
දෙවන කොටස - මාර්තු 11-15 හා 18--22
තෙවන කොටස - අප්‍රේල් 18-19 හා 26, 29, 30

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම කාණඩවල සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම පුහුණු වැඩසටහන් රාශියක් පිරිනැමීමට අපේක්‍ෂා කරයි.
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කර්යාලය පූර්ණ උපකරණ සහිතව නව ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

## D2 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්

(වැඩබලන ප්‍රධාන වෛද්‍ය නිලධාරිණී, වෛද්‍ය ඩබ්.ඩී.කේ ලෙනදොර විසින් වාර්තා කරන ලද පරිදි)




### හැඳින්වීම

ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් මූලිකත්වය දරන සෞඛ්‍ය මධ්‍යස්ථානය පූර්ණ සුවකාරක හා නිවාරණ සෞඛ්‍ය සත්කාරයක් ලබාදෙන ඒකකයකි. මෙම සේවාව බාහිර රෝගී ප්‍රතිකාර අංශයකින්, ආසාදන රෝගී වාට්ටුවකින් හා මහජන සෞඛ්‍ය අංශයක් ඇතුළත් නේවාසික ප්‍රතිකාර පහසුකම්වලින් යුක්තවන අතර මෙතුළින් සියලුම නේවාසික හා අනේවාසික සිසුන්ට, සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සෞඛ්‍ය සේවාව ලබාදේ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක නිවාරක සෞඛ්‍ය අංශය විෂබීජ පැතිරීම වැළැක්වීම, පිරිසිදු කිරීම, වසංගත රෝග අධ්‍යයන කටයුතු, පරපෝෂක රෝගකාරක පාලනය, ආහාර ස්වස්ථතාව, අපද්‍රව්‍ය බැහැර කිරීම, පාරිසරික සනීපාරක්ෂව, ජල සැපයුම හා සෞඛ්‍ය අධ්‍යාපනය යන කටයුතු සිදුකරයි.

### ජයග්‍රහණ

### සුවකාරක අංශය

සිසුන් 9063 දෙනෙකුට සහ කාර්ය මණ්ඩල හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් 5219කු ඇතුළත් මුළු රෝගීන් 14282 දෙනෙකුට බාහිර රෝගී අංශයෙන් සේවාවන් සපයා ඇත. සිසුන් 439කු වාට්ටුවේ නැවති ප්‍රතිකාර ලබා ඇත. විසිහතර පැය පුරා ක්‍රියාත්මක හදිසි කැඳවීම් සේවාවන් කාර්ය මණ්ඩල සහ සිසුන් යන දෙපාර්ශවයෙන්ම රෝගීන් 602 කට ප්‍රතිකාර කොට ඇත.

### එන්නත් කිරීම

එන්නත් කිරීමේ වැඩසටහනක් වෛද්‍ය, දන්ත, පශු වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන් සඳහා පවත්වන ලදි. පශු වෛද්‍ය සිසුන් 332කට පූර්ව අනාවරණ ARV එන්නත ලබාදුන් අතර වෛද්‍ය, දන්ත වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා සිසුන් 995කට හෙපටයිටිස් "බී" එන්නත ලබාදෙන ලදි. පැපොල එන්නත් 27ක් ,MR එන්නත් 35ක් නිවාරණ පියවරක් ලෙස ලබාදෙන ලදි. ටෙටනස් ටොක්සොයිඩ් එන්නත් 226ක්ද ලබාදී ඇත.

### වෛද්‍ය පරීක්ෂණ

කාර්ය මණ්ඩල සහ සිසුන් සඳහා වෛද්‍ය පරීක්ෂණ පවත්වා ඇත. නව කාර්ය මණ්ඩලය, කාර්ය මණ්ඩල ශිෂ්‍යත්ව හා ක්‍රීඩා වෛද්‍ය සිසුන් සඳහා පිළිවෙළින් මුළු වෛද්‍ය පරීක්ෂණ 142, 05 ,106ක් සිදුකර ඇත.

### වෛද්‍ය මණ්ඩලය

පේරාදෙණිය ශික්ෂණ රෝහලේ උපදේශන විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් යුක්ත වෛද්‍ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකු ඉදිරිපත් කර ඇත. නවකවදය හේතු කොට ගෙන ස්නායු ආබාධවලින් පෙළෙන සිද්ධීන් හතරක් සිසුන් අතරින් වර්තා විය. රාජකාරියේ යෙදී සිටියදී සිදුවූ අනතුරු 29ක් වාර්තාවූ අතර කාර්ය මණ්ඩල විසින් හදිසි අනතුරු නිවාඩු ලබාදෙන්නට විය. රෝගීන් මාරුකර යැවීම තියුණු අවදානම් කළමනාකරණය සඳහා හා විශේෂඥ සායන සඳහා රෝගීන් 259කු පේරාදෙණිය ශික්ෂණ රෝහලට සහ රෝගීන් 30කු මහනුවර මහරෝහලටත් මාරුකර යවන ලදි.

**රසායනාගාරය**

වෛද්‍ය රසායනාගාරය සුවකාරක සත්කාරය සඳහා පරිපූරක සේවාව ලබාදෙයි. 2012 වර්ෂයේදී රුධිර පරීක්ෂණ 14268ක්, මුත්‍රා පරීක්ෂණ 4792ක්, අසුචි පරීක්ෂණ 154ක් හා වෙනත් පරීක්ෂණ 35ක් සිදුකරන ලදි.

**ඖසුහල**

ප්‍රධාන රෝහල්වල සුලභව භාවිතා කරන ඖෂධ වර්ග බොහෝමයක් සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් අපගේ සිසුන් වෙත සපයා ඇත. 2012 වසරේදි ඖෂධ සඳහා හරබිල් පත්වලින් රුපියල් 1514819.64 ක් හා සුළු මුදල් වලින් රුපියල් 6185.60ක මුදලක් වියදම් කර ඇත. පසුගිය වසර පුරා වෛද්‍ය හිඟ ගාස්තු සඳහා රුපියල් 112666.10ක මුදලක් අයකරගෙන ඇත.

**නිවාරණ කටයුතු**

**සනීපාරක්ෂක කටයුතු**

දිනපතා කුණු එකතු කිරීමේ කටයුතු සිදුකළ අතර වාර්ෂික සහ අපද්‍රව්‍යවල මුළු එකතුව ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 960කි. දෛනික කුණු එකතු කිරීමේ දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී 50කි. සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කොම්පැක්ටර් රථය අවස්ථා කිහිපයකදී අක්‍රීය වීම නිසා මහනුවර මහ නගර සභාවේ කොම්පැක්ටර් රථය ලබාගන්නා ලදි.

**වසංගත රෝග පාලන කටයුතු**

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ මහජන සෞඛ්‍ය අංශය විශ්වවිද්‍යාලයේ ශ්‍රමදාන ව්‍යාපාරය තුළ ඩෙංගු නිවාරණ කටයුතුවල ක්‍රියාශීලීව නියැලී සිටි අතර 2012 මැලේරියා මර්ධන ව්‍යාපාරයේ සහය ඇතිව කීඨයන් සෙවීම හා දුම් ගැසීම් කටයුතු සිදුකරන ලදි. තවද මෙම වසරේදී වේයන් පාලනය කිරීම ආදි කටයුතු රාශියක් ද සිදුකරන ලදි.

**ජලභීතිකා රෝග කටයුතු**

2012 වසර තුළදී පශු වෛද්‍ය පීඨයේ සහයෝගය ඇතිව විශ්වවිද්‍යාල භූමිය තුළදී සුනඛයන් 197ක් එන්නත් කළ අතර බැල්ලියන් 22ක් ජීවානුහරණය කරණ ලදි.

**ආහාර හා ජල සනීපාරක්ෂක කටයුතු**

දෛනික පදනමින් ආපනශාලා පරීක්ෂාවන් 196 වතාවක් සිදුකළ අතර සිසුන් හා කාර්ය මණ්ඩල විසින් කරන ලද පැමිණිලිවලට අනුව ජල සාම්පල විශ්ලේෂණ හය වතාවක් 2012 වසරේදී සිදුකරන ලදි.

**වසංගත රෝග**

2012 වසරේදි බෝවන රෝග වැළදුනු රෝගින් 91ක් දෙනෙකු හඳුනාගන්නා ලදි. හෙපටයිටිස් 05, කම්මුල්ගාය 05, පැපොල 43, උණසන්නිපාතය 01, ඩෙංගු උණ 10, රුබෙල්ලා 22 හා පාචනය 05 වශයෙන් වු රෝගීන්ට ප්‍රතිකාර ලබාදුණි.

**බාධක සහ පිළියම්**

වෛද්‍ය නිලධාරීන්ගේ හිඟය නිසා 2012 දුෂ්කර වු වසරක් විය. ස්ථිර සේවයේ සිටින එකම වෛද්‍ය නිලධාරිණියට ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යන් ද ආවරණය කිරීමට සිදුවිය. අර්ධ කාලින පදනම මත වෛද්‍ය නිලධාරීන් දෙදනකු බඳවා ගත් අතර පැවරුම් පදනම මත බඳවාගත් වෛද්‍ය එස්.වී. වත්තේගම බාහිර රෝගී අංශයේ සේවයේ නිරත වුවාය. අර්ධ කාලීන පදනම මත බඳවාගත් කේ.පී.සි. ගුණසේකර (මිය) 2012 දෙසැම්බර් අවසානයේ මාස තුනක් සේවය කළාය.

බඳවා ගැනීමේ මණ්ඩල දෙකකදී වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකු බඳවාගත් අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු ජූලි සහ නොවැම්බර් මාසවල රාජකාරී බාරගත්හ. කම්පැක්ටර් රථය අඩපණ වීම නිසා කුණු එකතු කිරීමේ කටයුතුවලට බාධා සිදුවිය.

**අනාගත සැලසුම්**

බඳවාගත් සියලුම වෛද්‍ය නිලධාරීන් රාජකාරී බාරගත් පසු ඉරිදා සහ රජයේ නිවාඩු දිනවලදී බාහිර රෝගී අංශය විවෘතව තැබීමට අපේක්ෂා කෙරේ.

විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කුණු බැහැර කිරීමේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාම සඳහා නව කම්පැක්ටර් රථයක් අවශ්‍ය වේ. විශ්වවිද්‍යාල ප්‍රජාවට සේවාවන් සැලසීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානයට ගොඩනැගිලි දිගුවක් ගැනීමට ද සැලසුම් සකස් කෙරේ.

## D3 ශාරීරික අධ්‍යාපන අංශය
(වැඩබලන අධ්‍යක්ෂ පී. කුමාර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා බාර අංශය වශයෙන් ශාරීරික අධ්‍යාපන අංශය තරුණ තරුණියන් තුළ ජීවිත කාලීනව ක්‍රීඩාවන්හි හෝ වෙනත් විනෝද කටයුතුවල නිරතවීම තුළින් ස්වයං වර්ධනයක් හා වඩා යහපත් වූ ස්වස්ථතාවක් හා සෞඛ්‍ය තත්ත්වයක් අත්කර ගැනීම වැනි ද්විතික ප්‍රතිඵල අත්කර ගත හැකිය යන හැඟීම ඇතිකරලීම එහි ඉලක්කය කොට සළකයි. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම පිණිස විවිධ ක්‍රීඩා වැඩසටහන්, තරඟාවලි, දේශන මාලාවන්, වැඩමුළු හා විදෙස් සංචාර සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලබයි.

**ජයග්‍රහණ**

- **අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලි 2012**

සියලුම ක්‍රීඩා ක්‍රියාකාරකම්වල උච්චස්ථානය වනුයේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරනු ලබන මෙරට විවිධ විශ්වවිද්‍යාල පරිශ්‍රයන්වල පවත්වනු ලබන 2012 අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරඟාවලියයි. ජුනි මාසයේ ආරම්භ කළ මෙම තරඟාවලිය 2012 නොවැම්බර් මාසය අවසානය තෙක්ම පැවැත්විණ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි පළමු පෙළ ක්‍රීඩා උත්සවයේදී පාපන්දු, රග්බි, මල්ලවපොර (පිරිමි) හා දැල්පන්දු (කාන්තා) යන තරඟවලින් ශූරයන් බවට පත්ව විශ්වවිද්‍යාලයට ගෞරවයක් අත්කර දුන්හ. එපමණක් නොව ඔවුහු දෙවන ස්ථාන හතක් හා තෙවන ස්ථාන දෙකක් ද ලබා ගත්හ. විශ්වවිද්‍යාලයේ තරඟවලදී උපාධි අපෙක්ෂකයන් විසින් දක්වන ලද අති මහත් වූ වෙහෙස නිසාවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල 14 ක් අතුරින් පිරිමි අංශයෙන් තෙවන ස්ථානය ද සමස්ත කාන්තා අංශයෙන් තෙවන ස්ථානය ද සමස්ත පිරිමි සහ කාන්තා දෙඅංශයෙන්ම තෙවන ස්ථානය ද අත්කර ගැනීමට සමත් විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ පිරිමි අංශයෙන් ක්‍රීඩා ඉසව් 20කට සහභාගි වූ අතර කාන්තා අංශය ක්‍රීඩා ඉසව් 14 කට සහභාගි වූහ.

- **ජාත්‍යන්තර තරඟාවලි**

එම්. එම්. එල්. එස්. මනඋතුම් (A/BBA/012) ක්‍රීඩකයා මාර්තු 19 වැනි දින පකිස්තානයේදී පැවැත්වූ SAARC පැසිපන්දු කුසලානය සඳහා ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් සහභාගි වූවේය. හත්වැනි UITM ජාත්‍යන්තර ක්‍රීඩා ෆියෙස්ටා 2012 මැලේසියාවේ ද අලාම්හිදී 2012 සැප්තැම්බර් මස 06-10 දිනයන් දක්වා පැවැත්විය. මෙම ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලිය තාක්ෂණ විශ්වවිද්‍යාලය MARA විසින් සංවිධානය කළ අතර මෙම සංචාරය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් තිස්දෙනෙකු සහභාගි වූහ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දැල් පන්දු කණ්ඩායම මැලේසියා සයින්ස් විශ්වවිද්‍යාල ක්‍රීඩාපිටියේ 2012 සැප්තැම්බර් 13 හා 14 යන දිනවල පැවැත්වූ “Pest Bola Jaring USM 2012” තරඟාවලියට පීඨ නියෝජනය කරමින් ක්‍රීඩිකාවන් නව දෙනෙකු සහභාගි වූවාය.

- **කාර්ය මණ්ඩල ක්‍රීඩා වැඩසටහන -2012**

කාර්ය මණ්ඩල ක්‍රීඩා වැඩසටහන 2012 නොවැම්බර් 14 දින සිට දෙසැම්බර් 11 දින දක්වා පවත්වන ලදි. මෙම තරඟාවලියට මලල ක්‍රීඩා (සහය දිවීම) බැඩ්මින්ටන්, කැරම්, මේස පන්දු හා අත්පන්දු යන තරඟ ඇතුළත් විය.

- **වර්ණ ප්‍රදාන උත්සවය 2012**

2011 වසර සඳහා වන වර්ණ ප්‍රදාන උත්සවය 2012 මැයි 16 වැනි දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන් මහතාගේ සම්භාව්‍ය අනුග්‍රහය යටතේ විශ්වවිද්‍යාල ක්‍රීඩාගාරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. ක්‍රීඩකයෝ 152 දෙනෙකු හා ක්‍රීඩිකාවන් 87 දෙනෙකු පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් දේශීය සහ ජාත්‍යන්තර තරඟවලදී දැක්වූ විශිෂ්ට දක්ෂතා සඳහා වර්ණ ප්‍රදාන ලබාගත්හ. වර්ණ ප්‍රදානයට අමතරව ක්‍රීඩක ක්‍රීඩිකාවන් 18 දෙනෙකු වර්ෂය තුළදී ඔවුන් අත්කරගත් විශිෂ්ටතාවන් සඳහා විශේෂ ප්‍රදාන ද ලබාගත්හ.

- **ප්‍රධාන තරඟාවලි/ ආරාධිත තරඟාවලි**

විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ ක්‍රීඩා අමාත්‍යාංශය ජාතික තරුණ සේවා සභාව, පාපන්දු ලීගය හා වෙනත් ආයතන මඟින් පවත්වන ලද ක්‍රීඩා තරඟවලට සහභාගි වූහ. එමෙන්ම විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායම් ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාලයට හා සමහර ආයතන මඟින් සංවිධානය කරන ලද ආරාධිත තරඟාවලිවල බැඩ්මින්ටන්, පැසිපන්දු, දැල්පන්දු, පිහිනුම්, මේස පන්දු, ටයිකොන්ඩු, වැනි ක්‍රීඩාවලට සහභාගි වූහ.

ශාරීරික අධ්‍යාපන අංශය විසින් සංවිධානය කළ“pera 6’5 හොකී තරඟාවලිය ” තෙවන වතාවටත් අප්‍රේල් 10 වැනි දින විශ්වවිද්‍යාල හොකී ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි. කාන්තා ශූරතාවය පේරාදෙණිය විශ්වවිද්‍යාල කණ්ඩායම විසින් දිනාගත් අතර පිරිමි කාණ්ඩයේ දෙවන ස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාල පිරිමි කණ්ඩායම විසින් දිනාගන්නා ලදි. විශ්වවිද්‍යාල පැසිපන්දු කණ්ඩායම ශාරීරික විවෘත පැසිපන්දු තරඟාවලියක් 2012 දෙසැම්බර් මස 01-02 යන දිනවලදි පවත්වන ලදි. මෙම තරඟාවලිය සඳහා පිරිමි කණ්ඩායම් 04ක් සහභාගි වූහ.

**බාධක සහ පිළියම්**

ශාරීරික අධ්‍යාපන අංශයේ සමහර අංශයන් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය තව දුරටත් පවතී. හොඳින් නිමකළ ප්‍රේක්ෂකාගාරයක් සහිත අංග සම්පූර්ණ ධාවන පථයක් ඉදිකිරීම දීර්ඝ කාලයක සිට දැනෙන අවශ්‍යතාවයකි. පහත සඳහන් ක්‍රීඩා ස්ථානවල අඩුපාඩු වහාම නිවැරදි කළයුතුව ඇත.

1. පාපන්දු ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීම
2. රග්බි-පාපන්දු ක්‍රීඩාපිටිවල ප්‍රේක්ෂකාගාර
3. ක්‍රිකට් ක්‍රීඩාපිටිය සඳහා සංවර්ධන සැලසුමක්
4. පිහිනුම් තටාක සංකීර්ණය සඳහා සංවර්ධන සැලසුමක්
5. ක්‍රීඩාගාරයට නිසි ආලෝක පද්ධතියක් සහිත සංවර්ධන සැලසුමක්
6. ක්‍රීඩාගාරයේ දේශන/සම්මන්ත්‍රණ කාමර සඳහා පහසුකම්

**අනාගත සැලසුම්**

ශාරීරික අධ්‍යාපන අංශය බාහිර පුද්ගලයන් සඳහා ක්‍රීඩා හා විනෝද කටයුතු කළමනාකරණය හා ක්‍රීඩා පුහුණු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීමට සැලසුම් සකස් කරයි. එමෙන්ම මෙම අංශය උපාධි අපේක්ෂයන් සඳහා ද ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීමට සැලසුම් සකස් කරයි. මෙම අංශය උපාධි අපේක්ෂකයන් සඳහා ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ non-credit අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට ද අදහස් කරයි. ත්‍රෛමාසික ක්‍රීඩා වාරසගරාවක් ආරම්භ කිරීම ඉදිරි වර්ෂය සඳහා සැලසුම් කොට ඇති තවත් ව්‍යාපෘතියකි.

## D4 ශිෂ්‍ය සේවා අංශය

(සහකාර ලේඛකාධිකාරී එස්.සී. හේරත් විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

ශිෂ්‍ය සේවා අංශය සිසුන්ට විවිධාකාරයෙන් සේවාවන් ලබාදීම පිණිස විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ සහ වෙනත් ඒකකවල කාර්යයන් සම්බන්ධීකරණය කරනු ලබයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භයේදී සියලුම උපාධි අපේක්ෂක සිසුන්ට නේවාසික පහසුකම් සැපයීමට සැලසුම් කළ ද විශ්වවිද්‍යාලයට හැකියාව ඇත්තේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 55%කට පමණක් නේවාසික පහසුකම් සැපයීමටය. ශිෂ්‍ය නේවාසිකාගාර 15ක් හා භික්ෂු නේවාසිකාගාර දෙකක් විශ්වවිද්‍යාලයට ඇත. එමෙන්ම සෑම නේවාසිකාගාරයකටම පූර්ණ කාලීන උපශාලාධිපතිවරයෙක් ආචාර්ය මණ්ඩලයේ ශාලාධිපතිවරයෙකු හා අර්ධ කාලීන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල උපශාලාධිපතිවරයෙකු ද ඇත.

විශ්වවිද්‍යාල ප්‍රජාව ශිෂ්‍ය උපදේශනය, සංස්කෘතික ක්‍රියාකාරකම්, ආගමික කටයුතු සහ ශිෂ්‍ය සංගම්වල කටයුතු වැනි සුබසාධන, සංස්කෘතික හා ආගමික යන අංශවල පුළුල් පරාශයක කාර්යයන්වලට සහභාගි වේ.

විශ්වවිද්‍යාලයේ සිසු විනය පවත්වා ගැනීම සඳහා පියවර රාශියක් ගනු ලබයි. විශ්වවිද්‍යාලය තුළ සිසු විනය සම්බන්ද කරුණු පිළිබඳව උපකුලපතිතුමා වෙනුවට කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විනය පාලක ලෙස උපකුලපතිතුමා විසින් පත්කර ඇත. අදාළ පීඨ සමඟ සාකච්ඡා කොට සෑම පීඨයකටම නියෝජ්‍ය විනය පාලකවරුන් ද උපකුලපතිතුමා විසින් පත් කොට ඇත.

වර්තමානය වනවිට විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි කළ ශිෂ්‍ය සංගම් 67ක් ඇත. තවද, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 135, 112 (3) වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 (සංශෝධිත) සහ 1988 අංක 26 යටතේ කියවෙන වගන්ති ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් පණවන ලද අතුරු ව්‍යවස්ථාවන්ට අනුව පේරාදෙණිය ශිෂ්‍ය සංගමය සහ සියලුම පීඨ සංගම් 2011/2012 අධ්‍යයන වර්ෂය තුළදී ස්ථාපිත කරන ලදි.

විශ්වවිද්‍යාලයේ කලා සභාව විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා චිත්‍රපට උත්සව, වර්ෂික නාට්‍ය උත්සවය සහ සිසුන්ගේ නාට්‍ය තරඟ, චිත්‍ර, ඡායාරූප, කවි, කෙටි කථා තරඟ හා සංස්කෘතික ක්‍රියාකාරකම් රාශියක් සංවිධානය කරයි. වාර්ෂික නාට්‍ය උත්සවය කලා සභාවේ ඉතා වැදගත් ක්‍රියාකාරකම්වලින් එකකි.

2012 වසර සඳහා පත්කළ විනයපාලකවරු, ශාලාධිපතීන්/උප ශාලාධිපතීන් හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්ගේ නම් ලැයිස්තුව මේ සමඟ අමුණා ඇත

**ජයග්‍රහණ**

1. සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම
2. මාසික මහපොළ හා ශිෂ්‍යාධාර ක්‍රමානුකූලව නිසි වේලාවට ගෙවීම
3. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 1962 විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් ශිෂ්‍යත්ව 62ක් ප්‍රදානය කිරීම.

**බාධක සහ පිළියම්**

සිසුන්ට නවාතැන් ගැනීම සඳහා නේවාසික පහසුකම් හිඟ වීම.

**අනාගත සැලසුම්**

1. ආපන ශාලා පද්ධතිය දියුණු කොට දීර්ඝ කිරීම.
2. සිසුන්ගේ නේවාසික පහසුකම්වල තත්ත්වය දියුණු කොට පුළුල් කිරීම.
3. සමාජ සහ සංස්කෘතික වැඩසටහන් සඳහා වන පහසුකම් ශක්තිමත් කොට පුළුල් කිරීම.
4. සිසුන්ට අදාළ විනය ක්‍රියාපටිපාටි සංවිදිත කිරීම.
5. සිසුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්, විනයපාලක හා නියෝජ්‍ය විනය පාලකවරුන් සමඟ සම්බන්ධව කරවන සංවිධාන ජාලය සංවර්ධනය කිරීම.

## D5 ආරක්ෂක සේවාවන්

(වැඩබලන ප්‍රධාන ආරක්ෂක නිලධාරි, ආර්.එම්. ඩිනාල් රත්නායක මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාල භූමි ප්‍රමාණය අඛණ්ඩ වශයෙන් අක්කර 1795ක් දක්වා ව්‍යාප්ත වේ. ප්‍රධාන ආරක්ෂක නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි, ආරක්ෂක පරීක්ෂක හා ආරක්ෂක නියාමකවරුන්ගෙන් යුක්තවන ආරක්ෂක අංශය විශ්වවිද්‍යාලයේ සියලුම නිශ්චල හා චංචල දේපල ආරක්ෂා කිරීමේ වගකීම දරයි. වර්තමානය වනවිට ප්‍රධාන ආරක්ෂක නිලධාරි හා නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරු පුරප්පාඩු වී පවති. ආරක්ෂක අංශය සතුව ආරක්ෂක පරීක්ෂකවරුන් 08 දෙනෙකු සහ ආරක්ෂක නියාමකවරුන් 53දෙනෙකු සිටි. එය ප්‍රමාණවත් සංඛ්‍යාව නොවේ. එමනිසා පුද්ගලික ආරක්ෂක අංශවල සේවාව කුලියට ලබාගැනීමට ද ආරක්ෂක අංශයට සිදුව ඇත.

**ජයග්‍රහණ**

මුරපොළවල් සහ ජංගම මුර සංචාර මගින් සමස්ත විශ්වවිද්‍යාලයටම ආරක්ෂාව සැපයීම සඳහා ආරක්ෂක පියවර ගැනීම, නීති විරෝධි කටයුතු වැළැක්වීම, විමර්ශනය කිරීමේ සහ පරිපාලනයට වාර්තා කිරීම, සහය කාර්ය මණ්ඩලය, සිසුන් හා සේවකයන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ ඔවුනට ආරක්ෂාව සැපයීම සිසු විනය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම, සොරකම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සහ සොරකම් වැළැක්වීම, ගිණිගැනීම් වැළැක්වීම හා ආරක්ෂිත පියවර ගැනීම, විශ්වවිද්‍යාලය සහ ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරන උපාධි ප්‍රදානෝත්සවය, විවිධ උත්සව, ප්‍රදර්ශන හා වැඩමුළුවලට ආරක්ෂාව සැපයීම, විශ්වවිද්‍යාල නිල නිවාසවල පදිංචි වී සිටින කථිකාචාර්යවරුන්ගේ හා සේවකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා ඔවුන්ගේ ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගැනීම, පොලිසිය සමඟ සමීප සබඳතා පවත්වා ගනිමින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය නිසි පියවර ගැනීම, දෛනික වාර්තා ලබාදෙමින් එදිනදා සිදුවීම් පිළිබඳව උපකුලපතිතුමා දැනුවත් කිරීම හා ආගමික කටයුතු සංවිධානය කිරීම වර්ෂය තුළදී සිදුකරන ලදී .

**බාධක සහ පිළියම්**

කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීමට ආරක්ෂක අංශයට නොහැකි විය. වාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා ඵලදායි සහ කාර්යක්ෂම ජංගම මුර සේවාවන් සැපයීම දුෂ්කර කාර්යයකි. සන්නිවේදන උපකරණවල පවතින අඩුපාඩු නිසා තොරතුරු හුවමාරුවට බාධා සිදුවිය. මීට අමතරව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පහසුකම් ද ප්‍රමාණවත් නොවේ.

**අනාගත සැලසුම්**

ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම, වාහන සංඛ්‍යාව වැඩි කිරීම, ආරක්ෂක කාර්යාලයක් පීඨවල ස්ථාපිත කිරීම, පරිගණක විද්‍යාගාර, පුස්තකාල හා ගබඩාවල ආරක්ෂක කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන ප්‍රධාන දොරටුව අසළ ආරක්ෂක මුරපොළක් පිහිටුවීම, දිවා රාත්‍රී ආරක්ෂක සේවාවන් සැපයීම හා ආරක්ෂාව සම්බන්ධ තොරතුරු එකතු කිරීම, වඩා යහපත් වූ ආරක්ෂක සේවාවක් සැපයීම සඳහා පවතින අඩුපාඩු හඳුනා ගැනීම හා ඒවාට අදාළ විසඳුම් ලබාදීම.

## D6 විනයාරක්ෂක අංශය
(ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි, ඩබ්.ඒ.ඒ. වේරහැර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

විනයාරක්ෂක අංශය ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි සහ විනයාරක්ෂකයන් දෙදෙනකුගේන් සමන්විත වේ. මෙම අංශය නියෝජ්‍ය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී. විනයාරක්ෂක අංශයේ කාර්යභාරය වනුයේ නියෝජ්‍ය උපකුලපතිතුමාගේ මගපෙන්වීම යටතේ මධ්‍යස්ථාන, ක්‍රීඩාගාරය, ක්‍රීඩාපිටි හා නේවාසිකාගාරවලදී සිසුන්ගේ ක්‍රියාකාරකම් සහ හැසිරීම පිළිබඳව සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කරමින් සිසු විනය පවත්වා ගැනීමයි.

**ජයග්‍රහණ**

පීඨවල නවක සිසු කණ්ඩායම්වල නීති කඩකිරීම් අවම කරගැනීම පිණිස අතුරු ව්‍යවස්ථා සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. සිසුන් සමග කටයුතු කිරීමේදී බාහිර පාර්ශවයන්ගේ සේවාව අවශ්‍යවන හෙයින් හිඳගල, ගලහ හන්දිය, දන්ගොල්ල හන්දිය, පේරාදෙණිය හා මහකන්ද බස් නැවතුම්පල යන ස්ථානවල ත්‍රීරෝද රථ රියදුරන් සමග සම්බන්ධතාවය සම්බන්ධීකරණය කරන ලදි. සුබසාධන අංශයේ අධ්‍යක්ෂ සමග සම්බන්ධ වී සමාජ සුබසාධන ව්‍යාපෘතියක් හා නවකවදය වැලැක්වීමේ වැඩසටහනක් දියත් කරන ලදි.

සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම්.

- කරුණු සෙවීමේ මෙහෙයුම.
  මෙම වර්ෂය තුළදී පීඨ, නේවාසිකාගාර, ක්‍රීඩාපිටි හා ක්‍රීඩාගාරය යන ස්ථානවලදී සිදුවීම් 38ක් හඳුනාගන්නා ලදි.

- කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ආරක්ෂාව ලබා දෙමින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශයට සහය දක්වන ලදි.

- සිසු විනය සම්බන්ධයෙන් පීඨාධිපතීන්ට, විනය පාලකට, නියෝජ්‍ය විනය පාලකවරුන්ට සහ ශාලාධිපතීන්ට සහයෝගය දක්වන ලදි.


- විනය පරීක්ෂණ පැවැත්වීමේදි ලේඛන සහය ඇතුළත්ව සේවාවන් සපයා දෙන ලදි.

- විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවය, ප්‍රදර්ශන හා නාට්‍ය උළෙල වැනි ප්‍රධාන උත්සවවලට සහයෝගය දක්වන ලදි.

- ශාස්ත්‍ර පීඨය අසළ නිකරුණේ ගැවසෙමින් සිටි සැකකටයුතු පුද්ගලයෙකු අල්ලා පොලීසියට බාරදීමට පියවර ගන්නා ලදි.

- ජාතික ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ආරක්ෂක හා බුද්ධි අංශයට සහයෝගය දක්වන ලදි.

## D7 උද්‍යාන අංශය
(උද්‍යාන පාලක, ඩී.එම්.එස්.කේ.බී. පලිපාන මහතා විසින් වාර්තා කරන ලද පරිදි)



**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 700කි. පීඨ, නේවාසිකාගාර, කාර්ය මණ්ඩල බංගලාවන් සහ වෙනත් පහසුකම් සැපයීම සඳහා ඉන් හෙක්ටයාර 230ක් සංවර්ධනය කොට ඇත. විශ්වවිද්‍යාල උද්‍යානයේ විවිධ මල් පැළ හා ආවරණ ගස් සිටුවා බඩවැටි හා තණ බිම් විශාල ප්‍රමාණයක් කප්පාදු කොට සැලකිය යුතු මට්ටමක භූ අලංකාර සිදු කොට ඇත. උද්‍යාන විද්‍යා නියමයන්ට අනුව පවතින භූ අලංකාර වැඩිදියුණු කරන අතරම ඒවා නියමාකාරයෙන් පවත්වා ගැනීම උද්‍යාන අංශයේ ප්‍රධාන අරමුණ වේ.

පහත සඳහන් කාර්යයන් ඉටුකිරීම උද්‍යාන අංශයේ ප්‍රධාන වගකීම වේ.

1. විශ්වවිද්‍යාලයේ පවත්නා භූ අලංකාර පවත්වා ගැනීම.
2. පැළ තවාන් නඩත්තු කිරීම සහ විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට මල් පෝච්චි සැපයීම.
3. විශ්වවිද්‍යාල දේපලවලට හානි වන අන්දමේ අනතුරුදායක ගස්, ශාඛා ඉවත් කිරීම හා සාමාන්‍ය සේවා අංශය සහ ආරක්ෂක අංශය සමඟ එක්ව කොට කඳන් ටෙන්ඩර කිරීමේ කටයුතු මෙහෙය වීම.
4. විශ්වවිද්‍යාලයේ උද්‍යාන අලංකාර ඉහළ නංවා දියුණු කිරීම.
5. නව උද්‍යාන අලංකාර සඳහා සැලසුම් සකස් කිරීම හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම හා නව උද්‍යාන අලංකාර ක්‍රියාත්මක කිරීම.

**ජයග්‍රහණ**

2011 වසරේදී උද්‍යාන පාලන අංශය සිදුකළ කාර්යයන් කොටියෙන් පහත දැක්වේ.

දිරාපත්වූ හා අධිවර්ධිත ගස් වෙනුවට අළුතෙන් ගස් සිටුවීම, විශ්වවිද්‍යාල පරිශ්‍රයේ රුක් රෝපණය කිරීම වැනි නඩත්තු කටයුතු ඇතුළත් උද්‍යාන අලංකාර කටයුතු සතුටුදායක මට්ටමින් සිදුකරන ලදි. අනතුරුදායක ලෙස පිහිටා තිබූ ගස් හා ශාඛා ඉවත් කරන ලදි. විශ්වවිද්‍යාල භූමියේ සියලුම බඩවැටි නිතිපතා කප්පාදු කොට අඩි පාරවල් හා පඩිපෙළවල් පිරිසිදු කර වල්පැලැටි ගලවා නිසි ලෙස නඩත්තු කරන ලදි. ඉහළ හන්තානය, මාර්ෂ් කන්ද, මාවලවත්ත හා කුඩුගොඩැල්ල යන ස්ථානවල හටගත් ගිණි හේතුවෙන් විශ්වවිද්‍යාල දේපලවලට හානි සිදුවීමෙන් වලක්වා ගැනීම සඳහා ගිණි ආරක්ෂක වැටවල් යොදන ලදි.

උද්‍යාන අංශය මෙම වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට සිදුකළ සියලුම විශේෂ කටයුතුවලට එනම් විශ්වවිද්‍යාලයේ උත්සවවලට මල් පෝච්චි සැපයීමෙන්, නාට්‍ය උත්සවය සඳහා සරත්චන්ද්‍ර එළමහන් රංග පීඨය නිතිපතා නඩත්තු කිරීමෙන් හා විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සැසිය යන කටයුතු හා සහසම්බන්ධවී කටයුතු කිරීම ආදී වශයෙන් උපරිම සහයෝගය ලබාදෙන ලදි.

**විශේෂ වර්ධනයන් සහ ක්‍රියාකාරකම්**

1. උද්‍යාන කටයුතු සහ කැපූ තණ කොළ, අතු, ගොම පොහොර හා වෙනත් ඉවත ලන ද්‍රව්‍යයන් යොදාගෙන කොම්පෝස්ට් පොහොර සකස් කරන ලදි.
2. රුක්රෝපණ වැඩසටහන් සංවිධානය කොට සාර්ථකව අවසන් කරන ලදි.

**උද්‍යාන වර්ධනයන් හා නව උද්‍යාන සැලසුම්**

1. මා ඔය, සනාතන මන්දිරය අවට ප්‍රදේශය, පීඨ, පොදු ස්ථාන හා නේවාසිකාගාර යන ස්ථානවල උද්‍යාන වර්ධන කටයුතු සිදුකරන ලදි.
2. නව පශු වෛද්‍ය රෝහල් පරිශ්‍රයේ උද්‍යාන අලංකාර කටයුතු ක්‍රියාත්මක කළ අතර අලුතින් ස්ථාපිත කළ විශ්වවිද්‍යාල කිරිහල ප්‍රදේශයේ උද්‍යාන කටයුතු දියුණු කරන ලදි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තණබිම්වල තුඹස් ඉවත් කිරීම ආදි කටයුතු සිදුකොට නැවත සකස් කරන ලදි.
2. උද්‍යාන පාලන කටයුතු සඳහා බෝගම්බර බන්ධනාගාරයේ පුනරුත්ථාපන රැඳවියන් යොදා ගන්නා ලදි.

**බාධක සහ පිළියම්**

1. මෙම අංශයේ පවතින කම්කරුවන්ගේ හිඟය එදිනෙදා උද්‍යාන කටයුතු සිදුකිරීම සඳහා බලපාන ප්‍රධාන බාධකයකි.
2. විශ්වවිද්‍යාලයේ විශාල භූමි ප්‍රදේශ පුරා පැතිරුණු විශාල වැඩ කටයුතු ප්‍රමාණය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණ හැකියාවක් නොමැති වීම ද බාධකයකි.

**අනාගත සැලසුම්**

දියුණුව සඳහා කෙරෙන යෝජනාවන්

1. අවම තරමින් උද්‍යාන අධීක්ෂකයන් දෙදෙනෙකු බඳවාගෙන අධීක්ෂණ හැකියාව වැඩි කිරීම.
2. විවිධ දෙපාර්තමේන්තු සහ ඒකක මඟින් කෙරෙන ඉල්ලීම්වලට අනුව මෙම අංශයේ කම්කරුවන් මාරුකිරීමෙන් වැලැකීම.
3. සේවක පුරප්පාඩු පිරවීම හා තණ කොළ කපන්නා, ගස් ශල්‍යකර්ම ශිල්පීන් ආදී නව පුහුණු සේවක තනතුරු නිර්මාණය කිරීම.
4. අවශ්‍යතාවන්ට මෙන්ම විශ්වවිද්‍යාල පරිසරයට උචිත ආකාරයෙන් උද්‍යාන නියමයන්ට අනුකූලව අලුතෙන් ස්ථාපිත ගොඩනැගිලි සඳහා නව උද්‍යාන රටා සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.

## D8 වැඩ දෙපාර්තමේන්තුව
(වැඩ ඉංජිනේරු, ජේ.ඒ.සී.එන්. ජයසූරිය මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

වැඩ දෙපාර්තමේන්තුව විශ්වවිද්‍යාලයේ වර්ග අඩි මිලියන 4.02ක් අඩංගු ගොඩනැගිලි පන්සිය අසූ හයක් (586) කි.මී විසිහතරකින් යුතු අභ්‍යන්තර මාර්ග, ජල සහ විදුලි සැපයුම් ජාලය, වැසි ජල කාණු පද්ධතිය හා ජලාපවහන පද්ධතිය යන අංශවල සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා වගකිව යුතු වේ.

ඉහත කටයුතුවලට අමතරව වැඩ දෙපාර්තමේන්තුව ඉහත සඳහන් කළ පද්දතීන්වලට පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති බාහිර පාර්ශවයන්ට බාරදුන් විට ඒවා අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීම සඳහා ද වගකිවයුතු වේ.

වැඩ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වැඩ ඉංජිනේරු ඇතුළත් තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයන් නව දෙනෙකු (09) ලිපිකරු කාර්ය මණ්ඩල සාමාජිකයන් දස දෙනෙකු (10) රියදුරන් හා ගබඩාවල කාර්ය මණ්ඩලය සහ කම්කරුවන් එකසිය හැට හතර දෙනෙකුගෙන් (164) යුක්ත වේ.

**ජයග්‍රහණ**

විශ්වවිද්‍යාල පරිශ්‍රයේ එක් කළාපයක පවතින වැඩ ප්‍රමාණය මත පදනම්ව උතුරු, මධ්‍යම, දකුණු, බටහිර, නැගෙනහිර හා ඈත බටහිර ලෙස කළාප හයකට (මෙහෙයුම් සම්බන්ධ අරමුණ සඳහා) බෙදා ඇත. ඒ අනුව ශ්‍රම බලකාය මෙම කළාප අතර සමාන ආකාරයෙන් බෙදා ඇත. ශ්‍රම බලකාය මෙම කළාප අතර බෙදා හැරීමේදී ඔවුන්ගේ කාර්මික නිපුණතාව ආකල්ප, වැඩ එළඹුම්, සාමුහිකත්වය, වැඩට පැමිණීම සහ නායකත්ව ගුණාංග යන කරුණු ඇගයීමට ලක්කොට ඇත. මෙතෙක් විමධ්‍යගත කිරීමට නොහැකි වූ වැඩ එනම් මාර්ග නඩත්තුව ජලාපවහාන කළමනාකරණය, මධ්‍යම ජල කළමනාකරණය, කාර්යාල හා ගබඩා සේවාව සහ විශේෂ කුසලතා යන ඒකක පහ වැඩ ඉංජිනේරු යටතේ තබා ඇත.

මෙම සැකැස්ම තුළින් අපගේ වැඩ අධීක්ෂණයේ ගුණාත්මකභාවය හා කාර්යක්‍ෂමතාවය දියුණු කොට ඇති අතර කලක සිට අතහැර දමා තිබුණු විශ්වවිද්‍යාලයේ දෛනික වැඩ කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය කිරීමට ද අපට හැකි වී ඇත.

එමෙන්ම පුනරුත්ථාපන වැය ශීර්ෂයන් ඵලදායි ලෙස උපයෝගී කරගැනීම සඳහා ඇස්තමේන්තු සහ යෝජනා සකස් කිරීමේදී බලපාන ප්‍රබල ගැටළු නිරාකරණය කරගැනීම පිණිස මෙම දෙපාර්තමේන්තුව තුළ නව සැලසුම් හා ඇස්තමේන්තු අංශයක් ද සකස් කොට ඇත.

අපගේ වැඩ දෙපාර්තමේන්තුව තුළ කලා කවයක් ස්ථාපිත කර ඇති අතර සේවකයන්ගේ කාව්‍ය, කාටුන් හා වෙනත් නිර්මාණ එළිදැක්වීම පිණිස මාසික බිත්ති පුවත් පතක් ද පවත්වාගෙන යනු ලබයි. මෙම කලා කවයේ ක්‍රියාකාරකම් තුළින් සේවකයන්ගේ ගරුත්වය, ආත්ම විශ්වාසය හා ඔවුන්ගේ ධනාත්මක චින්තනය දියුණු කිරීමට හැකිවන අතරම ප්‍රීතිමත් සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට ද හැකිවනු ඇත.

**අනාගත සැලසුම්**

අපගේ විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පය හා උද්‍යාන පාලනය ආරක්‍ෂා කිරීම පිණිස සැලසුමක් ද ඇතුළත්ව අතිවිශාල ගොඩනැගිලි ව්‍යාපෘතීන් සඳහා ගෘහ නිර්මාණ හා ව්‍යුහ සැලසුම් හා ඇස්තමේන්තු අංශයක් සංවර්ධනය කිරීමට ද මම අපේක්ෂා කරමි.

අමතර ශ්‍රම බලකායන් යොදවා වැඩ කළාප ශක්තිමත් කිරීම පිණිස මූලික කටයුතු ද සකස් කොට ඇති අතර කාර්යක්ෂමතාවයකින් යුතුව කම්කරුවන් යෙදවීමට හා භාණ්ඩ සහ නිලධාරීන් ප්‍රවාහනය අවම කරගැනීම සඳහාත් කළාප කාර්යාලයක් හඳුන්වා දීමට ද අපේක්ෂා කරමි.

ශාස්ත්‍ර පීඨයේ ලලිත කලා අංශයේ සහයෝගය ඇතිව අපගේ හැකියාවන්ගෙන් පරිපූර්ණ කම්කරුවන් සඳහා වේදිකා නාට්‍ය හා සංගීත වැඩමුළු කිහිපයක් සූදානම් කිරීමට හා හොඳ තත්ත්වයේ නාට්‍ය කිහිපයක් නිෂ්පාදනය කිරීමටත් විශ්වවිද්‍යාලයීය කම්කරුවන්ගෙන් සැදුම්ලත් වාද්‍ය වෘන්දයක් සකස් කිරීමටත් මම අපේක්ෂා කරමි.

## උපග්‍රන්ථ E - මුදල් වාර්තාව

## E1 මුදල් වාර්තාව -2012
(මුල්‍යාධිකාරී එම්.ඩී. ගන්තුනේ මහතා විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

මහ භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කරන ලද පිළිවෙළින් මිලියන 2,935ක පුනරාවර්තන වියදම් සහ රුපියල් මිලියන 300ක මූලධන වියදම් කළමනාකරණය කරගැනීමට මුදල් දෙපාර්තමේන්තුවට හැකි විය. අභ්‍යන්තර හා බාහිර බාධක සහ දුෂ්කරතාවන් පැවතියත් විශ්වවිද්‍යාලයේ ඉලක්කයන් හැකිතාක් යහපත් ආකාරයෙන් ලඟාකර ගැනීම පිණිස සීමිත වූ මුදල් ප්‍රදානයන් උපයෝගී කරගැනීමට හා කළමනාකරණය කරගැනීමට අපට හැකිවිය. එනිසා නිර්දේශිත සහ පිළිගත් මුදල් කළමනාකරණ රෙගුලාසි නිසා පීඨ අටක්, අධ්‍යයන අංශ 74ක් හා සහය සේවා මධ්‍යස්ථාන 15ක් මෙහෙය වන්නට විශ්වවිද්‍යාලයට හැකි වූ බව අප සතුටින් ප්‍රකාශකර සිටිමු. සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් මිලියන 167ක මුදලක් උත්පාදනය කරගන්නා ලදි.

නේවාසික විශ්වවිද්‍යාලයක් ලෙස මෙම විශ්වවිද්‍යාලය අභ්‍යන්තර සිසුන් 10,000 කට, බාහිර සිසුන් 11,000කට සේවය සලසා ඇති අතරම පීඨ අටේ සහ මධ්‍යස්ථානවලින් ගාස්තු අයකරෙන ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් පවත්වා ඇත. සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන් කරගෙන යෑම සඳහා සියලුම පහසුකම් ලබාදී ඇත.

**බාධක සහ පිළියම්**

1. මූලධන ප්‍රදාන

මූලධන ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද මුදල් විශ්වවිද්‍යාලය විසින් ඉල්ලා සිටින අවස්ථාවේදී රජය විසින් එම මුදල් නිදහස් කර නොමැත. 2012 වසරේදී වෙන්කරන ලද මුදල්වලින් 78%ක් ලබාගැනීමට විශ්වවිද්‍යාලය සමත්වූ අතර එය 2011 වසරේ 36%ක් විය. 2011 වසරේ අතහැරුණු ව්‍යාපෘති අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට හැකිවිය.

**අනාගත සැලසුම්**

පසුගිය වසර දෙකක කාලය තුළ විශ්වවිද්‍යාලයේ මුදල් දෙපාර්තමේන්තුව විසින් දියත් කරනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා අවශ්‍ය පද්දති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාමාර්ගයන් දියුණු කිරීම හා ඉහළ නැංවීම පිණිස පියවර කිහිපයක් ගෙන ඇත. ඉහත සඳහන් පියවරවලට අමතරව 2013 වසරේදී පහත සඳහන් අනාගත සැලසුම් ක්‍රියාත්මක කිරීමට මුදල් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

1. ස්ථාවර වත්කම් කළමනාකරණය

විශ්වවිද්‍යාලයේ ආරම්භක අවධියේදී ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කොට යාවත්කාලීන කර නොතිබූ බවත් විශ්වවිද්‍යාලයේ භෞතික වත්කම් කළමනාකරණය සඳහා නිසි පද්දතින් ක්‍රියාත්මක කොට නොතිබූ බවත් නිරීක්ෂණය විය. එම නිසා විශ්වවිද්‍යාලයීය මුදල් දෙපාර්තමේන්තුව මේවන විට ස්ථාවර වත්කම් ලේඛනයක් සම්පූර්ණ කොට යාවත් කාලීන කර ඇත.

2. මුදල් දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම

නූතන අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි 2012 වසරේදී නව සංවිධාන ව්‍යුහයක් අප විසින් හඳුන්වා දී ඇත. එම නව ව්‍යුහය හඳුන්වාදීමෙන් අනතුරුව මුදල් දෙපාර්තමෙන්තුවේ රාජකාරී, වගකීම් හා විශ්වාසනීයත්වය ඉහළනැංවෙමින් පවතී.

3. කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කොට දියුණු කිරීම

විශ්වවිද්‍යාල කළමනාකරණ තොරතුරු පද්ධතිය, පඩි ලැයිස්තු සහ ණය ක්‍රමය, මිලදී ගැනීමේ ක්‍රමය හා ගබඩා කළමනාකරණ පද්ධතිය ඉහළ නැංවීම පිණිස නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරමින් සිටි. මෙම ව්‍යාපෘතිය 2013 වසරේ ආරම්භ කොට 2014 වසරේදී අවසන් කර මෙහෙයුම් ආරම්භ කිරීමට අපි අපේක්ෂා කරමු.

## E2 විගණන කමිටු වාර්තාව
(නියෝජ්‍ය අභ්‍යන්තර විගණන නිලධාරිණි, පී.එම්.ටී.ඩී.කේ. පොල්ගස්දෙණිය විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

විගණන කමිටුව විශ්වවිද්‍යාල පාලක සභාවේ අනු කමිටුවකි. යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ විධිවිධානවලට අනුව විධායක නොවන පාලක සභා සාමාජිකයන් තිදෙනෙකු සහ ලේඛකාධිකාරීවරයා කමිටුවේ සාමාජිකයෝ ලෙස සේවය කරති. උපකුලපතිතුමා මෙම කමිටුවේ ආරාධිත සාමාජිකයෙකු වන අතර මුල්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය මුල්‍යාධිකාරීන් සියලුම නියෝජ්‍ය ලේඛකාධිකාරීන් හා රජයේ විගණකාධිකාරී ද මෙම රැස්වීමට සහභාගි වෙති. මෙම රැස්වීම කැඳවනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිලධාරි විසිනි. යහපාලනය සඳහා වන විධි විධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම පරිපාලනය හා මුදල් ඉහළ නැංවීම සඳහාත් නිර්දේශ ඉදිරිපත් කරමින් ක්‍රියාකරයි.

නියෝජ්‍ය අභ්‍යන්තර විගණන නිලධාරිණියක්, ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්කර විගණන නිලධාරිණියක් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් හත්දෙනෙකු (07) 2012 වසරේදී විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ සේවයේ නියතු වූහ. ඔවුන්ගේ දෛනික රාජකාරීවලට අමතරව විගණන කමිටුවේ මගපෙන්වීම හා උපදේශකත්වය යටතේ පහත සඳහන් කාර්යයන් ද ඉටුකිරීමට හැකිවිය.

**වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ**

1. විගණන කමිටුව 2011 නොවැම්බර් මාසයේ සිට අභ්‍යන්තර විගණන අංශය හරහා සම්බන්ධීකරණය කරමින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ක්‍රියාමාර්ග සංවිධිත කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ අතර ඉතිරිව පවතින විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදි.

   විශ්වවිද්‍යාලය 2011-11-06 දිනට ඉතිරිව පැවති සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සපයා ඇත.

2. විගණන කමිටුව පහත සඳහන් යෝජනාවන් ඉදිරිපත් කරන ලදි.

   i. අධ්‍යයන නිවාඩු අනුමත කිරීමට පෙර බැදුම්කර සහ ගිවිසුම් අත්සන් කිරීම හා සම්බන්ද ක්‍රියාපටිපාටි සංවිධිත කිරීම.
   ii. බැදුම්කර සහ ගිවිසුම් පිළිබඳ කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම.
   iii. බැදුම්කරවල නිසි පරිපාලනයක් ඇති කිරීමේ සහ අයකර ගැනීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ අදහසින් ඒවායේ තොරතුරු දැන ගැනීම සඳහා බැදුම්කර සහ ගිවිසුම් පිළිබඳ මාසයක සාරාංශ වාර්තාවක් සකස් කොට උපකුලපතිතුමාට බාරදී එහි පිටපත් ලේඛකාධිකාරී, මුල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හා විගණන කමිටුව වෙත යැවීම.

විශ්වවිද්‍යාලය බැදුම්කර කඩකරන්නන්ගේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය සහ බැදුම්කර සහ ගිවිසුම් පරිපාලනය කිරීම සංවිධිත කිරීම සඳහා මේ වනවිටත් පියවර ගෙන ඇත. ඊට අමතරව බැදුම්කර හා බැදුම්කර කඩකරන්නන්ගේ තත්ත්වය නිරන්තරයෙන් සමාලෝචනය කොට අයකර ගැනීම් කඩිනම් කිරීම සඳහා නිර්දේශ කරන ලදි.

3. බලය බෙදීම සඳහා සැලසුමක් සකස් කිරීමට උපදෙස් දෙන ලදි. එම කාර්යය විශ්වවිද්‍යාලය විසින් මේවන විටත් සම්පූර්ණයෙන් අවසන් කොට ඇත.

4. ඉතිරිව පවතින සියලුම අත්තිකාරම් පිළිබඳව විමර්ශනය කරන ලෙසට කමිටුව විසින් නිර්දේශ කරන ලදි. ඊට අමතරව ඉදිරියේදී අංශ ප්‍රධානීන් හරහා උත්සව අත්තිකාරම් ගෙවීමේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කරන ලෙසට ද කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

ඒ අනුව විශ්වවිද්‍යාලය මේවනවිටත් උත්සව අත්තිකාරම් ගෙවීමේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.

එලෙස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්දති වැඩිදියුණු කොට ඒවා විශ්වවිද්‍යාලයේ උන්නතිය උදෙසා දායක වියයුතුයැයි යන්න විගණන කමිටුවේ අදහසයි.

## උපග්‍රන්ථ F - පාලක සභාව සහ සනාතන සභාව

## F 1 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පණතේ 44 වැනි වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2012 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| උපකුලපති | මාහාචාර්ය එස්.බී.එස්. අබේකෝන්<br>මහාචාර්ය ඒ. සේනාරත්න 2012.08.01 සිට ක්‍රියාත්මක වන පරිදි |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය වී.එස්. වීරසිංහ |
| වැඩබලන නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය එච්.එම්.එස්. හෙන්නායක 2012.08.06 සිට |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය එච්.එම්.එස්. හෙන්නායක 2012.12.07 දින සිට |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | මහාචාර්ය කේ. සමරසිංහ |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඒ.එස්.පී. අභයරත්න<br>මහාචාර්ය ඒ.එම්. නවරත්න බණ්ඩා 2012.11.15 සිට |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය යූ.බී. දිසානායක |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය එස්.බී. අබේකෝන්<br>මහාචාර්ය එල්. රාජපක්ෂ 2012.10.31 සිට |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය ජී. බුත්පිටිය<br>මහාචාර්ය එම්.ඩී. ළමාවංශ 2012.09.12 සිට |
| විද්‍යා පීඨය | මහාචාර්ය එස්.එම්.පී.පී. කරුණාරත්න |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය පී. අබේනායක<br>මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න 2012.10.30 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |

**සනාතන සභාව විසින් පත්කළ වෙනත් සාමාජිකයන්**

මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
මහාචාර්ය ආර්.එල්. විජේවීර
මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය ඒ. වික්‍රමසිංහ 2012.02.26 සිට

**පහත සඳහන් සාමාජිකයන් 2011.07.01 දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදි.**

එම්. අබේගුණසේකර මිය
ආචාර්ය ඒ.යු. ගමගේ
යූ.ඩබ්.බී. අත්තනායක මයා
බී.එම්.එන්. බාලසූරිය මයා
ආර්. චන්ද්‍රසේකර මයා
ඩබ්.ඩී.පී. ජයසේකර මිය
එම්.එස්. ප්‍රේමවංශ මිය
එස්. රත්වත්තේ මයා
ආචාර්ය එල්. වීරසිංහ
එච්.ඒ. හේවගේ මයා
එම්. සමරනායක මයා
මහාචාර්ය එම්.එල්.ඒ. කාදර් 2012.10.20 සිට (එම්.කේ.ජේ.ආර්. බණ්ඩාර වෙනුවට)
එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මයා 2012.12.01 සිට (එස්.එම්.ජී. ජයරත්න මයා වෙනුවට)

## F2 සනාතන සභාව සහ එහි සාමාජිකත්වය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (1985 අංක 07 දරණ පනතින් සංශෝධිත) 46 වැනි කොටසේ වගන්ති ප්‍රකාරව සංයුක්ත වූ සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වේ.

එහි සාමාජිකයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| **උපකුලපති** | ඉහත සඳහන් කළ පරිදි |
| **නියෝජ්‍ය උපකුලපති** | ඉහත සඳහන් කළ පරිදි |
| **පීඨාධිපතීන්** | ඉහත සඳහන් කළ පරිදි |

**අධ්‍යක්ෂවරුන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය බී.සී.එන්. පීරිස් |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය බී.ඒ.සී.බී. කරුණාරත්න |

| | |
|---|---|
| **පුස්තකාලයාධිපති** | ආචාර්ය කේ.ජී.පී.ජී. විජේතුංග (මිය) |

**අංශ ප්‍රධානීන්**

**කෘෂිවිද්‍යා පීඨය**

| | |
|---|---|
| කෘෂිජීව විද්‍යා අංශය | ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර |
| කෘෂිආර්ථික විද්‍යා අංශය | මහාචාර්ය එල්.එච්.පී. ගුණරත්න |
| කෘෂිඉංජිනේරු අංශය | ආචාර්ය කේ.එස්.පී. අමරතුංග<br>ආචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන (15.10.2012 සිට) |
| කෘෂිව්‍යාප්ති අංශය | මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී. වනිගසුන්දර<br>ආචාර්ය ජේ.ඒ.එස්.ඩී. සිල්වා (01.01.2012 සිට) |
| සත්ව විද්‍යා අංශය | මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව<br>මහාචාර්ය එච්.ඩබ්. සිරිල් (14.11.2012 සිට) |
| බෝග විද්‍යා අංශය | මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර<br>ආචාර්ය එච්.එම්.ජී.එස්.බී. හිටිනායක (15.10.2012 සිට) |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි |
| පාංශු විද්‍යා අංශය | මහාචාර්ය එස්.පී. ඉන්ද්‍රරත්න |

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර අංශය | ආචාර්ය එම්.පී.එස්. මුදලිගේ |
| හෙදවේද අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි (වැ.බ) |
| භෞතවේද අංශය | ආචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහක (වැ.බ) |
| විකිරණ හා විකිරණ චිකිස්තක අංශය | ආචාර්ය ආර්.ඩී. ජයසිංහ |
| ඖෂධවේද අංශය | (පීඨාධිපති විසින් ආවරණ කෙරේ)<br>එම්.එච්.එෆ්. සකීනා (07.11.2012 දින සිට) |

**ශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය | ආචාර්ය එම්.ඉසඩ්.එම්. නෆීල් |
| පුරාවිද්‍යා අංශය | ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න |
| සම්භාව්‍ය භාෂා අංශය | ආචාර්ය ඩබ්.එම්.එස්.කේ. විජේසුන්දර<br>ආචාර්ය වී. එදිරිසිංහ (18.11.2012 සිට) |
| ආර්ථික විද්‍යා අංශය | ආචාර්ය සී.ආර්. අබයසේකර<br>ආචාර්ය ජේ. නිජල් (01.11.2012 සිට) |

| | |
|---|---|
| අධ්‍යාපන අංශය | ආචාර්ය එස්.ඩී.කේ. විජේසුන්දර |
| ඉංග්‍රීසි භාෂා අංශය | ආචාර්ය එල්.එන්.ඒ. ප්‍රනාන්දු |
| | ආචාර්ය එස්. සිවමෝහන් (15.05.2012 සිට) |
| ලලිත කලා අංශය | එස්.එම්.ඒ. සමරකෝන් මයා |
| භූගෝල විද්‍යා අංශය | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හෙන්නායක |
| ඉතිහාස අංශය | මහාචාර්ය එච්. ධීරානන්ද හිමි |
| නීති අංශය | ආචාර්ය එන්.ඩී. උඩගම |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ් |
| දර්ශනය හා මනෝ විද්‍යා අංශය | එච්.එම්. ගුණසේකර මිය |
| | ආචාර්ය ඩී.ඩී.කේ.එස්. කරුණානායක (15.05.2012 සිට) |
| දේශපාලන විද්‍යා අංශය | මහාචාර්ය ඒ.එම්.එන්. බණ්ඩාර |
| | සිවයෝගලිංගම් මයා (15.11.2012 සිට) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | ආචාර්ය පූජ්‍ය එම්. ඤාණානන්ද හිමි |
| සිංහල භාෂා අංශය | ඊ.එම්.එම්.ආර්.පී.එල්. නුගපිටිය මයා |
| සමාජ විද්‍යා අංශය | මහාචාර්ය එස්.ඒ. කරුණාතිස්ස මයා |
| දෙමළ භාෂා අංශය | ආචාර්ය වී. මහේෂ්වරන් |

**දන්ත වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| මූලික විද්‍යා අංශය | ආචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක |
| සමාජ දන්ත සෞඛ්‍ය අංශය | වෛද්‍ය වී. විජයකුමාරන් |
| මුඛ සෞඛ්‍ය හා පරිදන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක |
| මුඛ ව්‍යාධිවේද අංශය | වෛද්‍ය පී.ආර්. ජයසූරිය |
| කෘතිම දන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ |
| දන්ත සංරක්ෂණ අංශය | මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ |
| | වෛද්‍ය ඩී.අයි. අමරතුංග (04.11.2012 සිට) |
| මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය | වෛද්‍ය ඒ.එම්. ආටිගල |

**ඉංජිනේරු පීඨය**

| | |
|---|---|
| රසායනික හා සැකසුම් ඉංජිනේරු අංශය | ආචාර්ය සී.එස්. කල්පගේ |
| සිවිල් ඉංජිනේරු අංශය | මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල් |
| | ආචාර්ය පී.බී.ජී. දිසානායක (01.06.2012 සිට) |
| | ආචාර්ය ඒ.එල්.එම්. මහරූෆ් (15.10.2012 සිට) |
| පරිගණක ඉංජිනේරු අංශය | ආචාර්ය පී.එම්.ටී.බී. සන්දිරිගම |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය | ආචාර්ය ඒ. අත්පුතරාජා |
| ඉංජිනේරු ගණිත විද්‍යා අංශය | ආචාර්ය කේ.ඒ.එස්. සුසන්ත |
| | ආචාර්ය ඩී.එස්.කේ. කරුණාසිංහ (01.06.2012 සිට) |
| යාන්ත්‍රික ඉංජිනේරු අංශය | මහාචාර්ය එල්. රාජපක්ෂ |
| | ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී. ගුණවර්ධන (01.11.2012 සිට) |
| නිෂ්පාදන ඉංජිනේරු අංශය | ආචාර්ය එන්.කේ.බී.එම්.පී. නානායක්කාර |
| | ආචාර්ය ආර්.ඒ. ඒකනායක මිය (16.04.2012 සිට) |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| කාය ව්‍යවච්ඡේද අංශය | වෛද්‍ය එස්.බී. අධිකාරි |
| නිර්වින්දන වෛද්‍ය අංශය | වෛද්‍ය එම්.වී.ජී. පින්ටෝ |
| ජෛව රසායන විද්‍යා අංශය | වෛද්‍ය පී.එච්.පී. ප්‍රනාන්දු |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය එස්.ඩී. ධර්මරත්න |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු |
| වෛද්‍ය විද්‍යා අංශය | මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය | වෛද්‍ය එෆ්. නූර්දීන් |
| ප්‍රසව හා නාරිවේද අංශය | වෛද්‍ය ඒ.සී.ඒ. කරුණානන්ද |
| ළමා රෝග අංශය | මහාචාර්ය ඒ. අබේගුණවර්ධන |

| | |
|---|---|
| පරපෝෂ විද්‍යා අංශය | වෛද්‍ය දේවිකා ඉද්දවල මිය |
| ව්‍යාධිවේද අංශය | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක මිය<br>මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග (25.07.2012 සිට)<br>මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක (03.09.2012 සිට) |
| භිෂග්වේද අංශය | වෛද්‍ය යූ. දන්ගහදෙණිය |
| භෞතවේද අංශය | වෛද්‍ය කේ.පී.ඒ.පී. කාරියවසම්<br>වෛද්‍ය එස්.ඒ. රාජරත්න (01.11.2012 සිට) |
| මනෝ වෛද්‍ය අංශය | වෛද්‍ය ඩී.ආර්.ආර්. අබේසිංහ<br>වෛද්‍ය ටී.එන්. රාජපක්ෂ (05.06.2012 සිට) |
| ශල්‍ය වෛද්‍ය අංශය | මහාචාර්ය එම්.ඩී. ළමාවංශ<br>වෛද්‍ය ඒ.යූ.බී. පෙතියාගොඩ (12.09.2012 සිට) |
| විකිරණ විද්‍යා අංශය | වෛද්‍ය පී.බී. හේවාවිතාරණ |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| උද්භිත විද්‍යා අංශය | ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා |
| රසායන විද්‍යා අංශය | මහාචාර්ය ඒ. වික්‍රමසිංහ |
| භූගර්භ විද්‍යා අංශය | ආචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල |
| අණුක ජීව විද්‍යා හා ජෛව රසායන අංශය | ආචාර්ය ආර්.ජී.එස්.කේ. රාජපක්ෂ |
| ගණිත විද්‍යා අංශය | ආචාර්ය ඒ.ඒ.එල්. පෙරේරා |
| භෞතික විද්‍යා අංශය | ආචාර්ය එන්.එෆ්. හෙට්ටිආරච්චි<br>ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර (17.01.2012 සිට) |
| සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අංශය | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු |
| සත්ව විද්‍යා අංශය | මහාචාර්ය කේ.බී. රණවන |

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

| | |
|---|---|
| පශු චිකිත්සක අංශය | මහාචාර්ය ඉන්දිරා සිල්වා |
| පශු ව්‍යාධිවේද අංශය | වෛද්‍ය අරුල්කාන්තන් |
| පශු මූලික විද්‍යා අංශය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න<br>වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ (01.11.2012 සිට) |
| ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශය | වෛද්‍ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර් |
| පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අංශය | වෛද්‍ය එන්.කේ. ජයසේකර<br>වෛද්‍ය ආර්.එස්. කළුපහන (16.04.2012 සිට) |

**අංශ ප්‍රධානීන් නොවන වෙනත් මහාචාර්යවරුන්**

**කෘෂිවිද්‍යා පීඨය**

| | |
|---|---|
| මහාචාර්ය ඒ.එන්. ජයකොඩි | මහාචාර්ය අයි.පී. වික්‍රමසිංහ |
| මහාචාර්ය එස්.ඊ. පීරිස් | මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන |
| මහාචාර්ය යූ. සංගක්කාර | මහාචාර්ය සී. සිවයෝගනාතන් |
| මහාචාර්ය ආර්.ඕ. තටිල් | මහාචාර්ය එම්.පී.බී. විජේවර්ධන |
| මහාචාර්ය ඒ.එන්.එෆ්. පෙරේරා | මහාචාර්ය ඩබ්.පී.ආර්.පී.ඩී. සිල්වා |
| මහාචාර්ය කේ. පෙරේරා මයා | මහාචාර්ය ඩබ්.පී.එම්.බී.බී. මාරඹේ |
| මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. කොස්තා | මහාචාර්ය එස්. සමිත |
| මහාචාර්ය එස්. ප්‍රේමරත්න | මහාචාර්ය වී.ඒ. සුමනසිංහ |
| මහාචාර්ය ඩී.සී. බණ්ඩාර (මිය) | මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී. වනිගසුන්දර |
| මහාචාර්ය ආර්.බී. මාපා | මහාචාර්ය කේ.එන්. නන්දසේන |
| මහාචාර්ය ඒ.එල්.ටී. පෙරේරා | මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා |
| මහාචාර්ය කේ.ජී.ඒ. ගුණසේකර (නිදහස් කොට ඇත) | මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර |
| මහාචාර්ය ඩී.සී.කේ. ඉල්ලපෙරුම (මිය) | මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ |
| මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක | මහාචාර්ය ජීවිකා වීරහේවා |

**ශාස්ත්‍ර පීඨය**

මහාචාර්ය එස්. සෙනෙවිරත්න
මහාචාර්ය එස්.ඩබ්. පෙරේරා
මහාචාර්ය එම්.ඩබ්.ඒ.ඩී. සිල්වා
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්
මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ
මහාචාර්ය ජී.බී. කීරවැල්ල
මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ
මහාචාර්ය එම්. සෝමතිලක
මහාචාර්ය කේ.ටී. සිල්වා
මහාචාර්ය එස්.එච්. හිස්බුල්ලා
මහාචාර්ය කේ. රාහුල හිමි
මහාචාර්ය එස්.කේ. පින්නවල
මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න
මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර
මහාචාර්ය ඒ.එස්.පී. අබේරත්න

**දන්ත වෛද්‍ය පීඨය**

මහාචාර්ය එස්.එල්. ඒකනායක
මහාචාර්ය එස්.පී.එන්.පී. නාගරත්න
මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න
මහාචාර්ය සී.ඩී. නානායක්කාර
මහාචාර්ය ආර්.එල්. විජේවීර
මහාචාර්ය එම්.ඒ.එම්. සිතීක්
මහාචාර්ය පී.එස්. රාජපක්ෂ
මහාචාර්ය ඒ. තිලකරත්න
මහාචාර්ය ජේ.යූ. වීරසිංහ
මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග
මහාචාර්ය කේ.එම්. විජේරත්න
මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ

**ඉංජිනේරු පීඨය**

මහාචාර්ය කේ.ජී.එච්.සී.එන්. සෙනෙවිරත්න
මහාචාර්ය කේ.එස්. වල්ගම
මහාචාර්ය එස්.බී. වීරකොන්
මහාචාර්ය කේ.පී.පී. පතිරණ
මහාචාර්ය කේ.එම්. ලියනගේ
මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල්
මහාචාර්ය ආර්. ශාන්තිනි
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
මහාචාර්ය එස්.ඩී. පතිරණ

**වෛද්‍ය පීඨය**

මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
මහාචාර්ය එන්. සේනානායක
මහාචාර්ය සී.කේ. අබේසේකර (මිය)
මහාචාර්ය සී.ඩී.ඒ. ගුණසේකර
මහාචාර්ය ඒ.එස්.බී. වීරකොන්
මහාචාර්ය වී.එල්.යූ. ඉලංගසේකර
මහාචාර්ය වී. තෙවනේසම්
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය ආර්. සිවකානේෂන්
මහාචාර්ය ඩබ්.එම්.සී.ජේ. ජයසිංහ
මහාචාර්ය එම්. චන්ද්‍රසේකර
මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය අයි.බී. ගවරමාන්න

**විද්‍යා පීඨය**

මහාචාර්ය බී.එම්.ආර්. බණ්ඩාර
මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
මහාචාර්ය අයි.ඒ.යූ.එන්. ගුණතිලක
මහාචාර්ය එච්.එම්.ඩී. නාමල් ප්‍රියන්ත
මහාචාර්ය යූ.එන්.බී. දිසානායක
මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
මහාචාර්ය ඕ.ඒ. ඉල්ලේපෙරුම
මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල
මහාචාර්ය ජේ.පී. එදිරිසිංහ
මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම්
මහාචාර්ය එච්.එම්.එන්. බණ්ඩාර
මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්
මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්.පී. විජේකෝන්
මහාචාර්ය කේ. ප්‍රේමරත්න
මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න
මහාචාර්ය එස්. කරුණාරත්න
මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා
මහාචාර්ය පී. ඒකනායක
මහාචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ
මහාචාර්ය එච්. අබේගුණවර්ධන
මහාචාර්ය එස්.පී. ගුණරත්න
මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න
මහාචාර්ය පී. අබේනායක

**පීඨ නියෝජිතයන්**

**කෘෂිවිද්‍යා පීඨය**

ආචාර්ය ආර්.පී. කරුණාගොඩ
මහාචාර්ය ඩබ්.ජී.පී. වීරක්කොඩි

**ශාස්ත්‍ර පීඨය**

ආචාර්ය සුදේශ් ද මෙල්
එම්.ජී.එස්. ජයකුමාර මහතා

**දන්ත වෛද්‍ය පීඨය**

වෛද්‍ය එන්. වනිගසූරිය
වෛද්‍ය ඊ.එම්.යු.සී.කේ. හේරත් 21.02.2012 දින සිට (ආචාර්ය ආර්.ඩී. ජයසිංහ වෙනුවට)
වෛද්‍ය ආර්.ඩබ්. පල්ලේගම 21.11.2012 දින සිට

**ඉංජිනේරු පීඨය**

ආචාර්ය පී.බී. බෝයගොඩ
ආචාර්ය ජී.එල්.එම්. මහරූෆ්

**වෛද්‍ය පීඨය**

වෛද්‍ය ඩී. දිසානායක
වෛද්‍ය කේ. මාරඹේ

**විද්‍යා පීඨය**

ආචාර්ය ජී.ජී.එස්. පෙරේරා
මහාචාර්ය ජී.එන්. නවරත්න

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

ආචාර්ය ඩී.ඩී.එන්.ඩී. සිල්වා
ආචාර්ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

ආචාර්ය එච්.එම්.ටී.යූ. හේරත්

## උපග්‍රන්ථ G- ව්‍යාපෘති විස්තර

### G1 ව්‍යාපෘති විස්තර ( දෙස්/විදෙස් ආධාර කළ) - 2012

| පීඨය | නම සහ විස්තර | ණය ප්‍රදානය | ආධාරක ආයතනය | ටී.ඊ.සී.රු. | ආර්.එෆ්.ඒ.රු. | ඩී.එෆ්.රු. |
|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | ජා.වි.පදනම ප්‍රදාන අංක RG/2006/EB/01 ආචාර්ය උදේනි එදිරිසිංහ | ප්‍රදාන | ජා.වි.ප | 2,322,000.00 | - | **2,322,000.00** |
| | ජා.වි.ප පර්යේෂණ ප්‍රදාන අංක RG/2007/BT/06 ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ | ප්‍රදාන | ජා.වි.ප | 953,177.00 | - | **953,177.00** |
| | ජා.වි.ප පර්යේෂණ ප්‍රදාන අංක RG/2007/BT/08 මහාචාචාර්ය එච්.ඩබ්. සිරිල් | ප්‍රදාන | ජා.වි.ප | 969,065.00 | - | **969,065.00** |
| | ජා.වි.ප පර්යේෂණ ප්‍රදාන අංක RG/2007/BT/07 ආචාර්ය ජී.එල්.පී. සිල්වා | ප්‍රදාන | ජා.වි.ප | 663,000.00 | - | **663,000.00** |
| | ජා.වි.ප පර්යේෂණ ප්‍රදාන අංක SIDA/2007/BT/04 මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම් ද කොස්තා | ප්‍රදාන | ජා.වි.ප | 1,630,860.66 | - | **1,630,860.66** |
| | ජා.වි.ප පර්යේෂණ ප්‍රදාන අංක SIDA/2007/BT/01 මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම් ද කොස්තා | ප්‍රදාන | ජා.වි.ප | 2,005,067.00 | - | **2,005,067.00** |
| | ජා.වි.ප ප්‍රදාන අංක NSF/GR/2007/BT/05 ආචාර්ය දේවිකා ද කොස්තා | ප්‍රදාන | ජා.වි.ප | 1,504,000.00 | - | **1,504,000.00** |
| | ජා.වි.ප ප්‍රදාන අංක RG/2009/BIOFER/002 ආචාර්ය ජීවිකා වීරහේවා | ප්‍රදාන | ජා.වි.ප | 655,000.00 | - | **655,000.00** |
| | ජා.වි.ප ප්‍රදාන අංක RG/2011/AG/04- මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ | ප්‍රදාන | ජා.වි.ප | 1,364,700.00 | - | **1,364,700.00** |
| | ජා.වි.ප ප්‍රදාන අංක RG/2011/TECH-D/02 ආචාර්ය කේ.පී.එස්. අමරතුංග | ප්‍රදාන | ජා.වි.ප | 1,545,500.00 | - | **1,545,500.00** |
| | ජා.වි.ප ප්‍රදාන අංක NSF/GR/2003/FR/01 ආචාර්ය දේවිකා ද කොස්තා | ප්‍රදාන | ජා.වි.ප | 614,935.90 | - | **614,935.90** |
| | CARP ප්‍රදාන අංක NARP/11/2003/UP/AG /01 ආචාර්ය ජේ.එල්.ඒ.පී. ජයකොඩි | ප්‍රදාන | CARP | 250,000.00 | 264,579.00 | **250,000.00** |
| | CARP ප්‍රදාන අංක NARP/11/UP/AG/02 ආචාර්ය ජේ.කේ. විද්‍යානආරච්චි | ප්‍රදාන | CARP | 250,000.00 | | **250,000.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | CARP ප්‍රදාන අංක NARP/11/UP/AG/03 මහීපාල මහතා | ප්‍රදාන | CARP | 249,000.00 | | **249,000.00** |
(අ) විශ්වවිද්‍යාලයේ ජල පොම්පාගාරය සඳහා වසර 30 කට පමණ පෙර මිලදී ගත් නමුත්, හොඳ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින විදුලි ට්‍රාන්ස්පෝමරයක් තිබියදී, 2010 වර්ෂයේදී රු. 1,552,910 ක් වැය කර විදුලි ට්‍රාන්ස්පෝමරයක් සවි කර තිබුණි.

(ආ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන්ට සායනික පුහුණුව ලබාදීම පිණිස පේරාදෙණිය, මහනුවර හෝ ගම්පොල ශික්ෂණ රෝහල් වෙත යොමු කිරීමට කටයුතු කිරීමෙන් තොරව, කුරුණෑගල මහරෝහල වෙත සිසුන් රැගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික බස්රථ ගාස්තු වෙනුවෙන් රු. 528,192 ක්ද, රියදුරු සහායකයින් සහ වෙනත් නිලධාරීන් සඳහා ගමන් වියදම් වෙනුවෙන් රු.243,335 ක්ද වශයෙන් එකතුව රු.771,527 ක වියදමක් දරා තිබුණි.

(ඇ) ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති සේවා මුර කාලසටහන අනුව ආරක්ෂක නිලධාරියකු විසින් අවම වශයෙන් මාසයකට පැය 192 ක් සේවයේ යෙදිය යුතු වුවද, එලෙස මාසයකට අවම වශයෙන් සේවය කළයුතු කාලය සේවය නොකර තිබියදී සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී පමණක් එකතුව රු. 774,262 ක මුදලක් අතිකාල වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය සඳහා කේ.වී.ඒ.400 විදුලි ට්‍රාන්ස්පෝමරයක් මිලදී ගැනීමට 2011 වර්ෂය අවසානයේදී රු. 4,143,413 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබියදී එම මුදලට මිලදී නොගෙන අදාල ට්‍රාන්පෝමරය මිලදී ගැනීම ප්‍රමාද කර පසුව රු. 6,008,676 කට ට්‍රාන්සපොමරයක් මිලදී ගැනීම හේතුවෙන් රු. 1,865,263 ක මුල්‍යමය අලාභයක් සිදුව තිබූ අතර, එය 2013 ජූලි මස වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දන්ත වෛද්‍ය පීඨයේ දන්ත සකස් කිරීමේ දෙපාර්තමේන්තුවේ භාණ්ඩ තොග නියැදියක් සම්බන්ධව භෞතිකව කළ පරීක්ෂාවේදී රු.695,627 ක් වටිනා තොග කල්ඉකුත්ව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉංජිනේරු පීඨයේ පීඨාධිපති කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂවලදී මිලදී ගෙන තිබූ රු. 373,719 ක භාණ්ඩ අයිතම 06 ක් අස්ථානගත වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයීය සේවකයන් වෙනුවෙන් සේවා නියුක්ති භාරකාර අරමුදලට 2011 හා 2012 වර්ෂ සඳහා දායක මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.975,965 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සේවකයකු වෙනුවෙන් අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් නොගෙවීම මත රු. 40,182 ක අධිභාර මුදලක්ද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායක මුදල් නොගෙවීම මත රු. 224,008 ක අධිභාර මුදලක්ද ගෙවීමට සිදුව තිබූ අතර, ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 සිට 2012 වර්ෂය දක්වා පැවත එන ගිවිසුම්ගත වටිනාකම රු. 6,240,416 ක්වූ කර්මාන්ත 24 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සඳහා සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීම පිණිස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2009 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු. 500,000 ක් ගෙවා තිබුණද, 2013 මාර්තු 31 දින වන විටත්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. ගෙවන ලද අත්තිකාරම් මුදල වසර 04ක් ප්‍රමාදව ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රධානය කරන ලද කොන්ත්‍රාත් 6 ක් වෙනුවෙන් සංචලන අත්තිකාරම් ලෙස රු. 12,250,740 ක මුදලක් ගෙවා තිබුණි. එම කොන්ත්‍රාත්වල ගිවිසුම්ගත මුදලින් සියයට 18 සිට සියයට 81 දක්වා ප්‍රමාණයක මුදලක් ගෙවීම් කර තිබුණත්, රු. 4,552,272 ක සංචලන අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවය සඳහා පුද්ගලික අංශයේ ආරක්ෂකයින් 116 ක් සහ විශ්වවිද්‍යාල ආරක්ෂක සේවයේ ආරක්ෂකයින් 71 ක් වශයෙන් එකතුව 187 ක ආරක්ෂක පරීක්ෂක හා නියාමකවරුන් සේවයේ යොදවා තිබුණද, අනුමත කාර්ය මණ්ඩලය 116 ක් පමණක් විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 71 දෙනෙකු සේවයේ යොදවා තිබියදී, 2010, 2011 සහ 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.8,664,805 ක්, රු. 9,918,343 ක් හා රු. 9,508,437 ක් වශයෙන් ආරක්ෂක සේවය සඳහා අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ආ) අතපසුවී ඒකරාශී වූ වැඩ සඳහා අතිකාල දීමනා අනුමත නොකළ යුතු වුවත්, නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවේ සඳහන් වැඩ කොටස් ඉටු කිරීම් වෙනුවෙන් රු.62,327,455 ක් අතිකාල ලෙස ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2101 කින් සමන්විත වූ අතර, වැටුප් සඳහා රු. 52,200,000 ක මුදලක් වර්ෂය තුළ ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, තථ්‍ය කාර්ය මණ්ඩලය 956 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු 1145 ක් පවතින බැවින් සමාලෝචිත වර්ෂයේදී එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් තොරව නිලධාරීන් අතිකාල සේවාවේ යෙදවීම හේතුවෙන් රු. 62,327,455 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අධ්‍යයන කාර්ය මණ්ඩයේ තනතුරු 64 කට අදාලව නිලධාරීන් 208 ක් පුරප්පාඩු පැවතුණි.

(ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 746 දෙනෙකුට 2012 ජූලි සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලසීමාව තුළ වැඩ වර්ජනයේ යෙදීම හේතුවෙන් කිසිදු සේවයක් ලබා නොගෙන රු. 52,326,817 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ සේවයේ නියුතු නිලධාරීන් තිදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.1,289,150 ක වැටුප් ගෙවා තිබුණි.

(උ) කෘෂිකර්ම පීඨයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නියමයන්ට අනුකූල නොවන ලෙස කථිකාචාර්යවරයෙකු බඳවා ගෙන ඔහු හට 2002 සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 6,658,935 ක් ගෙවා තිබුණි. මෙම කථිකාචාර්යවරයා වෙත ආචාර්ය උපාධිය හැදෑරීම වෙනුවෙන් 2003 පෙබරවාරි 05 දින සිට මාස 39 ක කාලපරිච්ඡේදය තුළදී විදේශ අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. 2013 පෙබරවාරි දක්වාම ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව, අයකළයුතු රු. 2,057,165 ක ඇප බැඳුම්කරයේ වටිනාකම අයකර ගෙන නොතිබුණි.

(ඌ) ශාස්ත්‍ර පීඨය, දන්ත වෛද්‍ය පීඨය හා සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය සඳහා අනුමත කථිකාචාර්යවරුන්ගේ පුරප්පාඩු 50 ක් පැවතියදී එම පුරප්පාඩු පිරවීමකින් තොරව, බාහිර හා තාවකාලික කථිකාචාර්යවරුන් 172 දෙනෙකු බඳවාගෙන රු.11,672,209

ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මෙහි අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්ෂික අයවැය සමඟ ඇතුළත් කළයුතු වුවද, අයවැය ලේඛණයේ ඇතුළත් රු.383,490,000 ක ප්‍රාග්ධන වියදම් සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරකම් 09 කට අදාලව එම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 5.3 පාලක සභා රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ පාලක සභා රැස්වීම් වාර 11 ක් පවත්වා තිබුණද, 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව, කාර්යක්ෂමතාවය අගය කිරීම හා මගපෙන්වීම සඳහා  අදාළ වාර්තා හා තොරතුරු පාලක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

දන්ත වෛද්‍ය පීඨය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 15,472,301 ක් හා ශාස්ත්‍ර පීඨය සඳහා රු.2,029,209 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ඊට අදාලව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

### 5.5 අයවැය  ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයේ සඳහන් ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී
පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය වු හෙයින් අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(i) වැය විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවීම්වල එකතුව රු.182,082,191 ක්වු අතර, එහි ප්‍රතිශතය සියයට 30 සිට සියයට 437 ක පරාසයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක අධි ඇස්තමේන්තු කිරීම් රු.66,629,928 ක් වූ අතර, එහි ප්‍රතිශතය සියයට 21 සිට සියයට 99 ක් අතර පරාසයක පැවතුණි.

(iii) ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලට ඇතුළත් නොවූ වැය විෂයයන් 08 කට අදාළ

එකතුව රු.3,673,360 ක් වු වියදම් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණු අතර, වැය විෂයයන් 04 ක් සඳහා සළසා දී තිබූ රු. 1,500,000 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(iv) ආදායම් විෂයයන් 07 කට අදාලව රු. 34,137,379 ක ආදායම් ලබාගෙන නොතිබුණි.

(ආ) කෙටුම්පත් අයවැය වාර්තාව සඳහා මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට ප්‍රථම පාලක සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අයවැය වාර්තාව සඳහා අනුමැතිය ලබා ගන්නා ලද්දේ 2012 ජුනි 09 වන දිනය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දූර්වලතා වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ආදායම් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම
(ආ) අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම
(ඇ) තොග පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) පර්යේෂණ ප්‍රදාන උපයෝජනය
(ඊ) අරමුදල් උපයෝජනය
(උ) මානව සම්පත් කළමනාකරණය.
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(එ) සේවක ණය පරිපාලනය
(ඒ) කොන්ත්‍රාත් පරිපාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

## H 2 2012 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ වාර්තාවෙන් පෙන්වා දෙන කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග

| | |
|---|---|
| **2.** | **මූල්‍ය ප්‍රකාශන** |
| **2.1** | **මතය ව්‍යාචනය** |
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| **2.2.1** | **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති** |
| | මේ පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සමග පැවති සාකච්ඡාවේදී වත්කම් අගය "0" ලෙස නොදක්වා එහි අගය රු. 1.00 ලෙස දැක්වීමට උපදෙස් ලැබුණු අතර ඒ අනුව අප විසින් එහි අගය රු. 1.00 ලෙස නිවැරදි කරන ලදී. එමෙන්ම මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට අදාල ලේඛන භාරදී ඇත.තවද භාණ්ඩ හඳුනාගැනීම, අංක කිරීම වැනි මූලික කටයුතු විශ්වවිද්‍යාලය විසින් සිදුකිරීමටත් එම වාර්ථා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීමත් සිදුවෙමින් පවතී. |
| **2.2.2** | **ගිණුම්කරණ අඩුපාඩු** |
| (අ) | වාර්තාවේ සඳහන් ඉදිකිරීම් කටයුතු නිමකර ප්‍රයෝජනයට ගන්නා ගොඩනැගිලි වලට අදාල නිවැරදි වටිනාකම් ජ'නල් අංක 0004 හා 0005 මගින් 2013/12/31 දිනට ප්‍රාග්ධනිත කර ඇති අතර ඊට අදාල ක්ෂය වටිනාකම් ජ'නල් අංක 0007 මගින් නිවැරදිව ගලපා 2013 වර්ෂයේ ගිණුම් සමග ඉදිරිපත් කර ඇත. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් ශේෂ සම්බන්ධයෙන් සිදුවී ඇති වරද පිළිගන්නා අතර එවැනි වරදවල් 2013 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව දක්වා ඇත.<br><br>අවසන් තොග වැඩිවීම — රු. 1,183,262.00<br>අත්තිකාරම් වටිනාකම් — රු. 18,621,001.00<br>නිළධාරී ණය — රු. 4,117,686.00<br>රු. 23,921,949.00<br><br>කෙසේ වෙතත් පහත සඳහන් ශේෂයන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතයෙහි සඳහන් ප්‍රතිපාදන වලට යටත්ව අරමුදල් ප්‍රකාශයේ නිවැරදිව දක්වා තිබුණි. මේ සඳහා අප විසින් විගණකාධිපතිගේ කෙටුම්පත් වාර්තාවට ලබාදුන් පිළිතුරෙහිද මේ බව සඳහන් කලත් එය සලකා බැලීමෙන් තොරව අවසාන වාර්තාව නිකුත්කොට තිබුණි.<br><br>**වෙනත් විශ්වවිද්‍යාල වලින් මුදල් ලැබීම - රු. 20,641,226.00**<br>රු. 20,641,226.00 ක වෙනස විශ්වවිද්‍යාලයේ එක් අංශයක් වන දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයෙන් විශ්වවිද්‍යාලට ලැබිය යුතු මුදලක් වන අතර එය විශ්වවිද්‍යාලයේම කොටසක් වන බැවින් හා බාහිර ආයතනයක් නොවන බැවින් ද එහි මූල්‍ය බලපෑම ඉවත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. එය නිවැරදි වේ.<br><br>**විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් - රු. 41,137,578.00**<br>විශ්‍රාම පාරිතෝෂික වශයෙන් වර්ෂය තුලදී මුදලින් ගෙවා ඇති එම මුදල් ප්‍රමාණය අරමුදල් ගලායාමක් ලෙස පෙන්වා ඇති අතර එම මුදල විශ්වවිද්‍යාලය සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය යන දෙකෙහිම එකතුව වේ. මෙය මුදල් බැහැරට ගලාගිය අරමුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර ඇති අතර ගෙවියයුතු පාරිතෝෂික ගිණුමේ ආරම්භක සහ අවසාන ශේෂය අතර වෙනස අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වර්ෂයේ මෙහෙයුම් පාඩුවට ඇතුලත් කර ඇත. |

| | |
|---|---|
| (ඇ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා ගිණුම්ගත කරනු ලබන්නේ අදාල පාඨමාලාව අනුව අරමුදල් ගිණුම් යටතේය. ඒ අනුව එක් එක් පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් අදාළ පීඨය පදනම් කර ගනිමින් වෙන් වෙන් වශයෙන් වූ අරමුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබයි. මෙම අරමුදල් ගිණුම්වල ආදායම් වියදම් මුදල් පදනම මත ගිණුම්ගත කරනු ලබන අතර මෙය ගිණුම්කරණ සටහන් අංක 1.4.1 හා සටහන් අංක 33 යටතේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව්කර ඇත.ඉදිරියේදී මෙය උපචිත පදනම යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | අදාල තොගය නිවැරදිව ගලපා 2013 ගිණුම් සමඟ ඉදරිපත් කර ඇත. |
| (ඉ) | **කෘෂිකර්ම පීඨය**<br>කෘෂි විද්‍යා පීඨයට අයත් කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානයේ ඉතිරිකිරීම් බැංකු ශේෂය 2013 වර්ෂයේ ගිණුම්වලට ඇතුලත් කර ඇති අතර ඊට අදාල මුදල් පොතේ සාරංශගත උපලේඛනය මේ සමඟ ඉදිරිපත් කරමි.<br><br>**ඉංජිනේරු පීඨය**<br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතුවේ එකතු වූ රු. 813,591.00 ක මුදල 2013 වර්ෂයේ විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත. |
| (ඊ) | විදේශ ආධාර වශයෙන් මෙම අයිතම ලැබී ඇති නිසා වටිනාකම් තක්සේරු කිරීමට අපහසු බැවින් එම අයිතම තක්සේරු කර 2013 වර්ෂයේදී ගිණුම්ගත කරනු ඇත. |
| (උ) | HETC ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති බාහිර ව්‍යාපෘතියක් වන අතර අදාල ගිවිසුම් ප්‍රකාරව HETC ව්‍යාපෘතිය මඟින් දරණු ලබන වියදම් විශ්වවිද්‍යාලයේ ගිණුම් යටතේ දැක්වීමට අවශ්‍ය නොවන අතර එම ගිණුම් අමාත්‍යාංශය යටතේ පවතින HETC ව්‍යාපෘති කාර්යාලය මඟින් පවත්වාගෙන යනු ලබයි. කෙසේ වෙතත් HETC ව්‍යාපෘතියට අදාල මුදල් ලැබීම්, වියදම් හා වත්කම් මිලදී ගැනීම් 2013 වර්ෂයේ ගිණුම් සමඟ හෙළිදරව් කිරීමේ සටහනක් මඟින් ඉදිරිපත් කර ඇත. |
| (ඌ) | විදේශ ශිෂ්‍යයන්ගේ ආදායම් 2013 වර්ෂයේ සිට අරමුදල් ගිණුමකට මාරු කිරීමට කටයුතු කර ඇති අතර ඊට අදාල ජ'නල් සටහන් මේ සමඟ ඉදිරිපත් කර ඇත. |
| (එ) | විශ්වවිද්‍යාලය සතු අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු වෙනස නිවැරදිව ගලපා 2013 වර්ෂයේ ගිණුම්වලට අතුලත් කර ඇති අතර සටහන් අංක 45 මඟින් හෙළිදරව් කර ඇත. |
| (ඒ) | විගණන ඡේදයේ සඳහන් රු. 153,137,696.00 ක් වටිනාකමැති ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 122 පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි සාරාංශ ගතකර දැක්විය හැකිය.<br><br>i. ඉතා පැරණි බැඳුම්කර කඩ කළ අය<br>1.i. අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත අයකර ගැනීම සඳහා නීතිපති උපදෙස් පැතූ ලිපිගොනු සංඛාව } 60<br>1.ii. ගිණුම් වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලිපිගොනු } 02 62<br>ii. බැඳුම්කර වටිනාකම සම්පූර්ණයෙන් ගෙවා නිදහස් කළ ලිපිගොනු 03<br>iii. වාරික වශයෙන් බැඳුම්කර නිරවුල් කරනු ලබන ලිපිගොනු 10<br>iv. අර්ථසාධක ශේෂය හැර ඉතිරිය නිරවුල් කළ ලිපිගොනු 04 |

| | |
|---|---|
| | v. නීතිමය පියවරගත් ලිපිගොනු 07<br>vi. අර්ථසාධක හා පාරිතෝෂික ගෙවීම් වලින් බැදුම්කර වටිනාකම පියවීමට කටයුතු කළ ලිපිගොනු } 16<br>vii. වෙනත් 20<br>122<br><br>ඉහත සඳහන් බැදුම්කර මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බැවින් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම් ගත කර ඇති අතර යම්හෙයකින් අයකර ගැනීමට නොහැකි වුවහොත් විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් පසුව පමණක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඔ) | මෙම හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් 2011.05.16 දින මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශිය සභාවේ සභාපතිගේද සහභාගිත්වය ඇතිව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී රැස්වීමක් පවත්වා ඇත. ඉන් පසුවද යහපත් ප්‍රතිචාරයක් නොලද හෙයින් 2011.07.21 දින නැවත මේ පිළිබඳව විමසන ලදි. එයට පිළිතුරු ලෙස 2011.08 දින රහිත ලිපියද ඉන් පසු මහා සභාව විසින් බදු ගෙවීම ප්‍රතික්ෂේප කළ බව දන්වමින් කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශිය සභාවේ සභාපතිගේ 2011.08.04 දිනැති ලිපියද එවා ඇත. ඒ අනුව නැවත 2011.11.22 දින ප්‍රාදේශිය සභා නිළධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වා ඇත. ඉන් අනතුරුව බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් 2012.05.25 හා 2013.09.23 දිනැති ලිපි මගින් දැනුම් දීම් කොට මේ සඳහා නිත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කොට ඇත.<br><br>ඉහත සඳහන් පරිදි සිහි කැඳවීම් ලිපි මගින් දැන්වුවද බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් මේ පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කොට ඇත. ඒ අනුව මේ පිළිබඳව පූර්ව නීති සාකච්ඡාවක් 2014.07.09 වන දින මහනුවර රජයේ අධිනීතිඥ මැදිරියේදී පැවත්වූ අතර එහිදී ඉල්ලා සිටි ලිපි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා රජයේ අධිනීතිඥ වෙත යොමු කිරීමට කටයුතු කොට ඇත. ඒ අනුව තව දුරටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී.<br>මෙම ක්‍රියාමාර්ග අවසන් වූ පසුව ප්‍රාදේශීය සභාව විසින් අදාල බදු මුදල නියත වශයෙන්ම ගෙවන බවට සහතික කළ පසු මෙම මුදල ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කළ හැකිවේ. |
| **2.2.3** | **නොසැසඳූ පාලන ගිණුම්** |
| | **<u>අවසන් තොගය - ශාස්ත්‍ර පීඨය රු. 51,550.00</u>**<br>තොග සමීක්ෂණය 2011 වර්ෂයේ ප්‍රථම වතාවට සිදුවන අවස්ථාවේදී සමහර තොග සමීක්ෂණයට භාජනය වී නොමැති නමුත් 2012 වර්ෂයේ එය නිසි ආකාරයෙන් සිදු වී ඇති බැවින් මෙම වෙනස සිදුවී තිබේ.<br><br>**<u>ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් 19කගේ බැදුම්කර ශේෂයන් රු. 1,073,181.00</u>**<br>2013 වර්ෂයේ ගිණුම් සමඟ නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.<br><br>**<u>ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු ( රු. 5,029,026.00 )</u>**<br>ගිණුමේ දැක්වෙන ශේෂ අනුව උපලේඛන ශේෂ නිවැරදිව සසඳා ඉදිරිපත් කර ඇත.<br><br>**<u>අවසන් තොගය - දන්ත වෛද්‍ය පීඨය ( රු. 9,879,089.00 )</u>**<br>දන්ත වෛද්‍ය පීඨයේ තොග සමීක්ෂණ වාර්තා හා ගිණුම් අනුව කිසිම වෙනසක් නොමැත. විගණන ඡේදයෙහි දන්ත වෛද්‍ය පීඨයේ ප්‍රධාන ගබඩාවේ තොගය අනෙකුත් සියලුම ස්ථාන වල ඇති තොග සමඟ සන්සන්දනය කර ඇත. දන්ත වෛද්‍ය පීඨයේ ඇති ලිපි ද්‍රව්‍ය තොගය සියලු පීඨවල ලිපි ද්‍රව්‍ය තොගය සමඟ ද, රසායන |

| | |
|---|---|
| | ද්‍රව්‍ය 12-01-31-05 ශීර්ෂය යටතේ ඇති සියලුම පීඨවල රසායන ද්‍රව්‍ය තොගය සමගද, අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය 12-01-31-11 ශීර්ෂය යටතේ ඇති අනෙකුත් රසායන ද්‍රව්‍ය සමගද, ගිණුම්ගත කර ඇත. මෙහිදී පහත සඳහන් සංඛ්‍යා ලේඛන මගින් කිසිදු වෙනසක් නොවන බව තව දුරටත් පැහැදිලි වේ.<br><br>ලිපි ද්‍රව්‍ය 776,492.61<br>රසායන ද්‍රව්‍ය 12-01-31-04<br>3,394,218.17<br>1,134,250.60<br>4,528,468.83<br><br>අනෙකුත් පරිභෝජන තොගය 3,439,114.61<br>මුළු තොගය 8,744,076.05<br>(+) ප්‍රධාන ගබඩාවේ තොග 4,286,149.00<br>ගිණුම් අනුව දන්ත වෛද්‍ය පීඨයේ මුළු තොග ශේෂය 13,030,225.05<br><br>සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 14,165,268.00<br>වෙනස 1,135,012.94<br><br>තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ශේෂය සමඟ ගිණුම් අනුව ශේෂය සමාන නොවන අතර එයට හේතුව වන්නේ ප්‍රාග්ධනිත අයිතම ගණනාවක් තොගයට ඇතුලත් කර තිබීමයි. එකී ප්‍රාග්ධනිත වටිනාකම් ඉවත් කර නිවැරදි තොග වටිනාකම තොගය ලෙස ගිණුම්ගත කර ඇත. |
| **2.2.4** | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්** |
| **(අ)** | දඩ හා ශාලා ගාස්තු 12018600 ලෙජරය වැරදියට ගිණුම්ගත කිරීම නිසා රු. 4,054,215.00 වශයෙන් සඳහන්ව ඇති අතර වැරදි නිවැරදි කිරීමෙන් පසු ශේෂය රු. 3,045,842.00 කි.<br><br>සිසුන්ගෙන් ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රම වේදයක් සකස්කොට මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| **(ආ)** | CW/CON/2009/749 - රු. 142,312.50<br>මෙම ව්‍යාපෘතිය අදාල රඳවා ගැනීමේ මුදල වන රු.142,312.50 ක මුදල නඩත්තු කාලසීමාව තුලදී අදාල අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සකසා නොමැති හෙයින් මෙම මුදල නිදහස් නොකරන ලෙසට ව්‍යාපෘති කළමණාකරු විසින් දන්වා ඇත.<br><br>CW/CON/2010/857 - රු. 35,652.00<br>මෙම ව්‍යාපෘතිය 2010 වසරේ ජූලි මස 30 වන දින අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් එහි අවසාන බිල්පත සමග රඳවා ගැනීමේ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලා ඇතත් අදාල කාලයේ ව්‍යාපෘති කළමණාකාරිනිය විසින් එම රඳවා ගැනීමේ මුදල නිදහස් නොකරන ලෙස දන්වා ඇත. දැනට එම නිළධාරිනිය විශ්වවිද්‍යාලයේ සේවය නොකරන අතර මේ පිළිබඳ දැනට වැඩ ඉංජිනේරු තනතුරේ කටයුතු කරන ඉංජිනේරු මහතාගෙන්ද දැනටමත් කරුණු විමසා ඇති අතර ඔහුගේ නිර්දේශ ලැබුණු වහාම අදාල මුදල වන රු. 35,652.00 ක මුදල නිදහස් කිරීමට හෝ රජයේ ගිණුමට බැර කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.<br><br>CW/CON/2009/824 - රු. 7,947.00<br>මෙම ව්‍යාපෘතිය සඳහා රඳවා ගැනීමේ මුදල වන රු. 7,947.00 ක මුදලක් රඳවාගෙන ඇති අතර මෙම |

| | |
|---|---|
| | ව්‍යාපෘතිය 2009-06-25 දින අවසන් කර ඇත. ප්‍රසම්පාදන අත්පොතෙහි 5.4.6 වගන්තිය අනුව මෙම ව්‍යාපෘතිය නඩත්තු කාල සීමාව තුල සෑහීමකට පත්වන අයුරින් සිදුකළාද යන්න පිළිබඳ දැනටමත් වැඩ ඉංජිනේරු මහතාගෙන් කරුණු විමසා ඇති අතර ඔහුගේ නිර්දේශය අනුව මෙම මුදල කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කිරීමට හෝ රජයේ ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br><u>CW/CON/2009/847 - රු. 39,483.97</u><br>මෙම ව්‍යාපෘතියට අදාල රඳවා ගැනීමේ ගාස්තු මුදල වන රු. 39,483.97 ක මුදල අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇත. 2014 දී ප්‍රාග්ධනිත කරනු ඇත.<br><br><u>රු. 49,897.00 ක් වූ පාරිතෝෂික මුදල</u><br>මෙම මුදල දැනට M.G. මනමේන්ද්‍ර යන අය වෙත ගෙවා ඇත.<br><br><u>11017800 – රු. 2,401,745.00</u><br><u>අවසාන බිල්පත නොගෙවීම - තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම</u><br>යථෝක්ත කොන්ත්‍රාත් කාර්යය අදියර දෙකක් යටතේ ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසින් සිදුකර ඇත. මෙහි පළමු අදියර 2001/10/26 දින ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත රු 12,804,132.00 + GST මුදලකට ප්‍රදානය කර ඇති අතර, අවසාන බිල්පත හා රඳවා ගැනීමේ මුදල් මේ වන විටත් ගෙවා අවසන් කර ඇත.<br><br>දෙවන අදියර 2001/11/02 දින මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත රු 13,836,873.00 + GST මුදලකට ප්‍රදානය කර ඇති අතර, මේ වන විට රු 13,769,905.00 ක මුදලක් පමණක් ගෙවා ඇත. අවසාන බිල්පත ලෙස එකී ආයතනය විසින් රුපියල් 2,401,745.09 ක මුදලක් ගෙවන ලෙසට ඉල්ලීම් කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම මුදල ගිණුම් වලට ගැනීමට තීරණය වී ඇත. |
| (ඇ) | මෙම ශේෂය ඇති වී ඇත්තේ 1995 සිට තොග නොගැලපීම් තොග සැසඳුම් ගිණුමට ගිණුම් ගත කිරීම මගින්ය. විශ්වවිද්‍යාලය මෙම ගිණුම නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර එම කමිටු නිර්දේශය අනුව මුදල් කමිටු සහ පාලක සභා අනුමැතිය සහිතව මේ වන විට නිරවුල් කර ඇත. |
| (ඈ) | <u>**රු. 460,500.00 වටිනා ලැබිය යුතු ශේෂ 13**</u><br>තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන කෙටිකාලීන පරිගණක පුහුණු පාඨමාලා සඳහා අයකරන ගාස්තුව වාරික වශයෙන් අයකරනු ලබයි. ඇතැම් පාඨමාලා ලාභීන් සම්පූර්ණ පාඨමාලා ගාස්තුව නොගෙවා පාඨමාලාව හැදෑරීම නවත්වන අතර ඔවුන්ගෙන් ලැබිය යුතු මුදල් මෙම ගිණුමේ පෙන්වා ඇත.ඇතැම් පාඨමාලා ලාභීන් සම්පූර්ණ පාඨමාලාව හදාරා මුදල් නොගෙවා ඇති අතර පාඨමාලාවට අදාල සහතිකපත් නිකුත් කිරීමේදී මෙම මුදල් අයකර ගනු ලැබේ.<br><br><u>**රු. 230,000.00 අග්‍රිම අත්තිකාරම් ශේෂය**</u><br>ජයතිලක යන අය විසින් ලබා ගෙන ඇති රු. 230,000.00 ක අත්තිකාරම් මුදල ඔහුගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට ප්‍රථම විමර්ශනයක් කරන ලදි. එකී විමර්ශනයේදී ඔහු විසින් එකී මුදල නිසි ලෙස පියවා නොමැති බැවින් එය ඔහුගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට නිර්දේශ කරන ලදි. මෙහිදී මෙම අය විසින් ඔහුගේ අර්ථසාධක අරමුදල කිසිදු අයකිරීමකින් තොරව ඔහු වෙත නිදහස් කරන ලෙස ඉල්ලීමක් කරමින් ඩි.එස්.පි අංක 404/2012 යටතේ මහනුවර දිසා අධිකරණයේ නඩුවක් පවරා පවත්වාගෙන යමින් සිටින බැවින් 2014 දෙසැම්බර් මස 15 දින ලබාදුන් නඩු නියෝගය අනුව අර්ථසාධක මුදලින් ඉහත සඳහන් මුදල 25% ක |

දෙපාර්තමේන්තු ගාස්තු, හිඟ ගෙවල් කුලි රු. 189,000.00 සහ විදුලි බිල්පත්ද ඇතුළුව රු. 485,914.98 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත රඳවා ගෙන ඉතිරි මුදල ඔහුට මුදවා හැරීමට කටයුතු කරනු ලැබේ.

**රු. 173,382.00 හඳුනා නොගත් වැටුප් අත්තිකාරම් ශේෂ**

පහත සඳහන් ගිණුම් සංකේත අංක යටතේ ඇති රු. 173,382.00 ක වැටුප් අත්තිකාරම් ශේෂය වර්ෂ ගණනාවක සිට පැවත එන හඳුනාගත නොහැකි සහ අයකල නොහැකි ශේෂයන් වන අතර මේ සම්බන්ධයෙන් විමර්ෂණය සඳහා පත්කළ කමිටු වාර්තාවේ නිර්දේශය මත ගිණුම් පොත් මගින් කපා ඉවත්කිරීමට 2013 නොවැම්බර් මස පැවැත්වූ 425 වැනි පාලක සභාව මඟින් අනුමැතිය ලබා දී ඇත. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කර ඇත.

| ගිණුම් සංකේත අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 12-01-30-01 | 20,900.00 |
| 12-01-30-02 | 9,000.00 |
| 12-01-30-03 | 15,200.00 |
| 12-01-30-04 | 31,300.00 |
| 12-01-30-06 | 95,382.00 |
| 12-01-30-07 | 1,000.00 |
| 12-01-30-08 | 600.00 |
| එකතුව | 173,382.00 |

**රු. 318,892..00 ක වෙනත් ලැබිය යුතු ශේෂ**

උක්ත කරුණට අදාලව විශ්වවිද්‍යාලයට සිදුවී ඇති පාඩුව වන රු. 145,000.00 ක මුදලක් අයකර ගැනීමට අදාල නීති ක්‍රියා මාර්ග ගන්නා ලෙස දැනුම් දීමෙන් අනතුරුව උපකුලපතිතුමාගේ 2007 දෙසැම්බර් 27 දිනැති ලිපියෙන් අදාල නීති ක්‍රියා මාර්ග ගන්නා ලෙස නීතිපති වෙත දන්වා යවා ඇත.

ඉන් අනතුරුව නීතිපතිවරයාගේ 2008.06.23 දිනැති ලිපිය මඟින් ගිවිසුම ප්‍රකාරව සමථකරණයකට පළමුව යොමු කළ යුතුව තිබුණ බැවින් එසේ යොමු කරන ලෙසට දැනුම් දී ඇත.

ඉන් අනතුරුව පාලක සභාව විසින් ලක්ෂ්මන් පෙරේරා මහතා සමථකරු ලෙස පත් කළද ඔහු එවකට පාලක සභිකයෙක්ද වූ බැවින් එය ප්‍රතික්ෂේප කරන ලදි.

නැවතත් ආචාර්ය ඒ.ආර්. ආරියරත්න මහතා සමථකරුවෙකු ලෙස පත් කර ඒ බව අදාල සමාගම වෙත දන්වා සිටි අතර එකී සමථකරු සම්බන්ධයෙන් ඔවුන්ගේ විරෝධතාවයක් තිබේ නම් දන්වන ලෙසද කරුණු විමසන ලදි. එයට පිළිතුරු වශයෙන් ඔවුන් එකී ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් රු. 25,000.00 ක වටිනාකමකින් යුත් චෙක් පතක්ද ඉතිරි මුදල රු. 10,000.00 ක් වූ වාරික වලින් ද ගෙවන බවට නැවත එකඟතාවය පල කරන ලදි.

එකී එකඟතාවය ඔවුන් විසින් පැහැර හැරීම හේතුවෙන් නැවතත් ඉහත තීරණය කළ පරිදි සමථකරණය වෙත යොමු වන බවට ඔවුන්ට දන්වා සිටින ලදි. එකී ආචාර්ය ආරියරත්න මහතා සම්බන්ධයෙන් ඔවුන් කැමැත්ත පල කලේ නැත.

මේ වකවානුව තුල සමථමණ්ඩල පනතේ ණය සීමාව රු. 250,000.00 ක් දක්වා ඉහල දැමීම හේතුවෙන් අධිකරණ ක්‍රියාවලියකට යොමු වීමට ප්‍රථම සමථ මුල මණ්ඩලය වෙත පැමිනිල්ලක් ඉදරිපත් කොට තිබිය යුතු බැවින් උක්ත කරුණ 2013.08.12 වන දින සමථ මුල මණ්ඩලය වෙත යොමු කළද එහිදී සමථයකට නොපැමිණි බැවින් සමථ නොවීමේ සහතිකය අප වෙත නිකුත් කරන ලදි.

<table>
<tr><td></td><td>ඉන් අනතුරුව ගිවිසුම ප්‍රකාරව නැවතත් සමථකරණ කරුවෙකු පත් කළ යුතු බැවින්, උපකුලපතිතුමා විසින් මහාචාර්ය අයි.ඒ.යු.එන්. ගුණතිලක මහතා පත් කළ අතර එකී කටයුතු 2014.11.20 දින ආරම්භ කිරීමට නියමිත අතර එහි නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව අදාල රු. 145,000/- ක මුදල ලබා ගැනීමට නීතිමය කටයුතු කරනු ලැබේ.<br><br><u>රු. 2,159,500 ක ණය ශේෂ</u><br>විශ්‍රාම ගිය එච්.ඒ.ජයතිලක මහතාගෙන් අයවිය යුතු රු. 174,054.00 ක් වු ණය වාරිකය පමණක් අය කර ගැනීමට ඇත. ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර ගැනීමේදී අයකර ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.<br><br>ඉතිරි පැරණි ආපදා ණය ශේෂයන්ගෙන් මෙම සේවකයන් සේවය අත්හිටවූ, විදේශ ගත වී ගිවිසුම් කඩ කර ඇති සේවකයන් හා නඩු විභාග වෙමින් පවතින සේවකයන් වන අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කොට නොමැති බැවින් අර්ථසාධක අරමුදල් නිදහස් කර ගැනීමේදී අයකර ගැනීමට කටයුතු කෙරේ.<br><br><u>රු. 10,544 ක උත්සව අත්තිකාරම් ශේෂය</u><br>ඉහත රු. 10,544.00 ක උත්සව අත්තිකාරම් ශේෂයෙන් මේ වන විට අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති පහත සඳහන් අර්ථසාධක අංක හිමි අයගෙන් අයකර ගත හැකි මුදල රු.5,000.00 ක් වන අතර මේ වනවිටත් අර්ථසාධක අරමුදල් නිදහස් කර ඇති සේවක මණ්ඩලයට අයත් රු. 5,544.41 ක මුදල් ගිණුම් වලින් කපා හැරීම සඳහා 2013 නොවැම්බර් මස 03 වැනි දින පැවැත්වූ 425 වැනි පාලක සභාව විසින් අනුමැතිය ලබා දී ඇති අතර අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>6164 - R.M. උපුල් තිලකරත්න 500.00<br>4982 - D.M. හේරත් බණ්ඩා 1,500.00<br>5583 - R.M. නවරත්න 2,100.00<br>5947 - P.M.G. විජේරත්න 600.00<br>5110 - R.M.H. ගුණරත්න <u>300.00</u><br><u>5,000.00</u></td></tr>
<tr><td>2.2.5</td><td>විගණනය සඳහා සාක්ෂි නොවීම</td></tr>
<tr><td>(අ)</td><td><u>දේපළ පිරියත හා උපකරණ</u><br>ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබයි. ඒ ඒ දෙපාර්තමේන්තුවල වෙනමම ඉන්වෙන්ටරි ලේඛන පවත්වාගෙන යනු ලබන අතර වත්කම් මිලදී ගැනීම් සඳහා මුදල් ගෙවීමට පෙර සියළුම වත්කම් මිලදී ගැනීම් ඉන්වෙන්ටරි ලේඛනවලට ඇතුලත් කරනු ලබයි. වාර්ෂිකව මිලදී ගත් සියළුම ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් ගිණුම් අංශයේ නඩත්තු කරනු ලබයි.</td></tr>
<tr><td>(ආ)</td><td><u>ගිවිසුම් කඩකළ ආචාර්යවරු 21 දෙනෙකුගේ ඇප බැඳුම්කර</u><br>ආචාර්යවරුන් හා නිලධාරීන් 08 දෙනෙකුගේ අර්ථසාධක අංක මේ වන විට හඳුනාගෙන ඇති අතර ඉතිරි 13 දෙනා ඉතා පැරණි ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් වේ.මොවුන්ගේ අර්ථසාධක අරමුදල් අංක සොයාගැනීමට කටයුතු කරමින් පවතී.</td></tr>
<tr><td>(ඇ)</td><td><u>පීඨ 08 ක කථිකාචාර්යවරු 64 දෙනෙකුගේ පර්යේෂණ දීමනා</u><br>අදාල විගණන සාක්ෂි විගණන අංශය වෙත ලබා දීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(ඈ)</td><td><u>ශාස්ත්‍ර පීඨයේ තොග ( රු. 4,246,133.00 )</u><br>2011 වර්ෂයට පෙර පීඨ දෙපාර්තමේන්තු වල හා අනෙකුත් අංශ, මධ්‍යස්ථාන වල පවත්වාගෙන යනු ලබන</td></tr>
</table>

ලිපිද්‍රව්‍ය තොග ආගනනය කර එහි වටිනාකම අවසන් ගිණුම් වලට ඇතුලත් කිරීමක් සිදු නොවුණු අතර 2011.12.31 දිනෙන් අවසන් වර්ෂයෙහි සිට සියළුම තොග සමීක්ෂණ කමිටුවක් මගින් සත්‍යාපනය කර අවසන් ගිණුම් වලට ඇතුලත් කිරීම ආරම්භ කරන ලදී.

2012, 2013 වර්ෂ වන විට සිය අංශ වෙත නිසි පරිදි සකස් කරන ලද තොග පොත් ලබා දී මෙම තොග පාලනය විධිමත් කරන ලදි.
එබැවින් මෙම තත්ත්වය මේ වන විට පීඨයෙහි දක්නට නොමැති අතර විගණනයට අවශ්‍ය සියළු තොග තොරතුරු ශාස්ත්‍ර පීඨයේ දෙපාර්තුමේන්තු වෙතින් ලබා ගැනීමේ හැකියාවක් මේ වනවිට ඇත.

(ඉ) **බාහිර විභාග අංශයේ ආධාර මගින් ලද වත්කම් ( රු. 1,468,164.00)**

පහත සඳහන් වත්කම් Distance Education Moderation ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති අතර 2012 මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් සටහන් අංක 14 යටතේ මෙය දක්වා ඇත.

| වත්කමේ නම | (රු.) |
|---|---|
| HP G3010 ස්කෑනර් යන්ත්‍රය | 15,400.00 |
| HP G3010 පරිගණක යන්ත්‍ර | 533,000.00 |
| HP G3010 Notebook පරිගණක යන්ත්‍ර | 864,000.00 |
| Digital Camera | 41,793.60 |

(ඊ) **නිරවුල් නොකළ ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ( රු. 5,298,577.00)**

මෙම ශේෂයන් උතුරු හා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිසුන් වෙනුවෙන් දරණ ලද ආදායම් හා වියදම් වලට අදාල ශේෂ වන අතර මෙය ගිණුමක් වශයෙන් දැනට විශ්වවිද්‍යාලයේ ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේ දී මෙය ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(උ) **ගෙවිය යුතු ඇප තැන්පත් ( රු. 4,709,600.00 )**

යාවත්කාලීන කරන ලද පරිගණක ගත ඇප තැම්පතු ලේඛනයක් විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන අතර එහි පිටපත් විගණනය සඳහා ඉදිරිපත්කර ඇත.

(ඌ) **බැංකු ගිණුමක 2010 ජනවාරි 01 දින සිට 2013 මැයි 30 දින දක්වා ඉවත් කරන ලද මුදල් ( රු. 1,596,783.00)**

මෙම ගෙවීම් වවුචර්පත් මේවන විට විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

(එ) **මූලධන වියදම් (රු. 4,487,513.00)**

මෙම ගෙවීම් වවුචර්පත් මේවන විට විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

(ඒ) **විවිධ ණයහිමියෝ**

මෙම ණයහිමි ශේෂයන් නියෝජනය වන්නේ පහත සඳහන් ගිණුම් වල ශේෂයන් අනුවය. එනම් රු.64,804.557.00 ක මුදල දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ලැබිය යුතු වටිනාකමක් වන අතර ඒ සඳහා උපලේඛනයක් ඉදිරිපත් කළ නොහැක. ඉතිරි ශේෂ සඳහා උපලේඛන නොමැත.

| | | |
|---|---|---|
| 11046200 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය | රු. 64,804,557.00 |
| 12012300 | වැටුප් පාලන ගිණුම | රු. 8,686.00 |
| 12021400 | අර්ථසාධක අරමුදල් ණය | රු. 387,085.00 |
| | | රු. **65,200,328.00** |

| | |
|---|---|
| **2.3** | **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.** |
| (අ) | **1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත**<br>**45 වගන්තිය**<br>මුදල් රෙගුලාසි 135 අනුව පිළියෙල කළ "මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම" මඟින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යයන් මේ වන විට විධිමත්ව සිදුකිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය**<br>I. **VIII පරිච්ඡේදයේ 6.1(අ) වගන්තිය**<br>කෘෂිකර්ම පීඨය<br>මෙම රු. 480,000.00 මුදල ගෙවීම් සඳහා 2012.12.22 දින පැවති 317 වැනි මූල්‍ය කමිටුවේ රැස්වීමේ වාර්තා අංක 317.87 යටතේ සහ 29.06.2013 දින පැවති 421 වැනි පාලක සභා රැස්වීමේදී මේ සඳහා අනුමැතිය ලබා දී ඇත.<br><br>II. **IX පරිච්ඡේදයේ 3.4 ,3.5 හා 3.6 වගන්ති**<br>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.4 උප ඡේදය අනුව සේවා නියුක්තිකයෙකු විසින් උපයා ගනු ලබන අතිකාල දීමනා ඔහුගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් 35 % කට (එනම් පැය 56කට) නොවැඩි වන පරිදි අතිකාල වැඩ කිරීමට අනුමැතිය දිය හැකිය.<br><br>එහෙත් ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.5 උප ඡේදය අනුව අති විශේෂ අවස්ථාවන්හිදී සේවා නියුක්තිකයාගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් 75%ක උපරිමයකට (එනම් පැය 120කට) නොවැඩි වන සේ අතිකාල දීමනා ගෙවීම අනුමත කිරීමට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස උපකුලපතිට හැකිය.<br><br>තවද IX පරිච්ඡේදයේ 3.6 උප ඡේදය අනුව සේවා අවශ්‍යතාවය හා යම් වැඩක හදිසි ස්වභාවය සලකා බලා යම් සේවා නියුක්තිකයෙකුගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් 75%කට වැඩියෙන් (එනම් පැය 120ට වැඩියෙන්) අතිකාල දීමනා අනුමත කිරීමට විශ්වවිද්‍යාල පාලක සභාවට හැකිය.<br><br>ඒ අනුව විශ්වවිද්‍යාලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සේවා අවශ්‍යතාවය මත පමණක් පහත සඳහන් අංශ සඳහා 35% සීමාව ඉක්මවා සේවකයන් අතිකාල සේවයේ යෙදවීමට සිදුවී ඇත.<br><br>**වැඩ දෙපාර්තමේන්තුව**<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය දැවැන්ත, මධ්‍යම හා කුඩා පරිමාණයේ ගොඩනැගිලි 598 කින් සමන්විත වන අතර, මෙම ගොඩනැගිලිවල සමස්ථ වර්ග ප්‍රමාණය වර්ග අඩි 4,020,000 ක් (වර්ග අඩි මිලියන 4.02 ක්) පමණ වේ. මෙම ගොඩනැගිලි බහුතරයක් වසර 60 කට වඩා පැරණි වන අතර මෙම ගොඩනැගිලි හා සම්බන්ධ ජල සැපයුම්, විදුලි සැපයුම්, පල්දෝරු කළමනාකරණ සහ ජල බැහැර කිරීම්, පද්ධතිවල නිතර බිඳවැටීම සිදුවේ. වැඩ දෙපාර්තමේන්තුව විසින් උක්ත සියලු බිඳවැටීම් පිළිසකර කිරීමට අමතරව දෛනික නඩත්තු කටයුතු වාරික නඩත්තු හා වැඩි දියුණු කිරීම් කටයුතු, කුඩා පරිමාණයේ පුනරාවර්තන කටයුතු මෙන්ම මුලධන හා පුනරාවර්තන ව්‍යාපෘති කටයුතු සඳහා සේවා සැපයිය යුතු වේ. උක්ත සියළු කටයුතු සඳහා සෘජු ශ්‍රමිකයන් අඩු වැඩි වශයෙන් යොදාගත යුතු වේ.<br><br>විශ්වවිද්‍යාල නිලනිවාස පද්ධතිය ඇතුළු මෙම සියලු පැරණි ගොඩනැගිලි බහුතරයක පවත්නා තත්වය අතිශයින් අසතුටුදායක බව ඕනෑම බාහිර නිරීක්ෂකයෙකුට නිරීක්ෂණය කල හැකි වේ. එම ගොඩනැගිලිවල කොන්ක්‍රීට් සැකිළි සම්බන්ධව ඉංජිනේරුමය දෘෂ්ඨිකෝණයකින් විමසා බලන්නෙකුට |

අන් නිරීක්ෂකයෙකුට පෙනෙන ජරාවාස වූ අසතුටුදායක බාහිර පෙනුමට අමතරව ඉතා ඈත ගැඹුරක් දක්වා විහිදී අනතුරුදායක තත්වයක් නිරීක්‍ෂණය වේ. මේ පිළිබඳව 2011 වසරේ දෙසැම්බර් මාසයේදී වැඩ දෙපාර්තමේන්තුව විසින් විශේෂ සමීක්ෂණයක් කරන ලද අතර, එහිදී එකතු කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, මෙම ගොඩනැගිලි පද්ධතිය ද ඒ හා බැඳුණු අනෙකුත් සේවා පද්ධතිය පිළිසකර කිරීම කඩිනම් හා අත්‍යවශ්‍ය කාරණයක් ලෙස හඳුනා ගන්නා ලදී. මේ සම්බන්ධව කඩිනම් මැදිහත්වීමක් නොකළහොත් එවකට පැවති සේවා සැපයීමේ රිද්මය හා ධාරිතාවය අනුව ඉදිරි වසර 15ක් හෝ 20ක් තුළ උක්ත සියලු සේවා පද්ධතීන් අක්‍රීය වන බවද නිරීක්‍ෂණය කරන ලදී. මේ පිළිබඳව විශ්වවිද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කමිටුව දැනුවත් කළ අතර ඒකරාශී කරගත් සියලු දත්ත විසඳුම්ද සමගින් විශ්වවිද්‍යාල පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

උක්ත සියලු කටයුතු සඳහා වැඩ දෙපාර්තමේන්තුව සතු සමස්ත ශ්‍රම බලකාය සේවකයන් 164 කට සීමාවූ බැවින් (දෛනික පැමිණීමේ සාමාන්‍ය අගය 140 ක් පමණ වේ.) සේවා අවශ්‍යතාවයන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව සේවක සංඛ්‍යාව කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පසක් වූ පසු පළමුව කොන්ත්‍රාත් පදනම මතත් දෙවනුව ස්ථිර අනුමත කාර්යමණ්ඩලය ලෙසත් සේවකයන් බඳවා ගන්නා තුරු උපරිම අතිකාල පැය ප්‍රමාණයක් යොදා උක්ත පිළිසකර ක්‍රියාවලිය ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කමිටුවේදී තීරණය කරගන්නා ලදී. මීට අමතරව අලුතින් බඳවා ගන්නා සේවකයන් යොදා උක්ත නඩත්තු කටයුතු හා පිළිසකර කටයුතු සතුටුදායක තත්වයට පැමිණි පසු අවශ්‍යතාවයට පරිදි අතිකාල පැය අනුමැතිය අවම කිරීමට හෝ නතර කිරීමටද පියවර ගැනීමට නියමිතය.

**<u>සෞඛ්‍ය මධ්‍යස්ථානය</u>**

මෙම ඒකකය වසර 70කට පෙර ආරම්භ කරනු ලැබුවේ ශිෂ්‍යයන් 3,000ට පමණ සහ දළ වශයෙන් කාර්ය මණ්ඩලය 1,500ට පමණ වෛද්‍ය සේවාවන් සහ සනීපාරක්ෂක සේවාවන් සැපයීම සඳහාය. 2012 වර්ෂය වන විට සිසුන් සංඛ්‍යාව 12,000ක් පමණ වූ අතර කාර්යමණ්ඩලය 3,000ක් පමණ දක්වා ඉහළ යන ලදී. එවිට වෛද්‍ය සේවාවන් සහ සනීපාරක්ෂක සේවාවන් සැපයීමේ ප්‍රමාණය ඉහළ ගිය නමුත් සේවාවන්ට සාපේක්ෂව සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව හෝ සේවක සංඛ්‍යාවෙහි ඉහළ යාමක් සිදුවී නොමැත. තවද මෙම මධ්‍යස්ථානය සාමාන්‍ය රෝහලක් මෙන් දවසේ පැය 24 පුරාම රාජකාරී කටයුතු සිදු කරන ස්ථානයක් වන බැවින් එම මුළු කාලසීමාවේම කාර්යමණ්ඩලය රාජකාරී කටයුතුවල නිරතව සිටින ස්ථානයකි. 2012 වර්ෂය වන විට අනුමත කාර්යමණ්ඩලයට වඩා ඌන කාර්යමණ්ඩලය වැඩි බැවින් එම කාර්යමණ්ඩලයේ රාජකාරී ආවරණය කිරීමද සිදු කළ යුතුය. මෙම හේතූන් මත සේවකයන් අතිකාල සේවයෙහි යෙදවීම සිදු කළ යුතු වේ.

මෙම මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දිනපතා සිදු කළ යුතු කසල බැහැර කිරීමේ කටයුතු පවිත්‍ර කිරීමේ සේවා ආදිය සඳහා සති අන්ත දිනවලදී ද සේවකයන් යෙදවීම සිදු කළ යුතු අතර එම දිනයන් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම සිදු කරනු ලැබේ.

**<u>ආරක්ෂක දෙපාර්තමේන්තුව</u>**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මහඉලුප්පල්ලම, දොඩම්ගොල්ල, මාවලවත්ත, මීවතුර ගොවිපලවල් ඇතුළුව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රක්නාලංකා ආරක්ෂක සමාගමේ ද සහාය මත සේවය සපයනු ලබන සේවා ස්ථාන සඳහා සේවය නියමාකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ආරක්ෂක නියාමකයන් සංඛ්‍යාව පහත පරිදිය.

| | |
|---|---|
| ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන | 28 |
| රක්නාලංකා ආරක්ෂක සමාගමේ සේවා ස්ථාන | <u>56</u> |
| | **<u>84</u>** |

මෙම සේවා ස්ථාන 84 පැය 24 සේවා ආවරණය පිණිස 08 X 3 ආකාරයට අවශ්‍ය වන ආරක්ෂක නියාමකයන් සංඛ්‍යාව

| | |
|---|---|
| 84 X 3 සංඛ්‍යාව | 252 |
| 5% නිවාඩු | 12 |
| | **264** |

දැනට සේවයේ යොදවා ඇති සමස්ත සේවක සංඛ්‍යාව 186 කි. ඒ අනුව මේ වන විටත් දෛනික ආරක්ෂක සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා වන සේවක හිඟය පහත පරිදිය.

| | |
|---|---|
| අවශ්‍ය සේවක සංඛ්‍යාව | 264 |
| යොදවන ආරක්ෂක නියාමක සංඛ්‍යාව | 186 |
| | **78** |

ඒ අනුව නියමිත ප්‍රමිතියෙන් යුතු ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැනට යොදවා ඇති සමස්ත සේවක පිරිසට අමතරව තවත් ආරක්ෂක නියාමකයන් **78** දෙනකුගේ හිඟයක් ඇති බව සැළකිය යුතුය.

ආරක්ෂක දෙපාර්තමේන්තුව අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනයක් බැවින් සේවක හිඟය හෝ වෙනයම් හේතුවක් මත සේවා ස්ථාන හිස්ව තැබිය නොහැකිය. මෙම ලිපියේ පෙර සඳහන් කර ඇති පරිදි ආරක්ෂක දෙපාර්තමේන්තුව මේ වන විට ආරක්ෂක නියාමකයන් 78 දෙනකුගේ හිඟයක් ඇත. මෙම හිඟය මාසිකව වැඩකළ යුතු පැය ගණනින් නම් 78 X 192 = පැය 14,976 කි. මෙම පැය ගණන ආවරණය කිරීම පිණිස සීමාව ඉක්මවා අතිකාල අනුමත කිරීමට සිදුවේ. විශ්වවිද්‍යාලයේ දෛනික සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් මානව හා භෞතික සම්පත්වල ආරක්ෂාව සහතික කිරීම සඳහාත් මෙය අත්‍යාවශ්‍ය තත්ත්වයකි.

III. **XX පරිච්ඡේදයේ 3 වගන්තිය**

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වැටුප් ගෙවනුයේ ඔවුන්ගේ පන්ති කාමර ඉගැන්වීම් ප්‍රමාණාත්මකව ගණනය කිරීමෙන් නොවන අතර විශ්වවිද්‍යාල ආචාර්යවරයාගේ සේවය පැය ගණනින් ගණනය කල හැකි සේවයක් නොවේ. ඔහුගේ ප්‍රධාන කාර්යය වන්නේ දැනුම නිපදවීම සහ බෙදාහැරීමය. (Creation and dissemination of knowledge). විෂයාන්තර දැනුම විශ්වීය පදනමින් ගොඩනගන අතරම ජාතික සංවර්ධනයට හා සමාජ සුභසිද්ධිය උදෙසා පර්යේෂණ කාර්යයෙහි යෙදීම හා නව දැනුම සමාජ සුභසිද්ධියට අදාලව බෙදා හැරීම විශ්වවිද්‍යාල ආචාර්යවරයා අතින් සිදුවන අතර එය ඉටු කිරීම ඔහුගේ රාජකාරි වගකීමද වේ. ආචාර්යවරුන්ට නිකුත් කරන පත්වීම් ලිපි සහ ඔවුන්ගේ උසස්වීම් පටිපාටිය විමසීමෙන් මෙය වටහා ගත හැකි වේ.

නව පර්යේෂණ ගවේෂණ සඳහා සහභාගීවීම ඉගැන්වීමේ කාර්යය සඳහා නව දැනුම උපයා ගැනීම සඳහා පුස්තකාල පොත්පත් පරිහරණය, අන්තර්ජාලය භාවිතා කිරීම, සඟරා ලිපි ලේඛන ලිවීම, දේශීය හා විදේශීය සාකච්ඡා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම, ක්ෂේත්‍ර සමීක්ෂණ සහ නිරීක්ෂණ වලට සම්බන්ධ වීම, සිසුන් සමග අදහස් හුවමාරු කර ගැනීම හා ඔවුන්ගේ විෂය ගැටළු සඳහා පිළිතුරු සැපයීම, තම දෙපාර්තමේන්තුවේ, පීඨයේ සහ විශ්වවිද්‍යාලයේ පරිපාලන වැඩි දියුණුවීම් කටයුතු සංවර්ධනය කිරීම වැනි විශාල කාර්යය භාරයක් විශ්වවිද්‍යාල ආචාර්යවරයා අතින් සිදුවන අතර එම කාර්යය නිශ්චිත පැය ගණනකට හෝ දෙපාර්තමේන්තු පරිශ්‍රයට සීමා කොට ගණනය කළ නොහැකි ය.

විශ්වවිද්‍යාල ආචාර්යවරයා ගතකරන කාලය නිශ්චිතව ගණනය කර දැක්වීමේ හැකියාවක් නොමැති අතර ඉතා පුළුල් පරාසයක පැතිරී යන මෙම කාර්යයන් සඳහා ඔහු පූර්ණ කාලීනව එම කටයුත්තේ නිරතව සිටී.

මේ කාර්යයේදී විශ්වවිද්‍යාල ආචාර්යවරයාට අත්‍යවශ්‍ය දෙයක් වන්නේ ශාස්ත්‍රීය නිදහස ය.(academic freedom) මෙහිදී පිළිගන්නා මූලධර්මය වන්නේ ආචාර්යවරයාගේ ශාස්ත්‍රීය නිදහස පාලනය කිරීමට ඇතිවිය හැකි මැදිහත්වීම් වලක්වා ගැනීම අවශ්‍ය බවය. ආචාර්යවරුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම සිදුකරන අංශ ප්‍රධානීන් , පීඨාධිපතිවරු සහ උපකුලපතිවරු ආචාර්යවරුන් අතරින් පත් කිරීමට විශ්වවිද්‍යාල පනතින් පියවර ගෙන තිබෙන්නේ මේ නිසා ය.

මෙම ශාස්ත්‍රීය නිදහස පිළිබඳ මූලධර්මය නිසා ආචාර්යවරුන් සඳහා පැමිණීමේ ලේඛන පවත්වා ගෙන යන්නේ නැත. මෙය ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුල පිළිගෙන තිබෙන මූලධර්මයකි. ලංකා විශ්වවිද්‍යාලය ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භ කල 1942 සිටම ස්ථිර ආචාර්යවරුන් සඳහා පැමිණීමේ ලේඛන අත්සන් නොකරන්නේ මේ නිසාය. එබැවින් පැමිණීමේ ලේඛන අත්සන් කිරීමට කරන ඉල්ලීම විශ්වවිද්‍යාලයේ පවතින බුද්ධිමය පරිසරය තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල නොහැක්කක් වන අතර එවැන්නක් ඉල්ලා සිටින්නේ නම් විශ්වවිද්‍යාලය මඟින් අපේක්ෂිත මුඛ්‍ය පරමාර්ථය බිඳ වැටෙනු ඇත.

එසේ වුව ද සෑම ආචාර්යවරයෙකුම ඔහුගේ විෂය සඳහා සිදුකරන ඉගැන්වීමේ කාර්යය, සිසුන් සඳහා පවත්වන සායන සහ ඔවුන්ගේ පර්යේෂණ අධීක්ෂණය සඳහා අංශ ප්‍රධාන විසින් කාලසටහන් මඟින් කාලපරිච්ඡේද වෙන් කර ඇත. අදාල අංශ ප්‍රධානීන් විසින් මෙම කාල සටහන් අනුගමනය කරන ආකාරය අධීක්ෂණය කරයි. අඛණ්ඩ ඇගයීම් සිදුකිරීම, වාරික ප්‍රශ්ණ පත්‍ර පිළියෙල කිරීම, සිසුන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ මඟින් ද කාලසටහන් අනුගමනය කිරීම යන ක්‍රියාමාර්ග මඟින් ද මෙම අධීක්ෂණය සිදු කරයි. මේ වන විටදී විශ්වවිද්‍යාල සනාථන සභාව ආචාර්යවරුන්ගේ කාර්යය තොගය (work load) ගණන් ගැනීම සඳහා වාර්තාවන් සලකා බලමින් සිටින බවද සඳහන් කළ යුතුය.

(ඇ) **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>**

**I. <u>මුදල් රෙගුලාසි 110</u>**

<u>කෘෂිකර්ම පීඨය</u>

හානිපූර්ණ ලේඛනයක් 2013 සිට පවත්වාගෙන යන අතර එහි 2010 වර්ෂයේ සිට සිදුවූ වාහන අනතුරු පිළිබඳ විස්තර දක්වා ඇත.

<u>විද්‍යා පීඨය</u>

හානිපූර්ණ ලේඛනයක් 2014 සිට පවත්වාගෙන යන අතර එහි 2014 වර්ෂයේ සිට සිදුවූ වාහන අනතුරු පිළිබඳ විස්තර දක්වා ඇත.

**II. <u>මුදල් රෙගුලාසි 188</u>**

2013 වර්ෂයේ ගිණුම් සමග නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

**III. <u>මුදල් රෙගුලාසි 212(2)v</u>**

පහත සඳහන් ගිණුම් සංකේත අංකයන් යටතේ ඇති වැටුප් අත්තිකාරම් මුදලින් මේ වන විට අයකර ඇති මුදල සහ අයකල හැකි මුදල පහත පරිදි වේ.

| | **අයකර ඇති මුදල** | **අයකල හැකි මුදල** |
|---|---|---|
| 12.01.30.01 | 1,500.00 | |
| 12.01.30.02 | 88,328.00 | |
| 12.01.30.06 | 45,544.12 | 34,834.00 |
| 12.01.30.07 | | 1,000.00 |
| 12.01.30.08 | | 700.00 |

**IV. මුදල් රෙගුලාසි 237(ආ)**

මෙම රු. 554,520.00 ක වටිනාකමින් 2008/12/09 දින වවුචර් අංක 372 යටතේ මිලදීගෙන ඇති ආහාර බඳුන් හා එහි වටිනාකම වූ රු. 1 10,060.00 තොග පොත්වල ඇතුලත් කර ඇත.

නමුත් 2012.02.21 දින වවුචර් අංක 46 යටතේ මිලදී ගෙන ඇති පිළිතුරු පොත් ප්‍රමාණය සහ එහි වටිනාකම වූ රු. 444,460.00 ක මුදල සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන් සඳහා නීති ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතී.

**V. මුදල් රෙගුලාසි 371**

* රු. 20,000.00 සීමාව ඇතුලත කරගත නොහැකි වූ අත්‍යවශ්‍ය කාර්යන් වෙනුවෙන් මෙම අත්තිකාරම් ලබාගෙන ඇති බව දන්වන අතර එම සියලුම අත්තිකාරම් සඳහා සකස් කල ඇස්තමේන්තු උපකුලපතිතුමාගේ අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇති අතර අත්‍යවශ්‍යය කටයුතු වෙනුවෙන් රු. 20,000.00 සීමාව ඉක්මවා ඇස්තමේන්තු ලබා දී ඇති අතර එම මුදල් නිසිපරිදි අයකරගෙන ඇත.

* **පශු වෛද්‍ය පීඨය**

පහතින් දක්වා ඇති පරිදි පීඨයේ අත්‍යවශ්‍ය හේතුන් හා සේවාවන් මත අතුරු අග්‍රිමයක් ලබා දීමට කටයුතු කර ඇත.

**2012.02.22 රු. 72,800.00 ක් වටිනා අංක 66 දරණ වවුචරය හා 2012.06.01 රු. 78,400.00 ක් වටිනා අංක 241 දරණ වවුචරය මගින් අත්තිකාරමක් වශයෙන් බයිරහා ෆාම් පුද්ගලික සමාගම වෙත ගෙවීම.**

පශු වෛද්‍ය ගොවිපල සඳහා කුකුල් පැටවුන් මිලදී ගැනීමට ලබා දී තිබූ අත්තිකාරම වේ. මෙම සැපයුම්කරු අදාල සැපයුම් සිදුකරනුයේ අදාල ගෙවීම් සිදු කිරීමෙන් පසුවය. එම අග්‍රිමයේ අයදුම්කරු පීඨාධිපතිතුමිය වන අතර අදාල බාහිර පාර්ශවය වෙනුවෙන් වගකීමට බැඳී සිටී. තවද චෙක්පත නිකුත් කර ඇත්තේ අදාල ආයතනය නමින් වේ.

**2012.02.22 රු. 20,000.00 ක් වටිනා අංක 67 දරණ වවුචරය හා 2012.05.31 රු. 15,000.00 ක් වටිනා අංක 234 දරණ වවුචරය මගින් එම් ජයසිංහ මහතා වෙත ගෙවීම.**

ඉහත අග්‍රිමයේ අයදුම්කරු වනුයේ පීඨාධිපතිතුමිය වන අතර පීඨාධිපතිතුමියගේ උපදෙස් මත සහකාර ලේඛකාධිකාරිතුමිය විසින් අග්‍රිමය ඉහත නිලධාරියා වෙත නිකුත් කරන ලෙස ඉල්ලීම් කර ඇත්තේ පීඨාධිපතිතුමියට මුදල් ලබා ගැනීමට බැංකුව වෙත යාමේ ප්‍රායෝගික අපහසුතාව නිසා වේ.

**2012.03.22 අංක 100 දරණ වවුචරයේ මෙට්‍රොපොලිටන්ට් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත ගෙවීම් කළ අග්‍රිමය**

මෙය සේවා ගිවිසුමකි. සැපයුම්කරු අදාල ගිවිසුමට බැඳෙනුයේ අදාල ගෙවීම් සිදු කිරීමෙන් පසුවය. අග්‍රිමයේ අයදුම්කරු පීඨාධිපතිතුමිය වන අතර අදාල බාහිර පාර්ශවය වෙනුවෙන් වගකීමට බැඳී සිටී. තවද චෙක්පත නිකුත් කර ඇත්තේ අදාල ආයතනය නමින් වේ.

**වවුචර අංක 180 දරණ 2012.04.20 දින සිලෝන් ඔක්සිජන් ලිමිටඩ් වෙත නිකුත් කළ අග්‍රිමය**

ඉහත අග්‍රිමය ඉල්ලුම් කර ඇත්තේ RPVJ රාජපක්ෂ මහාචාර්යවරයා වන අතර මෙම සැපයුම් අත්තාකාරමෙහි අදාල ගෙවීම් සිදුකිරීමෙන් පමණක් ආයතනය අදාල සේවාවන් ලබාදෙන බැවින් චෙක්පත අදාල ආයතනය නමින් නිකුත් කරන අතර මහාචාර්යවරයා බාහිර පාර්ශවය වෙනුවෙන් වගකීමට බැඳී සිටී.

**<u>වවුචර අංක 232 දරණ 2012.05.25 දින ටොයොටා ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත නිකුත් කළ අතුරු අග්‍රිමය</u>**

ඉහත ගෙවීම සිදුකර ඇත්තේ අමතර කොටස් මිලදී ගැනීමට පීඨ ප්‍රසම්පාදන කමිටුවේ අනුමත ගණුදෙනුවකි. මෙම සැපයුම්කරුද අදාල ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව අදාල භාණ්ඩ සැපයීම් සිදු කරනු ලැබේ. අග්‍රිමය පීඨාධිපතිතුමිය විසින් ඉල්ලුම් කර ඇති අතර බාහිර පාර්ශවය වෙනුවෙන් වගකීමට බැඳී සිටී.

**<u>වවුචර අංක 425 දරණ 2012.11.20 දින නිකුත් කළ අග්‍රිමය</u>**

මෙම අග්‍රිමය පීඨයේ සහකාර ලේඛකාධිකාරිතුමියගේ ඉල්ලීම මත නිකුත් කළ අත්තිකාරමකි. ගෙවීම එම්. ජයසිංහ මහතාට සිදුකර ඇත. ඔබගේ උපදෙස් පරිදි මින් ඉදිරියට මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරියෙකුට පමණක් අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කර ඇත.

**<u>2012.12.02 දින වවුචර් අංක 446 න් “Sri Lanka Umbrella Industries” වෙත රු. 26,200.00 ක ගෙවීම</u>**

මෙම මිලදී ගැනීම පීඨ ප්‍රසම්පාදන කමිටුවේ අනුමත ගණුදෙනුවක් වන අතර අදාල සැපයුම්කරු සැපයුම සිදු කරනුයේ ගෙවීම සිදුකිරීමෙන් අනතුරුව වේ. මේ අනුව කඩිනමින් වැහිකබා පශු වෛද්‍ය ගොවිපලේ සේවකයන් සඳහා අදාල කටයුතු කාර්යක්ෂමව කරගෙනයාමේ අරමුණින් මිලදී ගැනීම සිදුකර ඇත.

**<u>වවුචර අංක 454 දරණ 2012.12.19 දින ස්ටේට් ෆාමසුටිකල්ස් වෙත නිකුත් කළ රු. 43,000.00 අතුරු අග්‍රිමය</u>**

ඉහත අග්‍රිමය මඟින් පශු වෛද්‍ය රෝහලට ඖෂධ මිලදී ගැනීමට නිකුත් කළ චෙක්පතකි. අදාළ ආයතනයට ගෙවීම් සිදුකිරීමෙන් පසුව පමණක් සැපයීම සිදුකරයි. අයදුම්කරු වන්නේ අදාළ දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය වන අතර ඇය බාහිර පාර්ශවය වෙනුවෙන් වගකීමට බැඳී සිටී.

මින් ඉදිරියට අත්තිකාරම් ලබාදීමේදී ඉහතාකාරයේ ගැටළු ඇති නොවීමට කටයුතු කරන අතරම, ඉහත අත්තිකාරම් ලබා දෙනුයේ පීඨයේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමේ අරමුණින් නිසා මෙම කටයුතු සිදුකරගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා ඇත්නම් ඒවා ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

* මෙය රු. 65,000.00 නොව රු. 56,475.00 ලෙස නිවැරදි විය යුතුය.

විද්‍යාගාර උපකරණ වලට රෙක්සින් කවර මස්සවා ගැනීම සඳහා ආචාර්ය එම්.පී.එස්. මුදලිගේ මහත්මිය විසින් රු. 5,000.00 ක අත්තිකාරම ලබාගෙන ඇති අතර අදාල කාර්යය භාරගත් පුද්ගලයා විසින් එය දිගින් දිගටම ප්‍රමාදකර අවසානයේ දී එය ඉටු නොකිරීම නිසා අත්තිකාරම් මුදල වියදම් නොකර පියවා ඇත.

ආචාර්ය ඩී.බී.එම්.වික්‍රමරත්න මහතා විසින් රු. 46,475.00 ක අත්තිකාරම ලබාගෙන ඇත්තේ ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයෙන් මෙහි පැමිණි පිරිස පොලොන්නරුව හා සීගිරිය නැරඹීමට යාම සඳහා ගෙවිය යුතු වූ ඇතුල්වීමේ ගාස්තු ගෙවීම සඳහාය. නමුත් මෙම මුදල මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලබා දීම නිසා මෙසේ මුළු මුදලම නැවත පියවා ඇත.

එම්.එච්.එෆ්. සකිනා මහත්මිය විසින් රු. 5,000.00 ක අත්තිකාරම ලබාගෙන ඇත්තේ ෆාමසි දෙපාර්තමේන්තුව සඳහා Vigin Coconut Oil නියැදි එකතුකර ගැනීමට කුරුණෑගලට යෑම සඳහා ගමන් වියදම් වෙනුවෙනි. නමුත් දෙපාර්තමේන්තු සිසුන් ස්වේච්චාවෙන් මෙයට ඉදිරිපත් වීම නිසා ගමන් වියදම් ගෙවීමට අවශ්‍ය නොවීමෙන් මෙම අත්තිකාරම මෙසේ ඉතිරි වී ඇත.

| | |
|---|---|
| | **VI. <u>මුදල් රෙගුලාසි 570(ඈ) හා 571</u>**<br>2013 වර්ෂයේ ගිණුම් සමග නිවැරදි කර ඉදිරිපත් කර ඇත. |
| (ඈ) | **<u>1990 පෙබරවාරි 06 දිනැති අංක 422 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය</u>**<br>මෙම දීමනා ගෙවීම සඳහා 2012.05.10 දින පැවති 315 මුදල් කමිටු වාර්තා අංක 315/28 යටතේ හා 2012.11.15 දින පැවති 316 වැනි මුදල් කමිටුවේ අංක 16.4 යටතේ සහ පාලකසභා අනුමැතිය ලබා ගෙන ඇත. |
| (ඉ) | **<u>1994 ජූනි 14 දිනැති අංක 95(2) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u>**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 හි ප්‍රතිපාදන යටතේ බාහිර උපාධි පිරිනැමීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති ප්‍රකාශනය හා නියමුව දක්වා ඇත. (Policy Framework & Guideline for Offering External Degrees) තවද මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට ප්‍රථමයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලකසභාවට යොමු කරන ලද දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පිහිටුවීමේ යෝජනාව (proposal) සම්මත වී ඇති අතර එමගින් අප ආයතනයට අදාල අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, විභාග/ඉගෙනුම් සම්පත්/පුහුණු යන කෙටිකාලීන හා තාවකාලික තනතුරු ඇති කරන ලදී. මෙම තනතුරුවල කාර්යයභාරය ආචාර්යවරුන්ට තම මූලික ඉගැනුම් රාජකාරියට අමතර වශයෙන් නිරත විය හැකි තාවකාලික,තනතුරු වන අතර ඒ සඳහා තම මූලික වැටුපෙන් 25 % ක දීමනාවක් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 861 හි 7 (II) හි දක්වා ඇත. |
| (ඊ) | **<u>2000 ජනවාරි 19 දිනැති අංක 380 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය</u>**<br>ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අයත් රසායනාගාර 05 මගින් බාහිර පාර්ශවයන්ගෙන් පරීක්ෂණ භාරගෙන පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමක් කරන ලදී. සමාලෝචිත වර්ෂයේදී ඉපයූ ආදායමින් 60% ට ආසන්න ප්‍රමාණයක් රසායනාගාර භාර කථිකාචාර්යවරුන් සහ රසායනාගාර කාර්යය භාර නිලධාරීන් විසින් අංශ ප්‍රධානී හා පීඨාධිපතිතුමාගේ අනුමැතිය යටතේ ඉල්ලුම්කර ලබාගෙන ඇත. මේ සඳහා 2011 වර්ෂයේදී පළමුව උපකුලපතිතුමාගේ අනුමැතියත් දෙවනුව මුදල් කමිටුවේ අනුමැතියත් ලබාගෙන ඇත.<br>ඉහත කටයුතු විධිමත් කිරීම සඳහා මාර්තු මස 06 වන දින පැවති 330 වැනි මුදල් කමිටුවේදී පර්යේෂණ ආදායම් සඳහා නව චක්‍රලේඛයක් අනුමත කරන ලදී. |

| | |
|---|---|
| (උ) | **2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරණ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය**<br>උපරිම ණය ශේෂය රු. 250,000.00 ඉක්මවා නොයන සේ ණය මුදල් නිදහස් කිරීමට මේ වන විට කටයුතු කර ඇත. විගණන ජේදයේ සඳහන් නිළධාරීන්ගෙන් අදාල ණය වාරික නිසි පරිදි අයකරමින් පවතී. මෙම නිළධාරීන්ගේ ණය මුදල් වල වර්තමාන තත්වය පහත දක්වා ඇත. |

| අර්ථසාධක අංකය | නම | 31-12-2014 දිනට ශේෂය |
|---|---|---|
| P 16176 | ඩී. ඩී. උපනන්ද මයා | පැරණි ණය ශේෂය ගෙවා අවසන් |
| P 09248 | ඊ. ඒ. ආර්. එම්. එදිරිසිංහ | 108,736.00 |
| P 14688 | ඒ. එම්. පී. බී. අබේසිංහ | පැරණි ණය ශේෂය ගෙවා අවසන් |
| P 08523 | යූ.ඩී. දොඩන්වල | 134,821.00 |
| P 03065 | එච්. එම්. පී. එස්. බී. හිටිනායක | පැරණි ණය ශේෂය ගෙවා අවසන් |
| P 01758 | කේ. ජේ. සමරසේකර | 127,843.00 |
| P 01108 | පී. එස්. ඩී. වික්‍රමතුංග ( 2013 මැයි විශ්‍රාම ගොස් ඇති අතර මෙම ණය මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. ) | 199,973.00 |

| | |
|---|---|
| **2.4** | **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවු ගණුදෙනු** |
| (අ) | මෙය ආචාර්ය එස්. අලහකෝන් මහතාට ජාතික විද්‍යා පදනමෙන් ලබාදෙන ලද RG/2001/EF/01/NSF දරණ පර්යේෂණ ව්‍යාපෘතියකි. මෙය 2008 අප්‍රේල් 28 දිනෙන් නිම කල යුතු වුවද එසේ කල නොහැකි වූ බැවින් ජාතික විද්‍යා පදනම දැනුවත්ව 2009 වර්ෂය දක්වාම මෙම ව්‍යාපෘතිය කරගෙනවිත් අත්හිටුවා ඇත. ව්‍යාපෘතියට ලැබිය යුතු වූ සම්පූර්ණ මුදල ලබාගෙන නොමැති බව ජාතික විද්‍යා පදනමෙන් දැනුම්දෙන ලදී. එමෙන්ම 2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කිසිදු වියදමක් නොදරණ ලදී.<br><br>ආචාර්ය එස්. අලහකෝන් මහතාගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු සියළුම මුදල් මේ වන විට ඔහුගේ අර්ථසාධක අරමුදලින් අයකර ගිණුම පියවා ඇත. |
| (ආ) | 2002 මාර්තු 01 දින අත්සන් කරන ලද ගිවිසුමෙහි විදේශ විනිමය ගිණුමෙන් මුදල් මාරු කල හැක්කේ අවශ්‍ය උපකරණ ආනයනය කිරිමට පමණක් ලෙස සඳහන් කර නොමැත. 2002 පෙබරවාරි 21 දිනැති විදේශ විනිමය පාලකගේ ලිපියෙහි එම ගිණුමෙන් විදේශ මුදල් මාරු කරගත හැකි ආකාරය සඳහන් කර ඇති අතර එහි පිටපතක් මෙහි අමුණා ඇත. එහි 04 හි සඳහන් ආකාරයට ශ්‍රී ලංකා රුපියල් වලින් මුදල් මාරු කිරිම සඳහා විදේශ විනිමය පාලකගේ අනුමැතියක් අවශ්‍ය නැත. එසේ හෙයින් විදේශ විනිමය ගිණුමෙන් රුපියල් මිලියන 10 ක් මාරුකර ස්ථාවර තැන්පතුවක් විවෘත කිරිම ව්‍යාපෘතියේ කිසිම ගිවිසුමකට පටහැනි නොවේ.<br><br>ශල්‍යකර්මය සිදු කරන ශල්‍යවෛද්‍යවරයාට හා නිර්වින්දන වෛද්‍යවරයාට ව්‍යාපෘතියෙන් ගෙවීමට නියමිත මුදල් ඔවුන් ලබා නොගන්නා නිසා එම ඉතිරිවන මුදල් යොදාගෙන මෙම ස්ථාවර තැන්පතුව විවෘත කර ඇති අතර මෙයින් විශ්වවිද්‍යාලයට කිසිම අවස්ථාවකදී අලාභයක් සිදුවී නොමැත. තවද මෙම ස්ථාවර තැන්පතුව විවෘත කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ මුල්‍ය කමිටුවේ අනුමැතිය ලබාගැනිමෙන් පසුව රාජ්‍ය බැංකු වලින් නියම කල පොලි අනුපාතයන් ගෙන්වාගෙන වැඩිම පොලී අනුපාතයක් ලබාදුන් පේරාදෙණිය ලංකා බැංකු ශාඛාවේය. එසේම මෙම ස්ථාවර තැන්පතුවෙන් වාර්ෂිකව ලබා ගන්නා පොලි අදායම උපයෝගි කරගෙන බෙදුණු තොල හා තල්ල සහිත දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා, ගමන් ගාස්තු, හා ව්‍යාපෘතිය පවත්වා ගෙන යාමට අවශ්‍ය |

| | |
|---|---|
| | ශල්‍ය උපකරණ හා අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලබන අතර මෙම පොලියෙන් ලබාගන්නා මුදල ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී පමණක් විදේශ ගිණුමෙන් මුදල් මාරු කරගනු ලැබේ. |
| (ඈ) | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලීය මුදල් චක්‍රලේක අංක 70 ට අනුව මාර්තු හා දෙසැම්බර් මාස වලදී සේවක හා ආපදා ණය මුදල් වෙනුවෙන් වාරික අයකරගැනීම අත්හිටුවන අතර පොලිය පමණක් අයකරනු ලබයි.<br><br>අධ්‍යයන කාර්යමණ්ඩලයේ වැඩ වර්ජනය පැවති කාල සීමාවේදී ආචාර්යවරුන්ට වැටුප් නොගෙවීම නිසා එම කාල සීමාව තුල ණය වාරික අයකර ගැනීමට නොහැකි වූ අතර එම අය නොකල ණය වාරික ඔවුන්ගෙන් පසු කාලීනව අයකර ගන්නා ලදී. |
| 3. | **මූල්‍ය සමාලෝචනය** |
| 3.1 | <u>**මූල්‍ය ප්‍රතිඵල**</u><br>මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌනතාවය වැඩි වීමට ප්‍රධානතම හේතූන් වන්නේ,<br><br>(i) 2012 වසර හා සංසන්දනය කරන විට ක්ෂය වීම් රු. 16,073,810.00 කින් වැඩි වීම.<br>එනම් 2011 වසරේ රු. 458,702,293.00 ක් ලෙස පැවැති ක්ෂය වීම් වටිනාකම 2012 වසරේ දී රු. 474,776,103.00 ක් ලෙස ගණනය කර ඇත. මෙමගින් විශ්වවිද්‍යාලයට මූල්‍යමය අලාභයක් නොවේ.<br><br>(ii) 2012 වසර හා සංසන්දනය කරන විට විභාග ගෙවීම් රු. 23,541,282.00 කින් වැඩි වීම.<br>මෙහිදී 2011 වසරේ රු.6,662,589 ක් වූ විභාග වියදම 2012 දී රු.30,203,871 ක් වී ඇත. මෙම වියදම වැඩි වීමට හේතුව වූයේ විභාග ගාස්තු වැඩි කිරීමයි.<br><br>(iii) 2012 වසර හා සංසන්දනය කරන විට වැටුප් හා වේතන රු. 188,997,490.00 කින් ඉහල ගොස් ඇත.<br>මෙහිදී 2011 වසරේ මුළු වැටුප් හා වේතන වියදම වූ රු. 1,751,881,111.00 ක් වුවද එකී 2012 වසරේදී රු. 1,940,878,601.00 ක් ලෙස සටහන් ඇති අතර මෙයට ප්‍රධානතම හේතුව නව පත්වීම් හා වැටුප් වැඩි වීම් වේ.<br><br>ඉහත සඳහන් ප්‍රධාන කාරණා අනුව 2012 වසරේ ඌනතාවය රු. 56,372,665.00 කින් වැඩි වූ අතර එකී සමහර හේතූන් විශ්වවිද්‍යාලයේ සෘජු පරිපාලනයෙන් බැහැර වූ ඒවා වේ. වර්තමානය වන විට කළමනාකරණය කල හැකි සියලු වියදම් නියමිත ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කර ඇත. |
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** |
| 4.1 | **කලමණාකරණ අකාර්යක්ෂමතා** |
| (අ) | 1999 ට පෙර ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ බැඳුම්කර අයකර ගැනීම සම්බන්ධයෙන් නීති මගින් හෝ වෙනත් අයුරකින් කටයුතු කිරීමේ හැකියාවක් නොමැත. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ද බැඳුම්කර කඩ කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය වෙත අයකර ගැනීම සඳහා ලිඛිත අනුමැතියක් ලබාදී නොමැති හෙයින් අයකර ගැනීමට අවකාශ නොමැත. කෙසේ වුවද වර්ෂ 2000 න් පසු බැඳුම්කර කඩවීම් නීති මාර්ගයෙන් සහ වාරික ගෙවීම් ක්‍රම මගින්ද අර්ථසාධක අරමුදල් හිලව් කර ගැනීමෙන්ද අයකර ගැනීම සිදු කරනු ඇත. මේ අනුව 2013 වර්ෂය තුල අර්ථසාධක අයකිරීම්ද ඇතුළුව රු. 23,476,040.59 මුදලක්ද 2014 වර්ෂයේ නොවැම්බර් මස දක්වා කාලය තුළ අර්ථසාධක අයකර ගැනීම්ද ඇතුළුව රු. 38,811,705.29 මුදලක්ද අයකර ගැනීමට කටයුතු කර ඇත.<br><br>1999 ට පෙර ගිවිසුම් කඩකර ඇති ආචාර්යවරුන්ගේ නමට ඇති අර්ථසාධක අරමුදල බැඳුම්කර මුදලට පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබාගත් අතර එහිදීද අර්ථසාධක |

| | |
|---|---|
| | අරමුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අදාල ආචාර්යවරයාගේ ලිඛිත අනුමැතියකින් තොරව එකී මුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමේ හැකියාවක් නොමැති බව දක්වා ඇත.<br><br>මෙම තත්ත්වය 2014/12/09 වන දින පවත්වන ලද බැඳුම්කර කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර සුදුසු කටයුත්තක් කිරීම සඳහා අනුමැතිය ඉල්ලීමට තීරණය කරන ලදී. |
| (ආ) | සේවා අවශ්‍යතාවය මත පමණක් විශේෂ අවස්ථාවලදී අංශ ප්‍රධාන හා පීඨාධිපතිගේ හෝ ලේඛකාධිකාරිගේ අනුමැතිය මත සිකුරාදා දින සේවයට නොපැමිණි සේවා නියුක්තිකයන් සෙනසුරාදා දින අතිකාල සේවයේ යෙදවා ඇත. නිදසුනක් ලෙස උපාධි ප්‍රදානෝත්සවයට පෙර සුදානම් වන කාලසීමාව දැක්විය හැක. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහා සහ බාහිර පාර්ශවයන් සඳහා කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම සඳහා මෙම මධ්‍යස්ථානය යොදාගෙන ඇත.<br><br>මෙම මධ්‍යස්ථානයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මෙහි සඳහන් ආයතන හා පරිපාලන වියදම් විශ්වවිද්‍යාලය මඟින් දරා ඇත. |
| (ඈ) | ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නන් විසින් ඉදිරිපත් කොට ඇති නීති රීති හා තෝරා ගැනීමේ පටිපාටිය අනුව (Scholarship regulation and selection criteria) ශිෂ්‍යත්ව ලාභීන් නම් කරනු ලබයි. බොහොමයක් ශිෂත්ව සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නන් විසින් සීමා පනවා ඇති බැවින් එම සුදුසුකම් සපුරා නොමැති විට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නොහැකි වේ.බොහෝමයක් ශිෂ්‍යත්ව ඉතා පැරණි ශිෂ්‍යත්ව වන අතර ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබුවන්ගෙන් නොවිමසා අදාල වෙනස්කම් කිරීමට අපහසුය. මේ නිසා ශිෂ්‍යත්ව ප්‍රදානයේ මූල්‍යමය වශයෙන් අඩුවක් ඇත. එසේම ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා සිසුන් නිර්දේශ කරනු ලබන්නේ එක් එක් පීඨයන් මඟින් වන අතර,පීඨාධිපති වරුන් මේ පිළිබඳව දැනුවත් කොට ඇත. |
| (ඉ) | රු.1,569,840 ක මුදලක් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් වියදම් කොට තිබුනේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය උපකරණ හා විශ්වවිද්‍යාලයට email server මිලදී ගැනීමටයි.<br><br>ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2012 වසරේදී ආරම්භ කරන විට එදිනෙදා කාර්යයන් ඉටු කර ගැනීමට අප හට අනෙකුත් දෙපාර්තමේන්තු වලින් අදාල උපකරණ වරින් වර ඉල්ලා ගැනීමට සිදු විය. එලෙස අත්‍යාවශ්‍ය උපකරණ ද නොමැතිව ක්‍රියා කිරීමට සිදුවීම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ වැඩ කටයුතු වලට විශාල බාධාවක් විය. තවද විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශය ඇතුළු අනෙකුත් අංශ වලින් තාවකාලිකව ඉල්ලා ගත් උපකරණ ඔවුන්ගේ අවශ්‍යතා අනුව කෙටි කලකදී නැවත ඔවුන්ට භාර දීමටද සිදු වූ බැවින් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය හට අත්‍යාවශ්‍ය වූ මූලික උපකරණ මිලදී ගන්නවා හැරෙන්නට වෙනත් පිළියමක් එයට යෙදිය නොහැකි විය.ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා මිලදී ගත් ඡායාපිටපත් යන්ත්‍රයද මධ්‍යස්ථානයේ දෛනික වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට මෙලෙස මිලදී ගත් අත්‍යවශ්‍ය අංගයකි.<br><br>ඉහත සඳහන් කරන ලද මුදලින් රු. 892,000.00 මුදලක් email server මිලදී ගැනීමට වැය විය. 2011 වර්ෂයේ හඳුනා ගත් පරිදි pdn.ac.lk email පද්ධතිය 50MB වැනි අඩු අවකාශයක් ඇති විටින් විට බිඳ වැටීම් වලට ලක් වෙන පද්ධතියක් විය. නව email server පද්ධතියක් මිලදී ගැනීමෙන් pdn.ac.lk email පද්ධතිය භාවිතා කරන්නන්ට වැඩි අවකාශයක් ලබා දීමටත්, අධ්‍යයන කාර්යමණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ email පද්ධතිය භාවිතා කිරීමට පෙළඹවීමටත්, ඒ අනුව pdn.ac.lk domain සඳහා ඉහල වාර ගණනක පිවිසීමක් අන්තර්ජාලය තුල ලබා ගැනීමටත් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සමත් විය.<br><br>එමෙන්ම මේ පිළිබඳව තිරණය ගන්නා ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිතුමා ප්‍රධානත්වයෙන් රැස් වන web උප කමිටුවේ පූර්ණ අනුදැනුම යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ |

| | |
|---|---|
| | වෙබෝමෙට්‍රික්ස් ස්ථානගතකිරීම ඉහල නැංවීමට ගත් එක් පියවරක් වශයෙනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල වෙබෝමෙට්‍රික්ස් ස්ථානගත කිරීම් වලට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය දෙවැනි ස්ථානය දිනා ඇත.<br><br>ඒ අනුව ඉහත දක්වා ඇති සියලු මිලදී ගැනීම් කාලෝචිතව සහ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයන් අනුව සිදු කරන ලදී.එම මිලදී ගැනීම් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ පමණක් නොව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේද විවිධ කාර්යන් සාර්ථකව ඉටු කර ගැනීමට ඉවහල් විය. |
| **4.2** | **මෙහෙයුම් අකාර්යක්ෂමතා** |
| **(අ)** | මහපොල අරමුදල් ගිණුමේ පවත්නා වර්ෂය තුළ ලබා නොගත් වාරික මහපොල අරමුදල් වෙත හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත. ලබා නොගත් ශිෂ්‍යාධාර මුදල් ද මෙම වසරේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත හරවා යැවීමට කටයුතු යොදා ඇත.<br><br>උපාධිධාරී ගුරුවරුන්ගෙන් අවකරණය කර එවන මුදල් 2014 වසරේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කර ඇත. |
| **(ආ)** | ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි අංශය මඟින් පවත්වා ගෙන යනු ලැබූ පරිවර්තන පාඨමාලාවට සුදුසුකම් ලත් අධ්‍යයන කාර්යය මණ්ඩලයක පැවති ඌනතාව නිසා තාවකාලිකව නතර කරන ලදි.<br><br>ශාස්ත්‍ර පීඨය මගින් පවත්වා ගෙන යනු ලැබූ මෙම ඉංග්‍රීසි පරිවර්තන ඩිප්ලෝමාව 2012 වර්ෂයේදී ද අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ලත් අධ්‍යයන කාර්යය මණ්ඩලයක සේවය ලබා ගැනීමට උත්සුක වුවද එකී වර්ෂය තුල මෙම ව්‍යාපෘතියෙහි අරමුණු අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට නොහැකි විය. අවශ්‍ය අධ්‍යයන කර්යය මණ්ඩලයක සේවය ලබා ගෙන මෙම පාඨමාලාව 2014 වර්ෂයේදී නැවත ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙසට එකී අංශයේ අංශාධිපතිට පීඨාධිපති විසින් උපදෙස් ලබා දී ඇත. |
| **(ඇ)** | 2011 දෙසැම්බර් මස 31 දිනට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ තොග සමීක්ෂණ වාර්තාව අනුව රු. 994,559.00ක තොග අතිරික්තතා, භාවිතයට නොගන්නා තොග, කල් ඉකුත් වූ තොග, සෙමෙන් චලනය වන තොග හා හානි වූ තොග වශයෙන් තොග ශේෂයක් නොමැති බව දන්වා සිටිමි. කෙසේ වෙතත් 2011 දෙසැම්බර් 31 දිනට තොග වාර්තා අනුව තොග අතිරික්තතා, භාවිතයට නොගන්නා තොග හා හානි වූ තොග වශයෙන් රු. 199,292.27 විය. ඉන් භාවිතයට නොගන්නා තොග අයිතම අටක් සඳහා වටිනාකම වන රු. 90,403.26 ක් 2012 මැයි 25 වන දින වන විට විනාශ කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. එසේම ඌන තොග ගබඩා භාරකරුගෙන් අය කර ගැනීමට ද, අතිරික්ත තොග ශේෂය තොගයට ඇතුළත් කිරීමටත් කටයුතු කර ඇත.<br><br>තවද, 2012.12.31 දිනට තොග සමීක්ෂණ වාර්තාව අනුව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අතිරික්ත තොග, භාවිතයට නොගන්නා තොග, කල් ඉකුත් වූ තොග හා සෙමෙන් චලනය වන තොග වල වටිනාකම රු. 108,929.45ක් වූ අතර, ඉන් රු. 101,877.60ක් වන භාවිතයට නොගන්නා තොග විනාශ කිරීම සඳහා අදාල තොග සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇති අතර, එම කමිටු නිර්දේශය මත මෙතෙක් හඳුනාගත් සියලුම අතිරික්ත තොග, භාවිතයට නොගන්නා තොග, කල් ඉකුත් වූ තොග, සෙමෙන් චලනය වන තොග ආදිය සඳහා ඉදිරි පියවර ගනු ලැබේ. |
| **4.3** | **මතභේදයට තුඩුදෙන ගණුදෙණු** |
| **(අ)** | පාරිතෝෂික පනතේ විධිවිධාන අනුව මෙවැනි පාඩුවක් අයකර කර ගැනීමට ප්‍රතිපාදන නොමැත. එලෙස අයකර ගත හැක්කේ එකී පාඩුව හේතුකොට ගෙන යම් අයෙක් සේවයෙන් පහ කළ අවස්ථාවකදී පමණි. නමුත් මෙම අයගේ සේවය අවසන් වී ඇත්තේ විශ්‍රාම ගැනීම හේතු කොට ගෙනය. ඒ අනුව යම් පාඩුවක් වී ඇත්නම් එය අයකර ගත හැක්කේ විමර්ශනයකින් හෙළිදරව් කර ගැනීමකින් පසුව අර්ථසාධක අරමුදලෙනි. |

| | |
|---|---|
| (ආ) | ව්‍යුහ ඉංජිනේරු නිර්මාණ දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානිවරයා වන මහාචාර්ය පී.බී.ආර්. දිසානායක මහතාට විගණන විමසුමේ සඳහන් පරිදි රු. 356,500.00 ක මුදලක් උපදේශන ගාස්තු වශයෙන් හෝ වෙනයම් ආකාරයකට හෝ ගෙවීමක් කර නොමැත. |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ වාර්ෂික අයවැය ලේඛණ සකස් කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් උපයන ආදායම් අඩු කොට මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු ශුද්ධ මුදල් ප්‍රමාණය පමණක් දන්වනු ලබයි. ඒ අනුව උපදේශන සේවා අදායම 10% ප්‍රමාණයක් භාණ්ඩාගාරය වෙත යැවීමක් සිදු නොකරයි. |
| (ඈ) | මෙම මුදල් අදාල පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේ ලැබී තිබුණත් එහි වියදම් ඉදිරි වර්ෂ වලදී දැරීමට බලාපොරොත්තු වන බැවින් යොදා නොගන්නා ලද අතිරික්ත මුදල්වලින් රු.මිලියන 08 ක මුදලක් විශ්වවිද්‍යාලයේ පාලකසභාවේ අනුමැතියට යටත්ව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලදි. |
| (ඉ) | W M S M කුමාරි මිය 2001-03-03 දින සිට පරිවාස කථිකාචාර්යවරියක ලෙස සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කර ඇති අතර ඒ අනුව ඇගේ අවුරුදු 08 ක පරිවාස සේවා කාලය 2009-03-02 දිනට අවසන් වීමට නියමිතව තිබුණි.<br><br>ඇය විසින් 2006-12-18 දිනට වලංගු වන පරිදි දර්ශනය පිළිබඳ වරලත් උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව 2009-02-10 වන දින අධ්‍යයන නිවාඩු අවසන් කර සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි සේවය සඳහා වාර්තා කර ඇත .<br><br>අවුරුදු 08 ක පරිවාස කාලය අවසන් වීමට පෙර එනම් 2009-02-12 දිනැති ඉල්ලුම්පත්‍රය මඟින් කථිකාචාර්යවරියක ලෙස සේවයේ ස්ථිර වීමට හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා උසස් වීම සඳහා ඇය විසින් ඉල්ලුම් කර ඇත .<br><br>W M S M කුමාරි මිය අදාළ තනතුරෙහි ස්ථිර වීමටත් පශ්චාත් උපාධි ලැබීමෙන් සහ අදාළ තනතුරෙහි ලබාගත් පළපුරුද්දත් අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා උසස් වීම ලබාගැනීමටත් සියලු සුදුසුකම් ලබා ඇත. ඒ අනුව 2009-07-25 දින පැවැත්වූ 378 වන විශ්වවිද්‍යාල පාලකසභාව මඟින් ඇය කථිකාචාර්යවරියක ලෙස තනතුරෙහි ස්ථිර කොට 2009-10-02 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා උසස් වීම ලබාදීමටත් කටයුතු කර ඇත.<br><br>ඇය විසින් අවුරුදු 08 ක පරිවාස කාලය අවසන් වීමට පෙර අනුමත පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා සේවයේ ස්ථිර වීමට හා අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ලබාගැනීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා උසස් වීමට ඉල්ලුම් කර ඇති බැවින් ඇගේ සේවය අවසන් කිරීමට අවශ්‍යතාවයක් පැනනොනගින අතර 2012-12-31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු 5, 249, 271.00 ක මුදලක් ගෙවීම නිවැරදි වේ. |
| (ඊ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 5 පරිච්ඡේදයේ 2.2.1 උප වගන්තියට අනුව උසස් අධ්‍යාපන ආයතනයක අචාර්යවරයකු ජාතික මෙහෙවරක් සඳහා ඔහුගේ සේවය දීර්ඝ කිරීමක් අවශ්‍ය වුවහොත් තවදුරටත් නියමිත කාලපරිච්ඡේදයක් සඳහා මුදා හැරිය හැක.<br><br>ඒ අනුව භෝග විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂිවිද්‍යා පීඨයේ සේවයේ නියුතු මහාචාර්ය බී.සී.එස්. පිරිස් මහතා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම මත හා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක IRQUE ව්‍යාපෘතියේ තත්ත්ව ආරක්ෂණ විශේෂඥ /නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ/ තත්ත්ව ආරක්ෂණ විශේෂඥ/අධ්‍යක්ෂ තත්ත්ව ආරක්ෂණ යන තනතුරු වල කටයුතු කිරීම සඳහා 2010.01.01 සිට 2012.06.30 දින දක්වා පහත අයුරින් නිදහස් කර ඇත. |

1. 2010.01.01 සිට 2010.06.30 (වැටුප් රහිත නිවාඩු)
2. 2010.07.01 සිට 2010.12.31 (වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු)
3. 2011.01.01 සිට 2012.06.30 (වැටුප් රහිත නිවාඩු)

ඉහත කරුණු අනුව 2010.01.01 සිට 2012.06.30 දක්වා මහාචාර්ය බී.සී.එස්. පිරිස් මහතා විසින් විධිමත්ව ලබා ගත් අනුමැතිය සහිතව එකී තනතුරුවල සේවය කර ඇත.

(උ) මෙය IAEE ආයතනයෙන් ලැබුණු ප්‍රදානයකි. මෙම ව්‍යාපෘතිය 2005 වර්ෂයේ ලැබී තිබේ. මෙම ව්‍යාපෘතිය මූල්‍ය කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2005.02.25 දින මූල්‍ය කමිටුවට ඉදිරිපත් කර ඇත. 2005 වර්ෂයේ ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර ප්‍රගති වාර්තා අදාළ ආයතනය වෙත යවා ඇත. විදේශ ගමන් වියදම් සඳහා ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් ගෙවා ඇත.

(එ) කැබිනට් මණ්ඩලයේ නියෝගය පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් (2013.05.23 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 08/2013) අනුව භාෂා ප්‍රවීණතා දීමනා ලැබීමට විශ්වවිද්‍යාල සේවකයින් හිමිකම් නොලබන බැවින් ඔවුන්ට භාෂා ප්‍රවීණතා දීමනා ගෙවීම 2013 මැයි මස සිට අත්හිටුවන ලදි.

එහෙත් මෙම භාෂා ප්‍රවීණතා දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විශ්වවිද්‍යාල සේවයට බලපැවැත්වෙන පරිදි ඒවා අදාළ කර ගනිමින් චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් බැවින් 1994 සිට 2012 දක්වා කාලසීමාවට ගෙවා ඇති දීමනා අයකර ගැනීම සම්බන්ධයෙන් හෝ එම ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

**4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) 2003 සිට 2012 වර්ෂය දක්වා නිෂ්ක්‍රියව පැවති අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මුදල් කමිටුවේ අනුමැතියට යටත්ව 2013 වර්ෂයේ වසා දැමීමට කටයුතු කර ඇත.

(ආ)
- පර්යේෂණ නැන්වීම් හා උපකරණ නඩත්තු අරමුදල 11-01-31-800

  මෙම ගිණුම නමින්ම තවත් ගිණුමක් පවතින අතර එම ගිණුම මේ වන විටත් සක්‍රීය මට්ටමින් පවතින බැවින් මෙම මුදලද එම ගිණුමට මාරු කොට එම ගිණුමෙන් මෙම මුදල් ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම ගිණුම් මේ වන විට නිවැරදි කර ඇත.

- දීර්ඝ කාලීනව අක්‍රියව පැවත එන ශේෂ පිළිබඳව මුදල් කමිටුවට වාර්තා කොට එකී තීරණය අනුව මෙම ගිණුම් මේ වන විට නිවැරදි කර ඇත.

| | Title of the Research / Project | Ledger Code | Amount (Rs.) |
|---|---|---|---|
| 1. | Establishment of a Perennial Fruit Trees/Orchard | 1342000002 | 50,677.95 |
| 2. | Institute for Construction Training Development Fund | 110113300 | 133,914.00 |
| 3. | SIDA - Payment of Taxes | 1334000002 | 1,006,307.00 |
| 4. | Un-operated Research Grants – NSF | 1341000002 | 3,749.81 |
| 5. | Audio Visual Unit Fund – Fine Arts | 1101070403 | (920.07) |

| | | | |
|---|---|---|---|
| 6. | Science & Technology Personal Development Project | 1101070003 | (1,658,067.27) |
| 7. | Recovery of value of books | 1101040010 | (2,377.20) |
| 8. | Training program fund account | 1101070009 | (5,998.00) |
| 9. | NSF Research grant – RG/98/AG/03 | 1311000001 | 49,759.55 |
| 10. | National Science Foundation | 1311000002 | 20.00 |
| 11. | SIDA–Research Capacity building in elect. & elect. engineering | 1334000001 | 1,392,463.55 |
| 12. | Miscellaneous account - Research | 1342000001 | 3,521,093.39 |
| 13. | Uni. Clinical Lab revolving fund account | 1101040008 | 720,961.61 |
| 14. | Sports activities fund account | 1101070001 | 20,260.00 |
| 15. | Inter University sports festival account | 1101070002 | 5,400.00 |
| 16. | Halls of residence fund | 1101070005 | 9,245.22 |
| 17. | Student welfare fund account | 11011300 | 1,586,691.07 |

❖ දීර්ඝ කාලීනව අක්‍රියව පැවති මෙම පර්යේෂණ ගිණුම අක්‍රියව පැවතීමට හේතු සොයා බලා මේ වන විට නිවැරදි කර ඇත.

- 13-01-07-09-04 - රු.200,000.00

  පර්යේෂකයා රෝගාතුර වී ඇති නිසා එම මුදල් භාවිතා කිරීමට නොහැකි වී ඇති අතර එකී රු. 200,000.00 විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ගිණුමට මාරුකර නිවැරදි කර ඇත.

- 13-01-07-09-05 - රු. 94,500.00

  පර්යේෂකයා විසින් පරීක්ෂණය කිරීම නතර කර ඇති අතර මෙයද විශ්වවිද්‍යාලයේ පොදු ගිණුමට මාරුකර නිවැරදි කර ඇත.

- Research Centre Fund Account – Rs. 600,000.00

  මෙම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2006 වසරේ ලැබී ඇති අතර මෙයට හිමිකම් ඇති ආචාර්යවරුන් දෙදෙනා විසින් මෙම මුදල් ලබා ගෙන නොමැත. එකී ගිවිසුමට අනුකූලව එකී මුදල් නැවත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත යවන ලදී. මෙම ගිණුම් මේ වන විට නිවැරදි කර ඇත.

**(ඇ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 737 ප්‍රකාරව ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් අය කරනු ලබන මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර එයින් ලැබෙන පොලී නැවත කාර්යමණ්ඩල සංවර්ධන අවශ්‍යතා සඳහා චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන්ට යටත්ව වියදම් කරනු ලබයි. ඒ අනුව ගිවිසුම් කඩකරන ආචාර්යවරුන්ගෙන් ලැබෙන මුදල් 1101030002 දරණ ගිණුමට බැර කරනු ලබන අතර එම මුදල් නැවත ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබයි. එම ආයෝජනවලින් ලැබෙන පොලී ආදායම් පීඨ අනුව ඒ සඳහා වෙන්කර ඇති ගිණුම් වලට බැර කර එම මුදල් චක්‍රලේඛයේ සඳහන් කාර්යයන් සඳහා යෙදවාගනු ලබයි. 2012 වර්ෂය තුළදී ඇප බැඳුම්කර ආදායම් තැන්පතු වලින් රු. 17,040,345.25 මුදලක් ලැබුනු අතර එයින් රු.738,933.34 වියදම් කර ඇති අතර ඉතිරිය ඉදිරි අවශ්‍යතා සඳහා ගිණුම්වල රඳවා තබා ඇත.

| | |
|---|---|
| (ඈ) | විගණන නිරීක්ෂණයේ සඳහන් දත්තයන් NARP අයවැයට අනුව නිවැරදි වේ.<br>(2012.08.23 මුදල් ලැබී තිබු නමුත් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ  අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියා මාර්ග නිසා ව්‍යාපෘති වල වැඩකටයුතු නිසි ලෙස කිරීමට නොහැකි වූ බව දන්වා සිටින අතර එම මුදල් පාවිච්චි නොකළ නිසා එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු හෙයින් ආපසු එම මුදල් යවා ඇත. ඉහත පරීක්ෂණ ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් අතර වර්ෂය අවසාන වීමට පෙර පරිහරණය නොකරන ලද මුදල් ආපසු යවා ඇත.) |
| (ඉ) | රසායනික ද්‍රව්‍ය ඇණවුම් කරන අවස්ථාව වන විට ඖෂධවේදී දෙපාර්තමේන්තුව සතු විද්‍යාගාරයේ පැවති පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා ශිෂ්‍යයන්ගේ පරීක්ෂණ කටයුතු සහ ඉගැන්වීම් විද්‍යා පීඨයේ සහාය මත එම පීඨයේ විද්‍යාගාර තුල සිදු කරන ලදී. මෙම කටයුතු ඖෂධවේදී දෙපාර්තමේන්තුවට අයත් විද්‍යාගාරයක් තුල ඉටුකිරීම සඳහා  හැකි වූයේ 2013 වසරේ සිටය. එම නිසා රසායනික ද්‍රව්‍ය භාවිතය ප්‍රමාද වී තිබු  නමුත් දැනට එම රසායනික ද්‍රව්‍ය භාවිතය සඳහා යොදා ගනු ලබයි.<br>විමසුමේ සඳහන් ආකාරයට රසායනික ද්‍රව්‍ය ඇණවුම් කරනු ලැබූ අචාර්යවරුන් විදේශගතව සිටියත්  මේ වන විට නව ආචාර්යවරුන් බඳවාගෙන අදාල ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සිදු කරන නිසා ඉහත සඳහන් රසායනික ද්‍රව්‍ය බොහොමයක්  භාවිතා කරනු ලබයි.<br>එසේම රසායනික ද්‍රව්‍ය කිහිපයක් සුළු ප්‍රමාණවලින් ප්‍රායෝගික ඉගැන්වීම් සඳහා භාවිතා කරන බැවින් සෙමින් නිකුත් වුවද නිෂ්පාදන ඇසුරුම් ප්‍රමාණවලින් මිලදී ගත යුතුව ඇති නිසා ඉතිරිවන ප්‍රමාණය වැඩිය.<br>තවද මිලදී ගැනීම් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුව ඇණවුම් සඳහා කාලය ගත වන අතර පර්යේෂණ කටයුතු කිරීමේදී අවශ්‍ය ප්‍රතිඵල ලබා ගැනීමට භාවිතා කළයුතු රසායනික ද්‍රව්‍ය අවශ්‍යතාවය මත රඳවා තබා ගන්නා නිසා  බොහෝ රසායනික ද්‍රව්‍ය විද්‍යාගාරය සතුව ඇත.<br>දෙපාර්තමේන්තු විද්‍යාගාරය තුළ සියලුම සිසුන්ට තනි තනිව පරීක්ෂණ කිරීමට පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා කණ්ඩායම් වශයෙන් ප්‍රායෝගික ඉගැන්වීමේ කටයුතු කරනු ලබයි. එබැවින් රසායනික ද්‍රව්‍ය භාවිතය අඩු මට්ටමක පැවතියත් ඉදිරියේදී මෙම තත්වය දියුණු කිරීමත් සමඟ රසායනික ද්‍රව්‍ය භාවිතය ඉහළ යනු ඇත. |
| (ඊ) | Auto Clave උපකරණය රසායනාගාර දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන බොහෝ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා උපයෝගී කර ගත හැකි උපකරණයක්ය. එබැවින් එහි පවතින දැඩි අවශ්‍යතාව මත මෙය මිලදී ගනු ලැබූයේ එවකට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවති නව ගොඩනැගිල්ලේ  හෝ 2011/12 ශිෂ්‍ය කණ්ඩායමට වැඩිපුර සිසුන් බඳවා ගැනීම උදෙසා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් ඉදිකළ අර්ධ තාවකාලික විද්‍යාගාර 2න් එකක හෝ මෙම උපකරණය ස්ථාපිත කිරීමේ අරමුණෙනි. නමුත් එම තත්වය වෙනස් වූයේ මෙම ඉදිකිරීම් කටයුතු මන්දගාමී අයුරින් සිදු වූ නිසාය. පවතින ගොඩනැගිලි වල මෙම උපකරණය සවි කිරීම සඳහා එම ගොඩනැගිලි නවීකරණය කළ යුතු වූ අතර ඒ සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම ද මේ සඳහා බලපෑ තවත් සාධකයකි.<br>මෙම Auto Clave 150 L නැමති උපකරණය 2014 නොවැම්බර් මස අගභාගයේ දී සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අළුතින් ඉදිකරන ලද, එය ක්‍රියා කිරීමට අවශ්‍ය පහසුකම් පවතින නව අර්ධ කාලීන විද්‍යාගාරයෙහි තැන්පත් කර ක්‍රියාත්මක කරනු ලබයි.<br>ශීතකරණයේ දොරෙහි වූ සුළු ඇදවීම් සැපයුම්කරුට දන්වන ලද අතර ඒ සඳහා ඔවුන් පරීක්ෂාවට ලක්කර වසරක් වෙනුවට වසර 2ක වගකීම් සහතිකයක් නොමිලේ ලබා දෙන බව 2013/05/27 වන දින ලිඛිතව දැනුම් දුන් අතර පසුව එම වසර 2ක වගකීම් සහතිකය ලබා ගැනීමෙන් පසුව ගෙවීම් සිදු කර භාවිතය ආරම්භ කරන ලදී. |
| (උ) | මෙහි සඳහන් සෙමින් චලනය වන පොත්පත් මුද්‍රණය නවතා ඇති අතර මෙවැනි අඩුපාඩු/දුර්වලතා ඉදිරියේදි ඇති නොවන පරිදි කෙටි කලකදී අලෙවි කර නිමකළ හැකි වැඩි ඉල්ලුමක් පවතින පොත්පත් පමණක් අළුතින් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.<br><br>තවද සෙමින් චලනය වන පොත් තොගය අලෙවිය හා ප්‍රදර්ශණය සඳහා (විද්‍යා අධ්‍යාපන සම්පත් |

| | |
|---|---|
| | මධ්‍යස්ථානයෙහි පාසැල් සඳහා ප්‍රායෝගික වැඩ සටහන් පවත්වන දිනවලදී) සිදුකිරීමට කටයුතු කර ඇත.<br><br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් පාසල්වල පුස්තකාලවලට මෙම පොත් අලෙවි කිරීම සහ මෙම පොත් පිළිබඳව පාසල් පුස්තකාල දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. |
| (ඌ) | දන්ත වෛද්‍ය පීඨයෙන් රෝගීන් සඳහා ලබාදෙනු ලබන දන්ත සේවා සඳහා අවශ්‍ය වන වියදම් දැරීමට විශ්වවිද්‍යාලයෙන් ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා මෙම සපයන සේවා වලට සාපේක්ෂව මුදල් අයකිරීම විධිමත් අනුමැතියක් යටතේ සිදුකරන අතර විගණන විමසුමෙහි සඳහන් පරිදි ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තු 04 කින් දන්ත සේවා සැපයීමට අදාලව මුදල් අයකරනු ලබයි. මෙම අයකර ගන්නා මුදල් රෝගීන් සඳහා අවශ්‍ය උපකරණ හා බෙහෙත් ද්‍රව්‍ය මිළදී ගැනීමට ද දන්ත රෝහලට සේවය සපයන අනියම් සේවකයින්ගේ වැටුප් ගෙවීම සඳහා ද ප්‍රයෝජනයට ගනු ලබන අතර නිශ්චිත කාර්යක් සඳහා යොදා ගැනීමෙන් තොරව රඳවා තබා නොගනී. තවද ප්‍රධාන වශයෙන් මුදල් අයකරනු ලබන්නේ Orthodontics,Prosthetics, Restrative දෙපාර්තමේන්තුවලින් සහ Patient Record සඳහා වන අතර මෙම ලෙජර් ගිණුම් යටතේ 2012.12.31 දිනට තිබූ ශේෂයන්හි එකතුව රු. 2,259,121.55 වේ. |
| (එ) | මෙම ගිණුම ශාස්ත්‍ර පීඨයේ මානව හිමිකම් කේන්ද්‍රයට කැනේඩියානු ආධාර ව්‍යාපෘතියක් යටතේ 2007 දී ලැබුණු ප්‍රතිපාදන තැන්පත් කිරීම සඳහා ඇති කළ ඉතිරිකිරීමේ ගිණුමකි. එම ප්‍රතිපාදන වැය කිරීමෙන් පසුව කේන්ද්‍රය ලබා ගත් ආදායම් වල ඉතිරියක් බවට මූලික තැන්පතුව පත්විය. එම නිසා රුපියල් මිලියන 2.5ක් ස්ථිර තැන්පතුවක තැන්පත් කරන ලදී. එම තැන්පතුවට ලැබුණු පොලිය මෙම ගිණුමට බැරවීමෙන් වර්තමාන ඉතිරිය ගොඩනැගී ඇත. එබැවින් එය ඵලදායී ආයෝජනයකි. මානව හිමිකම් කේන්ද්‍රයට අවශ්‍ය පොත් ලබා ගැනීමට සහ සම්පත් දායකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට එකී ගිණුමේ මුදල් 2014 වර්ෂයේදී යොදාගැනීමට සැලසුම් කර ඇති බැවින් මෙම මුදල් ඵලදායකව යොදා ගැනීමට පියවර ගෙන ඇති බව සඳහන් කල යුතුය. |
| (ඒ) | මෙම යන්ත්‍රය මේ වන විට භාවිතයට ගනිමින් පවතී. |
| (ඔ) | 2012 දෙසැම්බර් මස වන විට ඉතිරිව තිබූ තොගයෙන් කොටසක් මේ වන විටත් දන්ත වෛද්‍ය සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු සඳහා සහ රසායනාගාර කටයුතු සඳහා නිකුත් කර ඇත. කල් ඉකුත් වුවද සියලුම පුහුණු කටයුතු සඳහා එම අයිතම යොදා ගන්නා බැවින් ආයතනයට අලාභයක් සිදුවී නොමැත. |
| **4.5** | **ආර්ථිකමය නොවූ ගනුදෙනු** |
| (අ) | විශ්වවිද්‍යාල ජල පොම්පාගාරය සඳහා ලබා දී ඇති විදුලි සැපයුම වසර 50 කට වඩා පැරණි බැවින් එහි සිදුවන විදුලි බිඳවැටීම් ගණනද අධික වේ. මෙම විදුලි බිඳවැටීම්වලදී එය නැවත සකස් කරන තෙක් විශ්වවිද්‍යාලයට ජල සැපයීම අඩාල වේ.<br><br>එබැවින් විශ්වවිද්‍යාල විදුලි පද්ධතිය යාවත්කාලීන කිරීමේ එක් පියවරක් ලෙස හා විශ්වවිද්‍යාලය වෙත අඛණ්ඩ ජල සැපයුමක් ලබා ගැනීමේ අරමුණ ඇතිව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ හොප්ගාඩ් සමාගම සතුව තිබූ ට්‍රාන්ස්ෆෝමරය ජල පොම්පාගාරයේ ස්ථාපිත කොට ඇත. |
| (ආ) | සම සෞඛ්‍ය පීඨයේ සිසුන්ට පේරාදෙණිය ශික්ෂණ රෝහලෙන් සායනික පුහුණුව ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලයීය කළමණාකාරිත්වය විසින් කිහිපවතාවක්ම උත්සාහ කර එය අසාර්ථක වී ඇති අතර අවසානයේ උසාවිය විසින් ලබාදුන් නඩු තීන්දුවක් මත සිසුන්ට කුරුණෑගල මහ රෝහලෙන් සායනික පුහුණුව ලබා දීමට සිදුවිය.<br>මෙසේ සිසුන් කුරුණෑගල මහ රෝහල වෙත රැගෙන යාම සඳහා සමහර අවස්ථාලදී ප්‍රවාහන පහසුකම් |

බාහිර ආයතනවලින් ලබාගැනීමට සිදු වු නිසා මෙම වියදම් දැරීමට සිදු වී ඇති අතර අනෙකුත් ගමන් වියදම් ද ඒ සඳහා සහභාගි වන දේශකවරුන්, රියදුරන් සහ සහයකයින් වෙත ගෙවීම නිසා මෙම වියදම් සිදු වී ඇත . එසේම පේරාදෙණිය, මහනුවර හෝ කෑගල්ල ශික්ෂණ රෝහල් මඟින් සායනික පුහුණුව ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය හා පීඨයේ කළමණාකාරීත්වය අදාළ පාර්ශව සමඟ තවදුරටත් සාකච්ඡා කරමින් සිටි.

**(ඇ)** ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ස්ථානගත කර ඇති සේවා ස්ථාන දිවා සේවා ස්ථාන, රාත්‍රී සේවා ස්ථාන සහ දිවා/රාත්‍රී සේවා ස්ථාන වශයෙන් වර්ග තුනකට අයත් වේ. මෙම සේවා ස්ථානවලින් බහුතරයක් දිවා/රාත්‍රී එනම් පැය 24 ම ක්‍රියාත්මක සේවා ස්ථාන වන අතර, මේවා ආරක්ෂක නියාමකයන් නොමැතිව හිස්ව තැබිය හැකි සේවා ස්ථාන නොවේ. එනිසා දිනට නියමිත සේවක පිරිස අනිවාර්යයෙන්ම සේවයට වාර්තා කළ යුතුය

මෙම සේවාවන් දෛනිකව පවත්වා ගෙන යාම සඳහා සේවා මුර ක්‍රමයක් සකස් කර ඇති අතර, ඒ අනුව අදාළ සේවකයා අනිවාර්යයෙන්ම තම නියමිත සේවා මුර සඳහා රාජකාරියට වාර්තා කරන අතර, නියමිත සේවා මුරයනට අමතර සේවයේ යෙදවීම වෙනුවෙන් අතිකාල අනුමත කරනු ලැබේ.

පහත සටහන් බලන්න.

**2012 දෙසැම්බර් මාසය තුළ සේවා වාර්තාව**

| | | |
|---|---|---|
| එස්.බී. හේරත්<br>ආරක්ෂක නියාමක | සේවය කළ දින ගණනː දින **25**<br>පැයවලින් 25 x 8 පැය **200**<br>ලබාගෙන ඇති අතිකාල පැය **128** | අදාළ මාසය තුළ වැඩකර ඇති<br>මුළු පැය ගණනː 200 x 128 = **328** |
| එච්.එම්.එන්.ටී.<br>බණ්ඩාර<br>ආරක්ෂක නියාමක | සේවය කළ දින ගණනː දින **22**<br>පැයවැලින් 22 x 8 පැය **176**<br>ලබාගෙන ඇති අතිකාල පැය **129** | අදාළ මාසය තුළ වැඩකර ඇති<br>මුළු පැය ගණනː 176 x 129 = **305** |
| යූ.බී. වීරසේකර | සේවය කළ දින ගණනː දින **23**<br>පැයවලින් 23 x 8 පැය **184**<br>ලබාගෙන ඇති අතිකාල පැය **119** | අදාළ මාසය තුළ වැඩකර ඇති<br>මුළු පැය ගණනː 184 x 119 = **303** |

අදාල ආරක්ෂක නියාමකයන් තමන්ට නියමිත රාජකාරි කාලවේලාවන් නියමිත පරිදි සම්පූර්ණ කර ඇති බව අවධාරණය කරමි.

**(ඈ)** සම සෞඛ්‍ය විද්‍යා පීඨයට 400KVA ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරිම සඳහා 2011.12.12 වන දින රු. 4,143,413/- ක ඇස්තමේන්තුවක් විදුලිබල මණ්ඩලයෙන් ලබා ගත් අතර, මෙය 270 හා 272 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටු විසින් සලකා බලා අනුමැතිය ලබාදී ඇති අතර, අදාළ පිරිවැය ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මඟින් දැරීමේ හැකියාව පිළිබඳ විමසා බැලීම සඳහා විදුලිබල මණ්ඩලයට ලිඛිතව ඉල්ලීමක් කරන ලෙස වැඩබලන ලේඛකාධිකාරීට උපදෙස් දී ඇත.

ඒ අනුව වැඩබලන ලේඛකාධිකාරී විසින් 2012.05.08 දාතම ලිපියක් වාණිජ ඉංජිනේරු/මධ්‍යම පළාත වෙත යොමු කරමින් ගාස්තු අය කර ගැනීමකින් තොරව අදාළ විදුලි සැපයුම ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

විදුලිබල මණ්ඩලයේ නීතිරීතිවලට අනුව ලබා දුන් ඇස්තමේන්තුව ගෙවිය යුතු බවත්, ගෙවීමකින් තොරව විදුලිය සැපයිය නොහැකි බවත්, 2012 වර්ෂයේ මිල සංශෝධනය අනුව නව ඇස්තමේන්තුව සඳහා රු.6,008,676.00 ක මුදලක් ගෙවිය යුතු බවත්, එම ලිපියට පිළිතුරු ලෙස වාණිජ ඉංජිනේරු / මධ්‍යම පළාත විසින් 2012.11.06 දාතම ලිපියෙන් දන්වා එවා ඇත. අදාළ ලිපියේ සඳහන් පරිදි රු. 4,143,413.00 ක ඇස්තමේන්තුව 2011 වර්ෂයේ මිල ගණන් අනුව සකස් කොට ඇති අතර, 2012 වර්ෂයේ මිල සංශෝධනය අනුව රු. 6,008,676.00 ක ඇස්තමේන්තුව සකස් කොට ඇත.

නව ඇස්තමේන්තුව සඳහා 274 වෙනි ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවේ අනුමැතිය ලැබුණු පසුව විදුලිබල මණ්ඩලයට මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ විදුලි අවශ්‍යතාවට අමතරව නව ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු හා CT ස්කෑන් යන්ත්‍රය ස්ථාපිත කිරීමෙන් පසු වැඩිවන විදුලි අවශ්‍යතාවයද මෙම ට්‍රාන්ස්ෆෝමරය සවි කිරීමේදී සලකා බලා ඇත.

2013.12.29 දිනවනවිට අදාළ ට්‍රාන්ස්ෆෝමරය සවි කිරීමේ කටයුතු සිදුකර අවසන් කොට ඇත.

**4.6 හඳුනාගන්නා ලද පාඩු**

**(අ)** භාණ්ඩ ඇණවුම් කරනු ලබන්නේ මූලික කරුණු 2 ක් පදනම් කරගෙනය.

1. සායනික කටයුතු සඳහා
2. දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්ගේ සහ දන්ත කාර්මික නිලධාරීන්ගේ පුහුණු කටයුතු සඳහා

එහිදී කල් ඉකුත් වූ භාණ්ඩයක් කිසිම අවස්ථාවක සායනික රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා යොදා ගත නොහැකි වුවද පුහුණු කටයුතු සඳහා ඒවා යොදා ගැනීමට බාධාවක් නොමැත. එහෙයින් ඒ සියලුම කල් ඉකුත් වූ භාණ්ඩ මේ වන විටත් පුහුණු කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. එම කල් ඉකුත් වූ භාණ්ඩ ඉවත් නොකොට ප්‍රයෝජනයට ගන්නා හෙයින් මෙහි දක්වා ඇති පරිදි ආයතනයට අලාභයක් සිදු වී නොමැත.

**(ආ)** මෙම භාණ්ඩ 06 තොග පොතට ලැබීම් ලෙස ඇතුලත් කර ඇති නමුත් නිකුත් කලේ කාටද යන්න සඳහන් කර නැත.

| | මිලදී ගත් වර්ෂය | භාණ්ඩය | ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| ① | 2008 | පිළිතුරු ලියන පොත් | 30,000 | 94,949.00 |
| ② | 2008 | පිළිතුරු ලියන ඇමුණුම් පොත් | 60,000 | 1 88,700.00 |
| ③ | 2008 | පිළිතුරු ලිවීමේ තනි කොළ | 15,000 | 11,280.00 |
| ④ | 2008 | සිමෙන්ති | 04(මලු) | 3,190.00 |
| ⑤ | 2008 | ගඩොල් | 200 | 1,350.00 |
| ⑥ | 2011 | Emergency rechargeable tube lights (Double) | 50 | 74,250.00 |

**(ඇ)** මෙහි සඳහන් රු.975,965.00 ක සේවා නියුක්ති භාර අරමුදලට අධිභාර ගෙවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් ලෙස කටයුතු කර ඇත.

**(1) <u>EN 01245071 රු. 359,395.10 ( අධිභාර )</u>**

සේවා නියුක්ති භාරකාර අරමුදල මගින් මෙම අධිභාරය ඉවත්කර ඇත.

**(2) <u>EN 0517412 රු. 31,457.59 + රු. 155.58 + රු. 62.36 = රු. 31,675.53</u>**

ඉහත සඳහන් අධිභාරයන් සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය මගින් ඉවත් කර ඇත.

මේ අනුව පහත සඳහන් ලෙස ගෙවා ඇති අධිභාර වල සාරාංශය ඉදිරිපත් කල හැක.

| | |
|---|---|
| අධිභාරය | රු 590,536.00 |
| **<u>අඩුකළා</u>** | |
| ඉහත අංක 1 අනුව ඉවත්කිරීමට එකඟ වූ රු 359,395.10 | |
| ඉහත අංක 2 අනුව ඉවත්කිරීමට එකඟ වූ රු 31,675.53 | |
| | <u>රු 391,070.63</u> |
| අධිභාර ලෙස සඳහන් ඉතිරි මුදල | <u>රු 199,465.37</u> |

| | |
|---|---|
| | **(3) EN 022173 රු 133,028.95**<br>මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කර ඇති අතර පාලක සභාව මඟින් අනුමත කර ඇති තීරණය මත අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. රු 133,028.95<br><br>**(4) රු 252,400.00**<br>මේ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වාගෙන යනු ලබන අතර එය මෙතෙක් අවසන් වී නැති අතර විමර්ශනයෙන් පසු ලැබෙන වාර්තාව මත කටයුතු කරනු ඇත. රු 252,400.00<br>රු 975,964.95 |
| (ඈ) | අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අදාළ අධිභාරය සඳහා මුදල් අයකර ගැනිමට අදාල විමර්ශනයේ අවසන් වාර්තාව තවමත් ලැබී නොමැති බැවින් ඊට වගකිව යුතු නිළධාරීන් හඳුනාගැනිමට නොහැකි වී ඇත. |
| 4.7 | **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** |
| (අ) | **2001**<br>432,424,426,471 සහ 398 යන ව්‍යාපෘති සඳහා ඒ වන විට නිමකළ වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාළ ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත.<br><br>**2002**<br>398, 463, 471 සහ 487 යන ව්‍යාපෘති සඳහා ඒ වන විට වූ කල වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාළ ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත.<br><br>**2003**<br>487, 528, 556,463, 529, 569 සහ 540 යන ව්‍යාපෘති සඳහා ඒ වන විට වූ කල වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාළ ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත. 463 සහ 542 ව්‍යාපෘති අවසන් කර ඇත.<br><br>**2004**<br>556, 540 සහ 560 යන ව්‍යාපෘති සඳහා ඒ වන විට වූ කල වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාල ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ |

| | |
|---|---|
| | සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත. 542 ව්‍යාපෘතිය අවසන් කර ඇත.<br><br>**<u>2005</u>**<br>540 සහ 560 යන ව්‍යාපෘති සඳහා ඒ වනවිට වූ කල වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාළ ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත. 656 ව්‍යාපෘතිය අවසන් කර ඇත.<br><br>**<u>2006</u>**<br>560 යන ව්‍යාපෘති සඳහා ඒ වන විට වූ කල වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාල ව්‍යාපෘති පිළිබඳව කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව වැඩ ඉංජිනේරුතැනගෙන් තහවුරු කර ගැනිම මත 2010/07/13 දින පැවති 254 වන හා 2011/06/14 වන දින පැවති 263 වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවල අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවන ලද මුදල අවසාන බිල්පත ලෙස සලකා රඳවා ගැනීමේ මුදල් කිසිවක් මුදා නොහැරීමේ තීරණය මත ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට ඇත. 542 ව්‍යාපෘතිය අවසන් කර ඇත.<br><br>**<u>2007</u>**<br>706 ව්‍යාපෘතිය අත්හිටුවා ඇති අතර අදාල කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට පියවර ගෙන ඇත.<br><br>**<u>2008</u>**<br>777 ව්‍යාපෘතිය උපදේශන සේවා සැපයීම වෙනුවෙන් ගෙවීමකි.<br><br>**<u>2010</u>**<br>717 නමින් ව්‍යාපෘතියක් ආරම්භ කර නොමැති අතර කිසිදු ගෙවීමක් මූලධන අංශය මගින් ගෙවා නොමැත. 814 ව්‍යාපෘතිය අත්හිටුවා ඇති අතර අදාළ කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර ඇත.<br><br>**<u>2011</u>**<br>895 මේ වන විට අදාල ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත.<br><br>**<u>2012</u>**<br>933 - අදාල ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර අවසන් බිල්පත ගෙවා අවසන් කර ඇත<br>934 - මෙම කොන්ත්‍රාත් කාර්යය මේ වන විට අවසන් කර ඇති අතර අවසන් බිල්පත ගෙවා නොමැත<br>904 - මෙම කොන්ත්‍රාත් කාර්යය අවසන් කර ඇති අතර අවසාන බිල්පත ගෙවා අවසන් කර ඇත. |
| **(ආ)** | මෙම කාර්යය 2008/09/03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රුපියල් මිලියන 328 ක මුලු පිරිවැය ඇස්තමේන්තුවකට 2009 වසරේ සිට ක්‍රියාත්මක කිරීම පිණිස අනුමත කර ඇත. ඒ අනුව කොන්ත්‍රාත් කාර්යය ආරම්භ කල යුතු වන්නේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මිල ප්‍රමාණ පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ අගැයීම් කමිටුවේ අනුමත වීමෙන් අනතුරුව බවත් මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඉදිකල යුතු ව්‍යාපෘතියක් බවත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. ඒ අනුව සමෝච්ච රේඛා සිතියම් සැකසීමෙන් තොරව ව්‍යාපෘතිය සැලසුම් කටයුතු හා මිල ප්‍රමාණ පත්‍රිකා සැකසීම කල නොහැකි බැවින් උපදේශක ආයතනය ලෙස මෙම කාර්යයට අදාල සමෝච්ච රේඛා සිතියම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සාදා ඉදිරිපත් කර ඇත. එම සමෝච්ච රේඛා සිතියම් මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/පාලන යටතේ සුරක්ෂිතව ඇත. එම සමෝච්ච රේඛා සිතියම් ඇඳීම සිදුකල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් රුපියල් 1,725,000.00 ක මුදලක් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය |

| | |
|---|---|
| | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති හෙයින් සහ උපකුලපති විසින් මේ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග කරන ලද සාකච්ඡාවේ තීරණයන්ට අනුව මෙම සමෝච්ච රේඛා සිතියම් නිසි ලෙස පිළියෙල කිරීම වෙනුවෙන් එකී ආයතනයට රුපියල් 1,500,000.00 මුදලක් ගෙවීමට අනුමත කර ඇතත් වැය ඇස්තමේන්තුව පියවා ගැනීම පිණිස ප්‍රමාණවත් මුදලක් එනම් රුපියල් 500,000/- ක මුදලක් පමණක් ගෙවීමට කටයුතු කර ඇත. තවද අමාත්‍ය මණ්ඩලයේ අනුමත වූ මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලසුමටද ඇතුලත් කර ඇති අතර දැනට ක්‍රියාත්මක කිරීමට යෝජිත සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම් කටයුතු සඳහා මෙම සමෝච්ච රේඛා සිතියම බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (111) ප්‍රකාරව සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකරගත යුතු වන්නේ ගිවිසුම්ගත මුදලෙන් සියයට 90 ක් ගෙවීමේදීය. ඒ අනුව මේ තුලින් කිසිදු අඩුපාඩුවක් සිදු වී නොමැත. තවද සෑම කොන්ත්‍රාත් කාර්යයක් සඳහාම ලබා දුන් සියලු අත්තිකාරම් මුදල් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අයකරගෙන ඇත. |
| 4.8 | **කාර්ය මණ්ඩල පරිපාලනය** |
| (අ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ මහඉලුප්පල්ලම, දොඩම්ගොල්ල, මාවලවත්ත, මීවතුර ගොවිපළවල් ඇතුළු විශ්වවිද්‍යාලයේ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගමේද සහාය මත සේවය සපයනු ලබන සේවා ස්ථාන සඳහා සේවය නියමාකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය වන ආරක්ෂක නියාමකයන් සංඛ්‍යාව පහත පරිදිය.<br><br>ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන 28<br>රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සේවා ස්ථාන 56<br>84<br><br>මෙම සේවා ස්ථාන 84 පැය 24 සේවා ආවරණය පිණිස 08 x 3 ආකාරයට අවශ්‍ය වන ආරක්ෂක නියාමකයන් සංඛ්‍යාව<br>84 x 3 සංඛ්‍යාව 252<br>5% නිවාඩු 12<br>264<br><br>දැනට සේවයේ යොදවා ඇති සමස්ත සේවක සංඛ්‍යාව 186 කි. ඒ අනුව මේ වනවිටත් දෛනික ආරක්ෂක සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා වන සේවක හිඟය පහත පරිදිය.<br><br>අවශ්‍ය සේවක සංඛ්‍යාව 264<br>යොදවන ආරක්ෂක නියාමක සංඛ්‍යාව 186<br>78<br><br>ඒ අනුව නියමිත ප්‍රමිතියෙන් යුතු ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැනට යොදවා ඇති සමස්ත සේවක පිරිසට අමතරව තවත් ආරක්ෂක නියාමකයන් 78 දෙනකුගේ හිඟයක් ඇති බව සැළකිය යුතුය.<br><br>ආරක්ෂක දෙපාර්තමේන්තුව අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනයක් බැවින් සේවක හිඟය හෝ වෙනයම් හේතුවක් මත සේවා ස්ථාන හිස්ව තැබිය නොහැකිය. මෙම ලිපියේ පෙර සඳහන් කර ඇති පරිදි ආරක්ෂක දෙපාර්තමේන්තුවට මේ වනවිට ආරක්ෂක නියාමකයන් 78 දෙනකුගේ හිඟයක් ඇත. මෙම හිඟය මාසිකව වැඩකළ යුතු පැය ගණනින් නම්, 78 x 192 = පැය 14,976 කි. මෙම පැය ගණන ආවරණය කිරීම පිණිස සීමාව ඉක්මවා අතිකාල අනුමත කිරීමට සිදුවේ. විශ්වවිද්‍යාලයේ දෛනික සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත්, මානව හා භෞතික සම්පත්වල ආරක්ෂාව සහතික කිරීම සඳහාත් මෙය අත්‍යාවශ්‍ය තත්ත්වයකි. |

| | |
|---|---|
| | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවාව නියමිත ප්‍රමිතියෙන් යුතුව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවක පිරිස වන සේවකයන් සම්පූර්ණ වූ විට අතිකාල ගෙවීමකින් තොරව සේවාව පවත්වා ගෙන යා හැකිය. |
| (ආ) | 2012.12.31 දිනට මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්මණ්ඩල තනතුරු වල පුරප්පාඩු 245 ක් පැවති අතර එම පුරප්පාඩු ඇති වූ වහාම පිරවීම එම පුරප්පාඩු පිරවීමේ දි අනුගමනය කල යුතු සංකිර්ණ හා දීර්ඝ ක්‍රියාපටිපාටිය නිසා කල නොහැක විය.<br><br>ඊට අමතරව 2007 ට පෙර මෙම විශ්වවිද්‍යාලයේ ඇති වූ පුරප්පාඩු 318ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවකට අනුමැතිය ලබා දී නොමැති වීමද සැලකිල්ලට ගත් විට  පිරවිය නොහැකි නිසා කපා හැර ඇති පුරප්පාඩු වල මෙන්ම සේවකයින් විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම වැනි හේතු නිසා ඇති වී තිබෙන එහෙත් ඉහත දක්වා ඇති හේතු නිසා පිරවීම ප්‍රමාද වී ඇති පුරප්පාඩු වල කාර්යභාරය ඉටු කර ගැනීමට වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති වු බැවින් එම පුරප්පාඩු පුරවන තෙක් දැනට සිටින සේවකයින් ලවාම එම කාර්යභාරයන් ඉටු කර ගැනීමට සිදු වී තිබීමද හේතු කොට ගෙන ඒ සඳහා දැනට සේවය කරන සේවකයින් අතිකාල සේවයේ යොදවමින් එම කාර්යභාරය ඉටු කර ගැනීම හැර පරිපාලනයට වෙනත් ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවීය.<br><br>තවද ඉහත පරිදි පිරවීමට අනුමැතිය ලබා දි නොමැති පුරපුපාඩු 318ක් තිබියදි ගත වූ වසර කිහිපය තුළදි විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අධ්‍යයන කටයුතු සාර්ථකව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට හා වැඩිවන කාර්යභාරයට සාපේක්ෂව අනුමත සේවක සංඛ්‍යාවෙහි වැඩි වීමක් සිදු නොවීමද සේවකයින් වැඩි වශයෙන් අතිකාල සේවයේ යෙදවීමට හේතු විය.<br><br>එබැවින් මෙවැනි පසුබිමක් හා වාතාවරණයක් තිබියදී විශ්වවිද්‍යාලය මඟින් 2012 වසර පුරා සියලුම සේවකයින්ට අතිකාල සේවය සඳහා ගෙවීම් කර ඇත්තේ අතපසු වි ඇති හා ඒකරාශි වූ වැඩ සඳහා නොවේ.<br><br>තවද සියලුම අංශ ප්‍රධානීන් වෙත සිය කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ගෙවිය හැකි අවස්ථා කවරේද යන්න හා අතිකාල සේවය පාලනය කිරීමට අනුගමනය කල යුතු විධි ක්‍රම දක්වමින් චක්‍ර ලේඛ උපදෙස් වරින් වර නිකුත් කොට ඇත.<br><br>ලේඛකාධිකාරී/ උපකුලපති විසින් අවස්ථාවෝචිත පරිදි අතිකාල සේවය සඳහා පූර්ව අනුමැතිය හා බලය ලබා දීමේ දි ඉහත කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කරනු ඇත. |
| (ඇ) | විගණකාධිපති වාර්තාවෙහි විශ්වවිද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩලය 2101 ක් ලෙසත්, තත්‍ය කාර්යමණ්ඩලය 956 ක් ලෙසත් ඒ අනුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 1,145 ක් ලෙසත් දක්වා ඇති සංඛ්‍යාලේඛණ නිවැරදි නොවේ.<br><br>2012.12.31 දින වන විට මෙම විශ්වවිද්‍යාලයේ පිරවිය හැකි අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු සංඛ්‍යාව 2,120 ක් බවද, තත්‍ය කාර්යමණ්ඩලය 1,875 ක් බවද ඒ අනුව එදිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 245 ක් පැවතුනි.<br><br>මෙම තත්ත්වය යටතේ පුරප්පාඩු 245 ක් සදහා වන ඉතිරිකිරීම් (ප්‍රතිපාදන) එම වර්ෂය තුල අතිකාල ගෙවීම් සඳහා වැය කර ඇති මුදල (රු. 62,327,455.00) මුදලට වඩා වැඩිය.<br><br>පැවති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වීමට හේතු වු කරුණු ඉහත 4.4 යටතේ  දක්වා ඇත. |

| | |
|---|---|
| (ඈ) | අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල වල පුරප්පාඩු පිරවීම සඳහා 2013 මාර්තු මස හා 2014 අප්‍රේල් මස පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා 2013 වසරේ තනතුරු 59 ක් ද 2014 වසරේ (ජූලි මාසය දක්වා) තනතුරු 26 ක් ද පිරවීමට කටයුතු කර ඇත. |
| (ඉ) | ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් උක්ත කාලපරිච්ඡේදය තුල වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් හැටියට වර්ජනයක් දියත් කරන ලදී. වැඩ වර්ජිත කාලපරිච්ඡේදය තුලදී ඔවුන්ට වැටුප් ගෙවීමක් සිදු නොකල අතර වැඩ වර්ජනය අවසන් වීමෙන් පසුව රජය හා වෘත්තීය සමිති අතර පැවති එකඟතාවයට අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2012.10.10 දිනැති ලිපිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ 2012.10.11 දිනැති ලිපිය අනුව එම කාලපරිච්ඡේදවලට අදාළ වැටුප් ගෙවීම් සිදු කරන ලදී. |
| (ඊ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය යනු 2011 අයවැය යෝජනා මත විශ්වවිද්‍යාලය විසින් සාදන ලද යෝජනාවක් (Proposal) අනුමත කරමින් උසස් අධ්‍යපන අමාත්‍යංශයේ ලේකම් මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල් වෙත ලිඛිතව දැනුම් දී රු මිලියන 100 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ලබාගෙන ක්‍රියාත්මක වන්නකි. අයවැය යෝජනාවේ පිටපතක් ලේකම්/උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙත ද යවා ඇත. ඒ අනුව මෙම පර්යේෂණ මධ්‍යස්ථානයට පත්කර ඇති කාර්ය මණ්ඩලය යෝජනාවේ (Proposal) අරමුණ ඉටුකර ගැනීමට පත්කර ඇති සේවකයන් මිස විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට බඳවාගත් අය නොවේ. පර්යේෂණ යෝජනාව ක්‍රියාත්මක වී අවසන් වන විට පත්කල අයගේ සේවය ද අවසන් වේ. එමෙන්ම ඔවුන්ට උසස්වීම් ලබාගැනීමේ ඉඩකඩක් ද නොමැත. |
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණියේ තනතුරක් වෙත බඳවා ගැනීමේ සුදුසුකම වනුයේ කථිකාචාර්ය (පරිවාස) තනතුරට අදාල සුදුසුකම් සමඟ පශ්චාත් උපාධියක්/ආචාර්ය උපාධියක් සමඟ වසර 6 ක පළපුරුද්ද ය. පළපුරුද්ද සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් හි කටයුතු කිරිම ගණනය කරනු ලැබේ.<br><br>1. විශ්වවිද්‍යාල මට්ටමෙහි ඉගැන්වීමෙහි පළපුරුද්ද<br>2. වෘත්තිය පළපුරුද්ද<br>3. පිළිගත් ආයතනයක සිදුකළ පර්යේෂණ<br>4. පශ්චාත් උපාධි හෝ ආචාර්ය උපාධි ලබා ගැනිම සඳහා ගතවු කාලය<br><br>ඉහත දක්වා ඇති චක්‍රලේඛයට අනුව කථිකාචාර්ය (පරිවාස) තනතුරට අදාල සුදුසුකම් කාණ්ඩ 04 ක් යටතේ වර්ගීකරණය කර ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ පිණිස අදාල කථිකාචාර්යවරයා ඉදිරිපත් කල අයදුම්පත්‍රය අනුව ඔහු අදාළ ක්ෂේත්‍රයෙහි විශේෂ උපාධි පාඨමාලාව දෙවැනි පෙළ පහල සාමාර්ථයක් සමඟින් සමත් වි ඇත. එය කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා 11 කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබීමකි. අදාළ ක්ෂේත්‍රයෙහි වසර 02 ක පශ්චාත් උපාධි පාඨමාලාවක් හදාරා ඉන් සමත් වි ඇත.<br>පහත අයුරින් වසර 06 ක ඉගැන්වීම්/ වෘත්තිය සහ පශ්චාත් උපාධි හැදැරීම වෙනුවෙන් පළපුරුද්ද ලබා ඇත.<br>01.පුහුණුවන විද්‍යාගාර සහායක - Sep. 1989 – July 1990 – මාස 09<br>02.තාවකාලික ප්‍රදර්ශක - Feb – July 1993 – මාස 06<br>03.තාවකාලික සහය කථිකාචාර්ය - Aug. 1993 – Dec.1994 – අවු. 01 මාස 05<br>04.තාවකාලික සහය කථිකාචාර්ය - Aug. 1998 – Aug. 1999 – අවු. 01 මාස 01<br>05.වැඩබලන ගොවිපළ කළමණාකරු- Sep. 1999 - Sep.2000 - අවු. 01 මාස 01 |

| | |
|---|---|
| | 06. පශ්චාත්උපාධිය - Apr.1996-Mar.1998 – අවු. 02<br><br>**එකතුව - අවුරුදු 6 මාස 10**<br><br>සම්මුඛ පරීක්ෂණය සඳහා සකස් කළ ලැයිස්තුවට අනුව මහීපාල මහතා ඉහත අංක 01 සහ 01.01 යටතේ වන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති බැවින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට ද අදාළ තනතුර සඳහා ඉල්ලුම් කර ඇති එකම අයදුම්කරු ද වීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව ඉහත තනතුර ලබාගැනීම සඳහා ඔහු සුදුසුකම් ලබා ඇත.<br><br>මේ අනුව එම්. බී. පී. මහීපාල මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම හා ඒ සඳහා වැටුප් ගෙවීමද නිවැරදිව ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණියට බඳවා ගැනීමේදී ආචාර්ය උපාධියක් තිබිය යුතු ම බවක් සඳහන් නොවේ. එම්. බී. පී. මහීපාල මහතා වෙත 2001.04.09 දිනැතිව නිකුත් කල පත්වීම් ලිපිය අනුව අධ්‍යයන නිවාඩු හිමිනොවන බව දන්වා තිබුණද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 88 අනුව මහීපාල මහතා හට අධ්‍යයන නිවාඩු හිමි බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් 19/06/2001 දිනැතිව දන්වා ඇත. ඒ අනුව එම්. බී. පී. මහීපාල මහතා වෙත ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබාදී ඇත.<br><br>එම්. බී. පී. මහීපාල මහතා සිය අධ්‍යයන නිවාඩුව අවසන්කර 2008. 10. 06 දින සේවයට සඳහා වාර්තා කර ඇතත් ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ බවට අදාළ සහතිකය ඉදිරිපත් කර නොමැති බව පිළිගනිමි. විශ්වවිද්‍යාලය මගින් යම් කථිකාචාර්යවරයෙකු සඳහා සම්පූර්ණ වැටුප් සහිතව අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේදී එකී කාලය තුල එම අධ්‍යයන කටයුතු අවසාන කළ යුතුය. ඒ අනුව මෙම කථිකාචාර්යවරයා සිය අධ්‍යයන නිවාඩුව අවසානයේ ගිවිසුම් ප්‍රකාරව සේවයට වාර්තා කළ ද එතැන් සිට මේ දක්වා සාධාරණ කාලයක් ගත වී ඇතත් ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇත. මේ සම්බන්ධව අප විසින් 2013.04.22 දිනැතිව විමසීමක් සිදුකළ අතර 2013.05.10 දිනැතිව පර්යේෂණ නිබන්ධනය අදාල අංශ වෙත යොමු කර ඇති බව දන්වා ඇත. මේ පිළිබඳව 2013.11.14 දිනැතිව නැවත සිහිකැඳවීමක් නිකුත් කර ඇත.<br><br>මීට අමතරව 2014-06-06 දිනැති ලිපිය සමග මහීපාල මහතාගේ වර්තමාන තත්වය පිළිබඳ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති විසින් එවන ලද 2014-01-10 දිනැති ලිපියද ඉදිරිපත් කර ඇත. |
| (ළ) | <u>ශාස්ත්‍ර පීඨය</u><br><br>ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය, නීති දෙපාර්තමේන්තුව, ලලිත කලා දෙපාර්තමේන්තුව හා බෞද්ධ අධ්‍යයන අංශය යන දෙපාර්තමේන්තු විසින් බාහිර කථිකාචාර්යයවරුන්ගේ සේවය ලබාගෙන ඇති ඒ ඒ අංශ වලින් මෙම බඳවාගැනීම් සිදුකර ඇත්තේ ක්ෂේත්‍රයේ විෂය මාලාවන්ට අදාල ප්‍රවීණ ගුරුභවතුන්ගේ අවශ්‍යතාවය මතයි. එමෙන්ම අවසන් වසර විශේෂ උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා තාවකාලික ආචාර්යවරුන්ගේ සේවය දේශණ පැවැත්වීමට යොදවා ගැනීම සුදුසු නොවන බැවින් සහ ප්‍රවීණ ගුරු භවතුන් ස්ථිර පදනම මත බඳවාගත නොහැකි බැවින් මෙසේ බාහිර කථාකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන ඇත.<br><br>ආයතන සංග්‍රහයෙහි පරිදි බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම අධෛර්යමත් කළ යුතු බව සඳහන්ව ඇතත් ආචාර්යවරුන් නිවාඩු ගත්විට ඒ සඳහා තාවකාලික සහ බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම වළක්වා නොමැත. එබැවින් විශේෂඥතා ඇති සම්පත්දායකයන් මගින් විෂයයන් ඉගැන්වීම සඳහා සහ අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී ඇති සහ ජාතික සේවය සඳහා මුදවා ඇති හා පුරප්පාඩු ගත තනතුරු සඳහාත් බාහිර කථිකාචාර්යවරු බඳවා ගැනීමට අවශ්‍යවන බව සඳහන් කරමි. |

කෙසේ වුවද විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ගෙවන වැටුපෙන් 1.08% ප්‍රමාණයක් බාහිර කථිකාචාර්යවරුන් සඳහා වැය ප්‍රතිශතය පවත්වාගෙන යෑමෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සඳහන් පරිදිම බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්මත් කර ඇති බව විද්‍යාමාන වේ.

එසේම විමසුමේ ඔබ විසින් යෝජනා කර ඇති පරිදි පුරප්පාඩු ගත තනතුරු සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගන්නේ නම් ඔවුන්ට ගෙවිය යුතු පඩිනඩි හා අනෙකුත් දීමනා සලකා බැලීමේදී වැටුප් වියදම මීට වඩා විශාල අගයක් ගැනීමට ඉඩ තිබුණි. කෙසේ නමුත් බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ලබා ගත හැකි සේවය සීමිත බැවින් ආචාර්යය මණ්ඩලයේ පුරප්පාඩුගත තනතුරු පිරවීමට කටයුතු කරමින් පවතී. 2010 සිට මේ දක්වා නව බඳවා ගැනීම් පිළිබඳ දත්ත පරීක්‍ෂා කර බලන්නේ නම් වාර්ෂිකව හඳුනා ගත් පුරප්පාඩු පිරවීම ද නොකඩවා සිදු කරමින් පවතින බව සඳහන් කළ යුතු ය.

එබැවින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්යමත් කර ඇති බව සඳහන් කරන අතර එසේ වුවද අධ්‍යාපනික අවශ්‍යතා ප්‍රමුඛතාවය මත ඉදිරියේදී බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හිදී එසේ බඳවා ගැනීමට සිදු වේ.
එසේම **වෛද්‍ය පීඨය** සඳහා පහත සඳහන් කර ඇති හේතූන් නිසා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී ඇත .

වෛද්‍ය සිසුන් සඳහා දේශන පැවැත්වීමට සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීමට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගන්නා අතර. එසේ සේවය ලබා ගන්නා විෂයන් සඳහා පීඨය තුල විශේෂඥ දැනුම ඇති කථිකාචාර්යවරුන් පත් කොට නොමැත.

ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව මඟින් ස්නායු ශල්‍ය විශේෂඥ දැනුම ඇස්, කන්, නාසා, උගුර සම්බන්ධ දැනුම, විකලාංග රෝග පිළිබඳව දැනුම ලබාගනු ලබන්නේ බාහිර කථිකාචාර්යවරුන් මඟිනි. එම විෂයන් පිළිබඳව විශේෂඥයින් විශ්වවිද්‍යාලීය කථිකාචාර්යවරුන් වශයෙන් බඳවාගෙන නොමැති අතර රජයේ රෝහල් වල සහ රජයේ විශ්‍රාමික විශේෂඥයින් අතරින් බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් තෝරා ගනු ලැබේ.

වෛද්‍ය දෙපාර්තමේන්තුව මඟින් බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් හමේ රෝග, පිළිකා රෝග, සමාජ රෝග වැනි විෂයන් පිළිබඳ විශේෂඥයන්ගේ සේවය ලබා ගනී. එයට හේතුව එම විෂයන් පිළිබඳ විශේෂඥයින් පීඨය තුල නොමැති වීමය.

ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව මඟින් වෛද්‍ය ශිෂ්‍යයන්ට සමාජයේ විවිධ අංගයන්හි ප්‍රායෝගික දැනුම ලබා දේ. රෝග බෝවීම සහ වැලැක්වීම පිළිබඳව අවබෝධය, මාතෘ සායන කටයුතු පිළිබඳව ඉගැන්වීම සඳහා පවුල් සෞඛ්‍යය සේවිකාවන්, පවුල් සෞඛ්‍ය හෙදියන් මහජන සෞඛ්‍යය පරීක්ෂකවරුන්, අඳ, ගොලු, බිහිරි පාසල් කාර්ය මණ්ඩලය, හෝටල් කාර්ය මණ්ඩලය, සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට සිදු වේ. ඒ එම නිළධාරීන් ඒ ඒ විෂයන් පිළිබඳ විශේෂඥ දැනුම ලබා ඇති බැවිනි.
ඖෂධවේදී දෙපාර්තමේන්තුව මඟින් වසංගත රෝග පිළිබඳව විශේෂඥ දේශකවරයෙකුගේ සේවය ලබා ගෙන ඇත. එම විෂයෙහි විශේෂඥයන් පීඨය තුල නොමැත.

නිර්වින්දන වෛද්‍ය දෙපාර්තමේන්තුව මඟින් බාහිර කථිකාචාර්යවරයෙකුගේ සේවය ලබා ගෙන ඇත්තේ ස්ථිර කාර්යමණ්ඩලයේ සේවයේ නියුතුව සිටින්නේ එක් කථිකාචාර්යවරියක් පමණක් බැවිනි. කථිකාචාර්යවරුන් දෙදෙනෙක් පශ්චාත් පුහුණුව සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇති හෙයින් මෙම අධ්‍යයන කටයුතු සියල්ල එක කථිකාචාර්යවරියකට පැවරී ඇත. එම දෙපාර්තමේන්තුව මඟින් පේරාදෙණිය රෝහල සඳහා විශේෂඥ වෛද්‍ය වරුන්ගේ සේවාව සපයන අතර සිසුන්ගේ සායනික පංති පැවැත්වීමද සිදු කරනු ලැබේ.

මෙම විෂයන් සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී විශ්වවිද්‍යාලයට විශාල වැය බරක් දැරීමට සිදු වේ. බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ඊට වඩා අඩු වියදමකින් එම කාර්යය ඉටුකර ගත හැක.

| | |
|---|---|
| | **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** ඉතා මෑතකදී ආරම්භ කල හෙයින් දැනට පීඨයේ සියලු ස්ථිර පුරප්පාඩු පුරවා නොමැති හෙයින් , බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම අනිවාර්යය වී ඇත. කෙසේ වෙතත් ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගත් විට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම ඉතා සීමිත වනු ඇත. |
| **5.** | **ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය** |
| **5.1** | **සංයුක්ත සැලැස්ම**<br>2012 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුලත් රු. 383,490,000.00 ක ප්‍රග්ධන වියදම් සහ අනෙකුත් අයවැය අයිතමයන් 2012-2016 අදාල සංයුක්ත සැලැස්මට ඇතුලත් කර නොමැති වුවද 2014-2018 සංයුක්ත සැලැස්මෙහි අයවැය ඇස්තමේන්තුන් ඇතුලත් කර ඇත. |
| **5.2** | **ක්‍රියාකාරී සැලැස්ම**<br>1.සියලුම පීඨවල විෂයන් සමාලෝචනය සිදු කර ඇත.එමෙන්ම ඇතැම් පීඨවල සමාලෝචනය කර අළුතින් සැකසූ විෂය පාඨමාලා විශ්වවිද්‍යාල සනාථන සභාවෙන් අනුමත කර ඇත.<br>2.ඉගැන්වීමේ ක්‍රමවේද වැඩසටහන් නැවත සකස් කිරිමට සෑම පීඨයකම සිදු කර ඇත. මේ සඳහා කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩ සටහන් පවත්වා ඉගැන්වීමේ ක්‍රමවේද දියුණු කිරිමට විශේෂ අවධානය යොමු කර ඇත.<br>3.සෑම පීඨයකම කථිකාචාර්වරුන්ගේ ඇගයීම් වැඩ සටහන් දියුණු කිරිමද සිදු කර ඇත.එය සිදු කරනු ලබන්නේ සිසුන් විසින් කරනු පාඨමාලා ඇගයීම් සහ ආචාර්වරුන්ගේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්හිදීය.<br>4.කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි මූලික වගකීම වන්නේ කථිකාචාරවරුන් පුහුණු කිරිමයි. මූලික පුහුණු වැඩසටහනට අමතරව Developing Research Capacity Of The University Staff වැඩසටහන අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 130 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදී. |
| **5.3** | **පාලකසභා රැස්වීම**<br>සමාලෝචිත වර්ෂය තුලදී පාලකසභා රැස්වීම් වාර 11 පවත්වා ඇත. ප්‍රසම්පාදන කමිටු විස්තර , ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් ආදී විස්තර සහ කාර්යමණ්ඩල තොරතුරු අනුව නව බඳවාගැනීම් තොරතුරු පාලක සභාවට වාර්තා කොට ඇත. අනෙකුත් වාර්තා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| **5.4** | **ප්‍රසම්පාදන සැලැස්ම**<br>2013 වර්ෂය සඳහා ශාස්ත්‍ර පීඨයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර විශ්වවිද්‍යාලීය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත.2013 වර්ෂයේ සිට දන්ත පීඨය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සැකසීමට කටයුතු සිදු කර ඇත. |
| **5.5** | **අයවැය ලේඛණමය පාලනය** |
| **(අ)** | විශ්වවිද්‍යාලය සෑම විටම අයවැය ලේඛන ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කරනු ලබන අතර විශ්වවිද්‍යාලයේ පාලනයෙන් බැහැර ඇතැම් සිද්ධීන් නිසා අයවැය ලේඛනයේ විචලනයන් දක්නට ලැබේ.<br>උදා: (1) ව්‍යවස්ථාපිත දීමනාවන්ගේ වැඩිවීම.<br>(2) සැළසුම් කළ ප්‍රමාණයට වඩා සිසුන් බඳවා ගැනීමට සිදුවීම.<br>(3) උද්ධමන කාරකයන් |
| **(ආ)** | ඉදිරියේදී නියමිත දිනට පෙර පාලක සභා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| **6.** | **පද්ධති හා පාලනයන්**<br>පෙන්වා ඇති දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පද්ධති පාලනයන් ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත. |

# වාර්ෂික වාර්තාව 2012

සංඛ්‍යාලේඛන හා තොරතුරු අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය
**www.pdn.ac.lk**